# පාලි භාෂාව

( 1, 2, 3. )

පණ්ඩිත වේරගොඩ අමරමෞලි
ස්ථවිරපාදයන් වහන්සේ විසින්
ලියන ලදී.

විද්‍යෝදය පරිවෙණාධිපති
අතිගරු බද්දේගම ශ්‍රී පියරතනාභිධාන
නායක මාහිමියන් වහන්සේ විසින්
පිළිගන්නා ලදී.

වෛද්‍යාචාර්ය ඩු. ජේ. සෝදිරිස් මහතා විසින්
කොටහේනේ සාහිත්‍ය මුද්‍රණාලයෙහි
මුද්‍රණය කරවන ලදී.

2492
1948

මිල රු. 3/50

# ප්‍රස්තාවනා

අපගේ සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ ශ්‍රී සද්ධර්මය ලියවුනු භාෂාවට අපි පාලිභාෂාව යයි කියමු. බුදුරජාණන් වහන්සේ දූත් තිබෙන පාලිභාෂාවෙන් ධර්මය දේශනා නො කළ සේකැයි ද, ඒ භාෂාව අනුරාධපුරයෙහි වූ මහාවිහාරයෙහි විසූ භික්ෂූන් විසින් නිපදවන ලද්දකැයි ද, මීට අවුරුදු සිය හතළිහකට පමණ පෙර සිටි යුරෝපයේ ප්‍රාචීන පඬිවරයෙක් පැවසීය. පාලිභාෂාවෙන් ලියවුනු පුරාතන ශිලා ලිපියක් මේතාක් දඹදිව්හිදී සොයාගත්ට බැරිවීමත්, බුදුරජාණන් වහන්සේහට සමකාලිකව සිටි 'නිගණ්ඨනාථ පුත්‍ර' යන නාමයෙන් අපේ පාලිපොත්හි ප්‍රසිද්ධ, මහාවීර නම් අන්‍යශාස්තෘවරයා දේශනා කළ ධර්මය ලියවී තිබෙන ජෛනග්‍රන්ථයන්හි භාෂාව හා පාලිභාෂාවද විසදෘශ වීමත් ඒ පඬිවරයාට ඒ නිගමනයට බැසගැණීමට හේතුවන්ට ඇත. ලංකා ශිලා ලේඛන සංග්‍රහයෙහි සම්පාදකයෙක් වූ වික්‍රමසිංහ මහතා ද ඒ අදහස ප්‍රකාශ කළ බව දනිමු. ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශ වූ ඒ අදහස් අපේ රටේ පාලි උගත්හු බොහෝ දෙනෙක් නො දත්හ. එහෙයින් ම අපේ රටේ පාලි උගතුන් ගෙන් පිළිතුරු ඒ අදහස ප්‍රකාශ කළවුන්ට නො ලැබුනේය. මීට අවුරුදු සත අවකට පමණ පෙර මහනුවරදී පැමැත්වූ සභාවකදී එක්තරා වියතෙකු විසින් ඒ අදහස පවසන ලදී. ඊට කලින් ඒ අදහසම එක්තරා ග්‍රන්ථයක සංශෝධනයෙහි ඉංග්‍රීසි පඬිවරයෙකු විසින් ප්‍රකාශ කළ බව ඒ වියතා නො කීය. අපේ රටේ පාලි උගතුන්ගේ ඇස් ඇරුණේ එවිට ය. ඉන් පසු පුවත්පත් සඟරා මගින් ද විවාදයක් විය. පරිවෙණාධිපතිවරු කීප නමක් ද තරුණ පඬිවරු කීප දෙනෙක් ද ඊට ඉදිරිපත් වූහ. තර්කයෙහි සඳහන් 'නිග්‍රහ' යන වචනය ආරංචියෙන් මිස එයින් ප්‍රකාශවන ක්‍රියාව කුමක්දැයි නො දත් හෙයින් ඒ අනුන් කෙලා කළා ඇනුම් බැණුම් කීම පරම

සැපතක් කොට සැලකූ ඒ වියතා තමාට පවහැනිව ලියූ ඒ පරිවෙණාධිපතිවරුන්ට හා පඬිවරුන්ටත් කුලමල පවා කියා ආක්‍රොශ පරිභව කළ-කරවූ-බව සුප්‍රසිද්ධ ය. ඒ දෙපක්‍ෂයෙහි ම ලියුම් කියවන්ට මට ඉඩ නොලැබිනි. ඒ පරිවෙණාධි පතිවරුන් හා තරුණ පඬිවරුන් ද ප්‍රකාශකරන්නේ ඇත්තේ පාලිභාෂාව මහාවිහාරවාසී භික්‍ෂූන් විසින් නොව බුදුරජාණන්වහන්සේ විසින් ම එකල පැවති අර්ධමාගධිය සකස්කොට නිපදවා ගන්නක්ය යන බව යි. මම ද ඒ පක්‍ෂය ම ගණිමි. ඒ පිළිබඳ ව මගේ අදහස් ලියන්ට මෙහි ඉඩ නැත. මාවිසින් මේ සම්බන්ධව කිය යුතු බොහෝ දෙය 1944දී ප්‍රසිද්ධකළ ප්‍රාචීනභාෂොපකාර සමිතියේ සඟරාවෙහි දක්වන ලදී.

'පාලි' ශබ්දයෙහි නිරුක්ත්‍යනුගත අර්ථය පිළිබඳව ද මතභෙද රාශියක් පවතී. ඒ මතයන්ගේ ගුණදොෂ විවෙචන යක් කරන්ට මෙහිදී අපි අදහස් නොකරමු. අපගේ මතය සඳෙහකත සඟරාවෙහි ම පළවිය. එහෙත් මෙහි එය සැකෙවින් වත් දැක්වීම ශිෂ්‍යයන් හට ප්‍රයොජනවත් විය හැකි ය.

'පාලි' යන්න මූර්ධජ 'ළ' කාරවත් කොට ද සමහරු ලියති. ඊට විරුද්ධවන්ට කරුණක් අපට නැත. පාලිභාෂා වෙහිදී 'ල' 'ළ' යන අකුරු දෙකෙහි විශෙෂයක් නැතැයි වෛයාකරණයන් කියූ හෙයිනි. එයින් තේරුම් ගත යුත්තේ 'ල' 'ළ' දෙක එක ම ශබ්දයක් හැඟින්වීම සඳහා යෙදුනු ලකුණු දෙකක් බව යි.

'පාලි' නොහොත් 'පාළි' යන්න භාෂාවාචී නොව ධර්මවාචි වෙ යි. ඒ බව නොයෙක් තැනින් ඔප්පුවෙ යි. බුද්ධ ධර්මය පමණක් නොව අන්‍ය ධර්ම ද සඳහා 'පාලි' යන්න යෙදුනු බව "භික්ඛු ච කණ්ටක වුත්තිකාති අයං භිඝස පාලි" යන සාමඤ්ඤ ඵල සුත්ත වණ්ණනා පාඨයෙන් පැහැදිලි වේ.

'ධර්මයට 'පාලි' යන නාමය කවර හෙයින් යෙදුනේ දැයි පරීක්‍ෂා කර බැලීම වටී. 'පා'-රක්ඛණෙ' යන ධාතුවෙන් කර්තෘ කාරකයෙහි 'ලි' ප්‍රත්‍යය කොට සමහරු 'පාලි' යන්න

නිපදවති. ‘රක්ඛන්තා’ යනු එවිට එහි අර්ථය යි. ධර්මය තමා රක්නා රකින බව සැබෑ ය. එහෙත් මේ ‘පාලි’ යන්නෙහි මූලාකුර වූ ‘පා’ යන්න මුල් කොට ඇති පාෂණ්ඩ, පාඛණ්ඩ, පාවචන, පාතිමොක්ඛ යන වචන පරීක්ෂා කර බලන විට පෙනෙන්නේ ‘පා’ යන්නෙහි ම ‘රක්ඛන්තා’ යන අර්ථය ඇති බව යි. එහෙයින් ඒ අර්ථ ඇති ‘පා’ යන්න හා ‘ලි’ යන්න අවසන් කොට ඇති තවත් වචනයක්ද සමාස වීමෙන් ‘පාලි’ යන්න සෑදුවන බව සිතිය හැකි ය.

‘පාෂණ්ඩ, පාඛණ්ඩ’ ශබ්දයන්ගේ නිරුක්තිය දක්වන ශබ්දස්තොම මහානිධිකාරයෝ

“පාලනාච්ච ත්‍රයී ධර්මඃ පාශබ්දෙන නිගද්‍යතෙ,
ෂ (ඛ) ණ්ඩයන්ති තං යස්මාත්–පාෂ (ඛ) ණ්ඩාස්තෙන
කීර්තිතාඃ”

යන ශ්ලෝකය ගෙණ ඇර දක්වමින් “වෛදධර්මය තදනුගාමීන් පාලනය කාරණ හෙයින් ‘පා’ ශබ්දයෙන් කියනු ලැබේ යයි ද, එය ෂණ්ඩනය (=මර්දනය) හෝ ඛණ්ඩනය කරන්නෝ ‘පාෂණ්ඩ’ හෝ ‘පාඛණ්ඩ’ නම් වෙතැ යි ද කීහ. සංස්කෘතයෙහි ධර්ම වාචී ‘පා’ ශබ්දයක් තිබුනු බව මෙයින් ඔප්පු වේ. ‘පා’ ශබ්දයෙහි තිබෙන මේ අර්ථය බොහෝ කලක පටන් අමතක වී ගිය බව කිය හැකි ය. ඒ නිසාම පුරාතනයෝ ද ‘පාවචන’ යන වචනය සංස්කෘත නො වෙතැයි සිතා ‘ප්‍රවචන’ යයි වෙනස්කරන්ට ඉක්මන් වූහ.’ ‘පාතිමොක්ඛ’ යන්නට නිරුක්ති ලියූ අටුවාචාරී‍යා ඇදුරෝ පවා නොගැලපෙන දෙය කීහ. ‘පාවචන’ යන්නට ‘ධර්ම වචන’ යයි ද, ‘පාතිමොක්ඛ’ යන්නට ‘ධර්මයට ආදි වූ මුඛය’ යි ද කිසි කෙනෙක් අර්ථ නො කීහ.

මේ වචනයන් පරීක්ෂා කර බැලීමෙහි දී මේ හැම තැනම යෙදුනේ ධර්මවාචී ‘පා’ ශබ්දය බව ඔප්පු වේ. ‘පාලි’ යන්නෙහි ‘පා’ ශබ්දය ද ධර්ම පර්‍යායය වන බව දූන් පැහැදිලි ය. ‘පා’ ශබ්දයෙන් අග කොටස ‘අලි’ හෝ ‘ආලි’ යි වෙසැසිය යුතු හැකි ය. මෙතකට සුදුසු වූ අර්ථයක් ‘අලි’ ශබ්දයෙහි නැත.

‘ආලි’ යනු ඇලට–ජලමාර්ගී විශේෂයකට–නමකි. ඒ ශබ්දය මෙහි ගැලපේ. එහෙයින් ‘පාලි’ යන්න ‘පා + ආලි’ යි විසන්ධි කළහැකි ය. එවිට එහි තේරුම නම් ‘ධර්මයට ඇල’ යනු යි. වේදය වනාහි බ්‍රාහ්මණයන්ගේ ධර්ම නමැති ජලය පිරුණු ඇලක් වැනි ය. එහෙයින් වේදය බ්‍රාහමණයන්ගේ පාලිය යි. එහෙත් ‘පාලි’ යන වචනය බෞද්ධයන් විසින් ම නිපදවූවක් හෝ බෙහෙවින් ව්‍යවහාර කරණ ලද්දක් හෙයින් බෞද්ධයන්ගේ ත්‍රිපිටක ධර්මය ම ‘පාලි’ නාමයෙන් ප්‍රසිද්ධ වී ය.

පාලිය හෙවත් ත්‍රිපිටකය දෙශනා කළ භාෂාව ‘පාලි භාෂා’ නම් වෙයි. බුදුරජානන් වහන්සේ විසින් ත්‍රිපිටක ධර්මය දෙශනා කරණ ලද්දේ එකල මගධ දෙශයෙහි සාමාන්‍ය ජනයා අතර පැවැති, දැනට ජෛන ග්‍රන්ථයන්හි දක්නා හැකි මාගධී භාෂාවෙන් නොව තක්ෂශිලා ආදි විශ්වවිද්‍යාලයවල මධ්‍ය භාෂාව ලෙස පැවති ශුද්ධ මාගධියෙනි. ශාක්‍ය ජනපදයෙහි උපන් බුදුරජානන් වහන්සේ මගධ දෙශයට අමුත්තෙකි. ශාක්‍ය ජනපදයෙහි පැවති භාෂාව ද මගධ දෙශයෙහි පැවති භාෂාවට වඩා වෙනස්වන්නට ඇත. එහෙයින් බුදුරජානන් වහන්සේ ධර්ම දෙශනා කළ භාෂාව මගධ දෙශයෙහි පැතිර පැවති සාමාන්‍ය භාෂාව නොව උගතුන් අතර පැවති මධ්‍ය භාෂාව විය යුතු ය. සාමාන්‍ය මාගධී භාෂාවට බෙහෙවින් ආසන්න හෙයින් ද, ඊට වඩා පිරිසිදු හෙයින් ද ඒ භාෂාව ශුද්ධ මාගධී නාමයෙන් ද ප්‍රකට වී ය.

පාලි භාෂාවෙහි ව්‍යාකරණය ඉතා පහසු ය. සවල්පය. එහෙයින් පාලි භාෂාව ඉගෙණීම ද සුකර ය. සිංහල භාෂාවෙහි බොහෝ වචන පාලිභාෂාවෙන් බිඳී ආ හෙයින් ද, බොහෝ සිංහල වාක්‍ය රචනාරීති පාලිවාක්‍යරචනා රීතීන් හා නො වෙනස් හෙයින් ද පාලිභාෂාව ඉගෙණීම සිංහලයන් හට සවභාවයෙන්ම පහසු ය.

පසුගිය කාලයෙහි පාලිව්‍යාකරණ ඉගෙණීමට තිබුනේ මුද්‍රණොපකරණ නො තිබුනු, එහෙයින් ම පොත්පත් සුලභ නුවූ අතීත කාලයෙහි කටපාඩම් කරගණු සඳහා පැරණියන්

ලියූ පොත් ය. පාඩම් කිරීමේ පහසුව සලකා ඒ පොත්හි ව්‍යාකරණ නීති ප්‍රකාශ කරණ සූත්‍ර ඉතා කෙටි කරණ ලදී. එහෙයින් ඒ සූත්‍රයන්ගේ අර්ථ වහා අවබෝධ කර ගැණීම අපහසු වී ය. පෙර කල මෙන් මෙ කල පොත් ලුහුඬු කිරීම අනවශ්‍ය ය. දැන් නවීන යන්ත්‍ර ආදියෙහි උපකාරයෙන් පොත් පත් ඉතා සුලභ ය. එහෙයින් පැරණි පොත් මුළු මනින් වාචෝද්ගත කිරීම අවශ්‍ය ය යි මට නොසිතේ.

ව්‍යාකරණය අවශ්‍ය වන්නේ නිවැරදි වචන හොඳ වාක්‍ය රචනා කිරීමට යි. එය අභ්‍යාසයෙන් ම කරන්නට පුළුවන් වන සේ ඉගැන්වීම වියරණ පොත් කට පාඩම් කරවා ඉගැන්වීමට වඩා ශිෂ්‍යයන්ට මහත් පහසුවක් ගෙණ දෙයි.

නොබෝ කලකින් සිංහල භාෂාව නවත් වරක් ලඞකාවෙහි ආණ්ඩුවේ භාෂාව වෙයි. එහෙයින් දැන් ද්‍රවිඩයන් වාසය කරණ පළාත්හි පවා සිංහල භාෂාව උගන්වන්ට කටයුතු සූදානම් කර තිබෙන බව ප්‍රසිද්ධ ය. සිංහල භාෂාව හොඳින් ඉගෙණීමට නම් පාලි භාෂාව හෝ සංස්කෘත භාෂාව ද තරමක් දුරටවත් උගත යුතු ය.

වේරගොඩ පණ්ඩිත අමරමෝලි ස්ථවිරයන් විසින් ලියූ 'පාලිභාෂාව' නමැති පොත ද පාලිභාෂාව ඉගෙණීමට නැමැත්තන්ට මහෝපකාර විය හැකි බව නිසැකය. මේ පොත කියවා බැලීමට ඉඩක් නොලැබුන නමුත් ඉගැන්වීමෙහි මහත් පලපුරුද්දක් ඇති මේ පණ්ඩිත ස්ථවිරයන් අතින් ලියැවුනු මේ පොත පරිශීලනය කිරීමෙන් නොබෝ කලකින් පාලි පොත් තේරුම් ගැණීමට හා පාලි වාක්‍යරචනා කිරීමටත් සාමර්ථ්‍යයක් ඇතිකර ගත හැකි යයි සිතමු.

මෙබඳු පොත් සුලභවීම පාලි භාෂාවෙහි පමණක් නොව සිංහල භාෂාවෙහි උන්නතියට ද හෙතුවනු ඒකාන්තයි.

මීට,

වැලිවිටියේ සෝරත ස්ථවිර

1948 මැයි 18 දින දීය.

# සංක්ෂෙපනය

**පාලිභාෂාව** නම් වූ මෙම ග්‍රන්ථය පාලිභාෂාව පහසුවෙන් හා ඉක්මනට ඉගෙණ ගැණීම සඳහා නවීනක්‍රමානුකූලව පාඨශාලාවන්ට ද ඔබිනසේ පිළියෙල කරණ ලද්දකි. පිරිවෙන්වල "මූලික 1 වැනි වර්ගය, 2 වැනි වර්ගය, 3 වැනි වර්ගය සහ ප්‍රාථමිකවර්ගීවලට අයත් අභිනව නිර්දෙශපත්‍රයට මෙහි එන විෂයයෝ සාකල්‍යයෙන් ම අනුරූපයහ. ප්‍රාචීන ප්‍රාරම්භ මධ්‍යම විභාගවලින් සම්පූර්ණවීමට ද අනික් ග්‍රන්ථයක පිළිසරණක් නොලැබ මේ ග්‍රන්ථය හැදෑරීමෙන් ම හැකිවේ.

එසේම මෙය පාඨශාලාශිෂ්‍යයන්ගේ ප්‍රයෝජනය පිණිස විශේෂ පරිශ්‍රමයකින් පිළියෙල වූවකි. S. S. C. විභාගයට සැරසෙන්නවුන් විසින්ද මේ ග්‍රන්ථය පරිශීලනය කිරීමෙන් ස්වකීය අභිමතාර්ථය මුදුන් පමුණුවා ගත හැකි වෙයි. මෙහිදී පාඨශාලා පරීක්ෂක ඩී. ඩබ්ලිව්. කළුආරච්චි මහතාට අපගේ ප්‍රශංසාව හිමිවිය යුතුය.

මේ ග්‍රන්ථය පිළිගෙණ වදාළාවූ අසමදෘවායසී විද්‍යෝදය පරිවේණාධිපති අතිගරු බද්දේගම ශ්‍රී පියරතනාභිධාන නායක මාහිමියන් වහන්සේට අපගේ නමස්කාරය වේවා. එසේම ස්වකීය අසනීප ගතිද නොසලකා මීට සාර භාර ප්‍රස්තාවනාවක් ලියාදීමෙන් ග්‍රන්ථගෞරවය දියුණුකළාවූ අප ආචාර්‍යයමාණ පණ්ඩිත වැලිවිටියේ සෝරතාභිධාන ගාලු කෝරළේ ප්‍රධාන නායක ස්වාමීන්ද්‍රයන්වහන්සේට ද, අප භ්‍රාතෘභූත වැලිවිටියේ පේමරතන ස්වාමිපාදයන්වහන්සේට ද, අපගේ ගෞරවාදර භක්තිය වේවා.

මෙම ග්‍රන්ථයෙහි මුල්පිටෙහි පෙණෙන චිත්‍රය සපයාදීමෙන් උපකාරකළාවූ මාතලේ ශ්‍රී ධර්මරාජ පරිවෙණාධිපති ගරු ගම්මුල්ලේ ශ්‍රී චන්ද්‍රජෝති ස්ථවිරපාදයන්වහන්සේට ද, මෙහි ශෝධ්‍යපත්‍ර කියවාදීමෙන් හා අකාරාදිය සම්පාදනය කර

දීමෙන් සහාය වූ ගම්මැද්දේගොඩ පුඤ්ඤසාර, දෙරවියාවේ ඤාණසාර යන භික්ෂූදෙනමටද, චිත්‍රය පිළියෙල කරවාදුන් ජී. පී. ඩී. ජිනදාස මහත්මයාටද, මුද්‍රණය යහපත්ව කරවාදුන් කොටහේනේ සාහිත්‍ය මුද්‍රණාලයයේ කළමනා-කාර තැන්පත් ජී. ජී. කේ. ගේවාවසම් මහත්මයාට ද අපගේ ප්‍රශංසාව හිමිවිය යුතුයි.

මෙය නැවත මුද්‍රණයකිරීම් කර්තෘගේ අදහස් පරිදි වීය යුතුය.

මීට,

වේරගොඩ අමරමෝලි ස්ථවිර

2492 වෙසක් පුර පසළොස්වක් දින
හැව්ලොක්ටවුන්හි මාලේවන ඖෂධශාලාවේ දී ය.

# අනුක්‍රමණිකා


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| සංඥා | 1 | සිංහල වාක්‍ය පාලියට නැගීම | 107 |
| ස්වරසන්ධි | 9 | වචනාර්ථ දැක්වීම | 111 |
| ප්‍රකෘතිසන්ධි | 19 | අර්ථ විභක්තිය | 111 |
| ව්‍යඤ්ජනසන්ධි | 20 | අරුත් බිඳීම | 112 |
| නිග්ගහීතසන්ධි | 23 | භාවාර්ථ කථනය | 115 |
| පරිචය | 27 | සංක්ෂෙපාර්ථ කථනය | 116 |
| නිත්‍යසන්ධි | 32 | වාක්‍යයන්හි අඩුතැන් පිරවීම | 117 |
| නාම (පුංලිංගික) | 34 | (4 කාණ්ඩය) සමාස | 118 |
| විශෙෂ අකාරාන්ත නාම | 38 | තද්ධිතය | 125 |
| නපුංසකලිංගික සාමාන්‍ය නාම | 42 | ආඛ්‍යාතය | 131 |
| ,, විශෙෂ නාම | 43 | වත්තමානා විභත්තිය | 132 |
| ආකාරාන්ත නාම | 45 | පඤ්චමී විභත්තිය | 134 |
| ඉකාරාන්ත නාම | 46 | සත්තමී විභත්තිය | 135 |
| ඊකාරාන්ත නාම | 49 | හීයත්තනී ,, | 136 |
| උකාරාන්ත නාම | 51 | පරොක්ඛා ,, | 137 |
| ඌකාරාන්ත නාම | 54 | අජ්ජතනී ,, | 138 |
| ඕකාරාන්ත නාම | 56 | භවිස්සන්ති ,, | 140 |
| සර්වනාම | 57 | කාලාතිපත්ති ,, | 140 |
| සඞ්ඛ්‍යා නාම | 68 | ක්‍රියා පිළිබඳ විශෙෂ විභාග | 142 |
| (2 කාණ්ඩය) පරිචය | 75 | නාම ධාතුක ක්‍රියා | 151 |
| විශෙෂ අභ්‍යාස | 95 | පරිචය | 153 |
| (3 කාණ්ඩය) වාක්‍ය ප්‍රභෙද | 97 | කිතකය | 161 |
| පදස්ථාපන විධි | 99 | අතීත කාලික කෘදන්ත | 171 |
| වාක්‍යයන්හි අදහස් විවෘරිම | 104 | ඊප්සාර්ථ කෘදන්ත | 173 |

| | පිටුව |
|---|---|
| පූර්වක්‍රියා | 174 |
| මිශ්‍රක්‍රියා | 175 |
| කාරකය | 175 |
| උක්ත අනුක්ත කාරක | 176 |
| කර්තෘ කාරකය | 176 |
| කර්ම ,, | 177 |
| කරණ ,, | 179 |
| සම්ප්‍රදාන ,, | 179 |
| අපාදාන ,, | 180 |
| ස්වාමි විභක්තිය | 181 |
| ආධාර කාරකය | 182 |
| සිංහල වාක්‍ය පාලියට නැගීම | 184 |
| ප්‍රබන්ධෝපදේශ (පාලි වාක්‍යරචනා) | 189 |
| කෝකිලෝ | 191 |
| වසන්ත උතු | 193 |
| ගෝ | 194 |
| කාලෝ | 195 |
| ආරෝග්‍යං | 196 |
| විනයෝ | 198 |
| පාලියෙන් කථාකිරීම | 199 |
| ඡන්දෝ විභාග | 204 |
| ආර්‍යා | 205 |
| ගීති | 206 |
| වක්ත්‍ර | 207 |
| වර්ණඡන්දස් | 208 |
| ත්‍රිෂ්ටුප් | 209 |
| ජගතී | ,, |
| අතිජගතී | ,, |

| | පිටුව |
|---|---|
| සක්කරී | 209 |
| අතිසක්කරී | 210 |
| අට්ඨි | ,, |
| අච්චට්ඨි | ,, |
| ධුති | ,, |
| අතිධුති | ,, |
| කති | 211 |
| පකති | ,, |
| ආකති | ,, |
| ෂට්ප්‍රත්‍යය | 211 |
| අලඞ්කාර විභාග | 213 |
| පසාද | 213 |
| ඔජ | 214 |
| මධුරතා | ,, |
| සමතා | ,, |
| සුඛුමාලතා | 215 |
| සිලෙස | ,, |
| උදාර | ,, |
| කන්ති | 216 |
| අත්ථව්‍යක්ති | ,, |
| සමාධි | ,, |
| ශබ්දාලඞ්කාර | 217 |
| ඡේක අනුප්‍රාස | ,, |
| වෘත්ත්‍යනුප්‍රාස | ,, |
| ශ්‍රුත්‍යනුප්‍රාස | 218 |
| අන්ත්‍යානුප්‍රාස | ,, |
| ලාටානුප්‍රාස | ,, |
| යමක | ,, |
| අර්ථාලඞ්කාර | 219 |
| අතිශයෝක්ති | ,, |

| | පිටුව |
| --- | --- |
| උපමා | 219 |
| රූපක | 220 |
| දීපක | ,, |
| ආක්ෂෙප | ,, |
| අර්ථාන්තරන්‍යාස | ,, |
| ව්‍යතිරේක | 221 |
| හේතු | ,, |
| ක්‍රම | ,, |
| සමාසෝක්ති | ,, |
| උත්ප්‍රේක්ෂා | ,, |
| පර්‍යායෝක්ති | 222 |
| ව්‍යාජස්තුති | ,, |

| | පිටුව |
| --- | --- |
| විශේෂෝක්ති | 129 |
| ශ්ලේෂ | ,, |
| තුල්‍යයෝගිතා | 223 |
| නිදර්ශන | ,, |
| උදාත්ත | ,, |
| අප්‍රස්තුත ප්‍රශංසා | ,, |
| අන්‍යෝන්‍ය | 224 |
| පරිවෘත්ති | ,, |
| ආශී | ,, |
| දුසමද් | ,, |
| නව රසය | 225 |
| උපග්‍රන්ථය | 229 |

# පාලිභාෂාව.

## මූලික 1 වැනි වර්‍ෂය.

## 1 කාණ්ඩය.

(සංඥා, සන්ධි, නාම පිළිබඳ විස්තර දැනුම.)

සංඥා

### 1 පාඩම.

ඒ ඒ අක්‍ෂරරූපයන්ට වෙන් වෙන් වශයෙන් හෝ කොටස් කොටස් වශයෙන් තබා ගණු ලබන නාමය ද, ඒ ඒ කාර්‍ය්‍යයන්ට අනුව ඒ ඒ විධියට තබා ගණු ලබන නාමය ද, ව්‍යාකරණයෙහි දී සංඥා නමින් ව්‍යවහාර කරණු ලැබේ.

[1] **අක්‍ෂර සංඥා:-**

අ, ආ, ඉ, ඊ, උ, ඌ, එ, ඔ,
ක ඛ ග ඝ ඞ
ච ඡ ජ ඣ ඤ
ට ඨ ඩ ඪ ණ
ත ථ ද ධ න
ප ඵ බ භ ම
ය ර ල ව ස හ ළ (අ)ං

යන මේ සතළිස් එක ලිවීමෙහි දී අවසානයක් නො දක්නා හෙයින් අකුරු නම් වෙත්.

1. දිව හෝ වාතවේගය මුඛයේ ඒ ඒ තැන්වල ගැටීමෙන් ඇතිවන ශබ්දවල කොටස් අක්‍ෂර නාමින් හැඳින්වෙති.

මේ අකුරු එක්සාලිස උච්චාරණයෙහි දී ලැබෙන පහසුව හා අපහසුව සලකා සවර ව්‍යඤ්ජනය යි දෙකොටසකට බෙදෙති.

**1 ස්වර :-**

අ, ආ, ඉ, ඊ, උ, ඌ, එ, (ඒ), ඔ, (ඕ), යන මේ අට ස්වර නම් වෙත්. අනුන්ගේ උදව්වක් නො ලැබ පහසුවෙන් උච්චාරණය වන හෙයින් මොහු මේ නම ලබති.

මේ සවරවර්ණයෝ, උසුරුවීමෙහි දී කොට වූ කාලසීමාවක් ගණු ලබන කොටස හ්‍රසව නමැයි ද දික්වූ කාලයක් ගණු ලබන කොටස දීඝ නමැයි ද ප්‍රභෙද දෙකකට බෙදෙති.

**හ්‍රස්ව :-** අ, ඉ, උ; (එ,) (ඔ);

**දීඝ :-** ආ, ඊ, ඌ, ඒ, ඕ;

**3 ව්‍යඤ්ජන :-**

ක්, ඛ්, ග්, ඝ්, ඞ්,
ච්, ඡ්, ජ්. ඣ්, ඤ්,
ට්, ඨ්, ඩ්, ඪ්, ණ්,
ත්, ථ්, ද්, ධ්, න්,
ප්, ඵ්, බ්, භ්, ම්,
ය්, ර්, ල්, ස්, හ්, ළ්, (අං)

යන මේ තෙතිස් අකුරු, සවරවල සැඟවී තිබෙන අර්ථය ප්‍රකාශකිරීමට උපකාර වන හෙයින් හෝ අනුන්ගේ උදව් වක් නොමැතිව උසුරුවීමට නොහැකි හෙයින් ව්‍යඤ්ජන නම් වෙත්. ව්‍යඤ්ජනයෝ[1] සමූහ සමූහ වශයෙන් පවත්නා අකුරු වර්ග නමැයි ද, තනි තනිව පවත්නා අකුරු අවර්ග නමැයි ද කොටස් දෙකකට බෙදෙත්.

---

1 එකම උත්පත්ති ස්ථානයක් ඇති අකුරු සමූහය එක් වර්ගය යි.

4 වර්ග :- ක් ඛ් ග් ඝ් ඞ්,
ච් ඡ් ජ් ඣ් ඤ්,
ට් ඨ් ඩ් ඪ් ණ්,
ත් ථ් ද් ධ් න්,
ප් ඵ් බ් භ් ම්,

5 අවර්ග :- ය්, ර්, ල්, ව්, ස්, හ්, ළ්, (අ)ං ;

උච්චාරණය කිරීමේදී පවත්නා වෙනස්කමේ හැටියෙන් ව්‍යඤ්ජනයෝ නැවතත් ඝෝෂ, අඝෝෂ වශයෙන් ද, සිථිල, ධනිත වශයෙන් ද, අල්පප්‍රාණ මහාප්‍රාණ වශයෙන් ද ප්‍රභේද දෙකට දෙකට වෙන් වෙත්.

6 ඝෝෂ :- ග්, ඝ්, ඞ්,
ජ්, ඣ්, ඤ්,
ඩ්, ඪ්, ණ්,
ද්, ධ්, න්,
බ්, භ්, ම්,
ය්, ර්, ල්, ව්, හ්, ළ්, ං,

7 අඝෝෂ :-
ක්, ඛ්,
ච්, ඡ්,
ට්, ඨ්,
ත්, ථ්,
ප්, ඵ්,
ස්,

මේ ඝෝෂාඝෝෂ විභේදය යි. මෙහි වෙනස ප්‍රකටව හැඟෙන සේ මෙකල උච්චාරණයක් ලක්දිව නැත. උගුරෙහි නිනාදය ඇතිකරන්නෝ ඝෝෂ නම්. නැතිවන්නෝ අඝෝෂ නම්.

8 සිථිල :-

ක්, ග්, ඞ්,
ච්, ජ්, ඤ්,
ට්, ඩ්, ණ්,
ත්, ද්, න්,
ප්, බ්, ම්,
ය්, ර්, ල්, ව්, ස්, හ්, ළ්, (අ)ං

9 ධනිත :-

ඛ්, ඝ්,
ඡ්, ඣ්,
ඨ්, ඪ්,
ථ්, ධ්,
ඵ්, භ්, මේ සිථිල ධනිත විභෙදයයි.

10 අල්පප්‍රාණ :-

ක්, ග්, ඞ්,
ච්, ජ්, ඤ්,
ට්, ඩ්, ණ්,
ත්, ද්, න්,
ප්, බ්, ම්,
ය්, ර්, ල්, ව්, ස්, හ්, ළ්. (අ)ං,

11 මහාප්‍රාණ :-

ඛ්, ඝ්,
ඡ්, ඣ්;
ඨ්, ඪ්,
ථ්, ධ්;
ඵ්, භ්,

මේ අල්පප්‍රාණ මහාප්‍රාණ විභෙදයයි.

12 අන්තස්ථ :-

ය් . ර් . ල් . ව් .

මොහු ස්වර ව්‍යඤ්ජන දෙවර්ගයටම සාධාරණ හෝ මධ්‍යයක සිටි හෙයින් අන්තස්ථ නමින් හඳුන්වති.

13 ඌෂ්මන් .

ස් , හ් ,

උඩට ගත් හුස්මයෙන් යුක්තව කියවෙන හෙයින් මොහු ඌෂ්මන් නම් වෙත්.

## 1 අභ්‍යාසය.

1. පාලි භාෂාවේ අකුරු කොතෙක්ද?
2. පාලි භාෂාවේ ස්වර කොතෙක්ද? ව්‍යඤ්ජන කොතෙක්ද?
3. " අ , ඉ, උ " මොහු කිනම් සංඥාවන්ට අයත්ද?
4. ආ . ඊ . ඌ. මොහු කිනම් සංඥාවන්ට අයත්ද?
5. ස්වර ව්‍යඤ්ජනයන්ට ඒ ඒ නම් දී තිබෙන්නේ කුමක් හෙයින්ද?
6. පාලි භාෂාවේ අකුරු අගසිට මුලට ලියන්න.
7. "යස්ස යො සා ධම්මස පාදං
   තස්ස පාදං තමෙසා ධමෙස්''

   මෙහි අකුරු ඝොෂ අඝොෂයන්ට වෙන් කරන්න.
8. අවර්ගාක්ෂරයෝ කවරහුද? කුමක් හෙයින් ඔහුට ඒ නම දී තිබේද?
9. සිථිල ධනිතවලත්, අල්පප්‍රාණවලත් වෙනසක් තිබේද?
10. " ය් . ර් ල් . ව් " මේ අක්ෂරයන්ට දුන් නම කුමක්ද? කුමක් හෙයින්ද?
11. ඌෂ්මන් අක්ෂරයෝ කවරහුද?
12. " න යුත්තං කූප ඛනනං
    පදිත්තෙ අග්ගිනා ඝරේ "
    මෙහි තිබෙන අල්පප්‍රාණ මහාප්‍රාණ තෝරන්න.

## 2 පාඩම.

සංයෝග අසංයෝග වශයෙන් ද අක්ෂරයන්ගේ ප්‍රභේද දෙකක් වෙත්.

14 සංයෝග ස්වර- (අ + ඉ)=එ
(අ + උ)=ඔ
සංයෝග ව්‍යඤ්ජන- (ක් + අ)=ක
(ය් + අ)=ය
(අ) ක් + ක=(අ) ක්ක
අ ග් + ග=(අ) ග්ග

15 අසංයෝග ස්වර- අ, ඉ,
" ව්‍යඤ්ජන- ක්, ග්; ය්, ර්

උත්පත්ති ස්ථානයන්ගේ වශයෙන් කණ්ඨජ, තාලුජ මූර්ධජ, දන්තජ, ඔට්ඨජ, නාසිකජ, උරජ වශයෙන් ප්‍රභෙද සතක් වෙත්

16 කණ්ඨජ- අ, ආ, ක්, ඛ්, ග්, ඝ්, ඞ්, හ්
17 තාලුජ- ඉ, ඊ, ච්, ඡ්, ජ්, ඣ්, ඤ්, ය්
18 මූර්ධජ- ට්, ඨ්, ඩ්, ඪ්, ණ්, ර්, ළ්
19 දන්තජ- ත්, ථ්, ද්, ධ්, න්, ල්, ස්
20 ඔට්ඨජ- උ, ඌ, ප්, ඵ්, බ්, භ්, ම්
21 [1]නාසිකජ- ඞ්, ඤ්, ණ්, න්, ම්, ං
22 උරජ- (ඞ, ඤ, ණ, න, ම, ය, ර, ල, ව යන මේ අක්ෂර යකට මුලින් සිට බැඳුනාවූ) හ් කාරය = බ්‍රහ්ම

මේ ආකාරයෙන් ඒ ඒ තැන් ගැටීමෙන් උපදින හෙයින් මොහු කණ්ඨජාදි නම් ලබත්.

අක්ෂරයන්ගේ ද්විජ, එකජාදි ප්‍රභෙද දෙකක් ද වෙති. උත්පත්තිස්ථාන දෙකක් ඇති අකුරු ද්විජ නම්. උත්පත්ති ස්ථාන එකක් ඇති අකුරු එකජ නම්.

---

1 මොහු ද්විජ වශයෙන් ද ගැණෙති.

23 ද්විජ:-

ඞ් = කණ්ඨ නාසිකා
ඤ් = තාලු නාසිකා
ණ් = මූර්ධ නාසිකා
න් = දන්ත නාසිකා
ම් = ඕෂ්ඨ නාසිකා
ඒ = කණ්ඨ තාලුජ
ඕ = කණ්ඨ ඔෂ්ඨජ
ව් = දන්ත ඔෂ්ඨජ

24 එකජ:- යථොක්ත ද්විජාක්ෂර හැර අනික් සියල්ල එකජ නමි.

ජිව්හා මධ්‍යකරණය, ජිව්හොපාග්‍රකරණය, ජිව්හාග්‍ර කරණය, ස්වස්ථානකරණය යයි අක්ෂරයන්ගේ ප්‍රභේද සතරක් ද වෙත්. අකුරු උසුරුවීමේ දී උදව්වෙන්නාහු කරණ නමි.

25 ජිව්හාමධ්‍යකරණය= ච්, ඡ්, ජ් ඣ් ඤ්
26 ජිව්හොපාග්‍රකරණය ට්, ඨ්, ඩ්, ඪ්, ණ්
27 ජිව්හාග්‍රකරණය- ත්, ථ් ද්, ධ්, න්
28 ස්වස්ථානකරණය- යථොක්ත අකුරු හැර සෙසු අකුරු වෙති. සංවෘත, විවෘත ස්පෘෂ්ට, ඊෂත්ස්පෘෂ්ට යන ප්‍රයත්න යන්ගේ වශයෙන් අක්ෂර ප්‍රභේද සතරක් වෙත්.

ප්‍රයත්නය නම් අකුරු උසුරුවීමේ දී ඇතිවන උත්සාහයයි.

29 සංවෘත- අ
30 විවෘත- (අ) ආ, ඉ, ඊ, උ, ඌ, එ, ඔ, ස්, හ්
31 ස්පෘෂ්ට= ක්, ඛ්, ග්, ඝ්, ඞ්
ච්, ඡ්, ජ්, ඣ්, ඤ්
ට්, ඨ්. ඩ්, ඪ්, ණ්
ත්, ථ්, ද්, ධ්, න්
ප්, ඵ්, බ්, භ්, ම්
32 ඊෂත්ස්පෘෂ්ට- ය්, ර්, ල්, ව්

**සංලක්‍ෂ්‍යය:**- අකුරක් උසුරුවීමට ගන්නා උත්සාහයේදී පවත්නා වාත වේගය උගුර හා ගැටීමෙන් උපදින ශබ්ද කොටස් හෙවත් අකුරු කණ්ඨජ නම්. 17 එසේම වාතවේග යෙන් කම්පාකල දිව ඇටිතල්ලෙහි හැපීමෙන් උපදින අකුරු තාලුජ නම්. 18 උඩුතල්ලෙහි දිව හැපීමෙන් උපදින අකුරු මුර්ධජ නම්. 19 දිව දත්වල හැපීමෙන් උපදින අකුරු දන්තජ නම්. 20 දෙතොල් එකට ගැටීමෙන් උපදින අකුරු ඔට්ඨජ නම්. 21 සංයොක්ත වාතවේගය නාසයෙහි ගැටීමෙන් උපදින අකුරු නාසිකජ නම්. 22 එම වාත වේගය පපුව තුල ගැටීමෙන් උපදින අකුරු උරජ නම්. 23 දෙතැනක් සම්බන්ධයෙන් උපදින අකුරු මිජ නම්. 24 එක්තැනක සම් බන්ධයෙන් ලැබෙන අකුරු එකජ නම්.

25 ශබ්දකොටසක් හෙවත් අකුරක් උපදවා ගැණීමට උදව්වන අවයවය කරණ නම්. මෙහිදී දිව මැද කරණයවේ. 26 දිව මැදවත් අගටත් අතර කොටස, 27 දිව අග කොටස; 28 උපදින තැනම කරණය වේ. 29 ප්‍රයත්නය නම් අකුරක් උපදවා ගැණීමට ඇතිවන වාත වේගයේ ශක්තියයි. සංවුත නම් හැකුළුනු හෙවත් මඳවූ වාත වේගයෙන් උපදින අකුරුයි. 30 සම්පූර්ණ වාත වේගයෙන් යුක්තව පැහැදිලි වශයෙන් උසුරුවන අකුරුයි. 31 වාත වේගය හෝ දිව යම්තම් හැර වීමකින් උපදින ශබ්ද කොටස්, 32 වාත වේගය හෝ දිව තරමක හැපීමකින් උපදින අකුරුයි.

33 **ලෝප** නම් අකුරක් මකා දැමීමයි.
34 **ආදෙශ** නම් අකුරකට අතික් අකුරක් මාරුකිරීමයි.
35 **ආගම** නම් අමුතුවෙන්ම අකුරක් පැමිණවීමයි.

## 2 අභ්‍යාසය.

1. සංයෝග අසංයෝගයන්ගේ වෙනස දක්වන්න.
2. එකජ හා මිජ අකුරු වෙන්කොට ලියන්න.
3. අක්‍ෂරයන්ගේ උත්පත්ති ස්ථාන කෙතෙක්ද? කවරහුද?
4. කරණය යනු කුමක්ද?

5. කරණයේ ප්‍රභේද කවරහුද?
6. ජිව්හාමජ්ඣකරණයට අයත් අක්ෂරයෝ කවරහුද?
7. ප්‍රයත්නය යනු කුමක්ද?
8. ප්‍රයත්න කොතෙක්ද?
9. සංවුත, විවට, ප්‍රයත්නයන්ට අයත් අක්ෂරයෝ කවර හුද?
10. "අමර" මෙහි තිබෙන අකාරයන්ගේ ප්‍රයත්න වෙන් වෙන් වශයෙන් පැහැදිලි කරන්න;
11. "ඉමං සරතපපිසිතං සරීරං
ධාරෙමි ලොකස්ස හිතත්ථමෙව"

මෙහි පවත්නා ඒ ඒ ප්‍රයත්නයන්ට අයිති අකුරු වෙන්කොට දක්වන්න.

12. ආදේශ ආගමයන්ගේ වෙනස කවරේද?

---

2 සන්ධි.

## 3 පාඩම.

**ස්වර සන්ධිය :-**

වෙන් වෙන්ව පවත්නා පද දෙකක් එකට ගැලපීම සන්ධි නම්. එසේ සන්ධි කිරීමේ දී අකුරු ලොප් කරන්ට සිදු වෙයි. අකුරු වෙන අකුරුවලට මාරුකරන්ට සිදුවෙයි. අමුතුවෙන් අකුරු පමුණුවාගන්ට සිදුවෙයි. අකුරු විපර්‍යාස කරන්ට සිදුවෙයි. හ්‍රස්ව අකුරු දීර්ඝකරන්ටද දීර්ඝ අකුරු හ්‍රස්වකරන්ටද සිදුවෙයි. මේ සන්ධික්‍රම යයි.

**ලෝප සන්ධිය ;-**

1. ස්වරවර්ණයක් පර කල්හි [1]පූර්වස්වරයට ලොප්වේ. ස්වර රහිත පූර්වව්‍යඤ්ජනය [2]පරස්වරය හා ගැළපේ.

---

1 මුල පදේ අගින් පිහිටි ස්වරය පූර්වස්වර නම්
2 අග පදේ මුලින් පිහිටි ස්වරය පරස්වර නම්

ලෝක + අග්ගෝ
ලෝක් + අ + අග්ගෝ
ලෝක් + අග්ගෝ=ලෝකග්ගෝ
යස්ස + ඉන්ද්‍රියානි=යස්සින්ද්‍රියානි
මහා + ඉච්ඡෝ=මහිච්ඡෝ
ලඞ්කා + ඉන්දො=ලඞ්කින්දො
නෝහි + එතං=නොහෙතං
මනසි + ඉච්ඡති=මනසිච්ඡති
තුණ්හී + අස්ස=තුණ්හස්ස
සාධු + ආවුසො=සාධාවුසො
අභිභූ + ආයතනං=අභිභායතනං
මෙ + අත්ථි=මත්ථි
සීලවන්තා + එත්ථ=සීලවන්තෙත්ථ

\+ + +

2. [1] **අසමාන ස්වරයා කෙරෙන් (පරවූ) පරස්වරයට ලොප්වේ.**

යස්ස + ඉදානි
යස්ස + දානි=යස්සදානි
ජායා + ඉව=ජායාව
ඉති + අපි=ඉතිපි
අස්සමණී + අසි=අස්සමණීසි
චක්ඛු + ඉන්ද්‍රියං=චක්ඛුන්ද්‍රියං
අකතඤ්ඤු + අසි=අකතඤ්ඤූසි
තෙ + අපි=තෙපි
වන්දේ + අහං=වන්දේහං
සො + හං=සොහං
මොග්ගල්ලානො + අසි=මොග්ගල්ලානොසි

1 අසමාන යනු එක ජාතියේ නොවන බවයි. අ යන්නට අ, ආ දෙක හැර සියල්ල අසමානයි. ඉ යන්නට ඉ, ඊ දෙක හැර සියල්ලද, උ යන්නට උ, ඌ දෙක හැර සියල්ලද, ඒ, ඕ දෙකට සියලුම ස්වරද අසමාන වෙති.

තේ + ඉමේ=තේමේ
සචේ + අජ්ජ=සචේජ්ජ
ආකාසේ + ඉව=ආකාසේව
වසලෝ + ඉති=වසලෝති

**සංලක්ෂ්‍යය:-** පූර්වස්වර පරස්වර දෙක අසමාන කල්හි පරස්වරයටම ලොප්වීමේ නීතියක් නැත. එහෙත් පරස්වරය ලොප්වන්නේ අසමාන ස්වරවූ කල්හි පමණයි. සමහර තැනෙක පූර්වස්වරයටද ලොප්වේ. මේ තැන් පරීක්ෂාවෙන් කියවා බලන්න.

ගච්ඡාමි + අහං=ගච්ඡාමහං
දසහි + උපාගතං=දසහුපාගතං
න + ආගතා=නාගතා
තත්‍ර + ඉමෙ=තත්‍රිමෙ
මහා + ඉද්ධිකො=මහිද්ධිකො
තථා + උපමං=තථූපමං
තෙන + උපසඞ්කමි=තෙනුපසඞ්කමි

**ආදේශ සන්ධි :-**

***3 පූර්වස්වරය වූ අ හෝ ආ සහිත ඉ හෝ ඊ හට 'ඒ' වේ.**
**පූර්වස්වරය වූ අ හෝ ආ සහිත 'උ' හට 'ඕ' වේ.**

අව + ඉච්ච
අව් + අ=ඉච්ච
අව් + එච්ච=අවෙච්ච
උප + ඉතෝ=උපේතෝ
උප + ඉක්ඛති=උපෙක්ඛති
බන්ධුස්ස + ඉව=බන්ධුස්සෙව
ජින + ඊරිතං=ජිනේරිත
මුඛ + උදකං=මුඛෝදකං
චන්ද + උදයෝ=චන්දෝදයෝ
යථා + උදකං=යථොදකං
න + උපේති=නෝපේති

* ඒ, ඕ දෙක අසවර්ණ ස්වර වශයෙන් පාලියෙහි දක්වෙති.

4 පූර්වස්වරයවූ [1]අවර්ණ, ඉවර්ණ, උවර්ණයන් ලොප්වූ සන්ධි සමහර තැනෙක පරස්වරයවූ අකාර ඉකාර උකාරයෝ ක්‍රමයෙන් දීර්ඝයට පැමිණෙති.

බුද්ධ + අනුස්සති
බුද්ධ් + අ + අනුස්සති
බුද්ධ් + ආනුස්සති
බුද්ධානුස්සති
තත්‍ර + අයං = තත්‍රායං
සඤ්ඤුවා + අස්ස = සඤ්ඤුවාස්ස
තද + අයං = තදායං
නායක + ආචාරො = නායකාචාරො
සමමන්ති + ඉධ = සමමන්තීධ
බහු + උපකාරකං = බහූපකාරකං
මධු + උදකං = මධූදකං
සද්ධා + ඉධ = සද්ධීධ
අප්පස්සුතො + අයං = අප්පස්සුතායං
දුක්ඛා + අයං = දුක්ඛායං
සචේ + අයං = සචායං
රත්ති + උපරතො = රත්තූපරතො

5. පරස්වරයට ලොප් වූ සන්ධි පූර්වස්වරයට සමහර තැනෙක දීර්ඝවේ.

දේව + ඉති = දේවාති
ලොකස්ස + ඉති ලොකස්සාති
වි + අතිපතන්ති = වීතිපතන්ති
වි + අතිනාමෙන්ති = වීතිනාමෙන්ති
සබ්බාපි + අපි = සබ්බාපීපි
සු + ඉධ = සූධ
සාධු + ඉති = සාධූති
විජ්ජු + ඉව = විජ්ජූව
කිංසු + ඉධ = කිංසූධ

---

1 වර්ණ ශබ්දයෙන් හ්‍රස්ව දීර්ඝ දෙක ගනු ලැබෙති.
අවර්ණ = අ, ආ ඉවර්ණ = ඉ, ඊ. උවර්ණ = උ, ඌ

## 3 අභ්‍යාසය.

1. පූර්වස්වරයවූ අහට කවර ස්වර පරකල්හි ලොප්වේද?
5. කවර ස්වර කෙරෙන් අහට ලොප්වේද?
3. ලඞ්කින්දො, නොහේතං, තුණ්හස්ස, සාධාවුසො, අභිභායතනං, මජ්ඣි, සීලවනෙත්ථ, මේ සන්ධීන් විසන්ධිකොට ලොප්වූ අකුරු මේයයි දක්වන්න.
4. ඉතිපි, චක්ඛුන්ද්‍රියං, වන්දෙහං, සෝහං. තේමෙ, ආකාසේව, වසලෝති මේ සන්ධීන් විසන්ධිකොට ලොප්වූ අකුරු වෙන් වශයෙන් දක්වන්න.
5. පූර්වස්වරය යනු කුමක්ද ? පරස්වරය යනු කුමක්ද ? තීණි + ඉමාණි මෙහි පූර්වස්වර පරස්වර වෙන්කොට මේයයි දක්වන්න.
6. චක්ඛු + ඉන්ද්‍රියං මෙහි ලොප්කළ හැක්කේ පූර්වස්වරයටද? පරස්වරයටද? ඊට හේතුද දක්වන්න!
7. පූර්වස්වරලොප පරස්වරලොප දෙකේ වෙනස දක්වන්න.
8. අසමාන යනු කුමක්ද? ඔවුහු කවරහුද?
9. අසවණ්ණ යනු කුමක්ද? ඔවුහු කවරහුද?
10. පූර්වස්වරය එ, ඔ, වූකල්හි පරස්වරයවූ ඒ, ඕ, දෙකට ලොප්වේද?
11. පූර්වස්වරය හා පරස්වර කිනම් ස්වරවූ කල්හි ඒ, ඕ ආදෙශයෝ වෙත්ද?
12. උපෙතො, ඹුබොදකං, චන්දොදයො. නොපෙති, මේ සන්ධීන් විසන්ධිකොට සන්ධිවූ හැටි දක්වන්න,
13. වාම + උරු මෙය සන්ධිකොට සිද්ධවූ අයුරු දක්වන්න.
14. අ, ඉ, උ අක්ෂරයන්ට පිළිවෙළින් දීර්ඝ වන අකුරු කවරහුද? දීර්ඝයට පළමු කටයුතු දෙය කුමක්ද?
15. තථායං, නායකාචාරො, මධූදකං, දුක්ඛායං, ස්වාහං දෙවාති, වීතිපතන්ති, සූධ, සාධූති, මේ සන්ධීන් විසන්ධිකොට සිද්ධවූ අයුරු දක්වන්න.

## 4 පාඩම.

6. **පූර්වස්වරය වූ ඒ හට ය් ආදේශවේ. පරස්වරයවූ අ හට දීඝද වේ.** [1]

මේ + අයං
ම් + ඒ = අයං
ම් + ය් = ආයං [2]ම්‍යායං
තේ + අහං = ත්‍යහං
යේ + අස්ස = ය්‍යාස්ස
පබ්බතේ + අහං = පබ්බත්‍යාහං

7. **අ ආ දෙක පරකල්හි පූර්වස්වරයවූ ඕ, ඌ දෙකට ව් ආදේශවේ.**

යාවිතකෝ + අස්ස
යාවිතක් + ඕ + අස්ස
යාවතක් + ව් + අස්ස = යාවතක්වස්ස
තාවතකෝ + අස්ස = තාවතක්වස්ස
කෝ + අත්ථෝ = ක්වත්ථෝ
යෝ + අයං = ය්වායං
සෝ + අස්ස = ස්වාස්ස
යතෝ + අධිකරණං = යත්වධිකරණං
බෝ + අජ්ජ = බ්වජ්ජ
දු + ආකාරෝ = ද්වාකාරෝ
චතු + එව = චත්වේව
සු + ආගතං = ස්වාගතං
[2]තතු + ඒව = තත්වේව

---

1 තේ + අතායතා = තතායතා
මෙ + අසි = මසි } මේ තැන්හි ය්කාරය නොපීඝ.

2 කෝ + අත්ථෝ = කොත්ථෝ. සාධු + ආවුසෝ = සාධාවුසෝ, සෝ + අයං = සොයං, සු + ආගතං = සාගතං හේතු + ඉති = හේතූති මෙතැන්හි නොවේ.

8. [1]අසමාන ස්වරය පරකල්හි ඉවර්ණයට ය් ආදේශවේ

වි + ආකතො = ව් + ඉ + ආකතො
ව් + ය් + ආකතො = ව්‍යාකතො
වුත්ති + අස්ස = වුත්‍යස්ස
අග්ගි + අගාරං = අග්‍යාගාරං

9 අසමාන ස්වරයා පරකල්හි ඉවර්ණයට 'ඉය්' ආදේශයද උවර්ණයට "උව්" ආදේශයද වේ

ති + අන්තං = ත් + ඉ + අන්තං
ත් + ඉය් + අන්තං = තියන්තං
ති + අද්ධං = තියද්ධං
අග්ගි + අගාරෙ = අග්ගියාගාරෙ
පඤ්චමී + අන්තෙ = පඤ්චමියන්තෙ
වි + අඤ්ජනා = වියඤ්ජනා
පරි + එසනා - පරියේසනා
භික්ඛු + ආසනෙ = භික්ඛුවාසනෙ
පුථු + ආසනෙ = පුථුවාසනෙ
දු + අඞ්ගිකං = දුවඞ්ගිකං

10 යථා තථා ශබ්දයන් කෙරෙන් පරවූ 'ඒව' ශබ්දයාගේ 'ඒ' හට කිසි තැනෙක 'රි' ආදේශවේ. පූර්වස්වරයට හ්‍රස්වවේ.

යථා + එව = යථරිව = යථෙව
තථා + එව = තථරිව = තථෙව

11 [2]ස්වරයා පරකල්හි 'ති' හට 'ච' ආදේශවේ. ච කාරය ද්විරුක්තවේ.

---

1 ගච්ඡාමි + අහං - ගච්ඡාමහං, පංචහි + අඞ්ගෙහි = පංචඞ්ගෙහි මේ තන්හි නොවේ.

2 අති පති ඉති යන ශබ්දයන්ගේ 'ති' හටම මෙ ආදේශය වෙයි. අතීතො අතිරිත්තං, ඉතිදං, පතීතො, යන තන්හි නොවේ.

අති + අන්තං
අච් + අන්තං = අච්චන්තං
අති + ඕදාතො = අච්චෝදාතො
පති + අයො = පච්චයො
පති + ඒති = පච්චෙති
ඉති + අස්ස = ඉච්චස්ස
ඉති + එතං = ඉච්චෙතං

12 [1] ස්වරයා පරකල්හි අභි, අධි යන ශබ්දයන්ට පිළිවෙළින් අබ්භ, අජ්ඣ යන ආදෙශයෝ වෙත්.

අභි + අක්ඛාතං = අබ්භක්ඛාතං,
අභි + උග්ගතො = අබ්භුග්ගතො,
අභි + ඕකාසො = අබ්භෝකාසො,
අධි + අගමා = අජ්ඣගමා,
අධි + උපගතො = අජ්ඣුපගතො,

13 [2] ස්වරයා පරකල්හි 'ධ' හට 'ද්' ආදෙශවේ

එකමිධ + අහං =
එකමිද් + අහං = එකමිදහං,

14 ස්වරයා හෝ ව්‍යඤ්ජනයා පරකල්හි 'පති' 'හට' 'පටි' ආදෙශවේ.

පති + අග්ගි = පටග්ගි,
පති + හඤ්ඤති = පටිහඤ්ඤති,

---

[1] අභ්‍යාසය.

1 ඒ කාරයට යකාරාදෙශවූකල්හි පරස්වරයට කුමක් වේද?
2. මේ යකාරාදෙශය කිනම් ශබ්දයන්හි පවත්නා 'ඒ' කාරයට වේද?

---

1 අභි + ඉජ්ඣිතං = අභිජ්ඣිතං; අධි + ඊරිත. 2 අධීරිතං, යන තන්හි නොවේ.

2 එක ශබ්දයකෙරෙත් පරවූ ඉධ ශබ්දයාගේ ධකාරයටම මේ ආදෙශයවේ.

3. ඒ, ඕ, ඉය්, උව්, යන මේ ආදේශයන් වන තැන් දක්වන්න.

4. ම්‍යායං, ය්‍යාස්ස, ඛ්වෙත්ථ, ය්වායං, ස්වාස්ස, ඛ්වස්ස, ද්වාකාරෙ, ස්වාගතං, අන්වෙති, තන්වෙව, ව්‍යාකතො, වුත්‍යස්ස, තියද්ධං, සත්තම්‍යත්ථෙ, පුථුවාසනෙ, දුවඞ්ගිකං, මේ සන්ධීන් විසන්ධි කොට සන්ධි කරන්න.

5. රි කාරාදේශය කොහි වේද? එසේ වූ කල්හි පූර්වස්වරයට කුමක් වේද?

6. ති; අභි, අධි, පති, යනා මොවුන්ට වන ආදේශ මෙයයි දක්වන්න. 'ති' යන්නෙන් කුමක් අදහස් කෙරේද?

7. යථරිව, යථෙව, අච්චන්තං, පච්චයො පච්චෙති, ඉච්චස්ස ඉච්චෙත, අබ්භුග්ගතො, අබ්භක්ඛානං අජ්ඣගමා, පටග්ගි, පටිසඤ්ඤති, මේ සන්ධීන් විසන්ධිකොට දක්වන්න.

8. 'ද්' ආදේශය කොබඳු තැනක වන්නේද?

9. අති, පති, ඉති, ශබ්දයන්ගේ 'ති'යට මුලින් දක්වූ ආදේශ සමහර තැනෙක නොවනබව පැහැදිලි කරන්න.

10. යථා, තථා ශබ්දයන් කෙරෙන් පරවූ 'එව' ශබ්දයාගේ 'ඒ' හට නිත්‍යයෙන් ම 'රි' ආදේශය වේද?

11. ස්වරයා පරකල්හි 'ඉ' හටද 'උ' හටද වන ආදේශයෝ කවරහුද?

12. 'ය්' ආදේශය කිනම් ස්වරයන්ට වේද?

---

## 5 පාඩම.

**ආගම සන්ධි**

**15.** ස්වරයා පරකල්හි 'ය් ව් ම් ද් න් ත් ර් ල්' යන මොහු ආගම වෙත්.

ය් ආගම

මා + ඉදං = මායිදං

න + ඉදං = නයිදං

ත + ඉමස්ස = තයිමස්ස

න + ඉමානි = නයිමානි,
ජ + ඉමානි = ජයිමානි,
වා + ඒව = වායේව,
බොධි + ඒව = බොධියේව,
තෙසු + ඒව = තෙසුයේව,
සෝ + ඒව = සෝයේව,

### ව් ආගම

ති + අඞ්ගුලං = තිවඞ්ගුලං
ති + අඞ්ගිකං = තිවඞ්ගිකං
භූ + ආදයො = භූවාදයො,
ප + උච්චති = පවුච්චති,

### ම් ආගම

ලහු + එස්සති = ලහුමෙස්සති,
ගරු + එස්සති = ගරුමෙස්සති,
කාසා + ඉව = කාසාමිව,
ඉධ + ආහු = ඉධමාහු,
ගිරි + ඉව = ගිරිමිව,
එක + ඒකස්ස = ඒකමේකස්ස,
යේන + ඉධ = යේනමිධ,
සෝතු + ඒව = සෝතුමේව,

### ද් ආගම

1 සම්මා + අඤ්ඤා = සම්මදඤ්ඤා,
සම්මා + අත්ථො = සම්මදත්ථො,
සම්මා + ඒව = සම්මදේව,
අත්ත + අත්ථං = අත්තදත්ථං,
බහු + ඒව = බහුදේව,
පුන + එව = පුනදේව,

---

1 පූර්වස්වරයට හ්‍රස්වවේ.

### න් ආගම

චිරං + ආයති= චිරන්නායති,
ඉතො + ආයාති=ඉතොනායාති,
අවිජ්ජා + අහොසි=අවිජ්ජානාහොසී,

### ත් ආගම

යස්මා + ඉහ=යස්මාතිහ,
තස්මා + ඉහ=තස්මාතිහ,
අජ්ජ + අග්ගෙ=අජ්ජතග්ගෙ,

### ර් ආගම

රාජා + ඉව=රාජාරිව,
විජ්ජු + ඉව=විජ්ජුරිව,
සාසපො + ඉව=සාසපොරිව,
සබ්භි + එව=සබ්භිරේව,
නි + අන්තරං=නිරන්තරං,
පුන + ඒව=පුනරෙව,
ධි + අත්ථු=ධිරත්ථු

### ළ් ආගම

ඡ + අභිඤ්ඤා=ඡළභිඤ්ඤා,
ඡ + අඞ්ගං=ඡළඞ්ගං,
ස + ආයතනං=සළායතනං,

**පකති සන්ධි** [1]

16. [2] ඡන්දස් පිරිහීමෙහිදීද, සුඛුච්චාරණයෙහිදීද, සන්ධි කොට දක්වන්නට නොකැමැති තන්හිදීද, ආලපනාන්තයෙහිදීද, නිපාතයන් ඇතිකල්හිද, නිමිති ඇතත් සන්ධි නොවේ නම් ඒ ප්‍රකෘති සන්ධිය නම් වේ

---

1. පාලිභාෂාවෙහි සන්ධි කර දක්වන්ට නුසුදුසු තැන් පකති සන්ධිවශයෙන් දැක්වෙති.
2. පද්‍යයන්හි අකුරු සම කිරීම ඡන්දස් නම්. පද්‍යයක මුලින් පදයෙහි අකුරු අට නම් අනික් තුන්පදයන්හිද, අකුරු අට බැගින් විය යුතුයි. සම පදයක සන්ධි කිරීමෙන් අකුරු සතක් වේ නම් එය විසන්ධියෙන් තැබිය හැකියි.

ආලපනයෙ:- [1] 'තතාමා වා තන්ද - අනිච්ච සඞ්ඛාර'
ඡන්දස් රැකීමෙහි:- [2] දෙවා 'ආභස්සරා යථා,'
සන්ධිච්ඡේදරහිත තැන: [3] 'භික්ඛූ ආමන්තේසි'
නිපාතයන් ඇති කල්හි:- [4] 'අහො අච්ඡරියං'

### 6 අභ්‍යාසය

1. ආගම යනු කුමක්ද?
2. කවර කවර අකුරු ස්වරයා පරකල්හි ආගම වේද?
3. 'ය් ව් ම් ද් න් ත් ර් ළ්' මේ අකුරු ආගම වන තැන් පිළිබඳ විනිශ්චයක් කරන්න.
4. තේදං, වායේව, තෙසුයේව, තීවඞ්ගුලං, පවුච්චති' ලහුමෙස්සති, සසාමිව, ගිරිම්ව, යේනමිධ, අත්තදත්ථං බහුදේව, පුනදේව, ඉතොනායාති, අවිජ්ජානාමොසි' නසමාතික, අජ්ජතග්ග, රුජරිව, සබ්භිරේව, නිරන්තරං, පුනරේව, ජලඩගං, සළායතනං මේ සන්ධීන් විසන්ධි කොට ආගම වූ අකුරු දක්වන්න.
5. ප්‍රකෘති සන්ධිය යනු කුමක්ද?
6 කිනම් තන්හි සන්ධි නොවේද? වෙන වෙනම උදාහරණ දක්වන්න

---

## 6 පාඩම.

**ව්‍යඤ්ජන සන්ධිය.**

**17.** [5]**ව්‍යඤ්ජනයා පරකල්හි ස්වරයෝ ලොප් වෙත්. එහි 'අ' ආගම ද වේ.**

---

1. 'ආනන්දානිච්චං' යි සන්ධි නොවේ. 2 'දෙවාභස්සරා' යි සන්ධි නොවේ
3. 'භික්ඛවාමන්තේසි' යි සන්ධි නොවේ. 4 අග්චච්ඡරියො, සන්ධි නොවේ.
5. මේ ලොපය 'එසො, සො; දෙදෙනාගේ ඔ හට ම වේ. ස්වරයා පරකල්හිද මේ ලෝපය හා අකාරාගමය වේ.
එසො + ආහොමගො = එස අහොමගො,
එසො + ඉද්දිනී = එස ඉද්දිනී,

එසෝ + ධම්මො = එසධම්මො = එසොධම්මො,
එසො + පතෙතා = එසපතෙතා = එසොපතෙතා,
සො + මුනි = සමුනි = සොමුනි,
සො + සීලවා = සසීලවා = සොසීලවා,

18. සවරයා කෙරෙන් පරවූ ව්‍යඤ්ජනාක්ෂරය දෙකක් වේ.

ඉධ + පමාදො = ඉධප්පමාදො,
ප + කමො = පක්කමො,
ප + කොසති = පක්කොසති,
වි + ගහො = විග්ගහො,
අව + සයො = අවස්සයො,
අට්ට + සරො = අට්ටස්සරො,
උප + දවො = උපද්දවො,
දු + කරං = දුක්කරං,
ස + ගුණො = සග්ගුණො,

19. සවරයා කෙරෙන් පරවූ මහාප්‍රාණාක්ෂරයට අල්පප්‍රාණ අක්ෂරයක් ද්විරුක්ත වේ.

උ + ඝොසො = උග්ඝොසො,
ස + ධම්මො = සද්ධම්මො,
අ + ඛමො = අක්ඛමො,
ජම්බු + ඡායා = ජම්බුච්ඡායා,
ප + ඵරති = පප්ඵරති,

20 [1] සවරයා කෙරෙන් පරවූ අල්ප්‍රාණාක්ෂරයට මහාප්‍රාණ අක්ෂරයක් ද්විරුක්ත වේ.

නි + කමති = නික්ඛමති,
නි + පතති = නිප්ඵතති,
නි + චයො = නිච්ඡයො,
නි + චරති = නිච්ඡරති,
නි + තරති = නිත්ථරති,

---

1 නිඋපසර්ගයා කෙරෙන් පරවූ කමු, පද, චි, චර, තර මොවුන්ගේ පූර්වාක්ෂරයටම මේ විධාන වේ.

**21. ව්‍යඤ්ජනය පරකල්හි 'අව' යන්නට 'ඔ' ආදේශය වේ.**

අව + කාසෝ = ඕකාසෝ,

අව + නද්ධා = ඕනද්ධා,

අව + වදති = ඕවදති,

අව + සානං = ඕසානං

**22. [1]ව්‍යඤ්ජනය පරකල්හි කිසිතැනෙක 'ඕ' ආගම වේ. 'අතිප්ප' ශබ්දයා කෙරෙන් 'ග්' ආගම ද වේ.**

පර + සතං = පරෝසතං,

පර + සහස්සං = පරෝ සහස්සං,

අතිප්ප + ඛෝ =

අතිප්ප + ඕ + ඛෝ

අතිප්ප + ග් + ඕ + ඛෝ = අතිප්පගෝඛෝ,

**23. විභක්ති ලෝප්කළ කල්හි [2]මන ශබ්දාදීන්ගේ අගට ඔ කාරයක් ආගම වේ.**

මන + මයං =

මන් + මයං = මන් + ඔ + මයං

මනෝමයං,

අය + මයං = අයෝමයං,

තප + ධනෝ = තපෝධනෝ,

තම + නුදෝ = තමෝනුදෝ,

රජ + ජල්ලං = රජෝජල්ලං,

රහ + ගතෝ = රහෝගතෝ,

අය + කපල්ලං = අයෝකපල්ලං,

---

1. 'අතිප්ප, පර' ශබ්දයන් කෙරෙන්ම වේ.
2. මනං සිරං උරං තේජං රජං ඔජං වයං පයං
රජං තපං වචං චේතං ඒවමාදී මනෝ ගණො,

## 16 අභ්‍යාසය.

1. සවර්ලෝපයෙන් පසු කුමක් කටයුතුද?
2. මේ විධිය කිනම් ශබ්දයන් පිළිබඳව වේද?
3. ස්වරයා පරකල්හින් මේ ව්‍යාකරණ විධිය වන්නේ නම් ඊට නිදසුන් දක්වන්න.
4. සභික්ඛු, එසගහපති, එසබුද්ධො, සමුනි, එස ආභොගො, එස ඉදානි මේ සන්ධීන් විසන්ධි කොට දක්වන්න.
5. අ + පමාදො, රුක්ඛ + ඡායා, නි + චයො, මේ විසන්ධීන් සිද්ධකිරීමේදී උවමනාවන වීසම විධි කවරහුද?
6. අල්පප්‍රාණාක්ෂරයට මහාප්‍රාණාක්ෂරය විකවීම කොබඳු තැන්වලදී සිදුවේද?
7. 'ණ්' ආගම පිළිබඳ පවත්නා විශේෂය කවරේද?
8. මනොගණ ශබ්දදිහු කවරහුද? එහි ඇති වෙනස කිම?
9. ඕකාරාගමය හා 'අ' ආගමය වන තැන් වෙන් කොට දක්වන්න.
10. රජෝජල්ලං, මනෝමයං, පුරෝහිතං, අතිප්පගොඛො, ඔකාසො, නික්ඛමති, නිජ්ජරති, අක්ඛාමි, සගුණෝ, විගතෙතෝ, සෝමුනි, එසො ආභෝගෝ, මේ සන්ධීන් විසන්ධි කොට දක්වන්න.

---

## 7 පාඩම.

**නිග්ගහීත සන්ධිය**

24. නිග්ගහීතය යම් වර්ගාක්ෂරයකට මුලින් පිහිටියේද ඊට එම වර්ගයෙහි පස්වැනි අකුරු විකල්පයෙන් ආදේශ වෙති.

දීපං + කරෝ = දීපඞ්කරෝ

රණං + ජහෝ = රණඤ්ජහෝ

සං + ඨිතො = සණ්ඨිතෝ

ජුතිං + ධරෝ = ජුතින්ධරෝ,

සං + මතෝ = සම්මතෝ,

ලකාරයට මුලින් පිහිටි නිග්ගහීතයට ල් කාරය ආදේශවේ.

සං + ලාපෝ = සල්ලාපෝ,

සං + ලක්ඛණං = සල්ලක්ඛණං,

පුං + ලිඞ්ගං = පුල්ලිඞ්ගං,

25. නිග්ගහීතයට අගින් 'ඒ, හි' යන නිපාතයන් ඇති කල්හි ඊට [1] 'ඤ්' ආදේශ වේ.

පච්චත්තං + ඒව = පච්චත්තඤ්ඤෙව,

තං + ඒව = තඤ්ඤෙව,

ඒවං + හි = ඒවඤ්හි,

තං + හි = තඤ්හි,

26. [2] නිග්ගහීතයට අගින් යකාරය ඇති කල්හි ඒ නිග්ගහීතයකාර දෙකකටම 'ඤ්' ආදේශවේ. 'ඤ' කාරය ද්විරුත්තවේ

සං + යෝගෝ = සඤ්ඤෝගෝ,

සං + යුත්තං = සඤ්ඤුත්තං,

සං + යෝජනං = සඤ්ඤෝජනං,

සං + යතෝ = සඤ්ඤතෝ,

සං + යාචිකාය = සඤ්ඤාචිකාය,

27 ස්වරයා පරකල්හි නිග්ගහීතයට විකල්පයෙන් ම්, ද්, යන ආදේශයෝ වෙත්.

[3] තං + අනන්තරා = තදනන්තරා,

යං + අනිච්චං = යදනිච්චං,

---

1. ඒව ශබ්දය ඇති කල්හි වන 'ඤ්' කාරය ද්විරුත්තවම සිටී.

2. නිග්ගහීතය සර්වනාමයකට අයිතිවූ කල්හි ඤ් ආදේශ නොවේ. ඒකං + යෝජනං = ඒකං යෝජනං; තං + යානං = තං යානං;

3. 'යං, තං, ඒතං' යන නපුංසක ලිංගිකයන්ගේ නිග්ගහීතයට 'ද්' ආදේශය වේ. අන්තන්හි 'ම්' ආදේශ වේ.

එතං + අවොච=එතදවොච,

යං + ආහු=යමාහු,

ධනං + එව=ධනමෙව,

නින්දිතුං + අරහති=නින්දිතුමරහති,

තං + අහං=තමහං,

කිං + එතං=කිමෙතං,

28. ස්වරයා හෝ ව්‍යඤ්ජනයා පරකල්හි කිසි තැනක නිග්ගහීතයක් [1]ආගම වේ.

ත + සම්පයුත්තා=තං සම්පයුත්තා,

ත + ඛණෙ=තංඛණෙ,

තා + සභාවො=තං සභාවො,

චක්ඛු + උදපාදි=චක්ඛුංඋදපාදි,

යාව + චිධ=යාවඤ්චිධ,

පුරිම + ජාතිං=පුරිමංජාතිං

පුබ්බ + ගමා=පුබ්බඞ්ගමා;

29. [2]පූර්වපදයෙහි වූ නිග්ගහීතයට කිසි තැනක ලොප් වේ.

කථං + අහං=කථාහං,

එවං + අහං=ඒවාහං,

තාසං + අහං=තාසාහං,

විදූතං + අග්ගං=විදූතග්ගං,

අරියසච්චානං + දස්සනං=අරියසච්චානදස්සනං,

සං + රාගො=සාරාගො,

සං + රම්භො=සාරම්භො,

සං + හාරෝ-සාහාරෝ

30. [3]නිග්ගහීතයට අගින් පවත්නා ස්වරයට කිසි තැනෙක ලොප් වේ.

---

1. සුබොච්චාරණය පිණිසය.
2. ඡන්දස්රැකීම පිණිසද, සුබොච්චාරණය පිණිසද කළයුතුයි.
3. ඉති, ඉව, ඉදානි, අසි, අපි, එව, යන පදයන්ගේම පූර්වස්වරයට ලොප් වේ. අන් තන්හි නොවේ.

කතං + ඉති=කතංති=කතන්ති.
කිං + ඉති=කිංති=කින්ති,
බීජං + ඉව=බීජංව,
චක්කං + ඉව=චක්කංව,
කලිං + ඉව=කලිංව,
ඉදං + අපි=ඉදංපි=ඉදම්පි,
ත්වං + අසි=ත්වංසි,
උත්තරිං + අපි=උත්තරිංපි=උත්තරිම්පි,
දාතුං + අපි=දාතුංපි=දාතුම්පි,
කිං + ඉදානි=කිංදානි=කින්දානි,
හලං + ඉදානි=හලංදානි=හලන්දානි,
සදිසං + එව=සදිසංව,

31. [1]නිග්ගහීතයකට අගින් පවත්නාවූ 'අස්ස, අස්සා' යන පදයන්ගේ 'අස්' යන කොටසට කිසි තැනෙක ලොප් වේ.

එවං + අස්ස=එවංස,
පුප්ඵං + අස්සා=පුප්ඵංසා,

32. කිසි තැනෙක රකාර යකාරයන්ගේද, හකාර වකාරයන්ගේද විපර්යාසය වේ.

පරියුදාහාසි=පයිරුදාහාසි.
අරියස්ස=අයිරස්ස,
බහ්වාබාධො=බව්හාබාධො

### 7 අභ්‍යාසය.

1. නිග්ගහීතයට ඞ්, ඤ්, ණ්, න්, ම්, යන අක්ෂරයෝ කොතැන්හි ආදේශ වෙත්ද?
2. 'එව, හි' නිපාතයන් ඇති කල්හි නිග්ගහීතයට කිනම් අකුරක් ආදේශ වේද? ඒ පිළිබඳව පවත්නා වෙනස කවරේද?

---

1. අත්තන්හි එවං + අස්ස=එවමස්ස යනු වේ.

3. අගින් පිහිටි යකාරය සහිතවූ නිග්ගහීතයට ආදෙශවන අකුර කුමක්ද? ඊට කුමන වෙනසක් සිදුවේද?

4. නිග්ගහීතයට වන 'ම් ද්' යන අක්ෂරයන් පිළිබඳ පවත්නා විශෙෂය කවරේද?

5. නිග්ගහීත ලෝපය හා ආගම කෙබඳු තන්හි වේද?

6. නිග්ගහීතයට අගින් පිහිටි කිනම් පදයන්ගේ අකුරු ලොප් වේද්ද?

7. ජුතින්ධරෝ, රණඤ්ජහෝ, සල්ලාපෝ, පුල්ලිඞ්ගං, තඤ්ඤෙව, තඤ්හි, සඤ්ඤුත්තං, සඤ්ඤ්විධාය, යදනිච්චං, එතදවෝච, තමහං, කිමෙතං, තංඛණෙ, පුරිමංජාතිං, එවාහං, සාරත්තා, කතනාති, බීජංච, දාතුමපි, සදිසංච, එවංස, පුප්ඵංසා, යන මේ සන්ධීන් විසන්ධි කොට සිද්ධවූ පරිදි දක්වන්න.

8. විපර්‍යාස සන්ධිය යනු කුමක්ද? විපර්‍යාස වන අක්ෂරයෝ කවරහුද? උදාහරණ වලින්ද පැහැදිලි කරන්න.

9. සන්ධිවිධි කෙතෙක්ද? කවරහුද?

10. ස්වර සන්ධියේත් ව්‍යඤ්ජන සන්ධියේත් ඇති වෙනස කවරේද?

---

## 8 පාඩම.

### පරිචය,

මෙහි මතුදැක්වෙන වාක්‍යයන්හි පෙණෙන සන්ධීන් විසන්ධි කොටද, විසන්ධීන් සන්ධි කොටද දක්වන්න.

1. "හන්දාහං හත චක්ඛුස්මි, කන්තාරද්ධානමාගතෝ" (ධ.අ) (කතරමගට පැමිණියේ නිත්‍යයෙන් අන්ධවූ ඇස් ඇත්තෙක්මි.

2. "අහම්පි තත්ථෙව ගමිස්සාමි" (ධ.අ) මමද එහි ම යන්නෙමි.

3. "ථෙරස්ස චඞ්කමනට්ඨානං කාලස්සෙව න සම්මජ්ජිංසු.' (ධ) (තෙරුන් සක්මන්කළ තැන කලින් ම නො, සැමැද්දුහුය.)

4 "බ්‍රාහ්මණොපිස්ස සරීරං ඣාපෙත්වා ආලාහනතො රොදනපරායණො අහොසි." (ධ) බමුණාද ඔහුගේ සිරුර දවා සොහොනෙහි අඬමින් සිටියේය.)

5. "සඞ්ඝඤ්ච නරදම්මස්ස ගච්ඡාමි සරණං අහං" (ධ) (මම බුදුරදුන්ගේ සඞ්ඝයාද පිහිට කොට යමි.)

6. [1]"දුබ්බචො එස භන්තෙ," (ධ) (ස්වාමීනී මේ අකීකරුවෙකි.

7. "න ඉදානෙව පුබ්බෙපෙස දුබ්බචො යෙව." (ධ) දැන් පමණක් නොවෙයි, මූ පෙරද අකීකරුවෙකි.

8. "අයං පවිසන්තොපි මං අක්කමෙය්‍ය" (ධ) (මූ එමින්ද මා පාගන්නේය.)

9. "කිමත්ථං තුය්හං කථෙමීති," (ධ) (කුමක් නිසා තුඹට කියම්ද?)

10. "තයො වාරෙ මම අණ්ඩානි ඛාදිත්වා ඉදානි මම්පි ඛාදිතුකාමොසි." (ධ) (තුන් වරක් මගේ බිත්තර කා දැන් මාද කන්ට කැමැත්තෙක් වෙහිය.)

11. "ආහර මෙ පත්තචීවරන්ති ආහරාපෙත්වා ගාමං පවිසති" (ධ) (මගේ පාසිවුරු දෙවයි ගෙන්වාගෙණ ගමට පිවිසෙයි.)

12 "එකකෙහි තිට්ඨන්තෙහි නිසීදන්තෙහි දුක්කරං කතං." (ධ) තනිව සිටින්නහු විසින්ද හිඳින්නහු විසින්ද කළ නො හැකි දෙයක් කරණ ලදී.)

13. "පඤ්ච අරිය සාවක කොටියො තුම්හාකං ආගමනං පච්චාසිංසන්ති." (ධ) (පස්කෙළක් අරිසව්වෝ නුඹ වහන්සේගේ ඊම බලාපොරොත්තු වෙත්.]

---

1 දු + වච = දුව්වච = දුබ්බච. මෙහි 'ව' හට ද්විත්ව හා 'බ්' ආදේශය සිද්ධයි.

14. "භගවා එතදවොච." (වතු-අ) ('බුදුරජාණන්වහන්සේ මෙය වදාළ සේක.)

15. තම්මුහුත්ත සමුට්ඨිතෙන ව්‍යාධිනා සායණ්හ සමයෙ කාලමකාසි' (ධ) එකෙණෙහි හටගත් ලෙඩකින් හවස් කාලයෙහි කළුරිය කෙළේය.)

16. "කිං නුමෙහ භික්ඛවෙ චූලකාලං විය මහාකාලං සල්ලක්ඛෙථ." (ධ) කිම තෙපි මහණෙනි, චූලකාලයා මෙන් මහාකාලයා සලකව්ද?)

17. "තංවෙ නප්පසහති මාරො වාතො සෙලංව පබ්බතං." (ධ) [වාතය ගල්කන්දක් මෙන්, මාරයා ඒකාන්තයෙන් ඔහු නොමඩියි.)

18. "ස්වාක්ඛාත සාසනා නීහරිත්වා කතිපාහෙනෙව ගිහිභාවං පාපේති" (ධ) මනාව දෙසූ දහම් ඇති සස්නෙන් බැහැර කොට කීපදවසකින්ම ගිහි බවට පමුණුවයි.)

19. "අනන්තානි ච සතමංසකෑව ආහරිත්වා වික්කිණන්තො ජීවිකං කප්පෙති." (ධ) අතුනුදු බොලම්සද ගෙණවුත් විකුණමින් දිවිරකියි.)

20. "උපසන්තො දමසච්චෙන සචෙ කාසාවමරහති." (ධ) (ඉන්ද්‍රිය දමනයෙන්ද සත්‍ය වචනයෙන්ද යුක්තවූ හෙතෙමේ ඒකාන්තයෙන් සිවුරට සුදුසු වෙයි.

21. "අත්ථඤ්ඤෙව මේ බ්‍රෑහි" (ධ) (අරුතම මට කියන්න.)

22. තංඛණඤ්ඤෙව තෙසං දිබ්බචක්ඛූනි උපපජ්ජිංසු." (ධ) (එකෙණෙහිම ඔනුට දිවවත් පහළ වූහ.)

23. "පුබ්බපාදතො වණ්ණගන්ධ සම්පන්නානි පුප්ඵානි ආහරථ." (ධ) කඳුපාවුලෙන් ලස්සන සුවඳැති මල් ගෙණ එව් )

24 'සරදතාපසො පුප්ඵඡත්තං ධාරයමානොව සත්තාහං පීතිසුඛෙන වීතිනාමෙසි " (ධ) සරද තවුසා මල් සත දරමින්ම සත් දිනක් ප්‍රීති සැපයෙන් කල්ගෑවීය.]

25. "පඤ්ඤත්තෙසු ආසනෙසු නිසින්නස්ස බුද්ධ පමුඛස්ස භික්ඛු සඞ්ඝස්ස දක්ඛිණොදකං දත්වා." (ධ) පැණවූ අසුන්හි වැඩහුන් බුදුපාමොක් භික්සඟනට දන් පිණිස පැන් පිළිගන්වා.)

26. "තස්ස නික්ඛමණතො පට්ඨාය නපස්සාම." (ධ) ඔහු ගිය තැන් පටන් ඒවා නො බලමු.)

27. "යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති." (ධ) යමක් පිණිස කුලදරුවෝ මනාව ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදි වෙත්ද?)

28. "දුච්ඡන්න ගෙහ සදිසො." (ධ) (සෙවෙනි දිරා ගිය ගෙයක් වැනිය.)

29. භරියං ගෙන්ත ආනෙස්සාමි" (ධ) (බිරියක් ගෙණ එන්නෙමි.)

30. "සචායං තුවඤ්ඤාතිං පස්සිස්සති දෙවසමාගමං පවිසිතුං න ලභිස්සාමි." (ධ) ඉදින් මේතෙමේ තිස්පය දක්නේ නම් දෙව් සබයට යන්ට නොලබන්නෙමි.)

31. "අජ්ජතග්ගෙ දානාහං ආවුසො ආනන්ද අඤ්ඤත්‍රෙව භගවතා අඤ්ඤත්‍ර භික්ඛු සංඝෙන උපොසථං කරිස්සාමි, (ධ) (ඇවැත් ආනන්දය, දැන් මම අද පටන් බුදුරදුන් හැර බික් සඟන හැර පොහොය කරන්නෙමි.)

32. "සුකරානි අසාධූනි අත්තනො අහිතානිච' (ධ) තමනට අහිත අසාධු දෙය (ලාමකයා විසින්) සුකරය.

33. "මිගරාජ නමොත්‍යත්ථු" (ධ) (මුවරජුනි, තුඹට නමස්කාර වේවා.)

34. ත්වං එතස්මිං පබ්බතෙ වස, අහං ඉමස්මිං පබ්බතෙ වසිස්සාමි, අඩ්ඪමාසම්පන උපොසථ දිවසෙ එකතො භවිස්සාම." (ධ) තුඹ තෙල පව්වෙහි වසන්න. මම මේ පව්වෙහි වසමි. අඩමසක් ගානේ පොහෝ දින යන්හි එකතුවන්නෙමු.

35. 'පච්චෙක බුද්ධො'ති මඤ්ඤෙ උපාසකාති ගොපාලං නිවත්තා පෙක්ඛා වෙහාසං අබ්භුග්ගන්ත්වා ගන්ධමාදනාභිමුඛො පක්කාමි." (ධ) පසේ බුදුරජතෙමේ සිට උවසුවයි ගොපොල්ලා නවත්වා අහසට පැන නැගී ගන්ධමාදනය බලා වැඩියේය.

36. "බාහා පග්ගය්හ කන්දන්තො තස්ස සන්තිකං අගමාසි." (ධ) දෙඅත් බැඳගෙණ හඬමින් ඔහු ලඟට ගියේය.

37, "අයං එත්තිකා සම්පත්ති මං නිස්සාය නිබ්බත්තාති සිතං අකාසි." මේ මෙපමණ සැපතක් මා නිසා ලැබී යයි සිනහ පහළ කළාය.

38. "හිරොත්තප්ප සම්පන්නා කුලධීතා පඤ්චවාරස්මිං සත්තිප්පහාරං විය වණෙ ඛාරොදක පරිසේකං විය පත්වා කිං සාමීති, ආහ." (ධ) ලජ්ජාබිය ඇති කුල දූ පපුවට අඩයටි පාරක්මෙන් තලක් මෙන්ද වණයෙහි මිරිස්හොදි බහාලූ තලක් මෙන්ද දුකට පැමිණ කිම හිමියනි කීය.

39. "මය්හමෙවෙකාසාහාරං, වඩ්ඪයිංසු" (ධ) හුදකලා මටම ආහාර පිසූහ.

40. "සොසොපි එකසො [1] දුල්ලභො ලෝකස්මිං" ලොව මේ හඬද දුලබය.

41. රථා ඔරුය්හ මහාසත්තස්ස ආභරණ භණ්ඩං ඔමුඤ්චිත්වා භණ්ඩිකං කත්වා ඨපෙත්වා කුද්දාලං ආදාය ආවාටං ඛනිතුං ආරභි" (ජා. අ) රියෙන් බැස මහබෝසතුන්ගේ ඇඳුම් ලිහා පොදියක් කොට තබා උදැල්ලක් ගෙණ වළක් කනින්ට පටන්ගත්තේය.

42. "නාබ්බණං විසමන්වෙති, නත්ථි පාපං අකුබ්බතො" (ධා) තුවාල නැති අතෙහි විස නොවදීයි. නොකරන්නහුට පවක් නැත.

---

1. දු + ලභ = දුල්ලභ; සු + ලභ = සුලභ = මෙය ද්විරුක්තවන්නේ 'දු' යන්න මූල්වූ කල්හිපමණය. 'සු' යන්න මූල්වුව ද්විරුක්ත නොවේ.

43. "තමෙම බාලං පචෙචති පාපං සුඛුමො රජො පටිවාතංව ඛිතෙතා" (ධ) උඩුසුලඟට දමා ගැසූ දූලි මෙන් බාලයා තරම ඒ වරද පැමිණේ.

44. "ගාථං අජ්ඣභාසි" (වතු අ) ගයක් කීය.

45. "දසසු ලොකධාතුසු දෙවතා සන්නිපතිත්වාන සම්බුද්ධං පයිරුපාසන්ති" (ධ) දසලොවෙක දෙවියෝ රැස්ව සම්බුදු රජුන්ට උවැටන් කෙරෙත්.

46. "සබ්බපාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා සචිත්තපරියොදපනං එතං බුද්ධානසාසනං" (ධ) සියලු පව් නොකිරීමද කුසල් රැස්කිරීමද සිත පිරිසිදු කිරීමද යන මෙය බුදුවරුන්ගේ අනුශාසන යයි.

47. [1] "සත්තා ගච්ඡන්ති සුග්ගතිං" (ධ) සත්වයෝ සුගතියට යෙති.

48. [2] "සාධුදස්සන මරියානං සන්නිවාසො සදාසුඛො", (ධ) ආර්යයන්ගේ දැකීම මැනවි. එකට විසීම හැම කල්හි ම සැප ගෙණ දේ.

---

## 9 පාඩම.

**33 නිත්‍ය සන්ධි,**

ධාතු හා උපසර්ගයන් පිළිබඳ වූ සන්ධිත් ඒකපදයෙහි සන්ධිත් නිත්‍යයෙන්ම සන්ධි වෙති.

උප + එති = උපෙති,
අව + වදති = ඔවදති,
අනු + එති = අන්වෙති,
අප + එති = අපෙති,

---

1. සු + ගති = සුග්ගති. මේ ද්විත්වය හැමතන්හිම නොවේ. මෙහි ඡන්දස් හේතුවෙන් වීය.
2. සාධු දස්සනං = මෙහි හ්‍රස්වත්වට ඡන්දස්තා වීය.

අති + කමති = අතික්කමති,
නි + කමති = නික්ඛමති,
නි + චරති = නිච්චරති,
නි + පතති = නිප්පතති,
පති + මුඤ්චති = පටිමුඤ්චති,
පති + වදති = පටිවදති,
අභි + කමති = අභික්කමති.

මොවුහු ධාතු උපසර්ගයන් පිළිබඳවූ නිත්‍ය සන්ධිහු වෙති.

ඒකපදයෙහි සන්ධිය නාමයන් හා ප්‍රත්‍යයන් එකට ගැළපීමෙහි දී ලැබේ.

මේ බුද්ධ ශබ්දයාගේ පද සිද්ධිය පිළිබඳ හැම පදයක් ම ඒකපද සන්ධිය වශයෙන් සැලකිය යුතුයි.

ඒකපද සන්ධි :-

ප-ඒ = බුද්ධ + ඕ = බුද්ධ් + අ + ඕ = බුද්ධෝ,
ප-බ = බුද්ධ + ආ = බුද්ධ් + ආ = බුද්ධා
ආ-ඒ = බුද්ධ + අ = බුද්ධ් + අ = බුද්ධ,
දු-ඒ = බුද්ධ + අං = බුද්ධ් + අං = බුද්ධං,
දු-බ = බුද්ධ + ඒ = බුද්ධ් + ඒ = බුද්ධෙ,
ත-ඒ = බුද්ධ + ඒන = බුද්ධ් + අ + ඒන = බුද්ධෙන,
ත-බ = බුද්ධ + ඒභි = බුද්ධ් + ඒහි = බුද්ධෙහි.
ච-ඒ = බුද්ධ + අ ය = බුද්ධ් + අ + ආය = බුද්ධාය,
ච-ඒ = බුද්ධ + අස්ස = බුද්ධ් + අස්ස = බුද්ධස්ස,
ච-බ = බුද්ධ + ආනං = බුද්ධ් + ආනං = බුද්ධානං,
ප-ඒ = බුද්ධ + ම්හා [ස්මා] බුද්ධම්හා; [බුද්ධස්මා]
ස-ඒ = බුද්ධ + ඒ [ස්මිං] = බුද්ධෙ; [බුද්ධස්මිං]
[ම්හි] [බුද්ධම්හි]
ස-බ = බුද්ධ + ඒසු = බුද්ධ් + අ + ඒසු = බුද්ධෙසු;

අනික් නාමයන් පිළිබඳව ද අගින් ප්‍රත්‍යය ගැළපීම මෙලෙසින් ම කටයුතුයි.

### 9 අභ්‍යාසය.

1. නිත්‍ය සන්ධි කවරහුද?
2. ධාතූපසර්ගයන් පිළිබඳ නිත්‍ය සන්ධියට උදාහරණ අටක් දක්වන්න.
3. සුර, අසුර, ශබ්දයන්ගේ හා බුද්ධ ශබ්දයාගේ පදසිද්ධි මෙසේ සිදුකර දක්වන්න.

---

## 10 පාඩම.

### නාම

නාම නම් අවිභක්තික ශබ්දප්‍රකෘති සමූහයකි. එය පුංලිඞ්ගිකනාම ස්ත්‍රීලිඞ්ගිකනාම නපුංසකලිඞ්ගිකනාම යයි තුන් කොටසකට බෙදේ. අකාරාන්ත, ආකාරාන්ත, ඉකාරාන්ත ඊකාරාන්ත, උකාරාන්ත, ඌකාරාන්ත, ඕකාරාන්ත යයි පුංලිඞ්ගික නාමයෝ 27 කොටස් සතකට බෙදෙති.

එසේම ආකාරාන්ත, ඉකාරාන්ත, ඊකාරාන්ත, උකාරාන්තා ඌකාරාන්ත, ඕකාරාන්ත යයි ස්ත්‍රීලිඞ්ගික නාමයෝ කොටස් පසකටද අකාරාන්ත, ඉකාරාන්ත, උකාරාන්ත යයි නපුංසක ලිඞ්ගික නාමයෝ කොටස් තුණකට ද බෙදෙති.

34 පුංලිඞ්ගික සාමාන්‍ය අකාරාන්ත නාමයෝ,

බුද්ධ 1 සුර, 2 අසුර, 3 නර, 4 උරග, 5 නාග, යක්ඛ, 7 ගන්ධබ්බ, 8 කින්නර, 6 මනුස්ස, 10 පිසාච, 11 පෙත, 12 මාතඞ්ග, 13 ජඞ්ගම, 14 තුරඞ්ග, 15 වරාහ, 16 සීහ, 17 ව්‍යග්ඝ, 18 අච්ඡ, 19 කච්ඡප, 23 තරච්ඡ, 21 මිග, 22 අස්ස, 23 ඝොත, 24 ආලොක, 25 ලොක, 26 නිලය,

---

1 දෙවියෙ, 2 අසුරයා, 3 මිනිහා, 4,5 නයා, 6 යකා, 7 ගඳඹා, 8 කින්නරා, 9 මිනිහා, 10 පිසාචයා, 11 ප්‍රෙතයා, 12 ඇතා, 13 ඇවිදින්නා, 14 අශ්වයා,, 15 උගුරා, 16 සිංහයා, 17 ව්‍යාඝ්‍රයා, 11 වලසා, 19 ඉබ්බා, 20 වලසා, 21 මුවා, 22 අශ්වයා, 23 බල්ලා, 24 එළිය, 25 ලොව, 26 ගෙය, 27 නපුංසක ලිංගික [illegible]

27 අනිල, 38 චාග, 29 වායාම, 30 ගාම, 31 නිගම'
32 ආගම, 33 ධමම, 34 කමම, 35 කාම, 36 සඞඝ,
37 ඝොස, 38 පටිඝ, 39 කොධ, 40 ලොභ 41 පුන්නාග,
42 පූග, 43 පනස, 44 චමපක, 45 අමබ, 46 හින්තාල,
47 තාල, 48 අජ්ජුන, 49 කිංසුක, 50 පුචිමන්ද.

35 විභත්ති.

නාමය ඒ ඒ අරුත්වලට බෙදන්නා විභක්ති නම්. එය පඨමා, ආලපන, දුතියා, තතියා, කරණ, චතුත්ථී, පඤ්චමී' ඡට්ඨී, සත්තමී යයි නව වැදෑරුම් වේ.

1. පඨමා[=පෙර]= ක්‍රියාවේ උක්තය දක්වෙන විභක්තිය.
2. ආලපන [අලප්]=ආමන්ත්‍රණය " "
3. දුතියා[කම්]=ක්‍රියාවට යටත්වන්නා " "
4. තතියා[කතු]=ක්‍රියාව කරන්නා " "
5. කරණ[කරණ]=ක්‍රියාව කිරීමට උදව්වන්නා "
6. චතුත්ථී[සපදන්)=ක්‍රියාව ලබන්නා " "
7. පඤ්චමී(අවදි]=ක්‍රියාවේ සීමාව " "
8. ඡට්ඨී[සබඳ]=අයිතිය " "
9. සත්තමී[අදර]=කාලය හෝ ස්ථානය උසුලන්නා " "

මේ එක එක විභක්තියක් එකවචන, බහුවචන යයි කොටස් දෙකට දෙකට බෙදේ.

1 එකවචන [එකබස]=එක දෙයක් දක්වන පදය.
2 බහුවචන[බුහුබස]එකට වැඩිවූ බොහෝ දෙය දක්වන පදය

ඒ ඒ විභක්තීන්ට නාමය බෙදා ගැණීමට උපකාරවන අකුරු ප්‍රත්‍යය නම්.

සාමාන්‍ය අකාරාන්ත නාමයන් ප්‍රථමාදී ඒ ඒ විභක්තීන්ට වෙන්කර ගැණීමේදී යොදනු ලබන ප්‍රත්‍යයෝ මෙසේ වෙති.

---

27 ගින්න, 28 තෑග්ග, 29 උත්සාහය, 30 ගම, 31 නියම්ගම, 32 ආගම, 33 ධර්මය, 34 කර්මය, 35 කාමය, 36 සමූහයා, 37 ශබ්දය, 38 වයිරය, 39 ක්‍රෝධය, 40 ලෝභය, 41 දෙඹ, 42 පුවක්, 43 කොස්, 44 සපු, 45 අඹ, 46 කිතුල්, 47 තල්, 48 කුඹුක්, 49 කෑල, 50 කොහොඹ;

| | ඒකවචන | (වි.අ) | බහුවචන | (වි.අ) |
|---|---|---|---|---|
| 1 පඨමා- | ඕ | (අ) | ආ, | (ආනො) |
| 2 ආලපන- | අ, ආ | ,, | ආ | ,, |
| 3 දුතියා- | අං | (ආනං) | ඒ, | ,, |
| 4 තතියා- | ඒන | (නා) | ඒහි, ඒභි | (නෙහි) |
| 5 කරණ- | ,, | ,, | ,, ,, | ,, |
| 9 චතුත්ථී- | ආය, අස්ස | (නො) | ආනං, | |
| 7 පඤ්චමී- | ආ, ම්හා, ස්මා, | | ඒහි, ඒභි, | (නෙභි) |
| 8 ඡට්ඨී - | අස්ස | (නො) | ආනං, | |
| 9 සත්තමී- | ඒ, ම්හි, ස්මිං, | (නි) | ඒසු | (නෙසු) |

සාමාන්‍ය අකාරාන්ත පුංලිඞ්ගික නාම ඒ ඒ විභක්ති වලට මෙසේ වර නගන්න.

### [1] බුද්ධ ශබ්දය

| විභක්ති | | ඒකවචන | බහුවචන |
|---|---|---|---|
| 1 පඨමා- | | බුද්ධො | බුද්ධා |
| 2 ආලපන- | (භො) | බුද්ධ, බුද්ධා | භවන්තො, බුද්ධා, |
| 3 දුතියා- | | බුද්ධං | බුද්ධෙ, |
| 4 තතියා | | බුද්ධෙන | බුද්ධෙහි; බුද්ධෙභි; |
| 5 කරණ | | බුද්ධෙන | බුද්ධෙහි, බුද්ධෙභි; |
| 6 චතුත්ථි | | බුද්ධාය, බුද්ධස්ස | බුද්ධානං |
| 7 පඤ්චමී | | බුද්ධා, බුද්ධම්හා; සමා- | බුද්ධෙහි, බුද්ධෙභි |
| 8 ඡට්ඨී | | බුද්ධස්ස | බුද්ධානං, |
| 9 සත්තමී | | බුද්ධෙ, බුද්ධම්හි, බුද්ධස්මිං; | බුද්ධෙසු, |

[1] **බුද්ධ ශබ්දය,**=මෙසේ කටපාඩම් කරන්න; "බුද්ධො, බුද්ධා, භොබුද්ධ, බුද්ධා භවන්තො බුද්ධා, බුද්ධං බුද්ධෙ, බුද්ධෙන බුද්ධෙහි බුද්ධෙභි, බුද්ධෙන බුද්ධෙහි බුද්ධෙභි, බුද්ධාය බුද්ධස්ස බුද්ධානං, බුද්ධම්හා, බුද්ධ සමා, බුද්ධෙහි බුද්ධෙභි, බුද්ධස්ස බුද්ධානං, බුද්ධෙ බුද්ධම්හි බුද්ධස්මිං බුද්ධෙසු;

බුද්ධ ශබ්දයේ ඒ ඒ විභක්තීන්ගේ අර්ථ පිළිවෙළින් මෙසේයි.

| | |
|---|---|
| 1 බුදුරජ තෙමේ | බුදුවරු, |
| 2 පින්වත් බුදුරජ | පින්වත් බුද්වරු; |
| 3 බුදුරජ | බුදුවරුන්, |
| 4 බුදුරජ විසින් | බුදුවරුන් විසින්, |
| 5 බුදුරජ කාරණකොටගෙණ | බුදුවරුන් කාරණකොට[ගෙණ], |
| 7 බුදුරජුට | බුදුවරුන්ට |
| 7 බුදුරදුගෙන් | බුදුවරුන්ගෙන්, |
| 8 බු:රදුගේ | බුදුවරුන්ගේ |
| 9 බුදුරජ කෙරෙහි | බුදුවරුන් කෙරෙහි, |

සෙසු සියලුම ශබ්දයන් පිළිබඳවූ ඒ ඒ විභක්තීන්ගේ අර්ථ මේ ලෙසින් ම පිළියෙල කරගන්න..

## 10 අභ්‍යාසය

1. නාම යනු කවරේද?
2. නාම හා පද දෙදෙනාගේ වෙනස දක්වන්න.
3. නාමයාගේ ප්‍රභෙද කවරේද?
4. තුරඞ්ග, වරාහ, මිග යන ශබ්දයන් විභක්තිවල වර නගන්න.
5. චම්පකස්ස, චම්පකො, අතිථාය, කිච්ඡරෙහි, සෝතාතං කාමම්සමිං, ගාමා, සබ්බික්ඛු, මේවායේ විභක්ති වචන වෙන් කොට දක්වන්න.
6. විභක්ති යනු කවරේද? කොතෙක්ද?
7. පඨමා, කරණ, පඤ්චමී, සත්තමී යන විභක්ති කවර කවර අරුත් පවසද්ද?

සංලක්ඛණය, තතියා, කරණ විභක්තිරූප හා පඤ්චමී බහුවචන රූපද එක ලෙස වරනැගෙති, එසේම චතුර්ථි ෂෂ්ඨී රූපද බොහෝ සෙයින් එකාකාර වෙති.

8. i "පණ්ඩිත පුරිසො ථෙරං තිමනොනසි" (ධ) (නුවණැති පුරුෂයෙක් තෙරුන් පැවරීය.]

ii "එවං නො ආචරියෙන අස්සජිථෙරෙන කථිතං"[ධ] (මෙසේ අපගේ ආචාර්ය වූ අස්සජි තෙරුන් විසින් කියන ලදී.)

iii "සභාගසකස්ස මුඛවණ්ණො න අඤ්ඤදිවසෙසු වීය. (ධ) (යහළුවාගේ මුව පැහැය අන් දිනවලදී මෙන් නොවෙයි.)

iv සො නිබද්ධං ඤාතිගාමෙයෙව පිණ්ඩාය චරති. (ධ) (ඔහු නිතර නෑ ගමෙහි ම පිඬු හැසිරෙයි.)

v "තෙ අපරභාගෙ දරකානං දෙමාති අත්තනාපි ගහෙ කා බාදිංසු" (ධ) (ඔවුහු පසුව දරුවන්ට දෙමුයි තමන්ද ගෙණ කෑමානුය.)

මෙහි අංකිත පදයන්ගේ විභක්ති සඳහන් කරන්න. හේතුද දක්වන්න.

9. බුද්ධ ශබ්දයේ එක හැටි රූප ඇති විභක්ති වචන යන් මේ මේ යයි ලියන්න.

10. බුද්ධස්ස, බුද්ධෙහි, බුද්ධෙ, බුද්ධාය, බුද්ධම්හා මේ පදවලට අරුත් පවසන්න.

---

## 11 පාඩම.

### 36. විශෙෂ අකාරාන්ත පුංලිඞ්ගික නාම.

1 මන [සිත] ශබ්ද

| | ඒ, | බ, |
|---|---|---|
| ප. | මනො | මනා |
| ආ | හෙ මන මනා | භවන්තො මනා |
| දු | මනං | මනෙ |

| | | |
|---|---|---|
| ත. | මනසා මනේන | මනේහි මනේභි |
| ක. | ,, ,, | ,, ,, |
| ච. | මනසෝ මනස්ස | මනානං |
| ප. | මනා මනම්හා මනස්මා | මනේහි මනේභි |
| ඡ. | මනසෝ මනස්ස | මනානං |
| ස. | මනසි මනේ මනම්හි මනස්මිං | මනේසු |

සංලක්ෂ්‍ය- තතියා, චතුත්ථී, ඡට්ඨී, සත්තමී, විභක්ති ඒකවචන යන්හි බුද්ධ ශබ්දයට වඩා මෙහි වැඩිපුර රූපයක් ඇති බව සලකන්න.

මන ශබ්දය මෙන් වර නැගෙන අනික් ශබ්ද.

1 වච, 2 වය, 3 තේජ, 4 තප, 5 චේත, 6 තම, 7 යස, 8 අය, 9 පය, 10 සිර, 11 සර, 12 උර, 13 රහ.

2 ගුණවන්තු (ගුණවතා)

| | ඒ | බ |
|---|---|---|
| අ, | ගුණවා ගුණවන්තෝ | ගුණවන්තෝ, ගුණවන්තා, |
| ආ | (හෙ) ගුණවං, ගුණව, ගුණවා | ගුණවන්තෝ ගුණවන්තා, |
| ප | ගුණවන්තං | ගුණවන්තෙ |
| ත | ගුණවතා, ගුණවන්තේන | ගුණවන්තේහි, ගුණවන්තේභි, |
| ක | ,, ,, | ,, ,, |
| ච | ගුණවතෝ, ගුණවන්තස්ස | ගුණවතං ගුණවන්තානං, |
| ප | ගුණවතා, ගුණවන්තම්හා-ස්මා. | ගුණවන්තේහි, ගුණවන්තේභි |
| ඡ | ගුණවතෝ, ගුණවන්තස්ස | ගුණවතං, ගුණවන්තානං, |
| ස | ගුණවති, ගුණවන්තම්හි-ස්මිං. | ගුණවන්තේසු |

මේ ශබ්දය කටපාඩම් කර ගන්න.

---

1 වචනය 2 වයස 3 තේජස 4 තපස 5 සිත 6 අඳුර 7 කීර්තිය 8 යකඩ 9 ජලය හෝ කිරි 10 හිස 11 විල 12 පපුව 13 රහස;

ගුණවන්තු ශබ්දය මෙන් වරනැගෙන අනික් ශබ්ද,

1 කුලවා 2 යසවා, 3 ධනවා, 4 සුතවා, සීලවා 6 සතිමා 7 ධිතිමා, 8 ගතිමා, 9 මතිමා, 10 ජුතිමා, 11 සිරිමා, 12 කලීමා, 13 චක්ඛුමා, 14 බන්ධුමා, 15 හේතුමා, 16 සේතුමා, 17 භානුමා,

### 3. ගච්ඡන්ත (යන්නා)

| | ඒ: | බ: |
|---|---|---|
| ප, | ගච්ඡං, | ගච්ඡන්තො, ගච්ඡන්තා, |
| ආ, | (භො) ගච්ඡං, ගච්ඡ, ගච්ඡා | ගච්ඡන්තො, ගච්ඡන්තා, |
| දු | ගච්ඡන්තං | ගච්ඡන්තෙ, |
| ත | ගච්ඡතා, ගච්ඡන්තෙන | ගච්ඡන්තෙහි, ගච්ඡන්තෙභි, |
| ක | ,, ,, | ,, ,, |
| ච | ගච්ඡතො ගච්ඡන්තස්ස | ගච්ඡතං, ගච්ඡන්තානං, |
| ප | ගච්ඡතා, ගච්ඡන්තම්හා-ස්මා- | ගච්ඡන්තෙහි, ගච්ඡන්තෙභි, |
| ඡ | ගච්ඡතො, ගච්ඡන්තස්ස | ගච්ඡතං, ගච්ඡන්තානං, |
| ස | ගච්ඡති, ගච්ඡන්තෙ ගච්ඡන්තම්හි, ගච්ඡන්තස්මිං | ගච්ඡන්තෙසු, |

සං. මෙහි බුද්ධශබ්දයාගේ මෙන් රූපයක්ද, ගුණවන්තුශබ්දයාගේ මෙන් රූපයක්ද සෑදී තිබේ පඨමා ඒකවචනය දෙකටම වෙනසි.

මෙසේ වරනැගෙන තවත් ශබ්ද,

1 මහන්ත, 2 චරන්ත, 3 තිට්ඨන්ත, 4 දදන්ත 5 භුඤ්ජන්ත, 6 සුණන්ත, 7 පචන්ත, 8 ජයන්ත, 9 ජීරන්ත, 10 චවන්ත, 11 මීයන්ත 12 සරන්ත,

---

1 කුල ඇත්තා, 2 කීර්ති ඇත්තා, 3 ධනය ඇත්තා, 4 දැනුමක් ඇත්තා, 5 සිල් ඇත්තා, 6 සිහි ඇත්තා, 7 නුවණ ඇත්තා, 8 ගමන් ඇත්තා, 9 නුවණැත්තා, 10 එළිය ඇත්තා, 11 ශ්‍රීය ඇත්තා, 12 පව් ඇත්තා, 13 ඇස් ඇත්තා, 14 නෑයන් ඇත්තා, 15 හේතු ඇත්තා, 16 හෙය ඇත්තා, 17 රශ්මිය ඇත්තා.

1 පුදන්නා, 2 හැසිරෙන්නා, 3 සිටින්නා, 4 දෙන්නා, 5 අනුභවකරන්නා, 6 අසන්නා, 7 පිසන්නා, 8 දිනන්නා, 9 දිරන්නා, 10 චුතවෙන්නා, 11 මැරෙන්නා, 12 සිහිකරන්නා,

## 4 රාජ (රජතුමා)

| | ඒ | බ |
|---|---|---|
| ප | රාජා | රාජානෝ |
| ආ | (භො) රාජ, රාජා, | (භො) රාජානෝ |
| දු | රාජානං, රාජං, | රාජානෝ |
| ත | රඤ්ඤා, රාජේන | රාජේහි, රාජේභි |
| ක | ,, ,, | රාජූහි, රාජූභි |
| ච | රඤ්ඤෝ, රාජිනො | රඤ්ඤං, රාජූනං, රාජානං |
| ප | රඤ්ඤා, රාජම්හා, රාජස්මා | රාජේහි, රාජේභි<br>රාජූහි, රාජූභි |
| ඡ | රඤ්ඤෝ, රාජිනො | රඤ්ඤං, රාජූනං, රාජානං |
| ස | රඤ්ඤෙ, රාජම්හි, රාජස්මිං, | රාජේසු, රාජූසු |

මේ ශබ්දයද කටපාඩම් කරගන්න.

## 5 බ්‍රහ්ම (බ්‍රහ්මයා)

| | | |
|---|---|---|
| ප | බ්‍රහ්මා | බ්‍රහ්මානෝ |
| ආ | (භො) බ්‍රහ්ම | (භවන්තො) බ්‍රහ්මානෝ |
| දු | බ්‍රහ්මානං, බ්‍රහ්මං | බ්‍රහ්මානෝ |
| ත | බ්‍රහ්මුනා | බ්‍රහ්මෙහි, බ්‍රහ්මෙභි |
| ච | බ්‍රහ්මුනො, බ්‍රහ්මස්ස | බ්‍රහ්මානං, බ්‍රහ්මූනං |
| ප | බ්‍රහ්මුනා | බ්‍රහ්මෙහි, බ්‍රහ්මෙභි |
| ඡ | බ්‍රහ්මුනො, බ්‍රහ්මස්ස | බ්‍රහ්මානං, බ්‍රහ්මූනං |
| ස | බ්‍රහ්මනි | බ්‍රහ්මෙසු, |

රාජ ශබ්දයට වඩා බ්‍රහ්ම ශබ්දයෙහි ඇත්තේ මද වෙනසකි.

## 6 අත්ත (තමා)

| | | |
|---|---|---|
| ප | අත්තා | අත්තානෝ |
| ආ | (භො) අත්ත, අත්තා | (භවන්තො) අත්තානෝ |
| දු | අත්තානං, අත්තං | අත්තානො, |
| ත | අත්තෙන, අත්තනා | අත්තනෙහි, අත්තනෙභි |
| ක | ,, ,, | ,, ,, |

| | | |
|---|---|---|
| ච | අත්තනො | අත්තානං |
| ප | අත්තනා | අත්තනෙභි, අත්තනෙහි |
| ඡ | අත්තනො | අත්තානං |
| ස | අත්තනි | අත්තනෙසු, |

බ්‍රහ්ම ශබ්දයෙත් අත්ත ශබ්දයෙත් ඇති වෙනස හිතේ තබාගන්න.

7 සඛ (යහළුවා)

| | | |
|---|---|---|
| ප | සඛා | සඛානො, සඛායෝ, සඛිනො |
| ආ | (භො)සඛ, සඛා, සඛි, සඛී, සඛෙ, | (භවන්තො)සඛානො, සඛායෝ, සඛිනො, |
| දු | සඛාරං, සඛානං, සඛං, | සඛානො, සඛායො, සඛිනෝ |
| ත | සඛිනා | සඛාරෙභි, සඛාරෙහි සඛෙභි, සඛෙහි |
| කා | ,, | ,, ,, |
| ච | සඛිනො, සඛිස්ස | සඛාරානං, සඛීනං |
| ප | සඛිනා | සඛාරෙභි, සඛාරෙහි සඛෙභි, සඛෙහි |
| ඡ | සඛිනො, සඛිස්ස | සඛාරානං, සඛීනං |
| ස | සඛෙ | සඛාරෙසු, සඛෙසු |

37 ස්ත්‍රීලිඞ්ගික අකාරාන්ත ශබ්දයෝ අවිද්‍යමානයහ.

---

## 12 පාඩම.

38. නපුංසකලිඞ්ගික සාමාන්‍ය අකාරාන්ත නාම; චිත්ත (සිත,)

| | ඒක, | බහු, |
|---|---|---|
| ප | චිත්තං (+ අං) | චිත්තා, චිත්තානි (+ආනි) |
| ආ | (භො) චිත්ත, චිත්තා, | (භවන්තො) චිත්තානි |
| දු | චිත්තං | චිත්තෙ, චිත්තානි |

| | | |
|---|---|---|
| ත | චිත්තෙන | චිත්තෙහි, චිත්තෙභි, |
| ක | ,, | ,, ,, |
| ච | චිත්තාය, චිත්තස්ස | චිත්තානං |
| ප | චිත්තා, චිත්තම්හා, + ස්මා, | චිත්තෙහි, චිත්තෙභි |
| ප | චිත්තස්ස | චිත්තානං |
| ස | චිත්තෙ, චිත්තම්හි, චිත්තස්මිං. | චිත්තෙසු |

සං:- චිත්ත ශබ්දය බුද්ධ ශබ්දයට වෙනස්වන්නේ පඨමා දුතියා විභක්ති දෙකෙහි, අනිත් සියල්ල බුද්ධ ශබ්දය හා සමය.

මේ මතු දැක්වෙන ශබ්දයෝ ද චිත්ත ශබ්දය මෙන් වර නැගෙති.

1 පුඤ්ඤ 2 පාප 3 ඵල 4 රූප 5 සොත 6 ඝාන 7 සුඛ 8 දුක්ඛ 9 දූත 10 සීල 11 ධන 12 ධ්‍යාන 13 ලොචන 14 මූල 15 කූල 16 ජාල 17 මඞ්ගල 18 නලින 19 මුඛ 20 පුලින 21 ධඤ්ඤ 22 හිරඤ්ඤ 23 පදුම 24 පණ්ණ 25 සුසාන 26 වන 27 ආයුධ 28 හදය 29 චීවර 30 වත්ථ 31 නයන 32 වදන 33 යාන 34 සොපාන 35 පාන 36 භවන 37 භුවන 38 ලොහ 39 අලාත 40 තුණ්ඩ;

### 39 නපුංසක ලිඞ්ගික විශෙෂ අකාරාන්ත නාම

### කම්ම (කර්මය)

| | | |
|---|---|---|
| ප | කම්මං | කම්මා, කම්මානි, |
| ආ | (හෙ) කම්ම, කම්මා, | (හෙ) කම්මානි; |
| දු | කම්මං | කම්මෙ, කම්මානි; |

---

1 පින, 2 පව, 3 ඵලය 4 රූපය 6 කණ, 6 නාසය, 7 සුවය 8 දුක 9 දූතය 10 සීලය 11 ධන 12 ධ්‍යානය 13 ඇස 14 මුල 15 ඉවුර 16 දැල 17 මගුල 18 පියුම් 19 කට 20 වැලි 21 ධාන්‍යය 22 අමුරන් 33 පියුම් 24 කොළය 25 සොහොන 26 කැලය 27 ආයුධය 28 හෘදය 29 සිවුර 30 වස්ත්‍රය 31 ඇස 32 මුහුණ 33 යානය 34 හිනිමග 35 බීම 36 ගෙය 37 ලොව 38 ලෝහය 39 ගිනිපෙනෙල්ල 40 තුඩ;

| | | |
|---|---|---|
| ත | කම්මුනා, කම්මනා, කම්මෙන, | කම්මෙහි, කම්මෙභි |
| ක | ,, ,, ,, | ,, ,, |
| ච | කම්මුනො, කම්මස්ස, | කම්මානං |
| ප | කම්මා, කම්මම්හා + සමා | කම්මෙහි, කම්මෙභි |
| ඡ | කම්මුනො කම්මස්ස | කම්මානං |
| ස | කම්මනි, කම්මෙ, කම්මම්හි-සමිං, | කම්මෙසු |

මන (සිත)

| | | |
|---|---|---|
| ප | මනං | මනා, මනානි |
| ආ | (භො) මන, මනා | (භො) මනානි |
| දු | මනං | මනෙ, මනානි |
| ත | මනසා, මනෙන | මනෙහි, මනෙභි |
| ක | ,, ,, | ,, ,, |
| ච | මනසො, මනස්ස | මනානං |
| ප | මනසා, මනම්හා, මනස්මා | මනෙහි, මනෙභි |
| ඡ | මනසො, මනස්ස | මනානං |
| ස | මනසි, මනෙ, මනම්හි + සමිං | මනෙසු |

මුලින් පුංලිඞ්ගයෙහි දී දක්වූ මන ශබ්දයම නපුංසක ලිංගයෙහි දී මෙසේ වරනැඟේ.

ගුණවන්තු (ගුණවතා)

| | | |
|---|---|---|
| ප | ගුණවං | ගුණවන්තා, ගුණවන්තානි |
| ආ | (භො) ගුණවං, ගුණව, ගුණවා, | (භො) ගුණවන්තා, ,, |
| දු | ගුණවන්තං | ගුණවන්තෙ, ගුණවන්තානි |

සෙස්ස පුංලිඞ්ගයෙහි මෙනි.

# 13 පාඩම.

## 40. පුංලිඞ්ගික ආකාරාන්ත නාම

සා (සුනඛයා);

| | | |
|---|---|---|
| ප- | සා. | සා, සානො. |
| ආ- | (හෙ) සා, | (හෙ) සා, සානො, |
| දු- | සානං | සානෙ, |
| ත- | සානා | සානෙහි, සානෙභි, (සාහි, සාභි) |
| ක- | ,, | ,, ,, |
| ච- | සාස්ස | සානං, |
| ප- | සානා | සානෙහි, සානෙභි, (සාහි, සාභි) |
| ඡ- | සාස්ස | සානං |
| ස- | සානෙ | සානෙසු |

[1]පච්චක්ඛධම්මා [2]ගාණ්ඩීවධන්වා යන ශබ්දයෝද මෙසේම වරනැගෙති.

## 41. ස්ත්‍රී ලිංගික ආකාරාන්ත නාම.

කඤ්ඤා (කෙල්ල);

| | | |
|---|---|---|
| ප- | කඤ්ඤා (+ආ) | කඤ්ඤා, කඤ්ඤායො, (+ආයො) |
| ආ- | (හෙ) කඤ්ඤෙ (=එ) | (හොති) කඤ්ඤා, කඤ්ඤායො (ආයො) |
| දු- | කඤ්ඤං | කඤ්ඤා, කඤ්ඤායො (ආයො) |
| ත- | කඤ්ඤාය (=ආය) | කඤ්ඤාහි කඤ්ඤාභි (+ආහි, ආභි) |
| ක- | කඤ්ඤාය ( ,, ) | ,, ,, ,, |
| ච- | කඤ්ඤාය ( ,, ) | කඤ්ඤානං (=ආනං) |
| ප- | කඤ්ඤාය ( ,, ) | කඤ්ඤාහි, කඤ්ඤාභි (=ආහි, ආභි) |
| ඡ- | කඤ්ඤාය ( ,, ) | කඤ්ඤානං (+ආනං) |
| ස- | කඤ්ඤායං, කඤ්ඤාය (+ආයං) | කඤ්ඤාසු (=ආසු) |

මේ ශබ්දය කටපාඩම් කරගන්න.

**මෙහි මතු දැක්වෙන ශබ්දයෝ ද මෙසේම වරනැගෙති.**

---

1 දුටුගත් ධර්මය ඇති, 2 එනම් දුන්න ඇති,

සද්ධා, 1 මේධා, පඤ්ඤා, 2 විජ්ජා, තණ්හා, 3 වීණා, 4 ඉච්ඡා, 5 මුච්ඡා, 6 මායා, මෙත්තා, 7 සික්ඛා, 8 ජඞ්ඝා, 9 ගීවා, 10 ජිව්හා, 11 වාචා, ඡායා, ගඞ්ගා, නාවා, ගාථා. සේනා, ලේඛා, 12 සාලා, 13 මාලා, 14 ඛිඩ්ඩා, 15 පිපාසා, 16 වේදනා, 17 චේතනා, දේවතා, 18 ගොධා, 19 බලාකා, පරිසා, සභා, 20 ඌකා, 21 සෙඵාලිකා, 22 සලාකා, ලඞ්කා, 23 සාඛා, 24 වාලිකා, 25 සිඛා, 26 වචා, 27 ජටා, 28 ලතා, 29 සිංසපා, 30 ජායා.

### 41 නපුංසකලිඞ්ගික ආකාරාන්ත නාම.

අසද්ධා (සැදැහැ නැති)

| | | |
|---|---|---|
| ප – | අසද්ධං | අසද්ධං, අසද්ධානි |
| ආ– | (භො) අසද්ධ, අසද්ධා | (භො) අසද්ධා, අසද්ධානි |
| දු– | අසද්ධං | අසද්ධෙ, අසද්ධානි |
| ත– | අසද්ධෙන | අසද්ධෙහි, අසද්ධෙභි |
| ක– | ,, | ,, ,, |
| ච– | අසද්ධාය, අසද්ධස්ස | අසද්ධානං |
| ප– | අසද්ධා, අසද්ධම්හා– | අසද්ධෙහි, අසද්ධෙභි |
| ඡ– | අසද්ධස්ස | අසද්ධානං |
| ස– | අසද්ධෙ, අසද්ධම්හි–ස්මිං; | අසද්ධෙසු |

[1] මුඛනාසිකා ශබ්දයද මෙසේම වරනැඟේ.

---

## 14 පාඩම.

### 42 පුංලිඞ්ගික ඉකාරාන්ත නාම.

අග්ගි (ගින්න)

| | | |
|---|---|---|
| ප– | අග්ගි (අග්ගිනි) | අග්ගී, අග්ගයෝ, (ඊ, අයො) |
| ආ | (භො) අග්ගි | (භො) අග්ගී, අග්ගයෝ |

1 නුවණ, 2 විද්‍යාව, 3 වීණාව, 4 කැමැත්ත, 5 සිහිනැතිවීම, 6 රැවටීම, 7 හික්මීම, 8 කෙණ්ඩය, 9 බෙල්ල, 10 දිව, 11 වචනය, 12 සාලාව, 13 මාලය, 14 සෙල්ලම, 15 පිපාසය, 16 වේදනාව, 17 සිතීම, 18 තලගොයා 19 කනකොකා, 20 උකුණා, 21 සේපාලිකා මල්, 22 ඉරටු, 23 දුන්න, 24 වැලි, 25 මුදුන, 26 වදකහ, 27 අවුල, 28 වැල, 29 ඇට්ටේරිය, 30 බිරිඳ.

1. මුඛයද නැහැයද;

| | | |
|---|---|---|
| දු- | අග්ගිං | අග්ගී, අග්ගයො |
| ත- | අග්ගිනා (+ නා) | අග්ගීහි, අග්ගීභි (+ ඊහි, ඊභි.) |
| ක- | ,, ,, | ,, ,, ,, |
| ච- | අග්ගිනො, අග්ගිස්ස (+ නො + ස්ස | අග්ගීනං (+ ඊනං) |
| ප- | අග්ගිනා, අග්ගිම්හා + ස්මා | අග්ගීහි, අග්ගීභි |
| ඡ- | අග්ගිනො, අග්ගිස්ස. | අග්ගීනං |
| ස- | අග්ගිම්හි, අග්ගිස්මිං | අග්ගීසු |

මෙහි මතුදැක්වෙන ශබ්දයෝ 'අග්ගි' ශබ්දය මෙන් වර නැගෙත්.

1 ජොති 2 පාණි 3 ගණ්ඨි 4 මුට්ඨි 5 කුච්ඡි 6 වත්ථි 7 සාලි 8 වීහි 9 ව්‍යාධි 10 සන්ධි 11 රාසි 12 විධි 13 ඉසි 14 මුනි 15 මණි 16 ගිරි 17 කවි 18 කපි 19 අසි 20 නිධි 21 අහි 22 කිමි 23 හරි 24 අරි 25 ජලනිධි 26 ගහපති 27 අධිපති 28 සාරථි 29 අතිථි 30 සමාධි.

සං. ආදි ශබ්දයද අග්ගි ශබ්දය මෙන් වරනැගේ. එහෙත් සත්තමියෙහි=ආදිං, ආදො, ආදිම්හි, ආදිස්මිං, ආදිසු' යි වෙනස්ව සෑදේ.

## 42 ස්ත්‍රීලිඞ්ගික ඉකාරාන්ත නාම

### රත්ති (රැය)

| | | |
|---|---|---|
| ප, | රත්ති | රත්ති, රත්තියො, රත්‍යො |
| ආ | (හෙ) රත්ති | (හෙ) රත්ති, රත්තියො, රත්‍යො |
| දු- | රත්තිං | රත්තී, රත්තියො, රත්‍යො |
| ත- | රත්තියා, රත්‍යා | රත්තීහි, රත්තීභි, |
| ක- | ,, ,, | ,, ,, |
| ච | රත්තියා, රත්‍යා | රත්තීනං |

---

1 ගිනි 2 අල්ල 3 ගැටය 4 මිට 5 බඩ, 6 වස්තිය 7 හැල් 8 වී, 9 ලෙඩ, 10 සන්ධිය 11 රැය 12 විධිය 13 සෘෂියා 14 තපස්වියා 16 මැණික 16 කන්ද, 17 පණ්ඩිතයා 18 වඳුරා 19 කඩුව 20 නිධානය, 21 නයා 22 පණුවා 23 විෂ්ණු 24 සතුරා 25 මුහුද 26 ගැහැවියා 27 ප්‍රධානයා 28 රියැදුරා 29 අමුත්තා 30 සමාධිය,

| | | |
|---|---|---|
| ප | රත්තියා, රත්‍යා | රත්තීහි, රත්තීභි, |
| ඡ | රත්තියා, රත්‍යා | රත්තීනං |
| ස | රත්තියං, රත්‍යං, රත්‍යා- රත්තිං, රත්තො, රත්තියා | රත්තීසු, රත්තීසු |

මෙහි පහත දැක්වෙන ශබ්ද ද රත්ති ශබ්දය මෙන් වර නැගෙති.

1 පත්ති 2 යුත්ති 3 කිත්ති 4 මුත්ති 5 තිත්ති 6 ඛන්ති 7 රස්මි 8 තන්ති 9 සිද්ධි 10 සුද්ධි 11 ඉද්ධි 12 බුද්ධි 13 බෝධි 14 භූමි 15 ජාති 16 පීති 17 නන්දි 18 සාති 19 කෝටි 20 දිට්ඨි 21 වුට්ඨි 22 තුට්ඨි 23 යට්ඨි 24 පාලි 25 ආලි 26 නාලි 2 කේළි 28 අඞ්ගුලි 29 දුන්දුභි 30 දෙණි 31 අටවි 32 ඡවි.

## 43 නපුංසක ලිඞ්ගික ඉකාරාන්ත නාම.

අට්ඨි (ඇටය)

| | | |
|---|---|---|
| ප - | අට්ඨි | අට්ඨීනි, අට්ඨී |
| ආ- | (භො) අට්ඨි | (භො) අට්ඨීනි, අට්ඨී |
| දු - | අට්ඨිං | අට්ඨීනි, අට්ඨී |
| ත- | අට්ඨිනා | අට්ඨීහි, අට්ඨීභි |
| ක- | " | " " |
| ච - | අට්ඨිනො, අට්ඨිස්ස | අට්ඨීනං |
| ප - | අට්ඨිනා, අට්ඨිම්හා -ස්මා | අට්ඨීහි, අට්ඨීභි |
| ඡ- | අට්ඨිනො, අට්ඨිස්ස | අට්ඨීනං |
| ස- | අට්ඨිම්හි, අට්ඨිස්මිං | අට්ඨීසු |

මතු දැක්වෙන ශබ්දයෝ අට්ඨි ශබ්දය මෙන් වරනැගෙති.

1 සප්පි 2 දධි 2 වාරි 4 අක්ඛි 5 අච්චි.

---

1 සෙනග 2 යුක්තිය 3 කීර්තිය 4 මිදීම 5 පිණායාම 6 ඉවසීම 7 රශ්මිය 8 පෙළ 9 සිදුවීම 10 පිරිසිදුව 11 සෘද්ධිය 12 නුවණ 13 අවබෝධය 14 පොළොව 15 ජාතිය 16 ප්‍රීතිය 17 සතුට 18 තිරය 19 කෙළවර 20 ඇදහීම, 21 වැස්ස 22 සතුට 23 යටිය 24 පෙල 25 තියර 26 කැළිය 27 කවටකම, 28 ඇඟිල්ල 29 බෙරය 30 ඔරුව 31 වනය 32 සම;

1 කලව, 2 දී 3 ජලය 4 ඇස 5 ගිනිසිල;

# 15 පාඩම.

## 44 පුංලිඞ්ගික ඊකාරන්ත නාම.

දණ්ඩී (දඬු ඇත්තා.)

| | | |
|---|---|---|
| ප - | දණ්ඩී | දණ්ඩී, දණ්ඩිනො |
| ආ - | (භෙ) දණ්ඩි, | (භෙ) දණ්ඩී; දණ්ඩිනො |
| දු - | දණ්ඩිනං, දණ්ඩිං, | දණ්ඩී, දණ්ඩිනො |
| ත - | දණ්ඩිනා | දණ්ඩිහි, දණ්ඩීභි |
| ක - | ,, | ,, ,, |
| ච - | දණ්ඩිනො, දණ්ඩිස්ස, | දණ්ඩීනං |
| ප - | දණ්ඩිනා, දණ්ඩිම්හා, දණ්ඩිස්මා | දණ්ඩිහි, දණ්ඩීභි |
| ඡ - | දණ්ඩිනො, දණ්ඩිස්ස, | දණ්ඩීනං |
| ස - | දණ්ඩිනි, දණ්ඩිම්හි, දණ්ඩිස්මිං; | දණ්ඩීසු, දණ්ඩිසු |

පහත දැක්වෙන ශබ්දයෝ දණ්ඩී ශබ්දය මෙන් වර නැඟෙති.

1 ඤාණී 2 හත්ථී 3 චක්කී 4 පක්ඛී 5 දාඨී 6 ඡත්තී 7 මාලී 8 වම්මී 9 භාගී 10 භොගී 11 සාමී 12 ධජී 13 ගණී 14 සසී 15 යානී 16 දන්තී 17 කරී 18 චාගී 19 කුසලී 20 මුසලී 21 බලී 22 පාපකාරී 23 ධම්මවාදී 24 සීහනාදී 25 භූමිසායී.

## 45 ඉත්ථිලිංගික ඊකාරාන්ත නාම.

ඉත්ථි (ගැහැණිය)

| | | |
|---|---|---|
| ප - | ඉත්ථි | ඉත්ථී, ඉත්ථියො |
| ආ - | (භෙ) ඉත්ථි | ඉත්ථී, ඉත්ථියො |
| දු - | ඉත්ථියං, ඉත්ථිං | ඉත්ථී, ඉත්ථියො |

---

1 නුවණැත්තා 2 අත්ඇත්තා 3 චක්‍රඇත්තා 4 පියාඇත්තා 5 දළඇත්තා 6 ඡත්‍රඇත්තා 7 මාලාඇත්තා 8 වර්මඇත්තා 9 කොටස් ඇත්තා 10 නාගයා 11 හිමියා 12 ධජඇත්තා 13 සමූහ ඇත්තා 14 සඳ 15 යානඇත්තා 16 දත්ඇත්තා 17 ඇතා 18 ත්‍යාගඇත්තා 19 කුසල් කරන්නා 20 බල හද්‍රයා 21 බලයඇත්තා 22 පව් කරන්නා 23 ධර්මවාදියා 24 සිංහනාද කරන්නා 25 බිම හොවින්නා.

| | | |
|---|---|---|
| ත- | ඉත්ථියා | ඉත්ථීහි, ඉත්ථීභි |
| ක- | ,, | ,, ,, |
| ච- | ඉත්ථියා | ඉත්ථීනං |
| ප- | ඉත්ථියා | ඉත්ථීහි, ඉත්ථීභි |
| ඡ- | ඉත්ථියා | ඉත්ථීනං |
| ස- | ඉත්ථියං, ඉත්ථියා | ඉත්ථීසු |

පහත දැක්වෙන ශබ්ද 'ඉත්ථී' ශබ්දයමෙන් වරනැගෙති.

1 මාතුලානී 2 අය්‍යකානී 3 මානවී 4 නාවිකී 5 වේනතෙය්‍යී 6 ගෝතමී 7 ගුණවතී 8 මහසී 9 භොතී 10 භික්ඛුණී 11 දණ්ඩිනී 12 රාජිනී

## නදී (ගඟ)

| | | |
|---|---|---|
| ප | නදී | නදී, නජ්ජෝ, නදියෝ |
| ආ | (හෙ) නදි | (හෙ) නදී, නජ්ජෝ, නදියෝ. |
| දු- | නදියං, නදිං | නදී, නජ්ජෝ, නදියෝ |
| ත- | නජ්ජා, නදියා | නදීහි, නදීභි |
| ක- | ,, ,, | ,, ,, |
| ච- | නජ්ජා-නදියා | නදීනං |
| ප | නජ්ජා, නදියා | නදීහි, නදීභි |
| ඡ- | නජ්ජා-නදියා | නදීනං |
| ස- | නජ්ජං, නදියං, නදියා | නදීසු, |

**පහත සඳහන් ශබ්දයෝ නදී ශබ්දය මෙන් වර නැගෙති.**

1 මහී 2 වේතරණී 3 වාපී 4 පාටලී 5 කදලී 6 නාරී, කුමාරී තරුණී 7 වාරුණී 8 බ්‍රාහ්මණී 9 සඛී 10 නාගී 11 දේවී 12 යක්ඛී 13 අජී 14 මිගී 15 වානරී 16 කුක්කුටී 17 සීහී 18 හංසී.

**සැ**, නදී ශබ්දය 'නජ්ජෝ' යි සිද්ධවූවාක් මෙන් වේතරණී ශබ්දය 'වේතරඤ්ඤෝ' යි සිද්ධ වේ.

---

1 නැන්දා, 2 අත්තා, 3 මානවිකාව, 4 නාවික ස්ත්‍රී, 5 ගරුඩමාතාව, 6 ගෞතමිය 7 ගුණ ඇත්ති, 8 පිදීයයුතු ස්ත්‍රිය, 9 පින්වත් ස්ත්‍රිය, 10 භික්ෂුණිය, 11 දඬුගත් ස්ත්‍රිය, 12 රැජිනිය.

1 පොළොව 2 එනම් නරකග 3 වැව 4 පළොල් 5 කෙසෙල් 6 ස්ත්‍රිය, 7 ඇතින්නිය, 8 බැමිණිය 9 යහළු ස්ත්‍රිය 10 නැයිත්ත 11 දේවිය 12 යක්ෂණිය 13 එළදෙන 14 මුවදෙන 15 වැඳිරිය 16 කිකිළිය 17 සිංහදෙනුව, 18 හංසිය

## 46 නපුංසක ලිඞ්ගික ඊකාරාන්ත නාම.

### දණ්ඩී (දඬුගත් කුලය)

| | | |
|---|---|---|
| ප - | දණ්ඩි | දණ්ඩීනි, දණ්ඩී |
| ආ - | (හෙ) දණ්ඩි | (හෙ) දණ්ඩීනි, දණ්ඩී |
| දු - | දණ්ඩිං | දණ්ඩීනි, දණ්ඩී |
| ත - | දණ්ඩිනා | දණ්ඩීහි, දණ්ඩීභි |
| කා - | ,, | ,, ,, |
| ච - | දණ්ඩිනො, දණ්ඩිස්ස | දණ්ඩීනං |
| ප - | දණ්ඩිනා, දණ්ඩිම්හා-ස්මා; | දණ්ඩීහි, දණ්ඩීභි |
| ඡ - | දණ්ඩිනො, දණ්ඩිස්ස | දණ්ඩීනං |
| ස - | දණ්ඩිනි, දණ්ඩිම්හි-ස්මිං; | දණ්ඩීසු |

සුඛකාරී (සුවකරන්නා) සීඝයායි (ඉක්මනට යන්නා) යනා ශබ්දයෝ ද මෙසේම වරනැගෙති.

---

## 16 පාඩම.

## 47 පුල්ලිඞ්ගික උකාරාන්ත නාම.

### භික්ඛු (මහණ)

| | | |
|---|---|---|
| ප - | භික්ඛු | භික්ඛවෝ, භික්ඛූ |
| ආ - | (භො) භික්ඛු | භික්ඛවෝ, භික්ඛූ |
| දු - | භික්ඛුං | භික්ඛවෝ, භික්ඛූ |
| ත - | භික්ඛුනා | භික්ඛූහි, භික්ඛූභි |
| කා - | ,, | ,, ,, |
| ච - | භික්ඛුනො, භික්ඛුස්ස | භික්ඛූනං |
| ප - | භික්ඛුනා, භික්ඛුම්හා-ස්මා; | භික්ඛූහි, භික්ඛූභි |
| ඡ - | භික්ඛුනො, භික්ඛුස්ස | භික්ඛූනං |
| ස - | භික්ඛුම්හි, භික්ඛුස්මිං | භික්ඛූසු, භික්ඛුසු |

### හේතු (හේතුව)

| | | |
|---|---|---|
| ප - | හෙතු | හේතූ, හේතවෝ, හේතුයෝ |
| ආ - | (හෙ) හෙතු | (හෙ) හේතූ, හේතවෝ, හේතුයෝ |
| දු - | හේතුං | හේතූ, හේතවෝ, හේතුයෝ |

සෙස්ස භික්ඛු ශබ්දය මෙනි.

### ජන්තු (සත්වයා)

ප - ජන්තු ජන්තූ ජන්තවො ජන්තුනො, ජන්තුයො
ආ - (භෙ) ජන්තු ජන්තූ ජන්තවො ජන්තුනො ජන්තුයො
දු - ජන්තුං ජන්තූ ජන්තවො ජන්තුනො, ජන්තුයො

සෙස්ස භික්ඛු ශබ්දය මෙනි.

## 48 පුල්ලිඞ්ගික උකාරාන්ත විශෙෂ නාම.

### සත්ථු (බුදුරජ)

ප - සත්ථා සත්ථාරො
ආ - (භෙ) සත්ථ, සත්ථා සත්ථාරො
දු - සත්ථාරං සත්ථාරෙ, සත්ථාරො
ත - සත්ථාරා සත්ථාරෙහි, සත්ථාරෙභි
ක - " " "
ච - සත්ථු, සත්ථුනො, සත්ථුස්ස, සත්ථාරානං, සත්ථානං
ප - සත්ථාරා සත්ථාරෙහි, සත්ථාරෙභි
ඡ - සත්ථු, සත්ථුනො, සත්ථුස්ස; සත්ථාරානං, සත්ථානං
ස - සත්ථරි සත්ථාරෙසු

පහත සඳහන් ශබ්දයෝද මෙසේ වරනගන්න.

1 කත්තු 2 භත්තු 3 වත්තු 4 නෙත්තු 5 සොත්තු 6 ඤාතු 7 ජෙතු 8 ඡෙත්තු 9 දාතු 10 ධාතු 11 නත්තු 12 බොද්ධු 13 විඤ්ඤාපෙතු

සං. කත්තු ශබ්දයාගේ චතුර්ථී ෂෂ්ඨී බහුවචනයන්හි වැඩිපුර 'කත්තූනං' යන පදය ද සත්තමී බහුවචනයෙහි 'කත්තූසු' යි පදයක්ද සිද්ධවේ.

### පිතු (පියා)

ප - පිතා පිතරො
ආ - (භෙ) පිත පිතා; (භෙ) පිතරො
දු - පිතරං පිතරෙ, පිතරො

---

1 කර්තෘ 2 පෝෂණකරන්නා 3 කියන්නා 4 නායකයා 5 අසන්නා 6 දන්නා 7 දිනන්නා 8 කපන්නා 9 දෙන්නා 10 දරන්නා 11 මුනුපුරා 12 අවබොධකරන්නා 13 දන්වන්නා.

| | | |
|---|---|---|
| ත – | පිතරා | පිතරෙහි, පිතරෙභි, පිතූහි, පිතූභි |
| ක – | ” | ” ” ” ” |
| ච – | පිතු, පිතුනො, පිතුස්ස; | පිතරානං, පිතානං, පිතූනං |
| ප – | පිතරා | පිතරෙහි, පිතරෙභි, පිතූහි, පිතූභි |
| ඡ – | පිතු, පිතුනො, පිතුස්ස; | පිතරානං, පිතානං, පිතූනං |
| ස – | පිතරි | පිතරේසු; |

## 49 ස්ත්‍රී ලිංගික උකාරාන්ත නාම.

### යාගු (කැඳ)

| | | |
|---|---|---|
| ප – | යාගු | යාගූ, යාගුයෝ |
| ආ – | (භො) යාගු | (භො) යාගූ, යාගුයෝ |
| දු – | යාගුං | යාගූ, යාගුයෝ |
| ත – | යාගුයා | යාගූහි, යාගූභි |
| ක – | ” | ” ” |
| ච – | යාගුයා | යාගූනං |
| ප – | යාගුයා | යාගූහි, යාගූභි |
| ඡ – | යාගුයා | යාගූනං |
| ස – | යාගුයං, යාගුයා | යාගූසු |

1 ධාතු 2 ධෙනු 3 කාසු 4 දද්දු 5 කණ්ඩු 6 රජ්ජු 7 කණෙරු 8 පියඞ්ගු යන ශබ්දයෝද යාගු ශබ්දය මෙන් වරනැගෙත්.

## 50 ස්ත්‍රී ලිංගික විශෙෂ උකාරාන්ත නාම.

### මාතු (මවු)

| | | |
|---|---|---|
| ප – | මාතා | මාතරෝ |
| ආ – | (භො) මාත, මාතා; | (භො) මාතරෝ |
| දු – | මාතරං | මාතරෙ, මාතරෝ |
| ත – | මාතුයා, මාතරා, මාත්‍යා; | මාතරෙහි, මාතරෙභි, මාතූහි, මාතූභි |
| ක – | ” ” | ” ” ” ” |
| ච – | මාතු, මාතුයා | මාතරානං, මාතූනං |

1 ධාතුව 2 දෙන 3 වළු 4 දදය 5 කැසීම 6 රැහැණ 7 ඇතින්න 8 පුවඟු.

ප – මාතුයා, මාතරා මාතරෙහි, මාතරෙභි, මාතූහි, මාතූභි
ඡ – මාතු, මාතුයා මාතරානං, මාතානං, මාතූනං
ස – මාතරි මාතරෙසු, මාතූසු

ධීතු, දුහිතු (=දූ) ශබ්ද ද මෙසේ වරනගන්න.

### 51 නපුංසක ලිංගික උකාරාන්ත නාම.

ආයු (ආයුෂ)

| | | |
|---|---|---|
| ප – | ආයු | ආයූනි, ආයූ |
| ආ – | (භො) ආයු | (භො) ආයූනි, ආයූ |
| දු – | ආයුං | ආයූනි, ආයූ |
| ත – | ආයුනා, ආයුසා | ආයූහි, ආයූභි |
| ක – | ” ” | ” ” |
| ච – | ආයුනො, ආයුස්ස | ආයූනං |
| ප – | ආයුනා, ආයුම්හා, ආයුස්මා; | ආයූහි, ආයූභි |
| ඡ – | ආයුනො, ආයුස්ස | ආයූනං |
| ස – | ආයුම්හි, ආයුස්මිං | ආයූසු, ආයූසු |

පහත සඳහන් වන ශබ්දයෝද මෙසේ වරනගන්න.

1 චක්ඛු 2 වපු 3 ධනු 4 දාරු 5 තිපු 6 මධු 7 සිඟු 8 හිඞ්ගු 9 වත්ථු 10 ජතු 11 අම්බු 12 අස්සු;

---

## 17 පාඩම.

### 52 පුංලිඞ්ගික ඌකාරාන්ත නාම.

අභිභූ (අභිනවනකළ අය)

| | | |
|---|---|---|
| ප | අභිභූ | අභිභූ, අභිභුවො |
| අ | (භො) අභිභූ | (භො) අභිභූ, අභිභුවො |
| දු | අභිභුං | අභිභූ, අභිභුවො |

1. ඇස 2. ධනය 3. දුන්න 4. දර 5. ඊයම් 6. මී 7. මුරුංගා 8. පෙරුම්කායම් 9. වස්තුව 10. ලාකඩ 11. ජලය 12. කඳුලු;

| | | |
|---|---|---|
| ත | අභිභූනා | අභිභූහි අභිභූභි |
| ක | ,, | ,, ,, |
| ච | අභිභුනො, අභිභුස්ස | අභිභූනං |
| ප | අභිභූනා, අභිභුම්හා-ස්මා; | අභිභූහි, අභිභූභි |
| ජ | අභිභුනො, අභිභුස්ස | අභිභූනං |
| ස | අභිභුම්හි, අභිභුස්මිං | අභිභූසු |

13 සයම්භූ පරාභිභූ ශබ්දයෝද මෙසේම වරනගන්න.

## 53 ස්ත්‍රී ලිඞ්ගික ඌකාරාන්ත නාම

### ජම්බූ (දඹ)

| | | |
|---|---|---|
| ප. | ජම්බූ | ජම්බූ, ජම්බුයෝ |
| ආ | (හෙ) ජම්බු | (හෙ) ජම්බූ, ජම්බුයෝ |
| දු | ජම්බුං | ජම්බූ, ජම්බුයො |
| ත | ජම්බුයා | ජම්බූහි, ජම්බූභි |
| ක | ,, | ,, ,, |
| ච | ජම්බුයා | ජම්බූනං |
| ප | ජම්බුයා | ජම්බූහි, ජම්බූභි |
| ජ | ජම්බුයා | ජම්බූනං |
| ස | ජම්බුයං ජම්බුයා, | ජම්බූසු |

පහත සඳහන් වන ශබ්දයෝද මෙසේ වරනැගෙති

1 වධූ 2 සරභූ 3 සරබූ 4 චමූ 5 වාමූරූ 6 නාගනාසූරූ

## 54 නපුංසක ලිඞ්ගික ඌකාරාන්ත නාම

### ගොත්‍රභූ

| | | |
|---|---|---|
| ප | ගෝත්‍රභූ | ගෝත්‍රභූ, ගෝත්‍රභූනි |
| ආ | (හෙ) ගොත්‍රභු | (හෙ) ගොත්‍රභූ ගෝත්‍රභූනි |
| දු | ගොත්‍රභුං | ගොත්‍රභූ, ගොත්‍රභූනි |
| ත | ගෝත්‍රභුනා | ගෝත්‍රභූහි, ගෝත්‍රභූභි |
| ච | ගෝත්‍රභුනො, ගෝත්‍රභුස්ස; | ගෝත්‍රභූනං |

---

13 තමාමම දැනගත්තේ, අනුන් අභිභවනය කළේ;

1 ස්ත්‍රිය 2 එතඹ මුවදෙන 3 සිඝාතලා 4 සේනාව 5 මනාකලවා ඇත්තී
6. ඇත්සොඬ වැනි සුන්දර කලවා ඇති ස්ත්‍රිය.

පං ගෝත්‍රභුනා, ගෝත්‍රභුම්හා-ස්මා- ගෝත්‍රභූහි, ගෝත්‍රභූභි
ඡ ගෝත්‍රභුස්ස, ගොත්‍රභුස්ස - ගෝත්‍රභූනං
ස ගෝත්‍රභුම්හි, ගෝත්‍රභුස්මිං--ගෝත්‍රභූසු, ගෝත්‍රභූසු;

අභිභූ, සයම්භූ, ධම්මඤ්ඤූ [1] ශබ්දයෝද මෙසේ වර නැඟෙති.

---

## 18 පාඩම.

### 55 පුල්ලිඞ්ග ඕකාරාන්ත නාම.

**ගෝ (ගවයා)**

| | | |
|---|---|---|
| ප | ගෝ | ගාවෝ, ගවෝ |
| ආ (භෝ) | ගෝ | (භෝ) ගාවෝ, ගවෝ |
| දු | ගාවුං, ගාවං, ගවං | ගාවෝ, ගවෝ |
| ත- | ගාවේන ගවේන | ගෝහි, ගෝභි |
| ක- | ,, ,, | ,, ,, |
| ච- | ගාවස්ස, ගවස්ස | ගවං, ගුන්නං, ගෝනං |
| පං- | ගාවා, ගවා, ගාවම්හා, ගවම්හා, ගාවස්මා, | ගෝහි, ගෝභි |
| ඡ- | ගාවස්ස - ගවස්ස | ගවං, ගුන්නං, ගෝනං |
| ස- | ගාවේ, ගවේ, ගාවම්හි ගවම්හි, ගාවස්මිං, ගවස්මිං; | ගාවේසු, ගවේසු ගෝසු |

### 56 ස්ත්‍රීලිඞ්ගික ඕකාරාන්ත නාම

**ගෝ (දෙන)**

| | | |
|---|---|---|
| ප | ගෝ | ගාවෝ, ගවෝ |
| ආ (භෝ) | ගෝ | (භෝ) ගාවෝ, ගවෝ |
| දු | ගාවුං, ගාවං, ගවං | ගාවෝ, ගවෝ |
| ත | ගාවේන, ගවේන | ගෝහි, ගෝභි |
| ක | ,, ,, | ,, ,, |

---

1. එතනෙහි ශබ්දය නපුංසක ලිංගයෙහි නිති අනුව උකාරාන්ත බවට හැරේ එකල 'ආයු' ශබ්දය මෙනි.

| | | |
|---|---|---|
| ච | ගාවස්ස, ගවස්ස | ගවං, ගුන්නං, ගෝනං |
| ප | ගාවා, ගවා, ගාවම්හා, ගවම්හා; –ගාවස්මා, ගවස්මා | ගෝහි, ගෝභි |
| ඡ | ගාවස්ස, ගවස්ස, | ගවං, ගුන්නං, ගෝනං |
| ස | ගාවෙ, ගවෙ, ගාවම්හි, ගවම්හි, ගාවස්මිං, ගවස්මිං; | ගාවෙසු ගවෙසු –ගෝසු |

### 67 [1] නපුංසක ලිඞ්ගික ඕකාරාන්ත නාම

**චිත්තගෝ** (=චිත්තගු = චිත්තගූ)

| | | |
|---|---|---|
| ප- | චිත්තගු | චිත්තගූ, චිත්තගූනි |
| ආ-(භො) | චිත්තගු | චිත්තගූ, චිත්තගූනි |
| දු | චිත්තගුං | චිත්තගූ, චිත්තගූනි |
| ත | චිත්තගුනා | චිත්තගූහි, චිත්තගූභි |
| ක | ” | ” ” |
| ච- | චිත්තගුනෝ, චිත්තගුස්ස | චිත්තගූනං |
| ප- | චිත්තගුනා, චිත්තගුම්හා, –චිත්තගුස්මා | චිත්තගූහි, චිත්තගූභි |
| ඡ- | චිත්තගුනෝ, චිත්තගුස්ස | චිත්තගූනං |
| ස- | චිත්තගුම්හි, චිත්තගුස්මිං; | චිත්තගූසු, චිත්තගූසු |

---

## 19 පාඩම.

සර්වනාමයෝ නාම සඞ්ඛ්‍යාවට ම ගැණෙති. වෙසෙසක් නොසලකා පුංස්ත්‍රී නපුංසක යන සියල්ලටම එක ලෙස භාවිත කරන්ට හැකි හෙයින් මොවුහු මේ නම ලබති. එහෙත් පද සිද්ධියෙහිදී මොවුන්ගේද ලිඞ්ග භේදය ඇත. එහෙයින් මේ හැම ශබ්දයක් ම ලිඞ්ගත්‍රයෙහි වෙන වෙන ම වරනැගේ.

---

1 චිත්තගෝ ශබ්දය නපුංසක ලිඞ්ගයෙහි නීති අනුව උකාරාන්ත බවට හැරේ. එකල ‘ආයු’ ශබ්දය මෙනි.

සබ්බ, කතර, කතම, උභය, ඉතර, අඤ්ඤ, අඤ්ඤතර, අඤ්ඤතම, පුබ්බ, පර, අපර, දක්ඛිණ, උත්තර, අධර, ය, ත, එත, ඉම, අමු, කිං, එක, තුම්හ, අම්හ, උභ, ද්වි, ති, චතු යන මේ සත්විස්ස සබ්බනාමයෝයි.

## අකාරාන්ත සබ්බනාම

**58 සබ්බ ශබ්දය ලිංගත්‍රයෙහි මෙසේ වරනැගේ.**

සබ්බ (සියල්ල) පුංලිඞ්ගයෙහි

| | | |
|---|---|---|
| ප- | සබ්බෝ | සබ්බේ |
| ආ- | (හෙ) සබ්බ, සබ්බා; | (හෙ) සබ්බේ |
| දු- | සබ්බං | සබ්බේ |
| ත- | සබ්බේන | සබ්බේහි, සබ්බේභි |
| කා- | " | " " |
| ච- | සබ්බස්ස | සබ්බේසං, සබ්බේසානං |
| ප- | සබ්බම්හා, සබ්බස්මා | සබ්බේහි, සබ්බේභි |
| ඡ- | සබ්බස්ස | සබ්බේසං, සබ්බේසානං |
| ස- | සබ්බම්හි, සබ්බස්මිං | සබ්බේසු |

ස්ත්‍රීලිංගයෙහි,

| | | |
|---|---|---|
| ප- | සබ්බා | සබ්බා, සබ්බායෝ |
| ආ- | (හෙ) සබ්බේ | (හෙ) සබ්බා සබ්බායෝ |
| දු- | සබ්බං | සබ්බා සබ්බායෝ |
| ත- | සබ්බාය | සබ්බාහි, සබ්බාභි |
| කා- | " | " " |
| ච- | සබ්බස්සා, සබ්බාය | සබ්බාසං, සබ්බාසානං |
| ප- | සබ්බාය | සබ්බාහි, සබ්බාභි, |
| ඡ- | සබ්බස්සා, සබ්බාය | සබ්බාසං, සබ්බාසානං |
| ස- | සබ්බස්සං, සබ්බායං | සබ්බාසු |

---

සියල්ල, කවර, කවර, විඅවයවය, ඉතිරි, අනික්, අනික්, නැගෙනහිර, බටහිර දකුණ උතුර, යට, යම්, ඒ, අර, මේ, මේ, කිම, එක, තුඹ මම, දෙක, දෙක, තුණ, සතර, සබ්බනාමයන්ගේ අර්ථ පිළිවෙළින් මෙසේ සලකන්න. ය, ත, එත ශබ්දයන්ගේ ආලපන විභක්තියක් නැත.

නපුංසක ලිංගයෙහි,

| | | |
|---|---|---|
| ප - | සබ්බං | සබ්බානි |
| ආ - | (භො) සබ්බ, සබ්බා; (භො) | සබ්බානි |
| දු - | සබ්බං | සබ්බෙ, සබ්බානි |
| ත - | සබ්බෙන | සබ්බෙහි, සබ්බෙභි |
| ක - | " | " " |
| ච - | සබ්බස්ස | සබ්බෙසං, සබ්බෙසානං |
| ප - | සබ්බම්හා, සබ්බස්මා | සබ්බෙහි, සබ්බෙභි |
| ඡ - | සබ්බස්ස | සබ්බෙසං, සබ්බෙසානං |
| ස - | සබ්බම්හි, සබ්බස්මිං | සබ්බෙසු |

කතර, කතම, උභය, ඉතර, අඤ්ඤ, අඤ්ඤතර, අඤ්ඤතම ශබ්දයෝද සබ්බ ශබ්දය මෙන් වර නැඟෙති.

ස්ත්‍රී ලිඞ්ගික 'ඉතර අඤ්ඤ' ශබ්දයන්ගේ චතුර්ථී ෂෂ්ඨී සප්තමී ඒකවචනයෝ මෙසේ සැලකිය යුත්තාහුය.

ඉතර,

ච - ඉතරිස්සාය, ඉතරිස්සා, ඉතරාය
ඡ - " " "
ස - ඉතරිස්සං ඉතරායං ඉතරාය

අඤ්ඤ

ච - අඤ්ඤිස්සාය අඤ්ඤිස්සා, අඤ්ඤාය
ඡ - " " "
ස - අඤ්ඤිස්සං අඤ්ඤායං අඤ්ඤාය

**59 අකාරාන්ත සර්වනාම පුබ්බ ශබ්දය ලිඞ්ගත්‍රයෙහි,**

| | | |
|---|---|---|
| ප - | පුබ්බා | පුබ්බෙ, පුබ්බා |
| ආ - | (භො) පුබ්බ, පුබ්බා; | (භො) පුබ්බෙ, පුබ්බා |
| දු - | පුබ්බං | පුබ්බෙ |
| ත - | පුබ්බෙන | පුබ්බෙහි, පුබ්බෙභි |
| ක - | " | " " |
| ච - | පුබ්බස්ස | පුබ්බෙසං, පුබ්බෙසානං |

| | | |
|---|---|---|
| ප – | පුබ්බා, පුබ්බම්හා, පුබ්බස්මා; | පුබ්බෙහි, පුබ්බෙභි |
| ඡ – | පුබ්බස්ස | පුබ්බෙසං, පුබ්බෙසානං |
| ස – | පුබ්බෙ, පුබ්බම්හි, පුබ්බස්මිං; | පුබ්බෙසු |

## ස්ත්‍රී ලිංගයෙහි

| | | |
|---|---|---|
| ප - | පුබ්බා | පුබ්බා, පුබ්බායො |
| ආ - | (භො) පුබ්බෙ | (භො) පුබ්බා, පුබ්බායො |
| දු – | පුබ්බං | පුබ්බා, පුබ්බායො |
| ත– | පුබ්බාය | පුබ්බාහි, පුබ්බාභි |
| ක– | ,, | ,, ,, |
| ච – | පුබ්බස්සා, පුබ්බාය | පුබ්බාසං, පුබ්බාසානං |
| ප – | පුබ්බාය | පුබ්බාහි, පුබ්බාභි |
| ඡ – | පුබ්බස්සා, පුබ්බාය | පුබ්බාසං, පුබ්බාසානං |
| ස – | පුබ්බස්සං, පුබ්බායං | පුබ්බාසු |

## නපුංසක ලිංගයෙහි

| | | |
|---|---|---|
| ප – | පුබ්බං | පුබ්බා, පුබ්බානි |
| ආ– | (භො) පුබ්බ | (භො) පුබ්බා, පුබ්බානි |
| දු – | පුබ්බං | පුබ්බානි |
| ත - | පුබ්බෙන | පුබ්බෙහි, පුබ්බෙභි |
| ක - | ,, | ,, ,, |
| ච – | පුබ්බස්ස | පුබ්බෙසං, පුබ්බෙසානං |
| ප – | පුබ්බා, පුබ්බම්හා, පුබ්බස්මා; | පුබ්බෙහි, පුබ්බෙභි |
| ඡ - | පුබ්බස්ස | පුබ්බෙසං, පුබ්බෙසානං |
| ස – | පුබ්බෙ, පුබ්බම්හි, පුබ්බස්මිං; | පුබ්බෙසු |

1 පර 2 අපර 3 දක්ඛිණ 4 උත්තර 5 අධර ශබ්දයෝද මෙසේ වරනැගෙති.

## 20 වැනි පාඩම.

### 60 අකාරාන්ත සර්වනාම ත ශබ්දය ලිඞ්ගත්‍රයෙහි.

#### ත (ඒ) පුල්ලිඞ්ගයෙහි

| | | |
|---|---|---|
| ප - | සෝ | නේ, තේ |
| දු - | නං, තං | නේ, තේ |
| ත - | නේන, තේන | නේහි, තේහි, නේභි, තේභි |
| කා - | " " | " " " " |
| ච - | නස්ස, තස්ස, අස්ස | නේසං, නේසානං, තේසං, -තේසානං |
| ප - | නම්හා, තම්හා, නස්මා, තස්මා. | නේහි, තේහි, නේභි, තේභි |
| ඡ - | නස්ස, තස්ස, අස්ස | නේසං, නේසානං, තේසං, -තේසානං |
| ස - | නම්හි, තම්හි, නස්මිං, තස්මිං; | නේසු, තේසු |

#### ස්ත්‍රී ලිඞ්ගයෙහි

| | | |
|---|---|---|
| ප - | සා | නා, නායෝ, තා, තායෝ |
| දු - | න , තං | නා, නායෝ, තා, තායෝ |
| ත - | නාය තාය | නාහි, තාහි, නාභි, තාභි |
| කා - | " " | " " " " |
| ච - | තිස්සාය, තිස්සා -තස්සා, තාය | තාසං, තාසානං |
| ප - | නාය, තාය | නාහි, තාහි, නාභි, තාභි |
| ඡ - | තිස්සාය, තිස්සා, තස්සා, තාය; | තාසං, තාසානං |
| ස - | තිස්සං, තස්සං, තායං; | නාසු, තාසු |

#### නපුංසක ලිඞ්ගයෙහි.

| | | |
|---|---|---|
| ප | නං, තං | නේ, නානි, තේ, තානි |
| දු - | නං, තං | නේ, නානි, තේ, තානි |
| ත - | නේන, තේන | නේහි, තේහි, නේභි, තේභි |
| කා - | " " | " " " " |

ච – නස්ස, තස්ස, අස්ස: නේසං, නේසානං, තේසං, – තේසානං;

ප – නම්හා, තම්හා, නස්මා, තස්මා; නේහි, තේහි, නේභි, තේභි

ඡ – නස්ස, තස්ස, අස්ස නේසං, නේසානං, තේසං, – තේසානං;

ස – නම්හි, තම්හි, නස්මිං, තස්මිං; නේසු, තේසු

**61 අකාරාන්ත සර්වනාම එත ශබ්දය ලිඞ්ගත්‍රයෙහි එත (= තෙල) පුංලිඞ්ගයෙහි.**

ප – ඒසෝ ඒතේ
දු – ඒතං ඒතේ
ත – ඒතේන ඒතේහි, ඒතේභි
ක – ,, ,, ,,
ච – ඒතස්ස ඒතේසං, ඒතේසානං
ප – ඒතම්හා, ඒතස්මා ඒතේහි, ඒතේභි
ඡ – ඒතස්ස ඒතේසං, ඒතේසානං
ස – ඒතම්හි, ඒතස්මිං ඒතේසු

ස්ත්‍රී ලිඞ්ගයෙහි

ප – ඒසා ඒතා, ඒතායෝ
දු – ඒතං ඒතා, ඒතායෝ
ත – ඒතාය ඒතාහි, ඒතාභි
ක – ,, ,, ,,
ච – ඒතිස්සාය, ඒතිස්සා, ඒතාය, ඒතාසං, ඒතාසානං
ප – ඒතාය ඒතාහි, ඒතාභි
ඡ – ඒතිස්සාය, ඒතිස්සා, ඒතාය: ඒතාසං, ඒතාසානං
ස – ඒතිස්සං, ඒතාසං, ඒතායං ඒතාසු

නපුංසක ලිඞ්ගයෙහි

ප – ඒතං ඒතේ, ඒතානි
දු – ඒතං ඒතේ, ඒතානි
ත – ඒතේන ඒතේහි, ඒතේභි
ක – ,, ,, ,,

| | | |
|---|---|---|
| ච - | ඒතස්ස | ඒතේසං, ඒතේසානං |
| ප - | ඒතම්හා, ඒතස්මා | ඒතේහි, ඒතේභි |
| ඡ - | ඒතස්ස | ඒතේසං, ඒතේසානං |
| ස - | ඒතම්හි, ඒතස්මිං | ඒතේසු |

## 62 අකාරාන්ත සර්වනාම ය ශබ්දය ත්‍රිලිඞ්ගයෙහි

### ය (=යම්) පුල්ලිඞ්ගයෙහි

| | | |
|---|---|---|
| ප - | යෝ | යේ |
| දු - | යං | යේ |
| ත - | යේන | යේහි, යේභි |
| ක - | ,, | ,, ,, |
| ච - | යස්ස | යේසං, යේසානං |
| ප - | යම්හා, යස්මා | යේහි, යේභි |
| ඡ - | යස්ස | යේසං, යේසානං |
| ස - | යම්හි, යස්මිං | යේසු |

### ස්ත්‍රී ලිඞ්ගයෙහි

| | | |
|---|---|---|
| ප - | යා | යා, යායෝ |
| දු - | යං | යා, යායෝ |
| ත - | යාය | යාහි, යාභි |
| ක - | ,, | ,, ,, |
| ච - | යස්සා, යාය | යාසං, යාසානං |
| ප - | යාය | යාහි, යාභි |
| ඡ - | යස්සා, යාය | යාසං, යාසානං |
| ස - | යස්සං, යායං | යාසු |

### නපුංසක ලිඞ්ගයෙහි

| | | |
|---|---|---|
| ප - | යං | යේ, යානි |
| දු - | යං | යේ, යානි |
| ත - | යේන | යේහි, යේභි |
| ක - | ,, | ,, ,, |
| ච - | යස්ස | යේසං, යේසානං |
| ප - | යම්හා, යස්මා | යේහි, යේභි |
| ඡ | යස්ස | යේසං, යේසානං |
| ස - | යම්හි, යස්මිං | යේසු |

# 21 පාඩම.

## 63 අකාරාන්ත සර්වනාම ඉම ශබ්දය ලිඞ්ගත්‍රයෙහි

### ඉම (=මේ) පුල්ලිංගයෙහි

| | | |
|---|---|---|
| ප - | අයං | ඉමේ |
| දු - | ඉමං | ඉමේ |
| ත - | අනෙන - ඉමිනා | ඒහි, ඒභි, ඉමේහි, ඉමේභි |
| ක | ” ” | ” ” ” ” |
| ච - | අස්ස, ඉමස්ස | ඒසං, ඒසානං, ඉමේසං, ඉමේසානං |
| ප - | අස්මා, ඉමම්හා, ඉමස්මා; | ඒහි, ඒභි, ඉමේහි, ඉමේභි, |
| ඡ - | අස්ස, ඉමස්ස | ඒසං, ඒසානං, ඉමේසං, ඉමේසානං |
| ස - | අස්මිං, ඉමම්හි, ඉමස්මිං; | ඒසු, ඉමේසු |

### ස්ත්‍රී ලිංගයෙහි

| | | |
|---|---|---|
| ප - | අයං | ඉමා, ඉමායෝ |
| දු - | ඉමං | ඉමා, ඉමායෝ |
| ත - | ඉමාය | ඉමාහි, ඉමාභි |
| ක - | ” | ” ” |
| ච - | අස්සාය, අස්සා, ඉමිස්සාය, ඉමිස්සා, ඉමාය; | ඉමාසං, ඉමාසානං |
| ප - | ඉමාය, | ඉමාහි, ඉමාභි |
| ඡ - | අස්සාය, අස්සා, ඉමිස්සාය, | ඉමාසං, ඉමාසානං |
| ස - | අස්සං, ඉමිස්සං, ඉමායං; | ඉමාසු |

### නපුංසක ලිංගයෙහි

| | | |
|---|---|---|
| ප - | ඉදං, ඉමං | ඉමේ, ඉමානි |
| දු - | ඉදං, ඉමං | ඉමේ, ඉමානි |
| ත= | අනේන, ඉමිනා | ඒහි, ඒභි, ඉමේහි, ඉමේභි |
| ක- | ” ” | ” ” ” ” |

| | | |
|---|---|---|
| ච - | අස්ස, ඉමස්ස | ඒසං, ඒසානං, ඉමේසං, ඉමේසානං |
| ප - | අස්මා, ඉමම්හා, ඉමස්මා; | ඒහි, ඒභි, ඉමේහි, ඉමේභි |
| ඡ - | අස්ස, ඉමස්ස | ඒසං, ඒසානං, ඉමේසං, ඉමේසානං |
| ස - | අස්මිං ඉමම්හි, ඉමස්මිං, | එසු, ඉමේසු |

**64 උකාරාන්ත සර්වනාම අමු ශබ්දය ලිඞ්ගත්‍රයෙහි**

අමු (= මේ) පුල්ලිඞ්ගයෙහි,

| | | |
|---|---|---|
| ප - | අසු, අසුකෝ, අමු, අමුකෝ | අසුකා, අමුකා, අමූ, අමුයෝ |
| දු - | අසුකං, අමුකං, අමුං, | අසුකෙ, අමුකෙ, අමූ, අමුයෝ |
| ත - | අමුනා | අමූහි, අමූභි |
| ක - | ,, | ,, ,, |
| ච - | අමුනෝ, අමුස්ස, අදුස්ස | අමූසං, අමූසානං |
| ප - | අමුනා, අමුම්හා, අමුස්මා | අමූහි, අමූභි, |
| ඡ - | අමුනෝ, අමුස්ස, අදුස්ස | අමූසං, අමූසානං |
| ස - | අමුම්හි, අමුස්මිං | අමූසු |

අමු, ස්ත්‍රීලිඞ්ගයෙහි,

| | | |
|---|---|---|
| ප - | අසු, අසුකා, අමු, අමුකා | අමූ, අමූයෝ, |
| දු - | අමුං | අමූ, අමූයෝ |
| ත - | අමුයා | අමූහි, අමූභි, |
| ක - | ,, | ,, ,, |
| ච - | අමුස්සා, අමුයා | අමූසං, අමූසානං |
| ප - | අමුයා | අමූහි, අමූභි |
| ඡ - | අමුස්සා, අමුයා | අමූසං, අමූසානං |
| ස - | අමුස්සං, අමුයං | අමූසු, |

අමු, නපුංසක ලිඞ්ගයෙහි

| | | |
|---|---|---|
| ප - | අදුං | අමූ, අමූනි, |
| දු - | අදුං | අමූ, අමූනි, |
| ත - | අමුනා | අමූහි, අමූභි, |
| ක - | ,, | ,, ,, |

| | | |
|---|---|---|
| ච – | අමුනො, අමුස්ස, අදුස්ස | අමූසං, අමූසානං |
| ප – | අමුනා, අමුම්හා, අමුස්මා | අමූහි, අමූභි |
| ඡ – | අමුනො, අමුස්ස, අදුස්ස, | අමූසං, අමූසානං |
| ස – | අමුම්හි, අමුස්මිං | අමූසු, |

## 65 නිග්ගහීතාන්ත සර්වනාම කිං ශබ්දය ලිඞ්ගත්‍රයෙහි

### [1] කිං (=කිම) පුල්ලිඞ්ගයෙහි

| | | |
|---|---|---|
| ප – | කො | කෙ |
| දු – | කං | කෙ |
| ත – | කේන | කේහි, කේභි |
| ක – | ” | ” ” |
| ච – | කස්ස, කිස්ස | කේසං, කේසානං |
| ප – | කම්හා, කස්මා, කිස්මා | කේහි, කේභි |
| ඡ – | කස්ස, කිස්ස | කේසං, කේසානං |
| ස – | කම්හි, කස්මිං, කිම්හි, කිස්මිං; | කේසු |

### කිං ස්ත්‍රී ලිංගයෙහි

| | | |
|---|---|---|
| ප – | කා | කා, කායො |
| දු – | කං | කා, කායො |
| ත – | කාය | කාහි, කාභි |
| ක – | ” | ” ” |
| ච – | කාස්සා, කාය | කාසං, කාසානං |
| ප – | කාය | කාහි, කාභි |
| ඡ – | කාස්සා, කාය | කාසං, කාසානං |
| ස – | කාස්සං, කායං | කාසු |

### කිං, නපුංසක ලිඞ්ගයෙහි

| | | |
|---|---|---|
| ප – | කිං කං | කේ, කානි |
| දු – | කිං, කං | කේ, කානි |
| ත – | කේන | කේහි, කේභි |
| ක – | ” | ” ” |
| ච – | කිස්ස, කස්ස | කේසං, කේසානං |
| ප – | කිස්මා, කස්මා, කම්හා; | කේහි, කේභි |
| ඡ – | කිස්ස, කස්ස | කේසං, කේසානං |
| ස – | කිම්හි, කිස්මිං, කම්හි, කස්මිං; | කේසු |

1 කිං ශබ්දයට තුන් ලිඟුයෙහිදී සියලු විබත්වලදීම ‘ක’ ආදේශව පද සිද්ධිය වේ. එකල අකාරාන්ත නාමයක් මෙන් විභක්තිවලට වරනැගේ.

## 66 අකාරාන්ත සර්වනාම තුම්හ ශබ්දය,

### තුම්හ (=නුඹ)

| | | |
|---|---|---|
| ප - | ත්වං, තුවං | තුම්හෙ |
| දු - | තං, තවං, ත්වං, තුවං; | තුම්හාකං, තුම්හෙ |
| ත - | ත්වයා, තයා | තුම්හේහි, තුම්හේභි |
| ක - | ,, ,, | ,, ,, |
| ච - | තව, තුය්හං, තුම්හං | තුම්හාකං, තුම්හෙ |
| ප - | ත්වයා, තයා | තුම්හේහි, තුම්හේභි |
| ඡ - | තව, තුය්හං, තුම්හං | තුම්හාකං, තුම්හේ |
| ස - | ත්වයං, තයං | තුම්හේසු |

තුන් ලිඟුයෙහිම මෙසේමය.

## 67 අකාරාන්ත සර්වනාම අම්හ ශබ්දය

### අම්හ (= මා)

| | | |
|---|---|---|
| ප - | අහං | මයං, අම්හේ |
| දු - | මං, මමං | අම්හාකං, අම්හේ |
| ත - | මයා, | අම්හේහි, අම්හේභි |
| ක - | ,, | ,, ,, |
| ච - | මම, මය්හං, අම්හං, මමං; | අම්හාකං, අස්මාකං, අම්හේ |
| ප - | මයා | අම්හේහි, අම්හේභි |
| ඡ - | මම, මය්හං, අම්හං, මමං; | අම්හාකං, අස්මාකං, අම්හේ |
| ස - | මයි | අම්හේසු |

තුන් ලිඟුයෙහිම මෙසේමය.

## 68 අකාරාන්ත සර්වනාම [1] ඒක ශබ්දය

### ඒක පුංලිඞ්ගයෙහි

| | | |
|---|---|---|
| ප - | ඒකෝ | ඒකේ |
| දු - | ඒකං | ඒකේ |

---

1 සංඛ්‍යාය, අතුල්‍යය, අසහාය, අන්‍යයයි ඒක ශබ්දයාගේ අර්ථ සතරක් වෙති. එයින් සංඛ්‍යා වාචක තැන ඒක වචන වෙයි. අන්‍ය තන්හි ඒක වචන බහු වචන දෙකොහිම යෙදේ.

| | | |
|---|---|---|
| ත- | ඒකේන | ඒකේහි, ඒකේභි |
| කා- | ,, | ,, ,, |
| ච- | ඒකස්ස | ඒකේසං, ඒකේසානං |
| ප- | ඒකම්හා, ඒකස්මා | ඒකේහි, ඒකේභි |
| ඡ- | ඒකස්ස | ඒකේසං, ඒකේසානං |
| ස- | ඒකම්හි, ඒකස්මිං | ඒකේසු |

එක ස්ත්‍රී ලිඞ්ගයෙහි

| | | |
|---|---|---|
| ප- | ඒකා | ඒකා, ඒකායො |
| දු- | ඒකං | ඒකා, ඒකායො |
| ත- | ඒකාය | ඒකාහි, ඒකාභි |
| කා- | ,, | ,, ,, |
| ච- | ඒකිස්සා, ඒකස්සා, ඒකාය; | ඒකාසං, ඒකාසානං |
| ප- | ඒකාය | ඒකාහි, ඒකාභි |
| ඡ- | ඒකිස්සා, ඒකස්සා, ඒකාය; | ඒකාසං, ඒකාසානං |
| ස- | ඒකිස්සං, ඒකස්සං, ඒකායං; | ඒකාසු |

එක නපුංසක ලිඞ්ගයෙහි

| | | |
|---|---|---|
| ප- | ඒකං | ඒකේ, ඒකානි |
| දු- | ඒකං | ඒකේ, ඒකානි |
| ත | ඒකේන | ඒකේහි, ඒකේභි |
| කා- | ,, | ,, ,, |
| | ඒකස්ස | ඒකේසං, ඒකේසානං |
| ප- | ඒකම්හා, ඒකස්මා | ඒකේහි, ඒකේභි |
| ඡ- | ඒකස්ස | ඒකේසං, ඒකේසානං |
| ස- | ඒකම්හි, ඒකස්මිං | ඒකේසු |

## 22 පාඩම.

69. මොහු සර්වනාමික [1] සඞ්ඛ්‍යා ශබ්දයෝ වෙති.

ති ශබ්දය පටන් අට්ඨාරස ශබ්දයතෙක් පැවති ශබ්දයෝ සියලු විභක්තිවල බහුවචනයෙහි පමණක් වරනැගෙති.

1 ඒක ශබ්දය මූලදී කියූ ලෙසය. මෙහි ඒක ශබ්දය සඞ්ඛ්‍යාවාචක ය. අන් සියලු තන්හි ඒක වචන පමණක් ගතයුතුයි.

උභ (දෙක) තුන්ලිඟුයෙහි ම සමාන වේ.

**බහුවචන**

ප- උභො, උභේ
දු- උභෝ, උභේ
ත- උභෝහි, උභෝභි, උභේහි, උභේභි
ක- " " " "
ච- උභින්නං
ප- උභෝහි, උභෝභි, උභේහි, උභේභි,
ඡ- උභින්නං
ස- උභෝසු, උභේසු

ද්වි (=දෙක) තුන් ලිඟුයෙහිම සමාන වේ.

ප- දුවේ, ද්වේ,
දු- දුවේ, ද්වේ,
ත- ද්විහි, ද්වීභි,
ක- " "
ච- ද්වින්නං, දුවින්නං,
ප- ද්විහි, ද්වීභි,
ඡ- ද්වින්නං, දුවින්නං,
ස- ද්වීසු,

ති (තුණ) බහුවචන පමණයි.

| | පුං- | ඉත්ථි- | නපුංසක- |
|---|---|---|---|
| ප- | තයෝ | තිස්සෝ, | තීණි |
| දු- | තයෝ | තිස්සෝ, | තීණි |
| ත- | තීහි, තීභි | තීහි, තීභි, | තීහි, තීභි |
| ක- | " | " " | " " |
| ච- | තිණ්ණං, තිණ්ණන්නං, | තිස්සන්නං, | තිණ්ණං තිණ්ණන්නං, |
| ඡ- | තීහි, තීභි | තීහි, තීභි, | තීහි, තීභි, |
| ප- | තිණ්ණං, තිණ්ණන්නං, | තිස්සන්නං, | තිණ්ණං තිණ්ණන්නං |
| ස- | තීසු | තීසු | තීසු |

### චතු (=4) බහුවචන පමණයි.

| | පුං | ඉත්ථි | නපුංසක |
|---|---|---|---|
| ප - | චත්තාරෝ, චතුරෝ, | චතස්සෝ, | චත්තාරි, |
| දු - | චත්තාරෝ, චතුරෝ, | චතස්සෝ, | චත්තාරි, |
| ත- | චතූහි, චතූභි | චතූහි, චතූභි, | චතූහි, චතූභි, |
| ක- | " " | " " | " " |
| ච - | චතුන්නං | චතස්සන්නං, | චතුන්නං |
| ප - | චතූහි, චතූභි | චතූහි, චතූභි, | චතූහි, චතූභි |
| ඡ - | චතුන්නං | චතස්සන්නං, | චතුන්නං |
| ස - | චතූසු | චතූසු, | චතූසු, |

### පඤ්ච (=5) තුන්ලිඟුයෙහිම සමානය.

| | |
|---|---|
| ප - | පඤ්ච, |
| දු - | පඤ්ච, |
| ත- | පඤ්චහි, පඤ්චභි, |
| ක- | " " |
| ච - | පඤ්චන්නං |
| ප - | පඤ්චහි, පඤ්චභි, |
| ඡ- | පඤ්චන්නං |
| ස - | පඤ්චසු |

මෙසේම, ඡ (6), සත්ත (7), අට්ඨ (8), නව (9), දස (10), ඒකාරස=ඒකාරස (11), බාරස=වාදස (12), තේරස, තේළස (13) චුද්දස=චෝද්දස=චතුද්දස (14), පඤ්චදස=පණ්ණරස (15), සෝළස=සෝරස (16), සත්තරස=සත්තදස (17), අට්ඨාරස=දට්ඨාදස (18) යන ශබ්දයෝද පඤ්ච ශබ්දය මෙන් වර නැගෙති, මොවුහු බහුවචනවූවෝ ලිඞ්ගත්‍රය යෙහිම, සමාන යෝය.

ඒකූනවීසති (19) ශබ්දය පටන් නවුති (90) ශබ්දය තෙක් ඇති ශබ්දයෝ ස්ත්‍රීලිඞ්ගික [1] ඒක වචනාන්තයෝය.

### ඒකූනවීසති (19) ස්ත්‍රීලිඞ්ගික යි.

---

1, මේ ශබ්දයෝද රාශිභේදයෙහි බහුවචන වෙති.
වෙවීසතියෝ බුද්ධදත්තා (බුද්ධ දත්තයෝ සම සතළිසක් වෙති.) සතාදිය ඊට උදාහරණය.

## ඒකවචන

ප - ඒකූන වීසති (=19)
ආ - (භො) ඒකූන වීසති
දු - ඒකූන වීසතිං
ත - ඒකූන වීසතියා
ක - ,,
ච - ඒකූන වීසතියා
ප - ඒකූන වීසතියා
ඡ - ඒකූන වීසතියා
ස - ඒකූන වීසතියං

මෙහි පහත දැක්වෙන ශබ්දයෝද ඒකූන වීසති ශබ්දය සේ වරනැගෙති.

20 වීසති,
21 ඒකවීසති
22 ද්වෙවීසති,=ද්වාවීසති=බාවීසති
23 තේවීසති.
24 චතුවීසති
25 පඤ්චවීසති=පණ්ණුවීසති, පණ්ණවීසති.
26 ඡබ්බීසති
27 සත්තවීසති.
28 අට්ඨවීසති

සං:- 'වීසති' යන්නට 'වීසා' යන ආදේශයක් ද වේ. එකල '20 වීසා, 21 ඒකවීසා, 22 ද්වෙවීසා' යනාදි වශයෙන් සිටී. 'වීසා' ශබ්දය 'කඤ්ඤා' ශබ්දය මෙන් ඒකවචනයෙහි පමණක් වරනගන්න.

29 ඒකූන තිංසති
30 තිංසති.
31 ඒකතිංසති.
32 ද්වත්තිංසති=බත්තිංසති.
33 තෙත්තිංසති.
34 චතුත්තිංසති.
35 පඤ්චතිංසති.
36 ඡත්තිංසති.
37 සත්ත තිංසති.
38 අට්ඨතිංසති.

සං:- තිංසති ශබ්දයට 'තිංසා' යන ආදේශයක්ද වේ. එකල '30 තිංසා, 31 ඒකතිංසා, 32 වත්තිංසා, 33 තෙත්තිංසා, යනාදි වශයෙන් භාෂාවෙහි සිටී.

'තිංසා' ශබ්දයද 'කඤ්ඤා, ශබ්දය මෙන් වර නැගේ.

39 එකූනචත්තාලීසති=ඒකූනචත්තාලීසා.
40 චත්තාලීසති=චත්තාලීසා.
=තාලීසති=තාලීසා.
41 ඒකචත්තාලීසති=ඒකචත්තාලීසා
42 වාචත්තාලීසති,=වාචත්තාලීසා.
විචත්තාලීසති=විචත්තාලීසා.
43 තෙචත්තාලීසති=තෙචත්තාලීසා.
=තිචත්තාලීසති=තිචත්තාලීසා.
44. චතුචත්තාලීසති=චතුචත්තාලීසා.
=චොත්තාලීසති=චෝත්තාලීසා.
=චුත්තාලීසති=චුත්තාලීසා.
45 පඤ්චචත්තාලීසති=පඤ්චචත්තාලීසා
46 ඡචත්තාලීසති=ඡචත්තාලීසා.
47 සත්තචත්තාලීසති=සත්තචත්තාලීසා.
48 අට්ඨචත්තාලීසති=අට්ඨචත්තාලීසා.

සං:- 'ලී' ආදේශ නොවන තන්හි 'චත්තාරීසති' චත්තාරීසා' යි. පියවිරුවින්ම සිටී.

49 එකූනපඤ්ඤාසා,
50 පඤ්ඤාසා
51 ඒකපඤ්ඤාසා
52 වෙපඤ්ඤාසා=විපඤ්ඤාසා.
53 තේපඤ්ඤාසා=තිපඤ්ඤාසා.
54 චතුපඤ්ඤාසා.
55 පඤ්චපඤ්ඤාසා.
56 ඡපඤ්ඤාසා.
57 සත්තපඤ්ඤාසා.
58 අට්ඨපඤ්ඤාසා.

සං;- 'පඤ්ඤාස' ශබ්දයට 'පණ්ණාසා' ආදේශය වූ කල්හි 'ඒකපණ්ණාසා, වෙපණ්ණාසා, තේපණ්ණාසා'' යනාදි වශයෙන් භාෂාවෙහි සිටී; 'කඤ්ඤා, ශබ්දය මෙන් වරනගන්න.

## 23 පාඩම,

59 ඒකූනසට්ඨි
60 සට්ඨි.
61 ඒක සට්ඨි
62 ද්වාසට්ඨි,=ද්වෙසට්ඨි=ද්විසට්ඨි
63 තේසට්ඨි,=තිසට්ඨි
64 චතුසට්ඨි
65 පඤ්ච සට්ඨි.
66 ඡසට්ඨි.
67 සත්තසට්ඨි.
68 අට්ඨසට්ඨි.
69 ඒකූන සත්තති
70 සත්තති.
71 ඒකසත්තති
72 ද්වාසත්තති=ද්විසත්තති.
73 තේසත්තති=තිසත්තති.
74 චතුසත්තති.
75 පඤ්ච සත්තති.
76 ඡසත්තති.
77 සත්තසත්තති.
78 අට්ඨසත්තති.

සං:- සත්තති ශබ්දයෙහි 'ති' වෙනුවට 'රි' ආදෙශ වූ කල්හි "සත්තරි, ඒකසත්තරි, ද්විසත්තරි, තේසත්තරි යනාදි වශයෙන් සිටී. වරනැගීමෙහි අමුත්තක් නැත.

79 ඒකූනාසීති.
80 අසීති
81 ඒකාසීති.
82 ද්වෙඅසීති ද්වාසීති.
83 තෙඅසීති.
84 චතුරාසීති [1]

1 'චතු + අසීති, යන තන්හි 'ර' ආගම වී චතුරාසීති යි සිද්ධවේ..

85 පඤ්චාසීති.
86 ඡාසීති.
87 සත්තාසීති,
88 අට්ඨාසීති.
89 ඒකූනනවුති,
90 නවුති.
91 ඒකනවුති,
92 ද්වානවුති=ද්වෙනවුති=ද්විනවුති,
93 තේනවුති=තිනවුති.
94 චතුනවුති,
95 පඤ්චනවුති.
96 ඡන්නවුති.
97 සත්තනවුති.
98 අට්ඨනවුති.
99 එකූන සතං,

70. 'එකූනසත, ශබ්දය නපුංසකලිඞ්ග එකවචනයෙහි පමණක් වර නැගේ.

ඒකූනසත (=99)

ඒකවචනයි. නපුංසක ලිඞ්ගිකයි.

ප – ඒකූනසතං,
ආ–(හෙ) ඒකූනසත,
දු– ඒකූනසතං
ත– ඒකූනසතෙන,
ක– ,,
ච – ඒකූන සතස්ස.
ප – ඒකූනසතා=ඒකූනසතම්හා=ඒකූනසතස්මා.
ඡ– ඒකූනසතස්ස.
ස – ඒකූනසතෙ=ඒකූනසතම්හි=ඒකූනසතස්මිං.

71, 'සත' (=100) ශබ්දයේ පටන් සතසහස්ස (100000) ශබ්දය තෙක් ඇති ශබ්දයෝ නපුංසක ලිංගික එකවචන

වෙති. කෝටි (=10000000) පකෝටි (=100000000) කෝටිප්පකෝටි (10000000000), අක්ඛොභිණී යන ශබ්දයෝ ස්ත්‍රීලිඞ්ගික ඒකවචනාන්තයෝ යි.

නහුත, නින්නහුත, අක්ඛෝභිණී, බින්දු, අබ්බුද, නිරබ්බුද, අහහ, අබබ, අටට, සොගන්ධික, උප්පල, කුමුද, පුණ්ඩරීක, පදුම, කථාන, මහාකථාන, අසංඛෙය්‍ය යයි මෙසේ සඞ්ඛ්‍යා විශේෂයෝ වෙති

---

# 2 කාණ්ඩය.

---

(=නාම පද-ආඛ්‍යාත පදයන් හා ගළපා වාක්‍ය රචනා කිරීමේ සාමාන්‍ය විධි.)

---

## 24 පාඩම.

1 අතීතෙ බාරාණසියං බෝධිසත්තො [1] බාරාණසි සෙට්ඨිස්ස කුලෙ නිබ්බත්ති. සො [2] පිතු අච්චයෙන සෙට්ඨිට්ඨානෙ අට්ඨාසි. චතූසු නගරද්වාරෙසු, චතස්සො දානසාලා, නගරස්ස මජ්ඣෙ එකං; අත්තනො [3] නිවෙසනද්වාරෙ එකං'ති ඡ දානසාලා කාරෙත්වා මහාදානං දෙති.

2 අථෙකදිවසං එකො පච්චෙකබුද්ධො [4] පාතරාස වේලාය ගෙහද්වාරෙ අට්ඨාසි. බොධිසත්තො තං දිස්වා ආසනා වුට්ඨාය [5] අය්‍යස්ස පත්තං ආහරථා'ති ආහ.

---

නහුත නම් දසදහසකි. නහුත සියයක් නින්නහුත නාම්. නින්නහුත සියයක් අක්ඛොභිණී නම්. මෙසේ මුලින් තිබෙන ගණන සියයෙන් ගුණ වූ කල්හි පසුවෙනි ගණනෙහි වටිනාකම ලැබේ. අන්තිම ගණන තෙක් ද මේ ක්‍රමය සැලකිය යුතුයි.

1 බරණැස සිටු කුලයෙහි; 2 පියාගේ ඇවෑමෙන්, 3 ගෙදර, 4 උදෑසන කාලයෙහි, 5 පසේබුදුන්ගේ,

3 මාරො සෙට්ඨිනො [6] දානන්තරායං කරිස්සාමීති [7] අන්තර වීථිම්හි [8] අඞ්ගාරකාසුං නිම්මිනි. පත්තහරණත්ථාය ගච්ඡමානො පුරිසො තං දිස්වා මහාභයප්පත්තො නිවත්තති. බොධිසත්තො කිං තාත නිවත්තොසීති පුච්ඡි. අයං'සාමීති සො වදි.

4 අථ බොධිසත්තො භත්තපාතිං ගහෙත්වා අඞ්ගාරකාසු මත්ථකෙන ගච්ඡන්තො [9] අසීතිහත්ථගම්භීරාය අඞ්ගාර කාසුතා එකං [10] මහාපදුමං [11] උග්ගන්ත්වා බොධිසත්තස්ස පාදෙ[12] සම්පටිච්ඡි.

---

## 25 පාඩම.

1 අතීතෙ බාරාණසියං බොධිසත්තො [1] පාරාපත යොනියං නිබ්බත්ති. බාරාණසි සෙට්ඨිනො [2] භත්තකාරකො තත්ථ එකං [3] පච්ඡිං [4] ඔලම්බෙත්වා ඨපෙසි. බොධිසත්තො තත්ථ [5] වාසං කප්පෙසි.

2 සො පාතොව නික්ඛමිත්වා [6] ගොචරෙ චරිත්වා සායං ආගන්ත්වා තත්ථ වසන්තො [7] කාලං ඛෙපෙති.

3 අථෙක දිවසං එකො කාකො [8] ධූපනවාසං සායිත්වා පාතොව ආගන්ත්වා බොධිසත්තස්ස [9] පිට්ඨිතො පිට්ඨිතො අගමාසි.

4 බොධිසත්තො :- "කස්මා ත්වං සම්ම! අම්හෙහි සද්ධිං චරසි?
කාකො :- "තුම්හාකං කිරියා මය්හං රුච්චති.

---

6 දානයට අන්තරායක්, 7 අතර වීදියෙහි 8 වළක්, 9 අසූරියනක් පමණ ගැඹුරැති, 10 මහා පියුමක්, 11 නැගී 12 පිළිගති.

1 පරෙවි; 2 කෑම හදන්නා, 3 කුරුළු කූඩුව, 4 එල්වා 5 විසීම කෙළේය 6 ගොදුරැකා, 7 කල් යවයි, 8 දුම් සුවඳ, 9 පිටි පසින්,

ඉතො පට්ඨාය තුම්හෙ [1] උපට්ඨහිස්සාමි.'

කපොතො :– "සම්ම, තුම්හෙ [2] අඤ්ඤගොචරා, මයං අඤ්ඤගොචරා, තුම්හෙහි අම්හාකං උපට්ඨානං දුක්කරං?"

කාකො :– "සාමි, තුම්හාකං ගොචරගහණකාලෙ අහම්පි ගොචරං ගහෙත්වා තුම්හෙහි සද්ධිංයෙව ගමිස්සාමි.

කපොතො :– "සාධු, [3] අප්පමත්තෙන භවිතබ්බං."

5 එවං බොධිසත්තො කාකං ඔවදිත්වා [4] තිණබීජාදීනි ඛාදති. කාකො ගන්ත්වා ගොමයපිණ්ඩං, [5] අපනෙත්වා පාණකෙ ඛාදති. භත්තකාරකො කාකස්සපි පච්ඡිං ඨපෙසි. තතො පට්ඨාය ද්වෙ ජනා වසන්ති.

6 අථෙකදිවසං සෙට්ඨිස්ස බහුං මච්ඡමංසං ආහරිංසු. කාකො තං දිස්වා ලොභං උප්පාදෙත්වා රත්තිං [6] නිත්ථුනන්තො නිපජ්ජි.

7 පුනදිවසෙ බොධිසත්තො ගොචරාය ගච්ඡන්තො 'එහි [7] සම්ම කාකා'ති ආහ.

'සාමි, තුම්හෙ ගච්ඡථ මය්හං කුච්ඡිරොගො අත්ථි."

සම්ම, කාකානං කුච්ඡිරොගො නාම කදාචි න [8] භූතපුබ්බො. අප්පමත්තො හොහීති ඔවදිත්වා බොධිසත්තො ගොචරාය ගතො.

8 කාකොපි පච්ඡිතො සීසං [1] උක්ඛිපිත්වා [2] භත්තගෙහං ඔලොකෙසි. භත්තකාරකස්ස [3] අභාවං ඤත්වා 'අයං දානි මය්හං කාලො'ති චින්තෙත්වා පච්ඡිතො [4] උප්පතිත්වා [5] රසකරොටියං [6] නිලීයි. සා කිලීති සද්දමකාසි.

---

1 උවැටන් කරන්නෙමි 2 අනික් දෙයක් කන්නෝය 3 වැරදි නොකළ යුතුය.

4 තණකොළ ඇට 5 පෙරළා, 6 නන්නාමින්, 7 යහලුව, 8 නොවිරූ දෙයකි

1 ඔසවා, 2 කුස්සිය, 3 නැති බව 4 නික්මී 5 ඇතිලියෙහි, 6 වාඩිවී ;

9 හත්ථකාරකො තං සුත්වා පච්ඡියො කාකං දිස්වා වාරං පිධාය කාකං [7] ගණ්හි. තස්ස සකල සරීරෙ [8] පත්තානි [9] ලුඤ්චිත්වා [10] අද්දසිඞ්ගිවෙරං [11] ලොණජීරකාය [12] කොට්ටෙත්වා [13] අම්බිලතක්කෙන [14] ආලොලෙත්වා තෙනස්ස සකල සරීරං [15] මක්ඛෙත්වා තං කාකං පච්ඡියං ඛිපි.

(කපොත ජාතකය 212)

---

## 26 පාඩම.

1 අතීතෙ බාරාණසියං [1] අඤ්ඤතරො බ්‍රාහ්මණො [1] වෙදබ්භං නාම මන්තං ජානාති. [3] නක්ඛත්තයොගෙ ලද්ධෙ මන්තං [4] පරිවත්තෙත්වා ආකාසං [5] උල්ලොකෙති ආකාසතො සත්තරතනවස්සං [6] වස්සති.

2 තදා බොධිසත්තො තස්ස සන්තිකෙ සිප්පං උග්ගණ්හාති.

3 අථෙකදිවසං බ්‍රාහ්මණො බොධිසත්තං [1] ආදාය චෙතියරට්ඨං අගමාසි. අන්තරාමග්ගෙ [2] පඤ්චසතා චෝරා බොධිසත්තං ච වෙදබ්භබ්‍රාහ්මණං ච ගණ්හිංසු. බොධිසත්තො අජ්ජ ධනවස්සාපනක නක්ඛත්තයොගො භවිස්සති [3] මා ඛො තුම්හෙ ධනං වස්සාපයිත්ථ. [4] සචෙ වස්සාපෙස්සථ තුම්හෙ විනාසං [5] පාපුණිස්සථ'' ඉති වත්වා වන්දිත්වා ධනත්ථාය අගමාසි.

4 චොරා බ්‍රාහ්මණං බන්ධිත්වා [6] පජ්ජාපෙසුං. බ්‍රාහ්මණො 'භො චොරා, තුම්හෙ මං කිමත්ථාය [7] ගණ්හිත්ථ'

---

7 අල්ලා ගන්නේය 8 පියාපත්, 9 සඳ, 10 අමු ඉඟුරු, 11 ලුණු දුරු සමඟ 12 අඹරා, 13 ඇඹුල් කාරමින්, 14 කවලම් කොට, ආලෙප කොට 16 දූමිය.

1 එක්තරා 2 නමක් 3 නැකතක් හමුවීම, 4 මතුරා 5 බැලූ කල්හි, 6 වසී

1 අඩ ගසා ගෙණ' 2 පන් සියයක් හොරු, 3 මාඛො ධනං වස්සාපයිත්ථ දන වැසි නොවස්වව; 4 ඉදින්, 5 පැමිණෙන්නාහුය. 6 නිදි කරවූහ. 7 අල්ලා ගත්තහුද,

'ධනත්ථාය [8] අය්‍යා'

සචෙ වො ධනෙන අත්ථො, ඛිප්පං මං බන්ධනා [9] මොචෙථ. චොරා තථා අකංසු

5 බ්‍රාහ්මණො නක්ඛත්තයොගං දිස්වා මන්තං පරිවත්තෙත්වා ආකාසං උල්ලොකෙසි. [10] තාවදෙව ආකාසතො රතනානි [11] පතිංසු. චොරා තං ධනං [12] සංකඩ්ඪිත්වා [13] උත්තරා-සඞ්ගෙසු [14] භණ්ඩිකං කත්වා [15] පායිංසු. බ්‍රාහ්මණොපි තෙසං පච්ඡතො අගමාසි. අථ තෙ චොරෙ අඤ්ඤෙ පඤ්චසතා චොරා ගණ්හිංසු.

"කිමත්ථං අම්හෙ ගණ්හථ?"

"ධනත්ථාය"

යදි වො ධනෙන අත්ථො එතං බ්‍රාහ්මණං ගණ්හථ. එසො ආකාසං උල්ලොකෙත්වා ධනං වස්සාපෙසි. අම්හාකං [1] පෙතං [2] එතෙනෙව [3] දින්නං"

6 චොරා චොරෙ [4] විස්සජ්ජෙත්වා අම්හාකං ධනං දෙහීති බ්‍රාහ්මණං ගණ්හිංසු. බ්‍රාහ්මණො අහං තුම්හාකං ධනං [5] දදෙය්‍යං. ධනවස්සාපනක නක්ඛත්තයොගො පන ඉතො [6] සංවච්ඡරමත්ථකෙ භවිස්සති. යදි වො ධනෙන අත්ථො [7] අධිවාසෙථ තදා ධනවස්සං වස්සාපෙමීති ආහ.

7 චොරා කුජ්ඣිත්වා [8] අම්භො! දුට්ඨබ්‍රාහ්මණ අඤ්ඤෙසං ඉදානෙව ධනං වස්සාපෙත්වා අම්හෙ අඤ්ඤං සංවච්ඡරං [9] අධිවාසාපෙසීති තිණ්හෙන [10] අසිනා බ්‍රාහ්මණං විධා ඡින්දිත්වා වෙගෙන [11] අනුබන්ධිත්වා තෙහි චොරෙහි සද්ධිං යුජ්ඣිත්වා තෙ සබ්බෙපි මාරෙත්වා ධනං ආදාය පුන වෙ

---

8 පින් වතුනි, 9 මුදව්, 10 එකෙණෙහිම, 11 වැටුනාහුය 12 අවුලා 13 උතුරු සළුවල, 14 පොදි, 15 ගියාහුය,

1 (අපි + එතං) මෙයද 2 මොහු විසින්ම, 3 දෙන ලදී, 4 අතහැර, 5 දෙන්නෙමි. 6 අවුරුද්දකින් පසු, 7 ඉවසව්. 8 බොල, 9 බලාපොරොත්තු කරව. 10 කඩුවකින්, 11 ලුහුබැඳ,

කොට්ඨාසා හුත්වා [12] අඤ්ඤමඤ්ඤං යුජ්ඣිත්වා
[13] අඩ්ඪතියානි පුරිසසතානි ඝාතෙත්වා එතෙන උපා-
යෙන යාව ද්වෙජනා [14] අවසිට්ඨා අහෙසුං තාව අඤ්ඤ-
මඤ්ඤං ඝාතයිංසු.

වෙදබ්භ ජාතකය 221

---

## 27 පාඩම.

1 අතීතෙ බාරාණසියං බොසත්තො රඤ්ඤො අග්ග
මහෙසියා කුච්ඡිස්මිං නිබ්බත්තො තස්ස සීලවකුමාරොති
නාමං [1] අකංසු සො පිතු අච්චයෙන රජ්ජෙ පතිට්ඨිතො
සො දානං දෙති. සීලං රක්ඛති. [2] උපොසථකම්මං
කරොති. ධම්මෙන රජ්ජං කාරෙති

2 කොසලරාජා මහන්තෙන [3] බලවාහනෙන බාරාණසිං
පාවිසි. සො එකම්පි [4] පටිසත්තුං [5] අපස්සන්තො
රඤ්ඤො නිවෙසනවාරං ගන්ත්වා [6] අමච්චගණපරිවුතො
[7] අපාරුතද්වාරෙ නිවෙසනෙ [8] අලංකත පටියත්තං
මහාතලං ආරුය්හ නිසින්නං නිරපරාධං සීලවමහාරාජ
නං සද්ධිං [9] අමච්ච සහස්සෙන [10] ගණ්හාපෙත්වා ගච්ඡථ
ඉමං රාජානං සද්ධිං අමච්චෙහි [11] පච්ඡාබාහං [12] ගාළ්හ
බන්ධනං බන්ධිත්වා, [13] ආමකසුසානං නෙත්වා [14] ගලප්ප
මාණෙ ආවාටෙ ඛණිත්වා යථා එකොපි හත්ථං උක්ඛිපිතුං
නාසක්කොති එවං පංසුං [15] පක්ඛිපිත්වා [16] නිඛණථ
රත්තිං සිගාලා ආගන්ත්වා එතෙසං කත්තබ්බ යුත්තකං
කරිස්සන්ති ති ආහ.

---

12 ඔවුනොවුන්, 13 දෙසිය පණසක් පුරුෂයන් 14 ඉතිරි වූද, 15 මැරූහ

1 කළාහුය. 2 පෙහෙවස්, 3 බලසෙනග, 4 විරුද්ධකාරයෙකු, 5 නොදක්නේ
6 ඇමතියන් පිරිවරණලද්දේ, 7 දොරවල් නොවැසූ 8 සරසා පිළියෙළකළ
9 දහස්ගණන් ඇමතියන් සමග 10 අල්වා ගෙන්වා 11 පිටිතලනයා,
12 දැඩි බැම්ම, 13 අමුසොහොන, 14 ගෙලපමණට, 15 බහා 16 වසව්.

3 සීලවරාජා අමච්චෙ ආමන්තෙත්වා චොරරඤ්ඤො [1] උපරි-කොපං අකත්වා මෙත්තමෙව [2] භාවෙථ තාතාති ඔවදි.

4 අථ [3] අඩ්ඪරත්තසමයෙ මනුස්සමංසං ඛාදිස්සාමාති [4] සිගාලා අගමිංසු. ජෙට්ඨකසිගාලො රාජානං [5] උපගඤ්ඡි. රාජා තං [6] ගීවාය ඩසමානං [7] හනුකට්ඨිකෙන ආකඩ්ඪිත්වා ගාළ්හතං ගණ්හි. සිගාලෙ අපරාපරං [8] සංසරන්තෙ පංසු සිථිලා අහොසි.

5 රාජා පංසුනො සිථිලභාවං ඤත්වා සිගාලං [9] විස්සජ්ජෙත්වා අපරාපරං [10] සංචරන්තො උභො හත්ථෙ උක්ඛිපිත්වා [11] ආවාටමුඛවට්ටියා නික්ඛමිත්වා සීතො සබ්බෙ අමච්චෙ [22] උද්ධරිත්වා අමච්චපරිවුතො ආමකසුසානෙ අට්ඨාසි.

6 තස්මිං සමයෙ ද්වෙ යක්ඛා [13] මතමනුස්සං පාදෙ ගහෙත්වා ආකඩ්ඪන්තා රඤ්ඤො සන්තිකං ගන්ත්වා දෙව, අම්හාකං ඉමං [14] භාජෙත්වා දෙහීති ආහංසු.

7 “භො, යක්ඛා, අහං ඉමං තුම්හාකං භාජෙත්වා දදෙය්‍යං, [15] අපරිසුද්ධොපනම්හි, න්හායිස්සාමි [16] තාවාති; යක්ඛා චොරරඤ්ඤො උදකං ආහරිත්වා [17] අදංසු න්හාත්වා සීතස්ස චොරරඤ්ඤො [18] සාටකෙ ආහරිත්වා අදංසු. චොරරඤ්ඤො භොජනං ආහරිත්වා අදංසු. චොර-රඤ්ඤො [19] මඞ්ගලඛග්ගං ආහරිත්වා අදංසු. රාජා ඛග්ගං ගහෙත්වා මතමනුස්සං උජුකං ඨපාපෙත්වා අසිනා පහරිත්වා ද්වෙ කොට්ඨාසෙ කත්වා විභත්තං යක්ඛානං විභජිත්වා අදාසි.

8 තෙ මහාරාජ, කිං කරොමාති පුච්ඡිංසු. තෙනහි තුම්හෙ මං චොරරඤ්ඤො [20] සිරිගබ්භෙ [21] ඔතාරෙථ ඉමෙ ච අමච්චෙ අත්තනො අත්තනො ගෙහෙ [22] පතිට්ඨාපෙථ. තෙ තථා අකංසු.

---

1 කොපරහි, 2 වඩව්, 3 පහලොස්පෑ ජාමයේ, 4 නරි, 5 ළඟාවිය. 6 ගෙල ඩසින්නහු, 7 හනු ඇටයෙන්, 8 දඟලන කල්හි, 9 අත හැර, 10 සොලව මින්, 11 වළකටෙන්, 12 ගොඩ ගෙණ, 13 මිනිය, 14 බෙද, 15 අපිරිසිදු වෙමි. 16 පළමු කොට, 17 දුන්හ, 18 රෙදි, 19 මගුල් කඩුව, 20 යහන් ගෙහි, 21 බහව්, 22 පිහිටුවව්,

9 තස්මිං සමයෙ චොරරජා සිරිසයන පිට්ඨෙ නිපන්නො නිද්දායති. රජා නිද්දායන්තස්ස තස්ස [1] ඛග්ගතලෙන [2] උදරං පහරි

10 සො භීතො [3] පබුජ්ඣිත්වා කථං නාම ත්වං ඉමං සයන පිට්ඨං ආගතොති පුච්ඡි. රජා අත්තනො [4] ආගමනාකාරං කථෙසි. තං සුත්වා චොරරජා, අහං මනුස්ස භූතො තුම්හාකං ගුණං න ජානාමි. පරෙසං [5] ලොහිත මංස ඛාදකෙහි යක්ඛෙහි තව ගුණං [6] ඤාතංති රජානං ඛමාපෙත්වා අනන්තං බලවාහනං ආදාය [7] සකරට්ඨමෙව ගච්ඡා.

---

## 28 පාඩම.

1 අතීතෙ බාරාණසියං බොධිසත්තො [8] කපියොනියං නිබ්බත්තො [9] අස්සපොතකප්පමාණො [10] එකචරො නදී තීරෙ විහරති. තස්සා පන නදියා [11] වෙමජ්ඣෙ එකො [12] දීපකො [13] අම්බපනසාදීහි ඵල රුක්ඛෙහි සම්පන්නො.

2 වානරො නදියා [14] ඔරිමතීරතො උප්පතිත්වා නදී මජ්ඣෙ එකො [15] පිට්ඨි පාසාණො අත්ථි; තස්මිං නිපතති. තතො උප්පතිත්වා තස්මිං දීපකෙ පතති. තත්ථ ඵලානි ඛාදිත්වා සායං තෙනෙව උපායෙන [16] පච්චාගන්ත්වා වාසං කප්පෙති.

3 තස්මිං කාලෙ එකො [17] කුම්භීලො [18] සපජාපතිකො තස්සා නදියා වසති. තස්ස භරියා කුම්භීලං ආහ. ‘මය්හං ඛො ඉමස්ස වානරින්දස්ස [19] හදයමංසෙ [20] දොහළො උප්පන්නො’ති.

---

1 කඩුතලයෙන්, 2 බඩට 3 අවදිවී 4 ආ හැටි, 5 ලේ මස් බුදින, 6 දන්නා ලදිමි, 7 සිය රටට, 8 වඳුරු ජාතියෙහි, 9 අස් පොව්වෙක් තරම් 10 තනිව හැසිරෙණ; 11 මැද, 12 දූවක්, 13 අඹ කොස් ආදිය, 14 මෙහා ඉවුරෙන්, 15 ගල්පොත්තක් 16 (පති + ආ) ආපසු අවුත්, 17 කිඹුලා, 18 බිරිඳ සහිත, 19 හදව ~, 20 දොළක්,

4 කුම්භීලො “සාධු භොති [1] ලභිස්සසි වත්වා අජ්ජ තං සායං ආගච්ඡන්තං ගණ්හිස්සාමීති ගන්ත්වා පිට්ඨිපාසාණෙ නිපජ්ජි. බොධිසත්තො දිවසං චරිත්වා සායණ්හසමයෙ දීපකෙ ඨිතොව පාසාණං ඔලොකෙසි.”[2] අයං පාසාණො ඉදානි [3] උච්චතරො ඛායති, කින්නුඛො කාරණන්ති චින්තෙසි.

5 අජ්ජ ඉමිස්සා නදියා උදකං නෙව [4] හායති. න වඩ්ඪති. [5] අථ පනායං පාසාණො [6] මහන්තො පඤ්ඤායති, කච්චිනුඛො එත්ථ මය්හං [7] ගහණත්ථාය කුම්භීලො නිපන්නො’ති. [8] වීමංසාමි තාව තං’ති පාසාණෙන සද්ධිං කථෙන්තො;

බොධිසත්තො. “පාසාණො” [9]
“පාසාණො”
“පාසාණො”

භො, පාසාණ, අජ්ජ මය්හං [10] පටිවචනං න දෙසීති ආහ.

6 කුම්භීලො [11] අද්ධා අඤ්ඤෙසු දිවසෙසු අයං පාසාණො වානරින්දස්ස පටිවදන්තං අදාසි. [12] දස්සාමි අස්ස පටිවචනං ඉති චින්තෙත්වා.

කුම්භීලො: = ‘කිං, භො වානරින්ද?’
වානරින්දො = ‘කො’සි ත්වං?’
කුම්භීලො. ‘අහං කුම්භීලො.’
වානරින්දො“ ‘කිමත්ථං එත්ථ [13] නිපන්නොසි?’
කුම්භීලො ‘තව හදයමංසං [14] පත්ථයමානො’

බොධිසත්තො අඤ්ඤො මෙ [15] ගමනමග්ගො නත්ථි අජ්ජ මයා එස කුම්භීලො වඤ්චෙතබ්බො’ති චින්තෙසි.

බොධිසත්තො:– ‘සම්ම කුම්භීල, අහං අත්තානං තුය්හං පරිච්චජිස්සාමි. ත්වං මුඛං විවරිත්වා මං තව [16] සන්තිකං ආගතකාලෙ ගණ්හාහි,

---

1 ලබන්නෙහි, 2 මේ ගල, 3 උස්වූමෙන් වැටහෙයි, 4 අඩුනොවෙ වැඩිනොවේ. 5 පත+අයං, 6 ලොකුවී, 7 ඇල්ලීමට, 8 සොයමි 9 ගල, 10 උත්තර 11 ඒකාන්තයෙන් 12 දෙමි 13 නිදන්නෙහිද 14 බලාපොරොත්තුවෙන් 15 සෑහැකි මගක්, 16 ළඟට,

7 කුම්භීලො මුඛං [1] විවරි. අථස්ස අක්ඛීනි [2] පිථීයිංසු. සො මුඛං විවරිත්වා අක්ඛීනි [3] නිමීලෙත්වා නිපජ්ජි. බොධිසත්තො [4] තථාභාවං ඤත්වා දීපකා උප්පතිතො ගන්ත්වා කුම්භීලස්ස [5] මත්ථකං [6] අක්කමිත්වා තතො උප්පතිතො [7] විජ්ජුල්ලතා විය පරතීරෙ අට්ඨාසි.

8 කුම්භීලො බොධිසත්තං [8] පසංසිත්වා අත්තනො වසනට්ඨානං [9] ගතො.

---

## 29 පාඩම.

1 අතීතෙ බාරාණසියං ඉල්ලීසො නාම සෙට්ඨී අහොසි. [1] අසීතිකො විභවො, ඛඤ්ජො, කුණී, [2] විසමඅක්ඛිමණ්ඩලො. [3] අස්සද්ධො මච්ඡරී;

2 නෙව අඤ්ඤෙසං දෙති. [4] න සයං පරිභුඤ්ජති. මාතා-පිතරො පනස්ස [5] යාව සත්තමා කුලපරිවට්ටා [6] දායකා දානපතිනො. සො සෙට්ඨිට්ඨානං ලභිත්වා [7] කුලවංසං නාසෙත්වා දානසාලං [8] ඣාපෙත්වා යාචකෙ [9] පොථෙත්වා [10] නික්කඩ්ඪිත්වා ධනමෙව [11] සණ්ඨාපෙසි. සො එක දිවසං ඝරං ආගච්ඡන්තො [12] පූතිමච්ඡකෙන උත්තරිභඞ්ගෙන සුරං පිවන්තං දිස්වා [13] පාතුකාමො අහොසි.

3 'අහං පිවිස්සාමි, [14] මයි පිවන්තෙ බහූ පිවිතුකාමා භවිස්සන්ති. එවං මෙ ධන [15] පරික්ඛයො භවිස්සති. සො තණ්හං අධිවාසිතුං අසක්කොන්තො [16] පණ්ඩුසරීරො අහොසි.

---

1 හැරියේය. 2 වැසුනාහ. 3 වසාගෙණ, 4 ඒ බව, 5 මතුපිට, 6 පාගා 7 විදුලිය, 8 සතුතිකොට, 9 ගියේය.

1 අසූකෝටියක් ධනය ඇති, 2 වපරවූ, 3 ශ්‍රද්ධාව නැති. 4 තෙමේ 5 සත්වන කුලපරපුරතෙක්, 6 දෙන්නෝය. 7 කුලසිරිත්, 8 දවා 9 තලා 10 එලවා, 11 රැස්කරවිය. 12 කුනුමස් හා කැවිලි සමග, 13 බොනු කැමැත්තේ, 14 මා බොනකල්හි, 15 විනාශය, 16 පාණ්ඩු පැහැසවූසිරුර,

4 එකදිවසං සො [17] අන්තරාපණතො [18] මාසකමත්තං දත්වා [19] සුරාවාරකං ආහරාපෙත්වා නගරා නික්ඛම්ම නදීතීරං ගන්ත්වා මහාමග්ගසමීපෙ එකං ගුම්බං පවිසිත්වා සුරං පාතුං ආරභි.

5 පුබ්බෙ තස්ස පිතා සක්කො හුත්වා නිබ්බත්ති, සො පුත්තං [1] ආවජ්ජෙන්තො තස්ස [2] එකකස්ස සුරාපිවනභාවං [3] අද්දක්ඛි. තං [4] දමෙත්වා දානං දාපෙත්වා දෙවලොකෙ [5] නිබ්බත්තනාරහං කරොමී ති [6] මනුස්ස පථං [7] ඔතරි. ඉල්ලීස සෙට්ඨිනො [8] නිබ්බිසෙසං ඛඤ්ජකුණිං [9] විසම චක්ඛුලං අත්තභාවං නිම්මිනිත්වා රාජගහනගරං පවිසිත්වා රාජානං වන්දිත්වා අට්ඨාසි.

රාජා:- 'කිං මහාසෙට්ඨි අවෙලාය ආගතොසි.?'

සෙට්ඨි:- 'ආගතොම්හි දෙව! [10] ඝරෙ මෙ අසීති කොටිමත්තං ධනං අත්ථි; තං දෙවො [11] ආහරාපෙත්වා අත්තනො භණ්ඩාගාරෙ පූරාපෙතු.

රාජා:- [12] අලං මහාසෙට්ඨි! තව ධනතො, අම්හාකං ගෙහෙ බහුතරං ධනන්ති,

සෙට්ඨි:- සචෙ, දෙව තුම්හාකං කම්මං නත්ථි වෙ [13] යථා රුචියා තං ගහෙත්වා දානං දම්මි ''

රාජා:- දෙහි, මහාසෙට්ඨි,

6 සෙට්ඨි.- 'සාධු දෙවාති රාජානං වන්දිත්වා නික්ඛමිත්වා ඉල්ලීසසෙට්ඨිනො ගෙහං අගමාසි. සබ්බෙ උපට්ඨාක මනුස්සා [14] පරිවාරෙසුං. එකොපි [15] නායං ඉල්ලීසොති ජානිතුං සමත්ථො නත්ථි.

---

17 ලඟ සුරසැලෙන්, 18 මස්සක්තරම්, 19 රාබඳුනක්,

1 සිතාබලන්නේ, 2 තනිව, 3 දැක්කේය· 4 හීකරුකොට' 5 ඉපදීමට සුදුස්සෙක්, 6 මිනිස්ලොවට, 7 බැස්සේය. 8 වෙනස්නැති 9 වපරවූ, 10 ගෙයි, 11 ගෙන්වා, 12 කමිනැත. 13 කැමතියේ, 14 වටකර ගත්හ, 15 (න + අයං) මේ නොවෙයි.

7 සො ගෙහං පවිසිත්වා අන්තො [1] උම්මාරෙ ඨත්වා [2] දොවාරිකං [3] පක්කොසාපෙත්වා, "යො අඤ්ඤො [4] මයා සමානරූපො ආගන්ත්වා [5] මමෙතං ගෙහන්ති පවිසිතුං ආගච්ඡති, තං පිට්ඨියං පහරිත්වා [6] නීහරෙය්‍යාථාති වත්වා පාසාදං ආරුය්හ ආසනෙ නිසීදිත්වා සෙට්ඨිභරියං පක්කොසාපෙත්වා [7] සිතාකාරං දස්සෙත්වා, භද්දෙ! දානං දෙමාති ආහ. තස්ස තං වචනං සුත්වා, අජ්ජ පන සුරං පිවිත්වා [8] මුදුචිත්තො හුත්වා [9] දාතුකාමො ජාතො භවිස්සතීති [10] වදිංසු. අථ තං සෙට්ඨිභරියා යථාරුචියා [11] දෙථ සාමීති ආහ.

ඉල්ලීස ජාතකය 297

---

# 30 පාඩම.

1 අථ සො [1] භෙරිවාදකං පක්කොසාපෙත්වා [2] සුවණ්ණ රජත මණි මුත්තාදීහි [3] අත්ථිකා ඉල්ලීස සෙට්ඨිස්ස ඝරං ගච්ඡන්තූති සකල නගරෙ භෙරිං චරාපෙසි. මහා ජනො [4] පසිබ්බකාදීනි ගහෙත්වා වාරෙ සන්නිපති. සක්කො සත්ත රතන පූරෙ ගබ්භෙ විවරාපෙත්වා තුම්හාකං දම්මි. [5] යාවදත්ථං ගණ්හිත්වා ගච්ඡථාති ආහ. මහා ජනො ධනං නීහරිත්වා [6] මහාතලෙ රාසිං කත්වා [7] ආභත භාජනානි පූරෙත්වා ගච්ඡති.

2 අඤ්ඤතරො ජනපද මනුස්සො ඉල්ලීස සෙට්ඨිනො ගොණෙ තස්සෙව රථෙ යොජෙත්වා සත්තහි රතනෙහි පූරෙත්වා මහා මග්ගා පටිපජ්ජිත්වා තස්ස ගුම්බස්ස අවිදූරෙන ගච්ඡති.

---

1 උළුවස්සෙහි, 2 දොරටුපල්ලා, 3 කැඳවා, 4 මාවැන්නෙක් 5 මේ ගෙය මගේය 6 එළවා දමව්. 7 සිනාවක් 8 මොළොක් සිත් ඇතිවූයේ 9 දෙනු කැමති විය 10 කීහ. 11 දෙන්න,

1 බෙරකාරුවකු, 2 රන් රිදී මැණික් මුතු ආදිත්ගෙන්, 3 ඕනෑ අය, 4 කූඩා මලු, 5 හැකිතාක්, 6 බිම, 7 ගෙණා භාජන,

3 "වසසසතං ජීව සාමි ඉල්ලීසසෙට්ඨි, මෙ යාවජීවං කමමං අකත්වා ජීවිතබබං ජාතං, සෙට්ඨිනො ගුණ කථං කථෙන්තා ච ගචඡන්ති.

4 සො සද්දං සුත්වා, කච්චිනු ඛො රක්ඛසා මම ධනං ලොකස්ස දින්නන්ති [1] ගුම්බා නික්ඛමිත්වා ගොණෙච රථඤ්ච සං ජානිත්වා අරෙ [2] චෙටක මය්හං ගොණෙ මය්හං රථොති වත්වා ගන්ත්වා ගොණෙ [3] නාසාරජ්ජුයා ගණ්හි.

5 ගහපතිකො රථා ඔරුය්හ අරේ දුට්ඨචෙටක' ඉල්ලීස මහා සෙට්ඨි සකල නගරස්ස දානං දෙති. ත්වං කිං අහොසීති [4] අසනිං පාතෙන්තො විය ඛන්ධෙ පහරිත්වා රථං ආදාය අගමාසි. සො පුන [5] කම්පමානො උට්ඨාය පංසුං පුඤ්ඡිත්වා වෙගෙනාගන්ත්වා රථං ගණ්හි. ගහපතිකො කෙසෙසු ගහෙත්වා නාමෙත්වා [6] කප්පරප්පහාරෙහි [7] කොට්ටෙත්වා [8] ගලෙ ගහෙත්වා [9] ආගතාභිමුඛං ඛිපිත්වා පක්කාමි.

6 සො කම්පමානො ගන්ත්වා ගෙහං පවිසිතුං ආරභි. වාර පාලා අරෙ දුට්ඨ ගහපති [10] කහං පවිසසීති [11] වංස පෙසිකාහි පොථෙත්වා ගීවාය ගහෙත්වා [12] නීහරිංසු. සො රඤ්ඤො සන්තිකං ගන්ත්වා.

"දෙව, මම ගෙහං තුම්හෙ [13] විලුම්පාපෙථ?

"නාහං සෙට්ඨි විලුම්පාමි. නනු ත්වමෙව ආගන්ත්වා සචෙ තුම්හෙ න ගණ්හථ අහං මම ධනං දානං දාපෙස් සාමීති නගරෙ භෙරිං [14] චරාපෙත්වා දානං අදාසි.

7 "නාහං දෙව තුම්හාකං සන්තිකං ආගච්ඡාමි. කිං තුම්හෙ මය්හං මච්ඡරියභාවං න ජානාථ.

අහං [15] තිණග්ගෙන තෙල බින්දුම්පි න කස්සචි දෙමි. සො දානං දෙති තං පක්කොසාපෙත්වා විමංසථ දෙවා"ති.

---

1 පඳුරෙන්, 2 කොල්ල, 3 නාස් ලනුවෙන්, 4 සෙන පහරක්, 5 වෙවුලමින්, 6 වැලමිටි පහරින්, 7 තළා, 8 බෙල්ල, 9 ආදිගට, 10 කොහි, 11 උණ පතුරින් 12 තල්ලු කළහ 13 කොල්ලකමවද 14 හසුරුවා 15 තණඅගකින්,

රාජා සක්කං පක්කොසාපෙසි. [2]ද්වින්නං ජනානං [3]විසෙසං, නෙව රාජා ජානාති. න අමච්චා. මච්ඡරිය සෙට්ඨී කිං දෙව අයං සෙට්ඨී; අහං සෙට්ඨී;

මයං [4] න සංජානාම; අත්ථි තෙ කොචි [5] සඤ්ජානන-
කො? භරියා මෙ දෙව;

භරියං පක්කොසෙත්වා [6] කතරො තෙ සාමිකො? 'අයං' සා සක්කස්සෙව සන්තිකෙ අට්ඨාසි. පුත්ත ධීතරො දාස කම්මකාරාදයොපි සක්කස්සෙව සන්තිකෙ තිට්ඨන්ති. තස්මිං ඛණෙ සක්කො නාහං මහාරාජ ඉල්ලීසො; සක්කො හමස්මි. [7] මහතියා සක්ක ලීළ්හාය ආකාසෙ අට්ඨාසි.

සක්කො ආහ. ඉල්ලීස, ඉදං ධනං මම සන්තකං; න තව; අහං හි තෙ පිතා; ත්වං මම පුත්තො. අහං දානාදීනි පුඤ්ඤානි කත්වා [8] සක්කත්තං පත්තො; සචෙ ත්වං නො ච දස්සසි? සබ්බං ධනං [9] අන්තරධාපෙත්වා ඉමිනා [10] වජිරෙන සීසං භින්දිත්වා [11] ජීවිතක්ඛයං පාපෙස්සාමි.

ඉල්ලීස සෙට්ඨී මරණභය භීතො දානං දස්සාමීති [12] පටිඤ්ඤං අදාසි.

ඉල්ලීස ජාතකය 299

---

# 31 පාඩම.

1 අතීතෙ බාරාණසියං බොධිසත්තො තස්ස රඤ්ඤො අමච්චො අහොසි. රඤ්ඤො පුරොහිතො [13] අභිමුඛරො [14] බහුභාණී හොති. තස්මිං කථෙතුං ආරද්ධෙ අඤ්ඤෙ ඔකාසං න ලභන්ති.

රාජා කදා නු ඛො එතස්ස [15] වචනුපච්ඡෙදකං කඤ්චි ලභිස්සාමීති [16] උපධාරෙන්තො විචරති.

---

2 දෙදෙනාගේ, 3 වෙනසක්, 4 නො හඳුනමි. 5 අඳුනන්නෙක්, 6 කවුද? 7 මහත් සක්තෙදින්, 8 සක් බව 9 අතුරුදන්කර, 10 වජ්‍රායුධයෙන්, 11 මරණයට, 12 පොරොන්දුවිය, 13 දෙඩමළුවෙකි; 14 නිතර දෙඩන් නෙක්, 15 කථාව නැවත්වීම කරන්නෙකු, 16 සොයමින්,

2 තස්මිං කාලෙ බාරාණසියං එකො [1] පීඨසප්පි [2] සක්ඛර
ඛිපනසිප්පෙ නිප්ඵත්තිං පත්තො හොති. බාරාණසිනගර
ද්වාරමූලෙ එකො [3] විටපසම්පන්නො මහානිග්‍රොධො අත්ථි.
ගාමදාරකා තං තත්ථා නෙත්වා සම්පරිවාරෙත්වා [4] කාකනි
කාදීනි දත්වා හත්ථිරූපකං කර, අස්සරූපකං කරාති
වදන්ති

3 සො සක්ඛරානි ඛිපිත්වා ඛිපිත්වා නිග්‍රොධපණ්ණෙසු
නානාවිධ රූපානි දස්සෙති. සබ්බානි පණ්ණානි ඡිද්දා-
නෙව අහෙසුං.

4 අථ බාරාණසී රාජා උය්‍යානං ගච්ඡන්තො තං ඨානං
පාපුණි. රාජා නිග්‍රොධ මූලං පත්වා රථෙ නිසින්නො
පතිතානං [5] ඡිද්දානං ඡායං තහර තහරං දිස්වා
[6] උල්ලොකෙන්තො සබ්බෙසං පත්තානං ඡිද්දභාවං දිස්වා
[7] කෙනෙතානි එවං කතානීති පුච්ඡි.
"පීඨසප්පිනා දෙවා"ති

5 රාජා ඉමං නිස්සාය බ්‍රාහ්මණස්ස වචනුපච්ඡෙදං කාතුං සක්කා
භවිස්සතීති චින්තෙත්වා "කහං පීඨසප්පී'ති පුච්ඡි. 'අයං
දෙවා'ති ආහංසු. රාජා තං පක්කොසාපෙත්වා පරිසං
* උස්සාරෙත්වා පුච්ඡි. අම්හාකං සන්තිකෙ එකො මුඛර
බ්‍රාහ්මණො අත්ථි. සක්ඛිස්සසි තං [8] නිස්සද්දං කාතුං?
නාළිමත්තා [9] අජලණ්ඩිකා ලභන්තො සක්ඛිස්සාමි දෙව;

6 රාජා පීඨසප්පිං ඝරං නෙත්වා [10] අන්තො සාණිං නිසීදා-
පෙත්වා සාණියං ඡිද්දං කාරෙත්වා බ්‍රාහ්මණස්ස [11] ඡිද්දාභි
මුඛං ආසනං පඤ්ඤාපෙත්වා, නාළිමත්තා [12] සුක්ඛා
අජලණ්ඩිකා පීඨසප්පිස්ස සන්තිකෙ ඨපාපෙත්වා
බ්‍රාහ්මණං උපට්ඨානකාලෙ ආගතං තස්මිං ආසනෙ
නිසීදාපෙත්වා කථං [13] සමුට්ඨාපෙසි.

---

1 පිළා, 2 ගල් විදීමෙහි, 3 වෙළෙප්‍යුත්, 4 සුලු කාසියක්, 5 සිදුරු ඇති බැවින්, 6 බලන්නේ 7 කෙන + එතානි, 8 නිහඬ, 9 එළු බෙටි, 10 තිරය ඇතුළෙහි, 11 සිදුර ඉදිරියෙන්, 12 වියළි, 13 පටන් ගත්තේය.
* විසුරුවා.

7 බ්‍රාහ්මණො අඤ්ඤස්ස ඔකාසං අදත්වා රඤ්ඤා සද්ධිං කථෙතුං ආරභි. අථස්ස පීඨසප්පී ¹ ඡාණිච්ඡිද්දෙන එකෙකං අජලණ්ඩිකං ² තාලුතලම්හියෙව ³ පාතෙති. බ්‍රාහ්මණො ආගතාගතං නාළියං තෙලං ⁴ පවෙසෙන්තො විය ගිලති. සබ්බා ⁵ පරික්ඛයං ගමිංසු.

8 රාජා තාසං පරික්ඛීණභාවං ඤත්වා ආහ. 'ආචරිය තුම්හෙ අතිමුඛරතාය නාළිමත්තා අජලණ්ඩිකා ගිලන්තා කිඤ්චි ⁶ න ජානිත්ථ. ඉතො දානි උත්තරිං ⁷ ජීරාපෙතුං න සක්ඛිස්සථ. ගච්ඡථ. ⁸ පියඞ්ගුදකං ⁹ පිවිත්වා ඡඩ්ඩෙත්වා අත්තානං අරොගං කරොථ. රාජා ¹⁰ කණ්ණසුඛං ජාතං ති පීඨසප්පිස්ස චත්තාරො ගාමෙ අදාසි.

සාලිත්ත ජාතකය 553.

## 32 පාඩම.

1 අතීතෙ බාරාණසියං බොධිසත්තො ¹¹ මූසිකයොනියං පටිසන්ධිං ගහෙත්වා ¹² අනෙක සත මූසික පරිවාරො අරඤ්ඤෙ විහරති.

2 අථෙකො ¹³ සිඟාලො ඉතොචිතොච විචරන්තො තං මූසිකයූථං දිස්වා ඉමෙ ¹⁴ මූසිකා වඤ්චෙත්වා ඛාදිස්සාමීති. චින්තෙත්වා මූසිකානං ¹⁵ ආසයස්සාවිදූරෙ ¹⁶ සූරියාභිමුඛො වාතං ¹⁷ පිවන්තො එකෙන පාදෙන අට්ඨාසි.

3 බොධිසත්තො ගොචරං චරමානො තං දිස්වා, සීලවා එසො භවිස්සතීති තස්ස සන්තිකං ගන්ත්වා භන්තෙ ත්වං කො නාමොති පුච්ඡි.

"ධම්මිකො නාම"

---

1 තිරයෙහි සිදුරෙන්, 2 තල්ල ඇතුලෙහි, 3 හෙලයි. 4 වදින්නාක් මෙන්, 5 අවසන්, 6 නොදත්තහුය. 7 දිරවා ගන්නට, 8 පුවඟු කොටා මිරිකා ගත්දිය, 9 බී, 10 කනටසුවයක්, 11 මීජාතියෙහි, 12 නොයෙක් සිය ගණන්, මී පිරිවර ඇත්තේ, 13 සිවලා, 14 මී රැළ, 15 ගෙය ලඟ, 16 හිරු දිශා බලා ගත්තේ, 17 බොමින්,

"චත්තාරො පාදෙ භූමියං [1] අට්ඨපෙත්වා තස්මා එකෙනෙව ඨිතොසි. 'මයි චත්තාරො පාදෙ පඨවියං ඨපෙන්තෙ පඨවී [2] වහිතුං න සක්කොති. තස්මා එකෙනෙව තිට්ඨාමි.

"මුඛං [3] විවරිත්වා කස්මා ඨිතොසි?"

මයං අඤ්ඤං [4] න භක්ඛයාම වාතමෙව භක්ඛයාම"

"අථ කස්මා සූරියාභිමුඛො තිට්ඨසි?"

"සූරියං නමස්සාමි."

බොධිසත්තො තස්ස වචනං සුත්වා සීලවා එසො භවිස්සතීති තතො පට්ඨාය මූසිකගණෙන සද්ධිං සායං [5] පාතං තස්ස උපට්ඨානං ගච්ඡති.

4 අථස්ස උපට්ඨානං කත්වා ගමනකාලෙ සිගාලො [6] සබ්බපච්ඡිමං මූසිකං ගහෙත්වා මංසං ඛාදිත්වා [7] අජ්ඣොහරිත්වා මුඛං [8] පුඤ්ඡිත්වා තිට්ඨති. [9] අනුපුබ්බෙන මූසිකගණො [10] තනුකො ජාතො. මූසිකා පුබ්බෙ අම්හාකං අයං ආසයො [11] නප්පහොති. [12] නිරන්තරා තිට්ඨාම, ඉදානි [13] සිථිලා. එවම්පි ආසයො [14] නපූරතෙව කින්නු ඛො එතන්ති බොධිසත්තස්ස තං පවත්තිං [15] ආරොචයිංසු

5 බොධිසත්තො කෙනනු ඛො කාරණෙන මූසිකා [16] තනුත්තං ගතාති චින්තෙන්තො සිගාලෙ [17] ආසඞ්කං ඨපෙත්වා [18] වීමංසිස්සාමි තන්ති උපට්ඨාන කාලෙ සෙස මූසිකා පුරතො කත්වා සයං පච්ඡතො අගමාසි. සිගාලො තස්ස උපරි [19] පක්ඛන්දි.

6 බොධිසත්තො අත්තනො ගහණත්ථාය පක්ඛන්දන්තං දිස්වා නිවත්තිත්වා,

---

1 නොතබා 2 උසුලන්ට, 3 හැරගෙණ, 4 අනිකක් නොකමු. 5 උදය, 6 සියල්ලන්ට පසුව යන, 7 ගිල, 8 පිස දමා, 9 පිළිවෙළින්, 10 අඩු විය. 11 නොපොහොසත් වෙයි. 12 හැසි, 13 තුනීය, 14 න පූරති + එව = නො පිරෙයි. 15 කීහ. 16 තුනී බවට, 17 සැකය, 18 සොයන්නෙමි 19 පැන්නේය

"භො සිගාල, ඉදං [1] තෙ වත සමාදානං [2] න ධම්ම සුධම්මතාය, පරෙසං පන [3] විහිංසනත්ථාය [4] ධම්මං ධජං කත්වා චරසි;"

7 මූසික රාජා කථෙන්තො කථෙන්තො යෙව [5] උප්පතිත්වා තස්ස ගීවාය පතිත්වා හනුකස්ස හෙට්ඨා අන්තො ගල නාලියං ඩසිත්වා ගලනාලිං [7] ඵාලෙත්වා [8] ජීවිතක්ඛයං පාපෙසි. මූසිකගණො නිවත්තිත්වා සිගාලං මුරු මුරූති ඛාදිත්වා අගමාසි.

බිළාර වත ජාතකය 388

---

## 33 පාඩම.

1 අතීතෙ බාරාණසියං බොධිසත්තො රුක්ඛ දෙවතා හුත්වා නිබ්බත්ති. තදා එකස්මිං ගාමකෙ [1] බාළිසිකො වසති. අථෙකො බාළිසිකො [2] බළිසං ආදාය දහරෙන පුත්තෙන සද්ධිං ගන්ත්වා [3] සොබ්භෙ බළිසං [4] ඛිපි. බළිසො [5] උදකං පටිච්ඡන්නෙන එකස්මිං ඛාණුකෙ [6] ලග්ගි.

2 බාළිසිකො තං ආකඩ්ඪිතුං අසක්කොන්තො චින්තෙසි "අයං බළිසො මහාමච්ඡෙ ලග්ගො භවිස්සති. පුත්තකං මාතු සන්තිකං පෙසෙත්වා [7] පටිවිස්සකෙහි සද්ධිං කලහං [8] කාරාපෙමි එවං ඉමෙ න කොචි කොට්ඨාසං [9] පච්චාසිංසතීති.

සො පුත්තකං ආහ. "ගච්ඡ, තාත! මහාමච්ඡං නො ලද්ධභාවං මාතු ආචික්ඛාහි, පටිවිස්සකෙහි කිර සද්ධිං කලහං කාරෙහීති වදෙහී"ති.

---

1 තුඹගේ වත් සමාදානය, 2 දැහැමි වුවත් පිණිස නොවෙයි 3 පෙළීම පිණිසය. 4 ධර්ම කොඩියක් කොට, 5 ඇගට පැන, 6 ගලනාලය, 7 පලා, 8 මරණයට,

1 බිලිබාත්තෝ, 2 බිලිය, 3 වලෙහි, 4 දැම්මේය 5 දියෙන්වැසීගිය. 6 පටලැවුනේය, 7 ලඟසිටියවුන්සමඟ, 8 කරවමි. 9 බලාපොරොත්තුවෙයි,

3 සො පුත්තං [10] පෙසෙත්වා බළිසං ආකඩ්ඪිතුං අසක්කොන්තො [11] රජ්ජුච්ඡෙදනභයෙන [12] උත්තරසාටකං ඵලෙ ඨපෙත්වා උදකං ඔතරිත්වා මච්ඡලොභෙන මච්ඡං [13] උපධාරෙන්තො ඛාණුකෙසු පහරිත්වා ද්වෙපි අක්ඛීනි [14] භින්දි.

ඵලෙ ඨපිත සාටකං පිස්සෙකො චොරො [1] හරි. සො [2] වෙදනාමත්තො හුත්වා හත්ථෙන අක්ඛීනි [3] උප්පීළියමානො ගහෙත්වා උදකා උත්තරිත්වා කම්පමානො සාටකං පරියෙසති.

4 සාපිස්ස භරියා කලහං කත්වා කස්සචි අපච්චාසිංසනභාවං කරිස්සාමී'ති එකස්මිංයෙව කණ්ණෙ [4] තාලපණ්ණං පිළන්ධිත්වා එකං අක්ඛිං [5] උක්ඛලිමසියා [6] අඤ්ජෙත්වා [7] කුක්කුරං [8] අඞ්කෙනාදාය [9] පටිවිස්සක ඝරං ආගමාසි.

5 අථ නං එකා [10] සහායිකා එවමාහ. එකස්මිංයෙව එත කණ්ණෙ තාලපණ්ණං [11] පිළන්ධිතං, එකං අක්ඛිං [12] අඤ්ජිතං. පියපුත්තං විය කුක්කුරං අඞ්කෙනාදාය ඝරතො ඝරං ගච්ඡසි, කිං උම්මත්තිකාසි ජාතා ? ති,

6 නාහං උම්මත්තිකා ත්වම්පන මං අකාරණෙන අක්කොසසි. පරිභාසසි. ඉදානි තං [13] ගාමභොජකස්ස සන්තිකං ගන්ත්වා අට්ඨකහාපණෙ දණ්ඩාපෙස්සාමී'ති එවං කලහං කත්වා උභොපි ගාමභොජකස්ස සන්තිකං ආගමංසු.

7 කලහෙ [14] විසොධියමානෙ තස්සායෙව මත්ථකෙ දණ්ඩො පති. අථ නං බන්ධිත්වා දණ්ඩං දෙහී'ති පොථෙතුං ආරභිංසු.

---

10 යවා, 11 ලනුව කැඩීම යන බියෙන්, 12 උඩින්රෙද්ද, 13 සොයන්නේ, 14 අඹුවිය.

1 ගෙණගියේය. 2 දුක්වෙදනා ඇත්තේ, 3 අතගාමින්, 4 තල්කොළයක් 5 වළන්දැලියෙන්, 6 ඇඳ, 7 බල්ලෙකු, 8 උකුළෙත් වඩාගෙණ, 9 ළඟ ගෙට, 10 යහළුස්ත්‍රියක්, 11 පැළඳින ලද. 12 ගානලදී. 13 ගම්දෙටුවාගේ, 14 විමසන කල්හි,

8 රුක්ඛදෙවතා ගාමෙ තස්ස ඉමං පවත්තිං අරඤ්ඤෙ වසන්තා [2] පතිතො තං [3] ව්‍යසනං දිස්වා [4] ඛන්ධන්තරෙ ඨිතා සො පුරිස, තුය්හං උදකෙපි කම්මන්තා [5] පදුට්ඨො, ථලෙපි; උභතො [6] භට්ඨොසි ජාතොති'' ආහ.

උභතො භට්ඨජාතකය 406

---

අභ්‍යාසය.

I

1 කීදිසො සීලවරාජා?
2 කථං සො ආවාටම්හා මුත්තො?
3 රඤ්ඤො සන්තිකං කෙ ආගතා? කිමත්ථාය?
4 ද්වෙ යක්ඛා රඤ්ඤො කිං කිං කම්මං කරිංසු
5 චොර රාජා අත්තනො බලවාහනං ගහෙත්වා කිමත්ථාය සකරට්ඨං ගතො?
6 පූරයතු.
සීලව රාජා........අකාසි. (කොපං, මෙත්තං, උපකාරං)
යක්ඛා............අදංසු. (උදකං; ධනං, විසං)
සිඟාලා ..........උපගච්ඡි. (මනුස්සං, රාජානං, ගෙහං)
යක්ඛිනී...........ඤාතං. (අපරාධං, තව ගුණං, තව සීලං)

ii

1 අතීතෙ කො කපියොනියං ජාතො?
2 නදී මජ්ඣෙ කිමත්ථි?
3 නදියා පාරිමතීරෙ කිමත්ථි?
4 වානරින්දො, කථං දීපං ගච්ඡති?
5 කුම්භීලො කත්ථ වසති?
6 වානරින්දං ගණ්හිස්සාමීති කො පිට්ඨි පාසාණෙ නිපජ්ජි?
7 වානරින්දො කුම්භීලං කථං වංචෙසි?
පාසාණො පටිවචනං......... (ගණ්හාති, න දෙති, ලභති)
කුම්භීලො වඤ්චෙතබ්බොති...........(අකාසි චින්තෙසි අනාසි.)

---

2 හිමියාගේ, 3 කරදරය, 4 බැම්මෙහි, 5 දූසිතවිය. 6 බිඳුනේය.

අහං අත්තානං............ (ගණ්හිස්සාමි, පරිච්චජිස්සාමි, තාපෙස්සාමි.)

බොධිසත්තො පාසාණං......... (ඔතාරෙසි. ඔලොකෙසි. පහරි.)

සො පරතීරෙ............(අගමාසි. අට්ඨාසි. අකාසි.)

iii

1 ඉල්ලීසො කීදිසො භවති?
2 සො කිං සණ්ඨාපෙසි?
3 ඉල්ලීසො කිං පාතුං ඉච්ඡි?
4 සො තං පාතුං නාදෙති?
5 සො ඉල්ලීස වණ්ණෙන ආගතො?
6 සො භරියං කිං අවදි?

............දානපතිනො අහෙසුං (මච්ඡරී, මාතාපිතරො)
............පරික්ඛයො භවිස්සති (ආහාරං, ධනං, ගුණං)
.........සුරං පාතුං ආරභි. (සක්කො, ඉල්ලීසො, ධුත්තො)
............උපට්ඨාක මනුස්සා පරිවාරෙසුං. (ඉමෙ, සබ්බෙ, උභො)
............දානං දම්මි. (ඉල්ලීසො, අහං, සක්කො)
යථා රුචිතා දෙථාති ආහ. (දාසො, භරියා, රාජා)

iv

1 සො භෙරිං චරාපෙසි?
2 යාවදත්ථං ගහෙත්වා ගච්ඡථාති කො ආහ?
3 සො මහාමග්ගං පටිපජ්ජි? කිමාදාය?
4 ඉල්ලීස සෙට්ඨි කිං කරොන්තො අට්ඨාසි?
5 සො රථං සජ්ජානීත්වා කිං අකාසි?
6 ගෙහමාගතස්ස ඉල්ලීසස්ස කා පවත්ති?
7 සක්කො ආකාසෙ ඨත්වා කිං අභාසි?
8 චරාපෙසි, ගච්ඡති, ගණ්හි, පක්කාමි, පරිංසු. විලුම්පාපෙථ, න ජානාථ, වීමංසථ, ආගච්ඡාමි, පාපෙස්සාමි, අට්ඨාසි; කත්තුකම්මපදෙහි ඝටයතු.

9 හෙරිවාදක, අඤ්ඤතරෙ, මනුස්සො, මහාජනො, ධනං, ඉල්ලීස සෙට්ඨි, සක්කො, රාජා, චෙටකා, තුම්හෙ, අහං, අඛ්‍යාත පදෙහි සද්ධිං ඝටයතු.

10 'ඉල්ලීස සෙට්ඨි' රචයතු.

v.

1 කීදිසො අමච්චො අහොසි?

2 රාජා කිං උපධාරෙන්තො විචරති?

3 එකො පීඨසප්පි කිං ජානාති?

4 සො කිං කරොති?

5 රාජා කිං පස්සි?

6 පීඨසප්පිනා කිං ලද්ධං?

7 පීඨසප්පි කථං බ්‍රාහ්මණං වචනුපච්ඡෙදං අකාසි?

8 රාජා තං කිං දාපෙසි?

9 පූරයතු :

බාරාණසී රාජා උය්‍යානං..............,

බ්‍රාහ්මණො තථං............,

සබ්බා පරික්ඛයං............,

පීඨසප්පිස්ස චත්තාරො...........,

10 පීඨසප්පි කථං ජීවිතං කප්පෙසි?

vi

1 මූසික යොනියං කො නිබ්බත්ති?

2 සිගාලො කථං නිපජ්ජි? කිමත්ථාය?

3 සිගාල මූසිකානං උත්තර පච්චුත්තරකථං කථෙතු?

4 මූසිකො සිගාලං කථං වීමංසි?

5 මූසිකො සිගාලං කථං ජීවිතක්ඛයං පාපෙසි?

6 පූරයතු :

...........පාතුකො ජාතො

...........උපට්ඨානං ගච්ඡති

...........භූමියං අවට්ඨපෙත්වා

...........තස්ස වචනං සුත්වා

............කණ්ඨෙන්නතා කණ්ඨෙනෙතා යෙව.

............හෙට්ඨා අනෙන්තා ගලතාලියං.

7 "සිගාලො" වණ්ණෙතු.

8 'මූසිකරාජා' වණ්ණෙතු.

vii

1 කා රුක්ඛ දෙවතා?

2 බාලිසිකො කිං කරොති?

3 බාලිසිකො කෙන වංචිතො

4 සො පච්ඡා කිං අකාසි?

5 තස්ස කායො වීපත්තියො අහෙසුං?

6 තස්ස භරියා කථං පටිපජ්ජි?

7 ගච්ඡි, ආචික්ඛාහි, පච්චාසිංසති, නිද්දි, පරිභාසති, අකාසි, පරියෙසි, ආරභිංසු;
සාධාතු කම්ම පදෙහි සටයතු.

8 කාලෙන විසොධියමානෙ තස්සායෙව මජ්ඣෙ දණ්ඩො පති. එතෙසං වචනානං විග්ගහං කරොතු.

9 'බාලිසිකො' වණ්ණෙතු.

10 භරියාය ගහිතවෙසං ආචික්ඛතු.

---

# 3 කාණ්ඩය.

වාක්‍යයන්හි කාරක යෙදෙන අයුරු,

## 34 පාඩම.

වාක්‍යය වනාහි 'යොග්‍යතා, ආකාඞ්ක්‍ෂා, ආසත්ති' යන ගුණයන්ගෙන් සමන්විත වෙයි.

**යොග්‍යතා**

සම්බන්ධවන පදාර්ථයන්ගේ අන්‍යොන්‍ය විරුද්ධත්වයක් නැතිකම යොග්‍යතා නම්.

'ජලෙන සිඤ්චති.
'අග්ගිනා ඩය්හතෙ.'
'උදකෙ නිමුජ්ජති.'

ජලයෙන් ඉසීමෙකිද, ගින්නෙන් දැවීමෙකිද, දියෙහි කිමිදීමෙකිද යන මෙහි අන්‍යොන්‍ය විරුද්ධාර්ථයක් ප්‍රකාශ නොවේ.

"අග්ගිනා සිඤ්චති"
"ජලෙන ඩය්හතෙ."
"භූමියං නිමුජ්ජති."

ගින්නෙන් ඉසී. දියෙන් දැවේ. බිම කිමිදියි. මෙසේ කීකල එහි පවත්නා විරුද්ධත්වය මනාව අවබෝධ වේ.

එහෙයින් වාක්‍ය රචනාවෙහි දී මේ ගැණ කල්පනාකාරී වියයුතුයි.

ආකාංක්ෂා

වාක්‍යයන්ගේ අදහස අවබෝධ කර ගැණීම පිණිස එක් පදයක් ඇසූ කල්හි ඊළඟ පදය අසා ගැණීම පිණිස ඇතිවන බලාපොරොත්තුවයි. ක්‍රියා පදයක් අසන්ට ලැබීමෙන් කාරක පදයාගේ ද, කාරක පද ශ්‍රවණයෙන් ක්‍රියාපදයාගේද ඇසීමට ඇතිවන බලාපොරොත්තුව ආකාංක්ෂා නම්.

'බුද්ධො' යි හෝ 'බුද්ධො ධම්මං' යි ඇසූ කල්හි 'අභාසි' යන ක්‍රියා පදය ගැණ බලාපොරොත්තු වෙති.

ආසත්ති

මුලින් පදයට අනතුරුව ඊළඟ පදය කල් නොයවා කීම 'ආසත්ති' නම්. මුලින් පදය කියා මද වේලාවක් ගත කොට දෙවැනි පදය කීමෙන් ඒ වාක්‍යය ආසත්ති ගුණයෙන් ඈත් වේ.

බුද්ධො ධම්මං.......................................... අභාසි.

මෙසේ අනික් පදය කල්පසුකොට කීම වාක්‍ය දෝෂයකි. එබැවින් 'බුද්ධො ධම්මං අභාසි' කීකල එය නිදොස් වේ.

## 34 අභ්‍යාසය

### i ශොධනය.

1 සකුණා පඨවියං ඩෙති.
2 මනුස්සා ආකාසෙ තිට්ඨන්ති.
3 අස්සා සමුද්දෙ නිසීදන්ති.
4 සකබර සාඨ්ලා භූමියං චරන්ති.
5 දෙවො වස්සන්ති.
6 සප්පා ගච්ඡාමි.
7 අහං තිට්ඨසි.
8 මනුස්සා වසති.
9 රුක්ඛො පතිංසු.
10 මයං භුඤ්ජාමි.
11 මූතයො වීහිං පාපං ඛාදති ගරහන්ති ගද්‍රභො,
12 අරයො සීවං ධනානි ජිඥන්ති ඉච්ඡන්ති.
13 එකදා ජිණ්ණො සම්බුද්ධස්ස විහාරං ගන්ත්වා
බ්‍රාහ්මණො ධම්මං සුණි.
14 භූපතො පිණ්ඩාය විහාරං පවිසිත්වා ඨානෙ
අගන්ත්වා ගුළෙහ සයි
15 තස්මිං පුරිසො නියුත්තකා පාටලිපුත්තනගරං රථෙ
අගමාසි.

---

## 35 පාඩම.

### වාක්‍යයන්හි පදසංගත විධිය.

1 සංක්ෂිප්ත වාක්‍යයක නාම මූලින් කර්තෘපදයද ඉක්බිති ක්‍රියාපදයද යෙදිය යුතුයි.

1 දෙවො වස්සති. 3 මෙඝො ගජ්ජති.
2 කුමාරො කීළති. 4 රුක්ඛො පතති.

2 නියොගයෙහි මේය විකල්පවේ.

“ත්වං ගච්ඡ
ගච්ඡ ත්වං
එහි ත්වං
ත්වං එහි
ත්වං ගච්ඡ ජෙතවනාරාමං
ගච්ඡ ත්වං ජෙතවනාරාමං”

3 ක්‍රියාව සකර්මක වූ කල්හි පළමුවෙන් කර්තෘ ද දෙවෙනිව කර්මය ද තෙවැනිව ක්‍රියාවද යෙදේ.

[1] කස්සකො ඛෙත්තං [2] කසති
කුමාරෙ මාතරං වන්දති.
වඩ්ඪකී රුක්ඛං ඡින්දති.
සූදෙ ඔදනං පචති.

4 ක්‍රියාව විකර්මකවූ කල්හි මුලින් අප්‍රධාන කර්මය යෙදේ.

මාතා කුමාරං චන්දං දස්සයති
මාලාකාරො රුක්ඛං පුප්ඵානි [3] කත්තාති.
දූතො ගාමං භාරං නයති
යාචකො ධනිං ධනං යාචතෙ.

5 අවසාන ක්‍රියාවට මුලින් අනික් ක්‍රියාවෝ යෙදෙති. ඒ ඒ ක්‍රියාවන්ට යමක් යමක් කර්මය වේනම් එය ඒ ක්‍රියාවට ඉදිරියෙහි ම යෙදිය යුතුයි.

“අදින්න පුබ්බකො සයමෙව සුවණ්ණානි [4] කොට්ටෙත්වා මට්ඨානි [5] කුණ්ඩලානි කත්වා අදාසි.

“සිගාලො සබ්බ පච්ඡිමං මූසිකං ගණ්හිත්වා මංසං ඛාදිත්වා අජ්ඣොහරිත්වා මුඛං පුඤ්ඡිත්වා තිට්ඨති.’

“බොධිසත්තො මූසිකයොනියං පටිසන්ධිං ගණ්හිත්වා වුද්ධි-මන්වාය මහාසරීරො සූකරච්ඡාපකසදිසො හුත්වා අනෙකසතමූසිකපරිවාරො අරඤ්ඤෙ විහරති.”

---

1 ගොවියා, 2 වපුරයි, 3 නෙළයි. 4 තලා, 5 අරුංගල්.

6 විශේෂණ පදය එම විශේෂ්‍යයට පෙරටුව යෙදිය යුතුයි. එහෙත් විශේෂණ පද කීපයක් වූකල්හි 'ච' ශබ්දයකින් එය සම්බන්ධකරණු.

"දුබ්බලො කුමාරො."
දීඝා රත්ති.'
'සුගන්ධං පුප්ඵං'

අප්පිණය වණ්ණ ඵරුසෙ ච පිඞ්ගල රූපෙ [1] මනො;

7 ඉදින් විශේෂණ පදය විශේෂ්‍ය පදයට ප්‍රධාන වේ නම් විශේෂ්‍ය පදයට අගින් යෙදේ.

"මහාසුවණ්ණො නාම [2] කුටුම්බිකො අඩ්ඪො මහද්ධනො මහාභොගො අපුත්තකො අහොසි"

8 ක්‍රියාවිශේෂණ පදය ඒ ක්‍රියාවට මුලින් ලගම යෙදේ.

සුඛං ගච්ඡති.
අභිණ්හමුපදිස්සරෙ,
මධුරං භාසති.
තුරිතං ගච්ඡති.
මුහුං මුහුං පස්සති.

9 සර්වනාමයක්වූ විශේෂණය විශේෂ්‍යයට මුලින් හෝ අගින් යෙදේ.

එස පණ්ඩිතො
පණ්ඩිතො එසො
අහං බුද්ධො
බුද්ධො හං

10 කරණ විභක්ත්‍යන්ත පදය කර්තෘ පදයට අගින්ද කර්මයට හෝ අධිකරණයට මුලින්ද යෙදේ.

'උපාසකො සහත්ථෙන දානං දෙති.'
'කපි මාරකො තිඛිණ සත්ථෙන සත සන්ධිතෙසු මංසං උප්පාටෙත්වා ගණ්හාති.'

---

1 මළ කල්හි, 2 ධනය ඇත්තා,

11 චල, භය, උප්පත්ති, ආදාන, අන්තරහිත යනාදිය අර්ථ කොට ඇති ධාතූන්ගෙන් නිපන් ක්‍රියා පදයක් වේ නම් එහි අපාදානය ඊට මුලින් ඒ සමග ම යෙදේ.

රුක්ඛතො පතිතො නරො'
චොරස්මා භීතො,'
'උභතො සුජාතො,'
ආචරියම්හා ගණ්හාති.'
සාවත්ථියා අන්තරහිතො'

12 ස්ථාන වාචකවූද, කාල වාචකවූද අධිකරණය වනාහි වාක්‍යාරම්භයෙහි යෙදේ.

'සාවත්ථියං මහාසුවණ්ණො නාම කුටුම්බිකො අහොසි'
'තස්මිං සමයෙ පුරොහිතො දසපරිස පරිවුතො නහානත්ථාය නදීතීරං ආගතො.'

13 ස්ථානවාචකවූද, කාලවාචකවූද අධිකරණද්වයක් එකම වාක්‍යයක යෙදෙන කල්හි කාලවාචක වූ අධිකරණය මුලින් යෙදේ.

"අතීතෙ මගධරට්ඨෙ තස්මිංයෙව පදෙසෙ මහාබොධිසත්තො වට්ටකයොනියං පටිසන්ධිං ගහෙත්වා මාතු කුච්ඡිතො ජාතො."

14 සම්බන්ධපදය සම්බන්ධීහුගේ පූර්වයෙහි යෙදේ.

"ඝාතිකස්ස කාලම්හා"
"වෙසාඛස්ස පුණ්ණමී දිවසෙ"
"ආසාළ්හිස්ස පාටිපදියං."
"ජෙතවනස්ස අවිදූරෙ."

15 සම්බොධනපදය වාක්‍යාරම්භයෙහි යෙදේ.

"තිස්ස! මා එවං කරි, තවෙව දොසො."
"කූටජටිල! අභිසපිස්සාමි."
"භන්තෙ! අහං පුබ්බෙ යථා තථා වා ජීවිතං

කාපෙසන්ති කුච්ඡිපූරං තාලපක්කං."
"ආවුසො! තුම්හෙ කිංනාම කරොථ."
"භන්තෙ! තුම්හෙ අම්හාකං එකදිවසම්පි
ව්‍යඤ්ජනත්ථාය මච්ඡං න දෙථාති ආහ."

16 හා, අහො, කට්ඨං යනාදී ඛේදවාචක හා විස්මය වාචක අව්‍යයෝ වාක්‍යාරම්භයෙහි යෙදෙති.

"හා දෙව"

"අහො තෙ භාරියං කම්මං කතං."

"අහො පණ්ඩිතා වතායං මල්ලිකා"

'කට්ඨං එකපුත්තක.'

17 අථ, අපි කථං, යනාදි අව්‍යය පදයෝද, කිං ශබ්දය පිළිබඳ රූපද, තනි ශබ්දරූපද බොහෝසෙයින් වාක්‍යාරම්භයෙහි යෙදෙති.

"අථ රාජා භාගිනෙය්‍යස්ස බහි ගෙහං දාපෙසි."

"අපි වීරක පස්සසි සකුණං මඤ්ජුභාණකං."

"කථං ධම්මං චරිස්සති."

"කිං නාමෙතං සත්ථාරු කතං,'

"කො නාමො තෙ සත්ථා"

"කස්ස දෙසො."

'කො වා ත්වං කස්ස වා පුත්තො,'

'කතීහි පරිසුජ්ඣති.

'කති වස්සා."

පාලිභාෂා විෂයෙහි නිත්‍යරීතිහු දුර්ලභ වෙති. මෙහි දක්වූයේ ගද්‍යවාක්‍ය විෂයෙහි බොහෝ සෙයින් බලපවත්නා රීති සමහරකි. මොහුද පද්‍ය වාක්‍යයෙහිදී වැඩිපුර බල නොපැවැත්වෙති. මෙහි මතු දක්වෙන අභ්‍යාසවලින් මේ රීතීන් පහදා ගන්න.

## නො ගැඹුරු වාක්‍යයන්හි අදහස් විචාරීම.

# 36 පාඩම.

(සිංහලයට පෙරළනු.)

### 1 අභ්‍යාසය.

අතීතෙ මගධරට්ඨෙ රාජගහනගරෙ එකො මගධරාජා රජ්ජං කාරෙසි.

තත්‍ථ සුමෙධො නාම බ්‍රාහ්මණො පටිවසති. සො අසද්ධං කම්මං අකත්‍වා බ්‍රාහ්මණකම්මමෙව උග්ගණ්හි.

තං පන භික්ඛුං සත්‍ථා ආමන්තෙසි. පුබ්බෙ පණ්ඩිතා අනායතනෙපි විරියං අකංසු. යො වා ආහන්ද,

අයං මම පුත්‍තො සොසන්තො නාම. [1] ගාමසතතො [2] පණ්ණාකාරං ආහරාපෙත්‍වා ඉමස්ස ජනපදසෙට්ඨිනො ධීතරා සද්ධිං මංගලං කත්‍වා, අත්තනො වසනගාමස්ස මජ්ඣෙ [3] විභූමකං ගෙහං කාරෙත්‍වා [4] පාකාර පරික්ඛෙපෙන චෙව [5] පුරිස ගුත්තියා ච [6] සුසංවිහිතාරක්ඛං කරොතු.

මියමානසද්ධම ඉදසද්ධිද්ධසද්ධම මයා කතන්ති [7] සාසනං [8] පෙසෙතු. එවං කතෙ අහං [9] මාතුලස්ස [10] කාතබ්බ යුත්තකං ජානිස්සාමි.

### 2 අභ්‍යාසය.

අථ තං සා පිතා තෙ දුබ්බලා ජාතා තං පණ්ණාකාරං ගහෙත්‍වා ගච්ඡන්තානං පපංචො භවිස්සති. එතං නිවත්තෙත්‍වා තං සබ්බං අත්තනො කුලගෙහං පෙසෙත්‍වා සෙට්ඨිපුත්තං ආහ.

“සාමි, ත්‍වං අත්තනො පිතුපාද පමෙස්ස තිට්ඨෙය්‍යාසි. අහං [11] උපසිංඝකපස්සෙ ඨස්සාමී”ති. ගෙහං [12] පවිසමානාතෙවච ගෙහස්ස පුරතො ච පච්ඡතො ච ආරක්ඛං ගණ්හථා”ති අත්තනො පරිසෙ [13] ආණාපෙසි.

---

1 ගම් සියයෙන්, 2 තෑගි, 3 දෙමහල්. 4 පවුරකින් වටකිරීමෙන්, 5 මිනිස් මුරකෑබීමෙන්, 6 මොනවට සකරණ ලද ආරක්ෂා ඇත්තක්, 7 ලියුමක්, 8 එවා, 9 මාමාට, 10 කළයුතු දෙය, 11 ඉඟ ඉද්දර, 12 වදිද්දීම, 13 තිගම සොල්ලේය.

පච්චූසකාලෙ පන සෙට්ඨිපුත්තො පිතුපාදපස්සෙ අට්ඨාසි. ඉතරා උස්සීසකපස්සෙ;

තස්මිං ඛණෙ සෙට්ඨි [1] උත්තානකො නිපන්නො හොති.

ආයුඝනකො පනස්ස [2] පාදෙ පරිමජ්ජන්තො 'පුත්තො තෙ සාමි ආගතො' ති ආහ.

කුහිං සො?

එස පාදමූලෙ ඨිතො.

අථ නං දිස්වා [3] ආයකම්මිකං පක්කොසාපෙත්වා,

“මම ගෙහෙ කිත්තකං ධනං?

සාමි, ධනස්සෙව [4] චත්තාළීසකොටියො උපභොග පරි-භොග භණ්ඩානං පන ගාමක්ඛෙත්ත දිපද චතුප්පද යානවාහනානං ච [5] අයං අයං පරිච්ඡෙදො. අහං [6] එත්තකං ධනං මම පුත්තස්ස සොසිතස්ස න දෙමීති [7] වත්තබ්බො, දෙමීති ආහ.

තං සුත්වා සෙට්ඨිධීතා “අයං පුන කථෙන්තො අඤ්ඤං [8] කිංචි කථෙය්‍යා” ති සොකාතුරා විය [9] කෙසෙ විකිරිත්වා රොදමානා “කිං නාමෙතං තාත වදෙථාති [10] මහන්තෙන තං උදරමජ්ඣෙ පහරන්තී පතිත්වා යථා පුන වත්තුං න සක්කොති තථාස්ස උරමජ්ඣෙ මහන්තෙන [11] සඤ්ඤන්තී [12] ආරොදන්තං දස්සෙසි. සෙට්ඨි තං [12] ඛණඤ්ඤෙව කාලමකාසි.

(ධම්මපදට්ඨකථා)

## 37 පාඩම.

### 3 අභ්‍යාසය.

මහාමිත්තත්ථෙරස්සාපි මාතු [14] විසගණ්ඩරොගො උප්පජ්ජි. ධීතාපිස්සා භික්ඛුණීසු පබ්බජිතා හොති.

---

1 උඩුකුරුව, 2 පා මිරිකන්නේ, 3 අයකැමියා, 4 කෝටිසතළිසක්. 5 මේ මේ පමණය; 6 මෙපමණ, 7 කියයුතු වූයේ; 8 වෙනැසක්, 9 කෙස් විසිදුවා 10 සිසින්, 11 අනින්නී, 12 හැඬීම, 13 (ඛණං + එව) එකෙණෙහිම, 14 විසප්පු,

සා තං ආහ. 'ආගච්ඡ අය්‍ය, මාතු සන්තිකං ගන්ත්වා මම අඵාසුභාවං ආරොචෙත්වා භෙසජ්ජං [1] ආහර'' ඉති.
සා ගන්ත්වා ආරොචෙසි.

ථෙරො 'නාහං [2] මූලභෙසජ්ජාදීනි සංහරිත්වා භෙසජ්ජං පචිතුං ජානාමි. අපි ච තෙ භෙසජ්ජං [3] ආචික්ඛිස්සං.

අහං [4] යතො පබ්බජිතො, න මයා ලොභසහගතෙන චිත්තෙන ඉන්ද්‍රියානි [5] භින්දිත්වා [6] විසභාගරූපං ආලොකිත-පුබ්බං.''

ඉමිනා සච්චවචනෙන මාතුයා මෙ ඵාසු හොතු. ගච්ඡ, ඉමං වත්වා උපාසිකාය සරීරං [7] පරිමජ්ජා-''ති.

සා ගන්ත්වා ඉමමත්ථං ආරොචෙත්වා තථා අකාසි. උපාසිකාය තං ඛණංයෙව ගණ්ඩො [8] ඵෙණපිණ්ඩො විය [9] විලීයිත්වා අන්තරධායි. (විසුද්ධිමග්ග)

---

# 48 පාඩම.

## 5 අගතාසය.

[10] තෙන ඛොපන සමයෙන සාවත්ථියං අඤ්ඤතරො භික්ඛු [11] අභිනා දට්ඨො කාලකතො හොති.

අථ ඛො [12] සම්බහුලා භික්ඛූ; යෙන භගවා තෙනුපසං-කමිංසු. උපසංකමිත්වා, භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. [13] එකමන්තං [14] නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං.

ඉධ භන්තෙ සාවත්ථියං අඤ්ඤතරො භික්ඛු අහිනා දට්ඨො කාල කතොති.

---

1 ගෙනෙන්න, 2 මුල්බෙහෙත්, 3 කියන්නෙමි. 4 යම්දවසක පටන්, 5 සතුටුවන සේ, 6 ඇස් ප්‍රියකරණ රූවක්, 7 අතගානු. 8 පෙණ පිඬක් 9 වියළි. 10 ඒ කාලයෙහි, 11 සර්පයකු විසින් ඩැහුයේ, 12 බොහෝ, 13 හුන්නාවූ,

[15] නහනූන සො භික්ඛවෙ භික්ඛු [16] චත්තාරි අහිරාජ-කුලානි මෙත්තෙන චිත්තෙන [1] ඵරි.

[2] සචෙහි සො භික්ඛවෙ භික්ඛු චත්තාරි අහිරාජකුලානි මෙත්තෙන චිත්තෙන [3] ඵරෙය්‍ය. නහි සො භික්ඛවෙ භික්ඛු [4] කාලංකරෙය්‍ය.

[5] අනුජානාමි භික්ඛවෙ ඉමානි චත්තාරි අහිරාජකුලානි මෙත්තෙන චිත්තෙන ඵරිතුං, [6] අත්තගුත්තියා [7] අත්තරක්ඛාය [8] අත්තපරිත්තායාති;

[9] විරූපක්ඛෙහි මෙ මෙත්තං, මෙත්තං [9] එරාපථෙහි මෙ, [9] ඡබ්‍යාපුත්තෙහි මෙ මෙත්තං, මෙත්තං [9] කණ්හාගොතමකෙහි ච, [10] අපාදකෙහි මෙ මෙත්තං, මෙත්තං [11] දිපාදකෙහි මෙ, [12] චතුප්පදෙහි මෙ මෙත්තං, මෙත්තං [13] බහුප්පදෙහි මෙ, මා මං අපාදකො හිංසි, මා මං හිංසි දිපාදකො, [14] මා මං චතුප්පදො හිංසි, මා මං හිංසි බහුප්පදො; සබ්බෙ සත්තා, සබ්බෙ පාණා, සබ්බෙ භූතා ච කෙවලා; සබ්බෙ [15] භද්‍රාණි පස්සන්තු [16] මා කඤ්චි පාපමාගමා (චතුභාණවාර)

---

## සිංහල වාක්‍ය ඛණ්ඩ පාළියට නැගීම.

1 (මේ වාක්‍ය පාළියට නගනු.)

1 මේ පොළොව විශාල වෙයි.
2 මිනිසකු විසින් කට හැකි නොයෙක් දෙය මෙහි තිබේ.
3 නිකම් නොසිටිනු.
4 නිකම් සිටීම පවකි.
5 සිතන්ට ඉක්මන් වෙව.

---

15 නොවේ. 16 නාකුලසතර, 1 මෛත්‍රියෙනොකෙළේය. 2 ඉදින්, 3 මෛත්‍රී කරන්නේ නම්, 4 නොමැරෙන්නේය. 5 නියම කරමි 6. 7. 8. තමන්ගේ ආරක්ෂාව පිණිස 9 එනම්, 10 පා නැත්තවුන්; 11 දෙපා ඇත්තවුන්, 12 සිවුපා ඇත්තවුන්, 13 බොහෝ පා ඇත්තවුන්, 14 නොපෙළාවා, 15 යහපත, 16 කිසියම් කරදරයක් නොවේවා.

මේ වචන බලන්න .— අකිච්චපසුත, පාප .

6 එය කරන්ට ඉක්මන් නොවෙතු.
7 ඔවුන්ට පොත පාඩම් තිබේ. එහෙත් ලොව පාඩම් නැත.
8 දෙටු සොහොයුරු තෙමේ ඉගෙණීමෙහි සමතෙකි.
9 පින් කළ පුරුෂයා සැප විඳියි.
10 ළදරු කුමරුවෝ බන්ධුන්ගේ භාරයට පත්වූහ.
11 පරොපකාරය කරව්.
12 මරණය දුකට පිළියමක් නොවේ.
13 සියල්ලෝම සාකච්ඡා කොට ඉගෙණ ගන්ට නියම කර ගත්හ.

2 (පාලියට පරිවර්තනය කරණු.)

1 ළමයා කොහේ ඉඳලාද?
2 මා ආවේ උද්දේති නුවර සිටලාය. ඇදුරු තුමාගෙන් ශිල්ප ඉගෙණීමටය.
3 ළමයා නුඹ අසත් පුරුෂයෙකි.
4 නුඹ ඇඟ හැමතැනම අසත් පුරුෂ ලකුණු තිබෙනවා.
5 අසත්පුරුෂයා කරපු දෙය මතක නැති කරයි.
6 එහෙයින් මා කැමති නැහැ නුඹට උගන්වන්න.
7 අනේ සවාමීනි.
8 මම දුර සිට පැමිණියෙක්මි. ඉතා දුප්පත් කොලුවෙක්මි.
9 අහිංසක මා කෙරෙහි අනුකම්පා උපදවා සිල්ප ටිකක් උගන්වන්න.
10 පුතේ ! මේ දුප්පත් කොලුවාට සිල්ප ටිකක් උගන්වන් නැයි මවුපියෝ කීහ.
11 ගුත්තිල ඇදුරු මවුපියන්ට ගරු කොට ඔහුට උගන් වන්ට පටන් ගති.
12 ගුත්තිල ඇදුරු දත් සියල්ල මූසිලට ඉගැන්වීය.

---

මේ වචන බලන්න :- පරිචය, ඤාති, පරෙපකාර, පඨකම්ම, චෙටක, අසප්පුරිස, ලක්ඛණ, නිද්ධන,

## 3 (පාලියට පරිවර්තනය කරන්න.)

1 ඇදුරු රහමඬලට පැමිණ වාදනය පටන් ගත්තේය.
2 ජය පරාජය කාට වේදැයි නොකිය හැකි ලෙස වාදය කෙරෙයි.
3 ගුත්තිල ඇදුරු දුන් පරද වේයයි බොහෝදෙනා සිතති
4 ඇදුරු වීණාවෙහි තතක් සින්දේය.
5 වීණා නාදය සිය ගුණයෙන් වැඩිවීය.
6 මූසිලද තතක් සිඳ දැමීය.
7 ඔහුගේ වීණා හඬ සිය ගුණයෙන් අඩුවිය.
8 ඇදුරුතුමා, දෙවෙනි, තුන්වැනි, සතරවැනි, පස්වැනි, සවැනි, සත්වැනි තත්ද ක්‍රමයෙන් සින්දේය.
9 හැම වරකදීම සිය සිය ගුණයෙන් වේණනාද වැඩිවීය.
10 මූසිලද එසේම සින්දේය.
11 ඔහුගේ වීණාවෙහි කිසි හඬක් දුන් නැත.
12 ඇදුරු තුමන්ට ජය අත්විය.
13 මූසිල පරාද වී යම් ලොවට ගොස් වීසුම් ගති.
14 ගුත්තිල ඇදුරු සුරපුරට පැමිණියේය.
15 වාදය මින් කෙළවර විය.

## 4 (පාලියට පරිවර්තනය කරන්න.)

1 එතුමා රජතුමාගේ පෙරෙවි බමුණුය.
2 යුතු අයුතුකම් දන්නෙකි.
3 අනුන්ගේ අයිතිය කඩාගන්ට නොසිතයි.
4 අනුන්ගේ දුකෙහි කම්පා වෙයි.
5 තමන්ට වන දුකක් ලාබ නොබලයි.
6 නඩුව විසඳුයේ කවරෙක්ද?
7 එසෙනම් උසාවියට යමු.
8 ධම්මධ්වජ ඇමතිතුමා නඩු අසුනට නැගුනි.
9 විනිශ්චය කියවා බැලීය.

---

මේ වචන බලන්න:- රඞ්ග, වාදන, තන්ති, සතගුණ, දුතිය, තතිය, චතුත්ථ, පඤ්චම, ඡට්ඨ, සත්තම, යමලෝක, වසි, සමත්ත,

10 අගතියෙන් කරණ ලද්දක් බව වැටහුනේය.
11 විත්තිකරු පරාජය කොට පැමිණිලි කරුව ජය අත් කෙළේය.
12 සියලු දෙනාම සාදු සාදුයි' අත්පොළසන් දුන්නෝය
13 රජතුමා ද මෙය දැන ගත්තේය.
14 සාල සෙනෙවියා ධුරයෙන් අස් කෙළේය.
15 පඬිතුමාට අධිකරණය බාරදුනි.

(5 පාලියට පරිවර්තනය කරන්න.)

1 තුඹ වහන්සේ මා ළඟට එවූයේ කවරෙක්ද?
2 සක්දෙව් රජය.
3 හේ කොහිදී හමුවීද?
4 වනයේදීය
5 කුමකට වනයට පැමිණියේද?
6 අඞ්ග සතරකින් යුත් මිනිසෙකු සොයා නුදුනහොත් මා මරන්නේය. එබන්දෙකු මා කොහෙන් සොයන්නටද?
7 එහෙයින් බෙල්ලේ වැල් ලාගෙණ මැරෙන්ට සිතුවෙමි
8 සක්දෙව් රජ මා සොයාගෙණ එහි පැමිණ මට මේ කරුණ දන්වා දෙව්ලොවට ගියේය.
9 එබැවින් මා සමඟ විත් මගේ දිවි ගළවා දෙන්න.
10 හේද ඊට අතිශයින් ම සතුටු විය.
11 පඬිතුමා ඡත්තපාණී කැඳවා ගෙණ මාලිගාවට ගොස් රජතුමන්ට බාර දුනි.

6 (පාලියට පරිවර්තනය කරන්න·)

1 ඒ උයනේ බොහෝ වඳුරෝ වසති
2 එහා මෙහා පැන ඇවිදින වඳුරු රැළෙන් එක්වැදිරියක්

---

4 මේ වචන උවමනා තැන යොදන්න:=පුරොහිත, යුත්ති, අයුත්ති, සන්තක, සහස්ස, ලාභ, විනිච්ඡිත, අධිකරණ සාලා, විනිච්ඡය, මුදිත, චොදක, පොථයිංසු, ධුර,

5 මේ වචන උවමනා තැන යොදන්න:- කො, චතුරඞ්ග, සමන්නාගතං, ආදි, මනුස්සො, තලතෙයා, සො මං මාරෙයා,

රාජාභරණ දූත වහවහා ගසින් බැස එතනට අවුත් දේවියගේ රන් මාලය කරේ දමාගෙණ ගසට ගියේය.

3 එහි සිටි ගැහැණිය නිදි හෙයින් ඒ කිසිවක් නො දැක්කේය.

4 වැඳිරිය වහා ඇතට පැන මාලය සඟවා තැබීය.

5 පරෙස්සමට සිටි ගැහැණිය අවදිවී බැලූ කල දේවියගේ පලඳනා පෙණෙන්ට නොතිබුණේය.

6 හොරු ගෙණ ගොස් යයි ඈ කලබොල විය.

7 සිරුර වෙව්ලන්ට පටන් ගති.

8 කටේ කෙල සිඳී ගියේය.

9 කිසිවක් විමසා ගන්ට අසමත්වූවා
'හොරෙක් හොරෙක්' යි කෑ ගැසීය.

10 ඇමතියෝ කලබල වී සොරු සොයන්ට පටන් ගත්හ.

## වචනාර්ථ දැක්වීම

### අර්ථ විවෘත්තිය

කිසියම් වාක්‍යයක හෝ වාක්‍යාංශයක අර්ථය අවබෝධ වන සේ පර්‍යාය වචන වලින් දැක්වෙන විවෘත්තිය අර්ථ විවෘත්ති නම්.

එය වනාහි වාක්‍යයෙහි පිහිටි අවබෝධයට දුෂ්කර වූ පදයන්ට පර්‍යාය වචන දැක්වීමකි. පරිවර්තනයේදී සමහර විට පදයාගේ නියම අර්ථය එක් වචනයකින් දිය නොහැකි වූයේ නම් ඒ පිළිබඳව වචන කීපයක් නමුත් දැක්වීමට බාධාවක් නැත.

අථ මාතුලො නන්ද මහාථෙරො කුමාරකං විහාර-මානෙත්වා පබ්බජ්ජාපෙත්වා තෙ පිටකං බුද්ධ වචනං උග්ගණ්හාපෙත්වා බාහිර සමයෙසු ච පරම කොවිදං කාරෙසි.

---

මේ වචන උච්චාරණය සොදන්නා:- උද්‍යාන, වානර, භුවනෙශ්වරමාලා, කම්පෙනී, ප්‍රසසී, ඝෘතං.

අරුත් දැක්වීම

**අථ**– ඉක්බිති; **මාතුලො**– මයිල්වූ; **නන්ද මහාථෙරො**– නන්දනම් ස්ථවිර තෙමේ.

**කුමාරකං** – කුමරු; **විහාරං** – විහාරයට; **ආනෙත්වා** – පමුණුවා; **පබ්බජාපෙත්වා**–හඳුවා ගනුමෙය්; **තෙපිටකං** තුන්පිටකයට අයත්; **බුද්ධ වචනං**– බුද්ධ ධර්මය; **උග්ගණ්හාපෙත්වා** – උගන්වා; **බාහිර සමයෙසු** – අන්‍ය ශාස්ත්‍ර විෂයෙහිද; **පරම කොවිදං**–අතිදක්ෂයෙකු; **කාරෙසි** – කරවීය.

සමාස බාහුල්‍යවූ කල අරුත් බිණීම :-

**අත්ථි සුගතාගම සුධාපගා නිසෙවිත කුදිට්ඨි විස කලඞ්කාය ලඞ්කාය භගවතො අධීරසස්ස මහානාගවනුය්‍යානෙ සමිතිසමාගත යක්ඛරක්ඛස ලොක විජයාපදානස්ස සිද්ධක්ඛෙත්තභූතො සීහල මහීමණ්ඩල මණ්ඩනායමානො විවිධ රතනාකරොපලක්ඛිත මහග්ඝ මණිහෙද්දෙ මණිහෙද්දෙ නාම ජනපදෙ.**

**සුගතාගම සුධාපගාය**— බුදුරදුන්ගේ දම් නැමැති අමා ගඟ දියෙන්; **නිසෙවිත කුදිට්ඨි විසකලඞ්කාය** – සෝදා හරිනලද මිසදිටු නමැති විෂ කලඞ්ක ඇති; **ලඞ්කාය**– ලක්දිව්හි; **මහානාග වනුය්‍යානෙ** – මහානාග වන උයන්හි; **සමිතිසමාගත** – සභායෙහි රැස්වූ; **යක්ඛරක්ඛසලොක** – යක්ෂ රාක්ෂස සමූහයා; **විජයාපදානස්ස** – ජය ගැණීම සිරිත් කොට ඇති; **භගවතො** – භාග්‍යවත් වූ; **අධීරසස්ස** – බුදුරජානන් වහන්සේට;

**සිද්ධක්ඛෙත්තභූතො**–ජය භූමියක්වූ; **සීහල මහීමණ්ඩල** – සිංහල ද්වීපයට; **මණ්ඩනායමානො** – ආභරණයක් වැනිවූ; **විවිධරතනාකරොපලක්ඛ**–නන් රුවන් ආකරයන්ගෙන් විසිතුරුවූ; **මහග්ඝමණිහෙද්දෙ** – අනගි මැණික් ජාති ඇති; **මණිහෙද්දෙ නාම** – මිණිහෙබ් නම්; **ජනපදෙ** – දනව්වෙක්; **අත්ථි** – ඇත්තේය;

**අන් ක්‍රමයක්.**

**යොපන භික්ඛු අනභිජානං උත්තරි මනුස්ස ධම්මං අත්තුපනායිකං අලමරියඤාණදස්සනං සමුදාචරෙය්‍ය ඉතිජානාමි ඉතිපස්සාමීති; තතො අපරෙන සමයෙන සමනුග්ගාහියමානො වා අසමනුග්ගාහියමානො වා ආපන්නො විසුද්ධාපෙක්ඛො එවං වදෙය්‍ය අජාන- මෙවං ආවුසො අවචං ජානාමි අපස්සං පස්සාමි තුච්ඡං මුසා විලපිත්ති. අඤ්ඤත්‍ර අධිමානා අයම්පි පාරා- ජිකො හොති අසංවාසො.**

**යොපන භික්ඛු** - යම්කිසි මහණෙක්; **අනභිජානං**- ස්වසන්තානයෙහි නො උපන් බැවින් ම තමා කෙරෙහි ඇතැයි නොදන්නේ; **අලමරිය ඤාණදස්සනං**-කෙලෙස ප්‍රහාණයෙහි සමර්ථවූ විශුද්ධඥාන දර්ශන ඇති; **උත්තරි මනුස්ස ධම්මං** - ධ්‍යානාදි උතුරු මිනිස් දම්; **අත්තුප නායිකං** - තමා කෙරෙහි එළවා = තමා හෝ එහි එළවා **ඉති ජානාමි** - මේ කාරණයෙන් මා කෙරෙහි ඇතැයි දනිමි. **ඉතිපස්සාමි** මේ කාරණයෙන් ඇසින් දුටුවාසේ දක්මියි; **අඤ්ඤත්‍ර අධිමානා** - අධිගත ධර්ම ඇත්තෙමි යන අභිමානය නැතිව; **සමුදාචරෙය්‍ය** - විඥවූ මිනිස් සතක් හට කියාද? **තතො අපරෙන සමයෙන** - ඒ ආරෝචිත කාලයෙන් අන්‍ය කාලයෙක; **සමනුග්ගාහිය මානොවා**- ධ්‍යාන විමොක්ෂාදීන් අතුරෙහි කවර ධර්මයෙක් තොප විසින් අධිගතද යනාදීන් විචාරණුලබන්නේ හෝ; **අසමනුග්ගාහියමානොවා** - නොවිචාරණු ලබන්නේ හෝ; **ආපන්නො** - ආරෝචිත කාලයෙහිම පරිජි අවන්නේ; **විසුද්ධාපෙක්ඛො**-තමහට ගෘහස්ථ භාවාදි විශුද්ධිය කැමැත්තේ; **ආවුසො** - ඇවැත්නි; **අජානං** - උතුරු මිනිස් දම් තමා කෙරෙහි නැති හෙයින්ම ඇතැයි නො දන්නෙම්; **එවං ජානාමි** - මෙසේ දනිමි. **අපස්සං** නොදක්නෙම්; **එවං පස්සාමි** - මෙසේ දක්මියි. **අවචං**- කීමි, **තුච්ඡං** - වචනාර්ථ රහිතවූ හෙයින් සිස්වූ; **මුසා**

බොරු; **විලපිතනි** - කීම්; **එවං වදෙය්‍ය** - මෙසේ කියාද; **අයම්පි භික්ඛු** - මේ මහණද; **පාරාජිකො** - පරාජයට පැමිණියේ; **අසංවාසො හොති** - අසංවාස වේ.

පැරණි සන්න බොහෝ සෙයින් ලියවී තිබෙන්නේ මේ ක්‍රමයට වෙයි. එයද අපි කීමේදී නිවරදය. ව්‍යාඛ්‍යා ක්‍රමයට මෙය හුඟක් ආසන්න වෙයි. මෙතෙක් දැක්වූයේ පරිවර්තන ක්‍රමය අනුව වෙයි. එයම ලිහිල් කොට පහසු වචනවලින් අරුත් බණින සිරිතක්ද වේ. මෙසේයි,

ලඞ්කාය යක්ඛගණනීහරණෙ ජිනස්ස
චම්මාසනුග්ගත හුතාසන ඵස්ස දූනා
සංසාර රක්ඛස චපුබ්බහව බුබ්බුලංව
යස්මිං විභාති මහියඞ්ගන ථූපරාජා.

**ලඞ්කාය** - ලඞ්කාදීපෙ; **යක්ඛ ගණනීහරණෙ** - යක්ඛ ගණස්ස බහිකරණ කාලෙම; **ජිනස්ස** - භගවතො; **චම්මාසනුග්ගත** - චම්මාසනතො උග්ගතස්ස; **හුතාසන විසදූනා** - අග්ගිස්ස සම්ඵස්ස දූනතො; **සංසාරරක්ඛස** - සංසාර සඞ්ඛාත රක්ඛසස්ස; **චපුබ්බහව බුබ්බුලංව** - සරීරෙ උට්ඨිත බුබ්බුලං විය; **මහියඞ්ගන ථූපරාජා** - මහියංගන නාමකො චේතිය රාජා; **යස්මිං** - යස්මිං ජනපදෙ; **විභාති**; - රාජෙති;

**ව්‍යාඛ්‍යා;**

මේ වනාහි විස්තර වශයෙන් අරුත් බණින ක්‍රමයක් වේ. මෙය මුලින් දැක්වූ රීති අනුගමනය කරමින්ම අලඞ්කාර ඉතිහාසාදියද ප්‍රකට කෙරෙයි.

**එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ.**

**එකන්ති** ගණන පරිච්ඡෙද නිද්දෙසො; **සමයන්ති** පරිච්ඡින්න නිද්දෙසො; **එකං සමයන්ති** අනියාමිත පරිදීපනං; තත්‍ථ **සමය** සද්දො;

සමවායෙ ඛණෙ කාලෙ සමූහෙ හෙතු දිට්ඨිසු.
පටිලාභෙ පහානෙ ච පටිවෙධෙ ච දිස්සති.

– පෙ — භගවා ඉමං අඤ්ඤං වා සුත්තන්තං දෙසෙසි. අච්චන්තමෙව තං සමයං කරුණා විහාරෙණ විහාසි. තස්මිං සමයෙති අත්ථො වෙදිතබ්බො.

භගවාති ගරු ගරුං හි ලොකෙ භගවාති වදන්ති; අයංච සබ්බගුණ විසිට්ඨතාය සබ්බසත්තානං ගරු තස්මා භගවාති වෙදිතබ්බො.

විහරතීති අවිසෙසෙන ඉරියාපථ දිබ්බ අරිය විහාරෙසු අඤ්ඤතර විහාර සමඞ්ගී පරිදීපනමෙතං - පෙ - සො හි එකං ඉරියාපථ බාධනං එකෙන ඉරියාපථෙන විච්ඡින්දිත්වා අපරිපතන්තං අත්තභාවං හරති පවත්තෙති, තස්මා විහරතීති වුච්චති.

ජෙතවනෙති ජෙතස්ස රාජ කුමාරස්ස වනෙ. තං හි තෙන රොපිතං, සංවඩ්ඪිතං, පරිපාලිතං අහොසි. තස්මා ජෙතවනන්ති සඞ්ඛං ගතං, තස්මිං ජෙතවනෙ. අනාථ පිණ්ඩිකස්ස ආරාමෙති අනාථ පිණ්ඩිකෙන ගහපතිනා චතු පඤ්ඤාස හිරඤ්ඤකොටි පරිච්චාගෙන බුද්ධ පමුඛස්ස භික්ඛු සංඝස්ස නිය්‍යාතිතත්තා අනාථ පිණ්ඩිකස්සාති, සංඛං ගතෙ ආරාමෙ;

භාවාර්ථ කථනය

වාක්‍යයෙහි සිටි අලඞ්කාර වර්ණනා අත්හැර දමා ගත යුතු සාරාංශය භාවාර්ථ නම්.

සඞ්ඝබොධි කුමාරො කාථාබිකාරකො තික්ඛ පඤ්ඤවන්තො ච ඤාණ විඤ්ඤාණ සම්පන්නො හුත්වා වයප්පත්තො ලොකස්ස ලොචනෙහි පියමානාය රූප සම්පත්තියා සවණඤ්ජලී පුටෙහි අස්සාදියමාන සදාචාර ගුණ සම්පත්තියා ච සබ්බ යසො සොභො අහොසි.

මේ සාලඞ්කාර වර්ණනාවෙහි භාවාර්ථය නම් "සඞ්ඝබොධි කුමාරතෙමේ ගුණින් නැණින් රුවින් යුක්තයෙකැයි පතළවී ගියේය." යනුයි.

**සංක්‍ෂෙපාර්ථ කථනය.**

අලඞ්කාරය පිණිස උපමාන උපමෙය වශයෙන් දක්වන ලද අරුත්වලින් උපමෙයාර්ථය පමණක් ගෙණහැර දක්වීම සංක්‍ෂෙපාර්ථ කථනයයි. නැතහොත් වැඩිපුර දක්වූ වර්ණනා හැර නියම සවභාවය පෙන්වීමයි.

කරිවරමථ දිස්වා සො ගුහාචාරයාතං
පටිභයරහිතචෙතා සීහරාජංව රාජා
නිජ නගර සමීපායාත මෙතං තරිත්ථං
අමිත බල මහාසෙනාතුරන්තොභියාසි.

**නියම අර්ථය:-**

පසු ඒ පඬිරජතෙම ගෙදෙරට ගියාවූ ඇත් රජකු දුටු නොබිය සිත් ඇති සිහරදෙකු මෙන් අපමණ සෙන් නැමති සැඩ වතුරෙන් සිය නුවර වෙත පැමිණි මේ (බීරධාර) රජහු දිනම්න් ඉදිරියට ගියේය.

**සංක්‍ෂෙපාර්ථය :-**

ඒ පඬිරජ තෙමේ සෙන් සමඟ තමන් රටට පැමිණි (බීරධාර) රජහු දිනා ජය ගත්තේය.

ඵලෙසු තොයෙසු ච පුප්ඵමානකා
විචිත්ත පුප්ඵා විකසිංසු සබ්බථා
නිරන්තරං පුප්ඵ සුගන්ධ වුට්ඨියා
අහොසි සබ්බං වසුධම්බරන්තරං,

**නියම අර්ථය :-**

දිය ගොඩ පිපෙන නන් වැදෑරුම් මල් හැම අයුරින්ම පිපුනාහ. සුවඳ මල් වැස්සෙන් සියලු අහස පොළොව අතර නීරතුරු විය.

**සංක්‍ෂෙපාර්ථය .-**

හැම කලට පිපෙන හැම මල්ම පිපුනාහ. නිතර මල් වැසිද ඇතිවිය.

## වාක්‍යයන්හි අඩුතැන් පිරවීම,

---

වාක්‍යයන්හි යලි ඇතුලත් වියයුතුවූ අර්ථාදිය සලකා සුදුසු පරිදි හිස්තැන් පිරවීම මෙයින් අදහස් කෙරේ. මෙසේ කල එක වාක්‍යයම අදහස් දෙතුන් පරිදි වනසේ සම්පූර්ණ කල හැකිය.

**පිරවියයුතු වාක්‍ය ;-**

— පුත්ත! — ත්වං, — අභාසිං; — ස විසෙසං — කදාචි— ඉන්ද්‍රිය භෙදදීසු — වත්තිතබ්බං. — සතතං — ගුණානු කිත්තනං ——. යෙන — චුති —— භවෙය්‍ය; සබ්බදා — සාධියං ——.

මෙහි අමුතුවෙන් පිරවූ පද කළු අකුරින් දැක්වේ.

1 **ප්‍රිය** පුත්ත! **පුබ්බේ** ත්වං **යං** අභාසිං; **තං** සවිසෙසං **අධිට්ඨාතබ්බං**. කදාචි **මොහවසෙන** ඉන්ද්‍රිය භෙදදීසු **න** වත්තිතබ්බං. **පරං** සතතං **සත්ථු** ගුණානුකිත්තනං **කාතබ්බං**. යෙන **සකානනබ්බම්හා** චුති **න** භවෙය්‍ය; **තත්‍ර** සබ්බදා සාධියං **කාතබ්බං**.

2 **භො** පුත්ත! **අහං** ත්වං **එකදා** අභාසිං **තං** සවිසෙසං **කරොහි**. **න** කදාචි **තයා** ඉන්ද්‍රිය භෙදදීසු **බාහුල්ලෙන** වත්තිතබ්බං. **ආචරියම්හා** සතතං **සත්ථු** ගුණානුකිත්තනං **සොතබ්බං**. යෙන **තම්හා** චුති **න** භවෙය්‍ය, **එතං** සබ්බදා සාධියං **තයා**.

3 **අම්භො** පුත්ත! **පුරා** ත්වං **සබ්බම්**භාසිං; **අධුනා** සවිසෙස**මවගච්ඡ**. කදාචි **කෙනචි** ඉන්ද්‍රිය භෙදදීසු **කථං කථමපි** වත්තිතබ්බං. **අනාරතං** සතතං **මහනීය** ගුණානු කිත්තනං **තක්කෙතබ්බං**. යෙන **තම්හා** චුති **කදා න** භවෙය්‍ය, **එවං** සබ්බදා සාධියං **ජීවිත පරිච්චාගෙනාපි**.

මේ මුලින් දැක්වූ සම්පූර්ණ කටයුතුවූ වාක්‍යය අර්ථය මද මද වශයෙන් වෙනස්වන අයුරු තුන් හැටියකින් පිරවූ පරිදියි.

**මූලික 2 වැනි වර්ෂය.**

# 4 කාණ්ඩය.

(සමාස, තද්ධිත, ආඛ්‍යාත, කිතක, කාරකයන් පිළිබඳ විස්තර දැනීම.)

## 1 සමාස.

වෙන් වෙන්ව පවත්නා පද දෙකක් හෝ වැඩි ගණනක් එක පදයක් වන අයුරු කෙටි කොට දැක්වීම සමාස නම්. එය අව්‍යය, කර්මධාරය, තත් පුරුෂය. බහුබ්‍රීහිය, ද්වන්ද්ව යයි පස් වැදෑරුම් වේ.

i **අව්‍යය සමාසය :**

අව්‍යයෝ නම් නිපාත උපසර්ග දෙදෙනා වෙති. විභක්ති වචන වශයෙන් මේ නිපාත උපසර්ගයන්ගේ වෙනස්වීමක් නැත. එහෙයින් ඔවුනු අව්‍යයෝ නම් වූහ.

අව්‍යය පදය මුලින් සිට අනික් පදයක් සමග වන ගැලපීම අව්‍යය සමාස නම්. මෙහි මුලින් පිහිටි අව්‍යය පදයාගේ අර්ථය ප්‍රධාන විය යුතුයි. නැත්නම් එය අව්‍යය සමාස පදයක් ලෙස ගණන් ගනු නොලැබේ.

උපනගරං (නගරස්ස සමීපං.)
නිද්දරථං (දරථානං අභාවො)
නිම්මක්ඛිකං (මක්ඛිකානං අභාවො)
අනුරථං (රථස්ස පච්ඡා)
අනුවාතං (වාතස්ස පච්ඡා)
අනුජෙට්ඨං (ජෙට්ඨානං අනුපුබ්බො)

අකාරාන්ත අව්‍යය සමාසය විභක්තිවලට වරනැගීමේදී පංචමී විභක්තිය හැර සෙසු විභක්තීන්ට අං ආදෙශ වේ. තතියා සත්තමී ඡට්ඨී විභක්තීන්ට අං ආදෙශය විකල්පයෙන් වේ.

පඨමා. උපනගරං
දුතියා උපනගරං
තතියා උපනගරේන - උපනගරං
චතුත්ථී උපනගරං
පඤ්චමී උපනරගම්හා - උපනගරස්මා
ඡට්ඨී උපනගරස්ස - උපනගරං
සත්තමී උපනගරේ - උපනගරං

යනු වශයෙන් විභක්තීන්ට වර නැගේ.

අධිත්ථි (ඉත්ථිසු අධිකිච්ච පවත්තතී)
උපවධු (වධුයාසමීපං)
උපගු (ගුන්නං සමීපං)

ඉකාරාන්ත උකාරාන්තාදි නැම ශබ්දයන් කෙරෙන්ම විභක්ති ලොප් වේ.

පඨමා අධිත්ථි
දුතියා අධිත්ථි
තතියා අධිත්ථි
චතුත්ථී අධිත්ථි
පඤ්චමී අධිත්ථි
ඡට්ඨී අධිත්ථි
සත්තමී අධිත්ථි

යනු වශයෙනි. උපසර්ග හා නිපාත පූර්වපද වශයෙන් මෙහි ප්‍රභේද දෙකකි. අව්‍යය හෙවත් අව්‍යයීභාව සමාසය පූර්වපදාර්ථ ප්‍රධානය.

ii කර්මධාරය සමාසය :

විශේෂණ විශේෂ්‍ය වූ එසේම සමාන විභක්තික වූ පද දෙකක් හෝ වැඩි ගණනක් එකට එකතු වී එක පදයක් බවට පැමිණීම කර්මධාරය සමාස නම්.

1 විසෙසන පුබ්බපද, 2 විසෙසනුත්තරපද, 3 විසෙසනොභයපද, 4 උපමානුත්තරපද, 5 සම්භාවනාපුබ්බපද, 6 අවධාරණපුබ්බපද, 7 නනිපාතපුබ්බපද, 8 කුපුබ්බපද, 9 පාදිපුබ්බපද යනු මෙහි ප්‍රභේද නවයක් වෙති.

1 විශෙෂණ පදය මුලින් ඇත්තේ විසෙසන පුබ්බ පද නම්.

මහාවීරො (මහන්තොච සො වීරො)
නීලුප්පලං (නීලානිච තානි උප්පලානිචෙති)
රත්තලතා (රත්තාච සා ලතා චෙති)
රත්තුප්පලං, ලොහිතචන්දනං, දුතියභික්ඛා, නාගමාණවිකා,

2 විශෙෂණ පදය අගින්සිට සමාස වූයේ විසෙසනුත්තර පද නම්.

සාරිපුත්තත්ථෙරො (සාරිපුත්තොච සො ථෙරොචාති)
බුද්ධඝොසාචරියො, ධම්මපාලාචරියො, මහොසධපණ්ඩිතො,

3 විශෙෂණ පදවයයක්ම පුබ්බපර වශයෙන් සිටි සමාස වූයේ විසෙසනොභය පද නම්.

සීතුණ්හං = (සීතං ච තං උණ්හං චෙති)
සිනිද්ධුණ්හා, ඛඤ්ජඛුජ්ජා, අන්ධබධිරො, කතාකතං,

4 උපමාන පදය අගින් සිට සමාසවතුයේ උපමානුත්තර පද නම්

මුනිසීහො, (සීහොවියසීහො, මුනිච සො සීහොවාති)
මුනිපුඞ්ගවො, බුද්ධනාගො, සද්ධම්මරංසි, සමණපදුමො,

5 සැලකියයුතු පදය මුලින් සිට සමාස වූයේ සම්භාවනා පුබ්බපද නම්.

ධම්මබුද්ධි (ධම්මොති බුද්ධි)
ධම්මසඤ්ඤා, අනිච්චසඤ්ඤා, ධාතුසඤ්ඤා, අත්තදිට්ඨි.

6 අවධාරණ පදය මුලින් සිට සමාස වූයේ අවධාරණ පුබ්බ පද නම්.

ගුණධනං = (ගුණො එව ධනං)
සද්ධාධනං, සීලධනං, පඤ්ඤාරතනං, චක්ඛුවාරං.

7 නිපාතය මුලින් සිට සමාස වූයේ නිපාත පුබ්බ පද නම්.

පූර්වපදයාගේ අර්ථය අප්‍රධාන හෙයින් අව්‍යය සමාසයට මෙය නො අයිතිය.

අසුරො = (න සුරො, අසුරො)
අබ්‍රාහමණො, අකුසලං, අනස්සො, අනාසවො,

8 කු යන පදය මුලින් සිට සමාස වූයේ කුපුබ්බපද නම්.

කදන්නං = (කුච්ඡිතං අන්නං, කදන්නං)
කාපුරිසො, (කුච්ඡිතො, පුරිසො)

9 ප ආදි උපසර්ග මුලින් සිට සමාස වූයේ පාදිපුබ්බපද නම්.

දුග්ගන්ධො = (කුච්ඡිතො ගන්ධො)

විකප්පො, අතිදෙවො, අභිධම්මං, දුක්කතං, සුකතං.
කර්මධාරය සමාසය පර පදයෙහි ලිඟු ලබයි. එහෙයින් අගින් පදයේ ලිඞ්ගය හැටියට විභක්තිවල වරනැගේ.

'මහාවීර' ශබ්දය බුද්ධ ශබ්දය මෙන් වරනගනු.

මුලින් පිහිටියේ සඞ්ඛ්‍යාවාචක පදයක් නම් ඒ දිගු සමාස නමැයි දක්වේ. මෙය කර්මධාරය සමාසයෙහි ම ඇතුළත්.

තිලොකං = (තයො ලොකා සමාහටා)
තිදණ්ඩං, තිමලං පඤ්චසීලං, දසසීලං, තිලක්ඛණං,

දිගු සමාස පදයෝ නපුංසක ලිඞ්ග එක වචනවල පමණක් විභක්තිවල වරනැගෙති.

iii **තත්පුරුෂ සමාස.**

ද්විතීයාදි විභක්ත්‍යන්ත පදය මුලින් සිට අන් පදයක් සමග ගැලපීම තත්පුරුෂ සමාස නම්. මෙය විබත් සමස් වශයෙන් සිංහලයෙහි දක්වේ. දුතියා, තතියා, චතුත්ථී, පඤ්චමී, ඡට්ඨී, සත්තමී තප්පුරිස යනි මේ ප්‍රභෙද සයකින් යුක්ත වේ

i. **දුතියා තප්පුරිස.**

ගාමගතො = (ගාමං ගතො)
සුඛප්පත්තො, සොතාපන්නො, මග්ගපටිපන්නො, රථා-රූළ්හො;

ii. **තතියා තප්පුරිස.**

බුද්ධභාසිතො = (බුද්ධෙන භාසිතො.)
ජිනදෙසිතං, සත්ථුවණ්ණිතං, ඉස්සරකතං, සුකාහටං;

iii. **චතුත්ථී තප්පුරිස.**

කඨිනදුස්සං = (කඨිනස්ස දුස්සං).
සඞ්ඝභත්තං, චීවරමූල්‍යං, යාගුතණ්ඩුලා, ගමිකභත්තං.

iv. **පඤ්චමී තප්පුරිස.**

මේථුනාපෙතො = (මේථුනස්මා අපෙතො.)
රුක්ඛපතිතො, චොරභයං, බන්ධනමුත්තො, අමනුස්ස-භයං.

v. **ඡට්ඨීතප්පුරිස.**

රාජපුත්තො = (රඤ්ඤො පුත්තො.)
බුද්ධසාවකො, ජිනවචනං, ධඤ්ඤරාසි, ඵලරසො, දෙවරාජා.

vi. **සත්තමී තප්පුරිස.**

රූපසඤ්ඤා = (රූපෙ සඤ්ඤා.)

ධම්මරුචි, ධම්මරතො, වනචාරී, ගාමසූකරො, ඵලමට්ඨො; තප්පුරිස සමාසයෙහිදු ලිඟු ලැබීම පරව තිබෙන පදයේ හැටියටය. 'දෙවරාජ, ශබ්දය 'බුද්ධ' ශබ්දය මෙනි. 'කඨිනදුස්ස, ශබ්දය 'චීවර' ශබ්දය මෙනි.

vii. **බහුබ්බීහි සමාසය.**

(බහු - වීහි'යස්ස සො) බොහෝ වී යමෙකුට වේත්ද, ඒ වී ඇති තැනැත්තාට 'බහුබ්බීහි' යනු නමකි. මේසේම සමාස වනු ලබන පදවල තමතමන්ගේ අර්ථ දුරුකොට **අන් අරුත් ඇති එක් පදයක් බවට පැමිණේ නම් ඒ**

සමාසය බහුබ්බීහි හෙවත් අන් අරුත් නමි. බොහෝ සෙයින් විශෙෂණ විශෙෂ්‍ය දෙපද කොතෙක්ම මෙහිද සමාස වෙති.

මෙය දිපද, භින්නාධිකරණ, තිපද, තනිපාතපුබ්බපද, සහපුබ්බපද, උපමානපුබ්බපද, සඞ්ඛ්‍යොභයපද, දිසන්තරාලත්‍ථ, ව්‍යතිහාර ලක්‍ඛණ යයි නව වැදෑරුම් වේ.

i. **දිපද බහුබ්බීහිය දුතියාදි විභත්‍ත්‍යන්තයන් සමග සමාස වේ.**

ආගතසමණො (= ආගතා සමණා යං සො )
ජිතින්ද්‍රියො (= ජිතානි ඉන්ද්‍රියානි යෙන සො.)
දින්නසුඞ්කො (= දින්නො සුඞ්කො යස්ස සො.)
නිග්ගතගාමො (= නිග්ගතා ගාමා යස්මා සො )
ඡින්නහත්‍ථො (= ඡින්නා හත්‍ථා යස්ස සො.)
සම්පන්නසස්සො (= සම්පන්නානි සස්සානි යස්මිං සො )

ii. **භින්නාධිකරණ බහුබ්බීහිය.**
ඡත්‍තපාණී (= ඡත්‍තං පාණිම්හි යස්ස සො )
දණ්ඩපාණී, වජිරපාණී, ඛග්ගහත්‍ථො, පත්‍තහත්‍ථො.)

iii. **තිපද බහුබ්බීහි.**
මත්‍තබහුමාතඞ්ගං(=මත්‍තා බහවො මාතඞ්ගා යස්මිං තං)
ඔනීතපත්‍තපාණී, සීහපුබ්බද්ධකායො.

iv. **නනිපාතපුබ්බපදබහුබ්බීහි.**
අසමො = (නත්‍ථි සමො යස්ස සො )
අප්පටිපුග්ගලො, අපුත්‍තකො, අහෙතුකො, අනාසවා.

v. **සහපුබ්බපද බහුබ්බීහි. මේ සමාසය ප්‍රථමාවියෙහි සමාස වේ.**
සහෙතුකො = (සහ හෙතුනා යො වත්‍තතෙ සො )
සප්පච්චයො, සක්කිලෙසො, සඋපාදනො, සපරිවාරො.

vi. **උපමානපුබ්බපද බහුබ්බීහි.**
අන්‍ධභූතො = (අන්‍ධො ඉව භූතො අයං.)
ධම්මභූතො, චක්ඛුභූතො, කාකසූරො, අත්‍ථභූතො.

vii. සඞ්ඛ්‍යොභයපද බහුබ්බීහි

ද්විතිකං = (ද්විකං වා තිකං වා.)

ඡප්පඤ්චවාචා, ද්විත්තිකං, සත්තට්ඨමාසා.

viii දිසන්තරලක්ඛණ බහුබ්බීහි.

පුබ්බදක්ඛිණා = (පුබ්බස්සාච දක්ඛිණස්සාච දිසාය යං අන්තරාලං.)

පුබ්බුත්තරා, අපරදක්ඛිණා, පච්ඡිමුත්තරා.

ix. ව්‍යතිහාරලක්ඛණ බහුබ්බීහි.

කෙසාකෙසි = (කෙසෙසු කෙසෙසු ගහෙත්වා ඉදං යුද්ධං පවත්තති)

දණ්ඩාදණ්ඩි.

බහුබ්‍රීහි සමාසය අන්‍ය පදයාගේ ලිඟු ලබයි.

ආගතසමණ (පුං) විහාරය, බුද්ධ ශබ්දය මෙනි.

ආගතසමණා (ඉ) සාලාව, කඤ්ඤා ශබ්දය මෙනි.

ආගත සමණ (න) කුලය, චිත්ත ශබ්දය මෙනි.

x ද්වන්ද සමාසය.

එක විභක්ති තවූ නාම පද දෙකක් හෝ සමූහයක් සුදුසු පරිදි එක පදයක් වන සේ ගැළපීම ද්වන්ද සමාස නම් වේ. මෙය සිංහලයෙහි දඅරුත් සමාස වශයෙන් දක්වයි.

මේ සමාසය ඉතරීතරයොගය, සමාහාරයයි ද්විප්‍රකාර වේ. ඉතරීතරයොගයෙහි සමාසවූයේ බහු වචනවල පමණක් වරනැගෙති. සමාහාරයෙහි සමාසවූයේ නිත්‍ය නපුංසක ලිඞ්ග එකවචනයෙහි පමණක් වරනැගෙති,

i. ඉතරීතරයොගයෙහි,

චන්දසූරියා = (චන්දො ච සූරියො ච චන්දසූරියා.)

සාරිපුත්තමොග්ගල්ලානා, සමණබ්‍රාහ්මණා, මාතාපිතරො.

ii. සමාහාරයෙහි,

චක්ඛුසොත = (චක්ඛු ච සොතං ච.)

ගීතවාදිතං, කංසතාලං, ඵාලපාචිතං, ධනුකලාපං, මංස මච්ඡං, සාකොල්ලකං, නාමරූපං, වේණරථකාරං.

චන්දසමාසය උභය පද ප්‍රධාන ය.

| චන්දසූරිය | චක්ඛුසොත. |
|---|---|
| පුං - බහු | නපුං - එක |
| ප. = චන්දසූරියා | ප. - චක්ඛුසොතං |
| දු. - චන්දසූරියෙ | දු - චක්ඛුසොතං |
| ත. - චන්දසූරියෙහි | ත. - චක්ඛුසොතෙන |
| ච. - චන්දසූරියානං | ච. - චක්ඛුසොතස්ස |
| ප. - චන්දසූරියෙහි | ප. - චක්ඛුසොතම්හා |
| ඡ. - චන්දසූරියානං | ඡ. - චක්ඛුසොතස්ස |
| ස. - චන්දසූරියෙසු | ස - චක්ඛුසොතෙ |

## 2 තද්ධිතය

තද්ධිත නම් පද දෙකක් ඉතාම සංක්ෂෙප කොට එක පදයක් බවට පැමිණ වීමයි.

'වසුදෙවස්ස අපච්චං' යන දෙපදයෙහි 'අපච්ච' ශබ්දය වෙනුවට 'අ' යොදා 'වාසුදෙව' කියා කොටකර ගණිති. මේ තද්ධිත ක්‍රමයයි. එයම සමාස වශයෙන් සංක්ෂෙපත්වය ලැබූ කල්හි 'වසුදෙවාපච්චං' යි සිටී. සමාස තද්ධිත දෙදෙනාගෙන් සිදුවන සංක්ෂෙපත්වය මෙසේ සලකාගතයුතු වෙයි. තද්ධිතයාගේ ලිඟු ලැබීම ක්‍රියානු ලබන්නාට බඳුය. 'වාසුදෙව' යන්නෙන් පුතා කියවෙන හෙයින් ඒ පුල්ලිඞ්ගිකයි 'වාසුදෙවී' යන්නෙන් දුව කියවෙන හෙයින් ඒ ස්ත්‍රී ලිඞ්ගිකයි. සමූහාර්ථ භාවාර්ථයන්හි ප්‍රත්‍යයවී නැඟෙන ශබ්ද ද, ස්වාර්ථයෙහි අ ප්‍රත්‍යයවී නිපැදෙන ශබ්ද ද නියත නපුංසක ලිඞ්ගික වෙති. තා ප්‍රත්‍යයාන්ත ශබ්ද නියත ස්ත්‍රී ලිඞ්ගිකයි.

තද්ධිතය ප්‍රධාන වශයෙන් සාමාන්‍ය තද්ධිතය, අව්‍යය තද්ධිතය, භාව තද්ධිතයයි කොටස් තුනකට වෙන් වේ. නොයෙක් නොයෙක් අර්ථයන්හි ප්‍රත්‍යයවී නිෂ්පාදනයවූ පද සාමාන්‍ය තද්ධිත වශයෙන් දැක්වේ.

තද්ධිතප්‍රත්‍යය වූ කල්හි බොහෝ සෙයින් ශබ්දයාගේ ආදිස්වරයට ඊට අගින් හල් අකුරක් නැති කල්හි වෘද්ධි වෙයි. වෘද්ධිය නම් අ, ඉ, උ යන මේ අක්ෂරයන්ට ආ, එ, ඔ යන අකුරු වීමයි.

i සාමාන්‍ය තද්ධිතය.

1 ඔහුගේ පුත්‍රායයි හැඟවීම්වස් 'අ, ඉ, අව, ආන, ආයන එය්‍ය, එර ඉක' යන ප්‍රත්‍යයෝ ඒ ඒ පද අගට යොදා භාවිත කරනු ලැබෙති. මේ සියලු ප්‍රත්‍යයන් පරකල්හිම ආදි ස්වරයට සුදුසු තැන වෘද්ධි වේ.

වසිට්ඨ + අ = වාසිට්ඨ, (වසිට්ඨස්ස අපච්ච වාසිට්ඨො)
දක්ඛ + ඉ = දක්ඛි; උපගු + අව = ඔපගව;
කච්ච + ආන = කච්චාන; කච්ච ආයන = කච්චායන
සුචි + එය්‍ය = සොචෙය්‍ය; සමණ + එර = සාමණෙර *

2 යමකින් අතයි, එතරවෙයි, හැසිරෙයි, උසුලයි යනු හැඟවීම පිණිස [1] 'ඉක' ප්‍රත්‍යය ඒ ඒ ශබ්ද අගට එකතු වේ.

ගුළ + ඉක = ගොළික; (ගුළෙන සංසට්ඨං)
නාවා + ඉක = නාවික; (නාවාය තරති.)
ධම්ම + ඉක = ධම්මික (ධම්මෙන චරති)
ඛන්ධ + ඉක = ඛන්ධික; (ඛන්ධෙන වහති.)

3 මෙය සදරයි. එයින් කරණ ලද්දේය. එයින් හටගත්තේය. මෙය ඔහුගේ නියමය, ශිල්පය, බඩුය, ජීවිකාවය යන අර්ථයන්හිද [1] 'ඉක' ප්‍රත්‍යය වේ.

අභිධම්ම + ඉක = ආභිධම්මික (අභිධම්මං අධීතෙ)
කාය + ඉක = කායික (කායෙන කතං)
සරීර + ඉක = සාරීරික (සරීරෙ සන්නිධානා වේදනා)
රථ + ඉක = රථික (රථෙ නියුත්තො)
වීණා + ඉක = වෙණික (වීණා අස්ස සිප්පං)
ගන්ධ + ඉක = ගන්ධික; (ගන්ධො අස්ස භණ්ඩං)
සූකර + ඉක = සූකරික (සූකරෙ හන්ත්වා ජීවති)

* සක්‍යප්‍රත්‍යයිකයා. 1 මෙය පර කල්හි සුදුසුසේ වෘද්ධිවෙයි.

4 එයින් සායම් කරණ ලද්දේය. මෙය ඔහුගේය. එහි උපන්නේය. යනාදි අර්ථයන්හි [1] 'අ' ප්‍රත්‍යය වේ.

කසාව + අ = කාසාවං (කසාවෙන රත්තං) සිවුර,
මහිස + අ = මාහිසං (මහිසස්ස ඉදං) අඟ,
මධුර + අ = මාධුරො (මධුරායං ජාතො) එහි වැස්සා,

උපන්නේය යන අ ර්ථයෙහි 'ඉම ඉය' දෙකද වෙති.

පච්ඡා + ඉම = පච්ඡිමො, (පච්ඡා ජාතො) පසුව උපන් අය,
අන්ත + ඉය = අන්තියො (අන්තෙ ජාතො) අන්තිමයා,

5 සමූහය යන අර්ථයෙහි [1] ක, [1] අ, [2] තා යන ප්‍රත්‍යයෝ වෙත්.

මධුර + ක = මාධුරක, (මධුරානං සමූහො)
මනුස්ස + අ = මානුස්ස (මනුස්සානං සමූහො)

මිනිස්සු රංචුව

ගාම + තා = ගාමතා (ගාමානං සමූහො)
ජන + තා = ජනතා, බන්ධුතා, සහායතා, යනුද මෙසේමයි.

6 මෙය එට කරුණුය යන අර්ථයෙහි 'ඊය' ප්‍රත්‍යය වේ.
මදන + ඊය = මදනීය (මදනස්ස ඨානං) මත්වන දෙය; බන්ධනීය, මුච්ඡනීය, රජනීය, දුස්සනීය යනුද මෙසේමය.

7 එය බහුලය යන අර්ථයෙහි 'ආලු' ප්‍රත්‍යය වේ.
අභිජ්ඣා + [3] ආලු = අභිජ්ඣාලු (අභිජ්ඣා බහුලො)
සීතාලු, ධජාලු, දයාලු,

8 එයින් කරණ ලද්දේය. යන අර්ථයෙහි 'මය' ප්‍රත්‍යයවේ.
මන + මයං = මනොමයං (මනසා පකතං)
සුවණ්ණමයං ඉද්ධිමයං, අයොමයං,

---

1 වෘද්ධිය වේ. 2 තා යන ස්ත්‍රී ලිංගිකයි. මෙය ගාම, ජන, බන්ධු, සහාය, යනාශබ්දයන් කෙරෙන්ම වේ. 3 සමහර තැනෙක අගින් ක ආගමද වේ. දයාලුකො, අභිජ්ඣාලුකො, යනු වේ.

9 [1] අතිශයාර්ථයෙහි තර, තම, ඉස්සික, ඉය, ඉට්ඨ යන ප්‍රත්‍යයෝ වෙති.

පාප + තර = පාපතරො (අයමෙතෙසං අතිසයෙන පාපො) පාපතරයා,

පාපතම, පාපිස්සික, පාපිය, පාපිට්ඨ යනු ද මෙසේමයි.

10 මෙය මොහුට ඇත්තේය. යන අර්ථයෙහි වී, සො, ඉල, ආල, ව යනාදි ප්‍රත්‍යයෝ වෙත්.

මෙධා + වී = මෙධාවී, (මෙධා අස්ස අත්ථීති) නුවණ ඇත්තා;

ලොම + සො = ලොමසො (ලොමානි අස්ස සන්ති)

පිච්ඡ + ඉල = පිච්ඡිලො (පිච්ඡානි අස්ස සන්ති)

වාචා + ආල = වාචාලො (වාචා අස්ස අත්ථීති)

කෙස + ව = කෙසවො (කෙසා අස්ස සන්තීති)

තප + [2] සී = තපස්සී (තපො අස්ස අත්ථි) තපස ඇත්තා

දණ්ඩ + [3] ඉක = දණ්ඩිකො, (දණ්ඩො අස්ස අත්ථි) දඬු ඇත්තා.

දණ්ඩ + [3] ඊ = දණ්ඩී. ,, ,, ,,

ගුණ + [4] වන්තු = ගුණවන්තො (ගුණො අස්ස අත්ථි) ගුණ ඇත්තා.

සති + [5] මන්තු = සතිමන්තො ( සති ,, ,, , සිහි ඇත්තා.

සද්ධා + [6] අ = සද්ධො (සද්ධා අස්ස අත්ථි) සද්ධා ඇත්තා,

11 පළමුවෙනි දෙවෙනි යනාදි සඞ්ඛ්‍යා පූරණාර්ථයෙහි ම, ථ, ඨ, තිය, ඊ යන ප්‍රත්‍යයෝ වෙත්.

පඤ්ච + ම = පඤ්චමො; (පඤ්චන්නං පූරණො) පස්වැන්නා,

චතු + [7] ථ = චතුත්ථො (චතුන්නං පූරණො) සිවුවැන්නා

---

1 මෙයා මොහුට මේ කාරණෙන් උතුම්ය· යන අර්ථ යයි, 2 තප ශබ්දදීත් කෙරෙත් වේ. 3 දණ්ඩ ශබ්දදීත් කෙරෙන් වේ. 4 ගුණාදී අවර්ණාන්ත ශබ්දයන් කෙරෙන් වේ. 5 සති ආදි අවර්ණාන්ත නොවන ශබ්දයන් කෙරෙන් වේ. 6 සද්ධාදි ශබ්දයන් කෙරෙන් වේ. සුද්ධ තැන වෘද්ධිද වේ. 7 චතු ශබ්දයා කෙරෙනි.

ඡ + [1] ඨ = ඡට්ඨො (ඡන්නං පූරණො) සවැන්නා
ද්වි + [2] තිය = දුතියො (ද්වින්නං පූරණො) දෙවැන්නා
ති + තිය = තතියො (තිණ්ණං ,, ) තුන් වැනියා

ඡට්ඨම, සත්තම, දසම, වීසතිම, සතම, යනුද මෙසේමය.

එකාදස + ඊ = එකාදසී (එකාදසන්නං පූරණො)
එකොළොස් වැනියා;

මෙය ස්ත්‍රී වාචකය. පුරුෂ වාචක කල්හි එකාදසමො යි කියාසිටී.

12 ද්විශබ්දාදීන් කෙරෙන් පරිමාණාර්ථයෙහි 'ක' වේ.

ද්වි + ක = ද්විකං (දෙ පරිමාණානි අස්ස.)
තික, චතුක්ක, පඤ්චක, සත්තක, අට්ඨක, යනුද මෙසේය.

**අව්‍යය තද්ධිතය.**

මෙසේ නිපන් තද්ධිත පදයෝ අව්‍යයන් ලෙසින් භාෂා වේ පෙණී සිටිති. එහෙයින් විභක්ති, වචන නොගණීත්.

13 එකශබ්දාදීන් කෙරෙන් වාරෙක යන අර්ථයෙහි 'ක්ඛත්තුං' ප්‍රත්‍යය වේ.

එක + ක්ඛත්තුං = එකක්ඛත්තුං, එක්වරෙක.
තික්ඛත්තුං, පඤ්චක්ඛත්තුං; සතක්ඛත්තුං, බහුක්ඛත්තුං යනුද මෙසේයි.

14 සංඛ්‍යා ශබ්දයන් කෙරෙන් විභාගාර්ථයෙහි 'ධා', 'සො' යන ප්‍රත්‍යයෝ වෙත්.

ද්වි + ධා = ද්විධා, (ද්වීහි විභාගෙහි) දෙපරිද්දකින්.
තිධා. චතුධා. පඤ්චධා යනුද මෙසේයි.
පද + [3] සො = පදසො (පදවිභාගෙන.)

15 සබ්බනාමයන් කෙරෙන් ප්‍රකාරවචනාර්ථයෙහි ථා ථත්තා, ප්‍රත්‍යයෝ වෙත්.

---

1 ඡ ශබ්දයාකෙරෙනි. 2 ද්වි, ති, ශබ්දයන් කෙරෙනි. ද්වි ශබ්දයට 'දු' යයිද ති, ශබ්දයට 'ත' යයිද පසුව ආදෙශ වේ. 3 අත්‍යාදි සාමාන්‍ය නාමයන් කෙරෙන් වේ.

ත + ථා = තථා (තෙන පකාරෙණ.)
ය + ථා = යථා (යෙන පකාරෙණ.)
ත + ථත්තා = තථත්තා (තෙන පකාරෙණ.)

16 කිං, ඉම ශබ්දයන් කෙරෙහි ප්‍රකාර වචනාර්ථයෙහි 'ථං' ප්‍රත්‍යය වේ.

(කිං) = [1] ක + ථං = කථං (කෙන පකාරෙණ)
ඉම + [2] ථං = ඉත්ථං = (අනෙන පකාරෙණ)

17 කාල වාචක කල්හි ජ්ජ, ජ්ජු යන ප්‍රත්‍යයෝ වෙත්.
ඉම + ජ්ජ = [3] අජ්ජ (ඉමස්මිං කාලෙ)
සමාන + ජ්ජු = [4] සජ්ජු (සමානස්මිං කාලෙ)
අපර + ජ්ජු = අපරජ්ජු (අපරස්මිං කාලෙ)

භාව තද්ධිතය.

18 මෙහි භාව යන්නෙන් ස්වභාවය කියවේ. යමක හැඟී කියමනා කල්හි අ, ය, ත්ත, තා, ත්තන, ත, යන ප්‍රත්‍යයන්ගෙන් එකක් ඒ ඒ නාමයන් කෙරෙන් යොදාගතයුතුයි.

විසම + [5] අ = වෙසමං (විසමස්ස භාවො)
පටුනො + [5] අ = පාටවං (පටුනො භාවො පාටවං)
පණ්ඩිත + [6] ය = පණ්ඩිච්චං (පණ්ඩිතස්ස භාවො)
පණ්ඩිත කම;
කුසල + ය = කොසල්ලං (කුසලස්ස භාවො)
අධික + ය = ආධික්කං (අධිකස්ස භාවො)

---

1 කිං ශබ්දයට 'ක' වේ. 2 ඉම ශබ්දයාහට 'ඉ' ආදේශවේ 3 ඉම ශබ්දයට 'අ' වේ 4 සමාන ශබ්දයට 'ස' ආදේශවේ. 5 වෘද්ධි වේ. විසම ශබ්දාදිය කෙරෙන් වේ. 6 මේ ය ප්‍රත්‍යය කළ කල්හි ඊට මුලින් පිහිටි ශබ්දයාගේ අග පිහිටි ස්වරය ලොප්වේ. ඉන් පසු ඉතිරි වූ හල් ව්‍යඤ්ජනය යකාරය සමග එක් වේ. යකාරය සහිත වූ ව්‍යඤ්ජනය 'තල තද' යන අකුරුවලින් එකක් නම් ච, ල, ඤ, ජ, යන අකුරු පිළිවෙළින් වෙති. ඒ ආදේශ වූ අකුර ද්විත්වවම සිටී. ආදිස්වරයට වෘද්ධිවේ එසේම සකාරය කවර්ගය ච වර්ගය ටවර්ගය පවර්ගය යන අක්ෂරයන්ගෙන් එකක් නම් ඒ ජාතියේ අකුරක්ම ඊට ආදේශව ද්විත්වයට පැමිණේ.

සුබුම + ය = සොබුම්මං (සුබුමාය භාවො)
චන්‍ද + තත = චන්‍දත්තං (චන්‍දස්ස භාවො)
මනුස්ස + තා = මනුස්සතා (මනුස්සස්ස භාවො)
පුථුජ්ජන + = තතනං=පුථුජ්ජනත්තනං (පුථුජ්ජනස්ස භාවො)

19 රමණීය ශබ්දාදීන් කෙරෙන් [1] ක' ප්‍රත්‍යයවේ.

රමණීය + ක = රාමණීයකා (රමණීයස්ස භාවො)
කල්‍යාණකං, චොරකං, අඬ්ඪකං යනාදීයද මෙසේමයි.

# 3 ආඛ්‍යාතය.

ක්‍රියා ලක්‍ෂණ සන්දර්ශනය කෙරේණුයි ආඛ්‍යාත නම්. කාල කාරක පුරිස යන මේවා ක්‍රියා ලක්‍ෂණයෝයි.

අතීත වර්‍තමාන අනාගත යයි කාල තුණකි. කම්ම කත්තු භාව යයි කාරක තුණකි. පඨම මජ්ඣිම උත්තම යයි පුරුෂ තුණකි. ගමන පචනාදි ධාතූන්ගේ අර්‍ථය ක්‍රියා නම්. එය කාල කාරක පුරුෂ මගින් හෙළිවෙයි.

කාලාදීන්ගේ වසයෙන් ධාත්වර්‍ථය බෙදන්නුයි විභක්ති නම්. මොවුහු 'ති' ආදීහුය. ඔවුහු වත්තමානා, පඤ්චමී, සත්තමී, පරොක්ඛා, හීයත්තනී, අජ්ජතනී, භවිස්සන්තී, කාලාතිපත්තිය යි අට වැදෑරුම් වෙත්.

ක්‍රියාව දරාණුයි ධාතු නම් භූ ආදීහුයි. මොවුහු සකම්මක, අකම්මක වසයෙන් දෙකකට බෙදෙත්. යම් ධාතු කෙනෙක් කර්මයක් බලාපොරොත්තු විය හැකි ක්‍රියාව දක්වත් ද, ඔවුහු සකම්මක ධාතු නම් වෙත්. 'කටං කරොති, ගාමං ගච්ඡති, ඔදනං පචති'' යනාදිය මෙති. කර්මය බලාපොරොත්තු විය නොහැකි ක්‍රියාව දක්වන්නෝ අකර්මක නම් වෙත්. 'අච්ඡති, සෙති, තිට්ඨති' යනාදිය මෙති

---

1 ආදි වාද්ධිය වේ.

මේ ධාතුහු නැවත විකරණ භෙදයෙන් සත් වැදෑරුම් වෙත්.

i අවිකරණ භුවාදීහුය.
ii නිග්ගහීත පුබ්බ අවිකරණ රුධාදීහුය.
iii යවිකරණ දිවාදීහුය
iv ණුණා උණා විකරණ සු ආදීහුය.
v නා, ප්ප ණ්හා විකරණ කියාදීහුය.
vi ඔ විකරණ තනාදීහුය.
vii එ අය, විකාරණ චුරාදීහුය යන මොහුයි.

පළමු කොට භූවාදීයට අයත් අකම්මක භූ ධාතුවෙන් පවත් ගෙණ නැවත අනික් ධාතූන්ගේ ක්‍රියාපද ද හැකි තරමක් විස්තර කරන්නෙමු.

[1] වත්තමානා විභත්තිය.

ක්‍රියා පදයක් සාදා ගැණීමේදී ධාතුවට අගින් එකතු කළයුතු ප්‍රත්‍යයෝ – ති, අන්ති, සි, ථ, මි, ම; තෙ, අන්තෙ, සෙ, ව්හෙ, එ, මෙහ යන දොළස වෙති. මේ ප්‍රත්‍යයෝ පළමු කොට පරස්සපද අත්තනොපද වශයෙන් දෙකට බෙදෙති. පාලියෙහිදී මේ පරස්සෙමපදික ආත්මනෙපදිකයන්ගේ භෙදයක් නොසලකති.

පරස්සපද - ති අන්ති, සි, ථ, මි, ම.
අත්තනොපද - තෙ, අන්තෙ, සෙ, ව්හෙ, ඒ, මෙහ.

මොවුහුද පුරුෂ භෙදයෙන් තෙවැදෑරුම් වෙත්. නැවත එක වචන බහු වචන භෙදයෙන් දෙවදෑරුම් වෙති

| | පරස්සපද | | අත්තනොපද | |
|---|---|---|---|---|
| | එක | බහු | එක | බහු |
| [2] පඨම පුරිස | ති | අන්ති | තෙ | අන්තෙ |

1 ආදිමෘද්ධිය වේ. 2 නාම පදයක ප්‍රථමා විභක්ති එකවචනය එකවචන ක්‍රියාවටද, බහුවචනය බහුවචන ක්‍රියාවටද උක්තය වශයෙන් සිටී.

[1] මජ්ඣිම පුරිස සි ථ සෙ ව්හෙ
[2] උත්තම පුරිස මි ම ඒ මෙහෙ,

අකර්මක √භූ ධාතුයෙහි කර්තෘකාරකයෙහි,

| | | | | |
|---|---|---|---|---|
| ප. පු [3] | භවති | භවන්ති | භවතෙ | භවන්තෙ |
| ම. පු | භවසි | භවථ | භවසෙ | භවව්හෙ |
| උ. පු | භවාමි | භවාම | භවෙ | භවාමෙහෙ. |

සකර්මක √පච කර්තෘකාරකයෙහි,

| | | | | |
|---|---|---|---|---|
| ප. පු | පචති | පචන්ති | පචතෙ | පචන්තෙ |
| ම. පු | පචසි | පචථ | පචසෙ | පචව්හෙ |
| උ. පු. | පචාමි | පචාම | පචෙ | පචාමෙහෙ |

අකර්මක ධාතුවලින් කර්ම කාරකයෙහි ක්‍රියා පද නො සෑදේ.

√ගමු ධාතුයෙහි කර්තෘකාරකයෙහි,

| | | | |
|---|---|---|---|
| [4] ගච්ඡති | ගච්ඡන්ති | ගච්ඡතෙ | ගච්ඡන්තෙ |
| ගච්ඡසි | ගච්ඡථ | ගච්ඡසෙ | ගච්ඡව්හෙ |
| ගච්ඡාමි | ගච්ඡාම | ගච්ඡෙ | ගච්ඡාමෙහෙ |

√පච කර්මකාරකයෙහි,

| | | | |
|---|---|---|---|
| [5] පච්චති, | පච්චන්ති | පච්චතෙ, | පච්චන්තෙ |
| පච්චසි, | පච්චථ | පච්චසෙ, | පච්චව්හෙ |
| පච්චාමි, | පච්චාම | පච්චෙ, | පච්චාමෙහෙ |

---

1 'ත්වං, තුම්හෙ,' යන දෙපදය මධ්‍යම පුරුෂ එක වචන හා බහු වචන යන්ට උක්තය වශයෙන් සිටී. 2 'අහං, මයං' යන දෙපදය උත්තම පුරුෂ එක වචන හා බහුවචනයන්ට උක්තය වශයෙන් සිටී. 3 භූ හට වෘද්ධි වී භො වේ. එහි ඕ හට 'අව' ආදෙශ වූ කල්හි භව වේ. මේ භවයන්න ආඛ්‍යාතාධිකාර වශයෙන් ගෙණ අගින් ප්‍රත්‍ය යොදා ඒ ඒ ක්‍රියා පද සොදා ගත හැකි වෙයි.

4 ධාත්වන්තයට 'ච්ඡ' ආදෙශ වේ. 5 කර්මකාරක 'ය' සමග බැඳුනු ධාතුවේ අකුර ච, ත වර්ගයන්ගෙන් එකක් නම් ඒ ය කාරයත් සමග ධාතුවේ අක්ෂරයට පිළිවෙලින් ච වර්ගයෙහි අකුරු වෙත්. යවර්ග වූ රකාර වකාරයන්ට ශ ව යන අකුරු ආදෙශ වෙත්. මෙසේ ආදෙශ වූ අක්ෂරය ද්විත්වවෙමසිටී. වකාරයට නිතරම 'බ' ආදෙශ වේ.

කර්මකාරකයෙහි ධාතුප්‍රත්‍යයන්ගේ මැදට ය් වැටේ. පච + ය් + තෙ, පච්‍යතෙ පච්චතෙ; මෙහි කර්තෘ නිතරම තෘතීයාවෙන් සිටී 'දෙව-දත්තෙන පච්චතෙ' යනුයි.

අනු √ භූ = කම්කාරකයෙහිද වේ. එසේ කල

| | |
|---|---|
| අනුභූයතෙ | අනුභූයන්තෙ |
| අනුභූයසෙ | අනුභූයවෙහ |
| අනුභූයෙ | අනුභූයමෙහ |

මෙසේ ද සෑදේ. තව ක්‍රමයක්,

| | | | |
|---|---|---|---|
| [1] ගමෙති | ගමෙන්ති | සමමති | සමමන්ති |
| ගමෙසි | ගමෙථ | සමමසි | සමමථ |
| ගමෙමි | ගමෙම | සමමාමි | සමමාම, |

√ගමු කම්කාරකයෙහි,

| | | | |
|---|---|---|---|
| ගච්ඡියති | ගච්ඡියන්ති | ගච්ඡියතෙ | ගච්ඡියන්තෙ |
| ගච්ඡියසි | ගච්ඡියථ | ගච්ඡියසෙ | ගච්ඡියවෙහ |
| ගච්ඡියාමි | ගච්ඡියාම | ගච්ඡියෙ | ගච්ඡියමෙහ, |
| ගම්මති | ගම්මන්ති | ගමියති | ගමියන්ති |
| ගම්මසි | ගම්මථ | ගමියසි | ගමියථ |
| ගම්මාමි | ගම්මාම | ගමියාමි | ගමියාම |

**2 පඤ්චමී විභක්තිය.** පවත්නා කාලයෙහියි.

[2] විධානය, ආශිර්වාදය යන දෙඅරුත්හි පඤ්චමී වේ. තු අන්තු සි ථ මි ම; තං අන්තං ස්සු, ව්හො, ඒ ආමසේ, මේ ප්‍රත්‍යයෝ පෙරසේ පරස්සපද අත්තනොපදදියට තිසි සේ යොදනන යුත්තාහුයි.

√භූ කත්තෘකාරකයෙහි;

| | | | |
|---|---|---|---|
| භවතු | භවන්තු | භවතං | භවන්තං |
| භව - භවාහි | භවථ | භවස්සු | භවව්හො |
| භවාමි | භවාම, | භවෙ | භවාමසෙ, |

කම්කාරකයෙහි,

| | | | |
|---|---|---|---|
| අනුභූයතු | අනුභූයන්තු | අනුභූයතං | අනුභූයන්තං |
| අනුභූයාහි | අනුභූයථ | අනුභූයස්සු | අනුභූයව්හො |
| අනුභූයාමි | අනුභූයාම | අනුභූයෙ | අනුභූයාමසෙ |

---

1 ධාතු ප්‍රත්‍යය දෙදෙනා මැද 'එ' ඒ ගමෙති කියා සෑදේ.

2 අජ්ඣෙසන, අනුමති, පත්ථනා පත්තකාලාදීහෙයිද වේ

√පච කත්තෘකාරකයෙහි,

පචතු පචන්තු පචතං පචන්තං
පච, පචාහි පචථ පචස්සු පචව්හො
පචාමි පචාම පචෙ පචාමසෙ,

කම්මකාරකයෙහි,

පච්චතු පච්චන්තු පච්චතං පච්චන්තං
පච්ච, පච්චාහි පච්චථ පච්චස්සු පච්චව්හො
පච්චාමි පච්චාම පච්චෙ පච්චාමසෙ

√ගමු කත්තෘකාරකයෙහි,

ගච්ඡතු ගච්ඡන්තු ගච්ඡතං ගච්ඡන්තං
ගච්ඡ, ගච්ඡාහි ගච්ඡථ ගච්ඡස්සු ගච්ඡව්හො
ගච්ඡාමි ගච්ඡාම ගච්ඡෙ ගච්ඡාමසෙ

'ගම්යතු, යනාදිය ප්‍රත්‍යය වෙනස් කිරීමෙන් පෙරසේ සාදාගත හැකිය.

3 සත්තමී විභත්තිය. පවත්නා කාලයෙහිය.

එය්‍ය එය්‍යුං, එය්‍යාසි එය්‍යාථ, එය්‍යාමි එය්‍යාම;
එථ එරං, එථො එය්‍යව්හො, එය්‍යං එය්‍යාමහෙ

අනුමති පරිකල්ප යන අර්ථයන්හි වේ.

√භූ කත්තෘකාරකයෙහි,

භවෙ, භවෙය්‍ය භවෙය්‍යුං භවෙථ භවෙරං
භවෙය්‍යාසි භවෙය්‍යාථ භවෙථො භවෙය්‍යව්හො
භවෙය්‍යාමි භවෙය්‍යාම භවෙය්‍යං භවෙය්‍යාමහෙ

කම්මකාරකයෙහි

අනුභූයෙය්‍ය අනුභූයෙය්‍යුං අනුභූයෙථ අනුභූයෙරං
අනුභූයෙය්‍යාසි අනුභූයෙය්‍යාථ අනුභූයෙථො අනුභූයෙය්‍යව්හො
අනුභූයෙය්‍යාමි අනුභූයෙය්‍යාම අනුභූයෙය්‍යං අනුභූයෙය්‍යාමහෙ

√ පච ධාතූ කර්තෘකාරකයෙහි.

| | | | |
|---|---|---|---|
| 1 පචෙ පචෙය්‍ය | පචෙය්‍යුං | පචෙථ | පචෙරං |
| 1 පචෙ පචෙය්‍යාසි | පචෙය්‍යාථ | පචෙථො | පචෙය්‍යව්හො |
| 1 පචේ පචෙය්‍යාමි | පචෙය්‍යාම | පචෙය්‍යං | පචෙය්‍යාමෙහ. |

කර්මකාරකයෙහි.

| | | | |
|---|---|---|---|
| 1 පච්චෙ පච්චෙය්‍ය | පච්චෙය්‍යුං | පච්චෙථ | පච්චෙරං |
| පච්චෙය්‍යාසි | පච්චෙය්‍යාථ | පච්චෙථො | පච්චෙය්‍යව්හො |
| පච්චෙය්‍යාමි | පච්චෙය්‍යාම | පච්චෙය්‍යං | පච්චෙය්‍යාමෙහ |

√ ගමු ධාතූ කර්තෘකාරකයෙහි.

| | | | |
|---|---|---|---|
| ගච්ඡෙ, ගච්ඡෙය්‍ය | ගච්ඡෙය්‍යුං | ගච්ඡෙථ | ගච්ඡෙරං |
| ගච්ඡෙය්‍යාසි, | ගච්ඡෙය්‍යාථ | ගච්ඡෙථො | ගච්ඡෙය්‍යව්හො |
| ගච්ඡෙය්‍යාමි | ගච්ඡෙය්‍යාම | ගච්ඡෙය්‍යං | ගච්ඡෙය්‍යාමෙහ |

ගමෙ ගමෙය්‍ය යනාදියද පිළියෙළ කරගන්න.

කර්මකාරකයෙහි

ගච්ඡීයෙය්‍ය, ගමීයෙය්‍ය — පෙ —    ගච්ඡීයෙථ, ගමීයෙථ — පෙ —

4 **හීයත්තනී විභත්තිය.** අතීත කාලිකයි

ආ ඌ, ඕ ත්ථ, අ ම්හා, ත්ථ ත්ථුං, සෙ ව්හං, ඉං ම්හසෙ, හීයත්තනී අජ්ජතනී කාලාතිපත්ති යන විභක්තිවලදී ධාතුවට මුලින් කිසි තැනෙක 'අ' ආගමව ක්‍රියාපද සෑදේ.

√ භූ ධාතූ කර්තෘකාරකයෙහි.

| | | | |
|---|---|---|---|
| අභවා | අභවූ | අභවත්ථ | අභවත්ථුං |
| අභවො | අභවත්ථ | අභවසෙ | අභවව්හං |
| අභවං | අභවම්හා | අභවිං | අභවම්හසෙ |

කර්මකාරකයෙහි.

| | |
|---|---|
| අනුභූයථ (ත්ථ) | අනුභූයත්ථුං |
| අනුභූයසෙ, | අනුභූයව්හං |
| අනුභූයං | අනුභූයාම්හසෙ |

1 ප්‍රථම මධ්‍යම පුරුෂ එක වචනයන්ට රූප දෙක බැගිනි.

√ පච

| | | | |
|---|---|---|---|
| අපචා | අපචු | අපචත්ථ | අපචිත්ථුං |
| අපචෙ | අපචත්ථ | අපචසෙ | අපචවහං |
| අපචං | අපචම්හා | අපචිං | අපචම්හසෙ |

කම්මකාරකයෙහි.

අපච්චා අපච්චු අපච්චත්ථ අපච්චිත්ථුං
—පෙ— —පෙ—

√ ගමු කත්තෘකාරකයෙහි.

| | | | |
|---|---|---|---|
| අගච්ඡා | අගච්ඡු | අගච්ඡත්ථ | අගච්ඡිත්ථුං |
| අගච්ඡෝ | අගච්ඡත්ථ | අගච්ඡසෙ | අගච්ඡවහං |
| අගච්ඡං | අගච්ඡම්හා | අගච්ඡිං | අගච්ඡම්හසෙ |
| අගමා | —පෙ— | | |

කම්මකාරකයෙහි.

අගච්ඡීයත්ථ, ගච්ඡීයත්ථ අගමීයත්ථ ගමීයත්ථ – පෙ –

**5 පරොක්ඛා විභත්තිය.** අතීත කාලිකයි.

අ උ – එ ත්ථ – අ ම්හ – ත්ථ රෙ – ත්ථො වෝ – ඉ ම්හෙ; ප්‍රධාන වශයෙන් පරොක්ඛා විභත්තිය තමන් ඇසින් නුදුටු ඇසූ දෙයක් කීමෙහි යෙදේ. සාමාන්‍ය අතීත කාලික විභක්තියක් හැටියටද භාෂාවෙහි යෙදේ.

√ භූ කත්තෘකාරකයෙහි,

| | | | |
|---|---|---|---|
| [1] බභූව | බභූවු | බභූවිත්ථ | බභූවිරෙ |
| බභූවෙ | බභූවිත්ථ | බභූවිත්ථො | බභූවිව්හො |
| බභූව | බභූවිම්හ | බභූවි | බභූවිම්හෙ |

කම්මකාරකයෙහි.

[2] අනුබභූවිත්ථ අනුබභූවිරෙ —පෙ—

---

පරොක්ඛා විභත්තියෙහිදී සමාන ස්වර ධාතුන්ගේ ආදි අක්ෂරය ද්විත්ව වේ. එහි මහාප්‍රාණ අක්ෂරයක් නම් අල්පාක්ෂරය හා අකාරය ආදේශ වේ. ධාතුවෙහි ඉතිරිව පවත්නා උඟ හට උව වේ. බභූව යනුයි.

2 'ය' ට ලොප් විය.

√ පච කත්තෘකාරකයෙහි,

| | | | |
|---|---|---|---|
| 1 පපච | පපචු | පපචිත්ථ | පපචිරෙ |
| පපචෙ | පපචිත්ථ | පපචිත්ථො | පපචිව්හො |
| පපච | පපචිම්හ | පපචි | පපචිම්හෙ |

කම්මකාරකයෙහි,

| | | | |
|---|---|---|---|
| පපච්ච | පපච්චු | පපච්චිත්ථ | පපච්චිරෙ |

— ශා —

√ ගමු කත්තෘකාරකයෙහි

| | | | |
|---|---|---|---|
| 2 ජගාම, ජගම | ජගමු | ජගමිත්ථ | ජගමිරෙ |
| ජගාම | ජගමිත්ථ | ජගමිත්ථො | ජගමිව්හො |
| ජගාම | ජගමිම්හ | ජගමි | ජගමිම්හෙ. |

කම්මකාරකයෙහි:- ජගමීයිත්ථ යනාදී වශයෙනි.

6 අජ්ජතනී විභත්තිය. අතීත කාලිකයි.

ඊ, උං, ඔ, ත්ථ, ඉං, මහා, ආ, ඌ, සෙ, වහං, අ, ම්හෙ,

√ භූ කත්තෘකාරකයෙහි.

අභවි, භවි – අභවිංසු, භවිංසු, අභවුං, භවුං
අභවො, භවො – අභවිත්ථ, භවිත්ථ
අභවිං, භවිං – අභවිම්හා, භවිම්හා

අත්තනො පද,

| | |
|---|---|
| අභවා, භවා | අභවූ, භවූ |
| අභවිසෙ | අභවිව්හං |
| අභවං, අභව | අභවිම්හෙ |

කම්මකාරකයෙහි,

| | | | |
|---|---|---|---|
| අන්වභූයි, | අනුභූයි, | අන්වභූයිංසු, | අනුභූයිංසු |
| අන්වභූයි, | අනුභූයි, | අන්වභූයිත්ථ, | අනුභූයිත්ථ |
| අන්වභූයිං | අනුභූයිං. | අන්වභූයිම්හ, | අනුභූයිම්හ |

1 පච ධාතුහුගේ ආදි වර්ණයට ද්විත්වව 'පපච' යි වීය.
2 'ගු ගාමි' යනු [illegible] ජ [illegible] 'ජගාම යි' සිද්ධ වීය.

⁄_පච කත්‍රීකාරකයෙහි,

අපචිපචි අපචීපචී - අපචිංසු පචිංසු අපචුං පචුං
[1] අපචී, පචි අපචො, පචො - අපචිත්ථ පචිත්ථ
අපචිං, පචිං - අපචිම්හ, පචිම්හ, අපචිම්හා පචිම්හා,

අත්තනොපද,

අපචිත්ථ' පචිත්ථ, අපචා පචා - අපචු
අපචිසෙ අපචිව්හං
අපචං, අපච අපචිමෙහ

කම්කාරකයෙහි,

අපච්චි, පච්චි - අපච්චිංසු, පච්චිංසු, අපච්චුං, පච්චුං
අපච්චි, පච්චි, අපච්චො, පච්චො - අපච්චිත්ථ, පච්චිත්ථ
අපච්චිං, පච්චිං, - අපච්චිම්හා පච්චිම්හා,

⁄_ගමු කත්‍රීකාරකයෙහි,

අගච්ඡි, ගච්ඡි, අගච්ඡි ගච්ඡි- අගච්ඡිංසු, ගච්ඡිංසු
අගච්ඡුං, ගච්ඡුං,
අගච්ඡි. ගච්ඡි, අගච්ඡො ගච්ඡො-අගච්ඡිත්ථ, ගච්ඡිත්ථ
අගච්ඡිං ගච්ඡිං - අගච්ඡිම්හ, ගච්ඡිම්හ
අගමාසි, - අගමිංසු, ගමිංසු, අගමංසු, අගමුං.
අගමි, ගමි, අගමො ගමො, - අගමිත්ථ, ගමිත්ථ,
අගමුත්ථ, ගමුත්ථ,
අගමිං, ගමිං - අගමිම්හ ගමිම්හ, අගමුම්හ, ගමුම්හ
අජ්ඣගා, අජ්ඣගුං, අජ්ඣගා, අජ්ඣගුත්ථ; අජ්ඣගං අජ්ඣගුම්හ

අත්තනොපදයෙහි,

අගච්ඡිත්ථ, ගච්ඡිත්ථ යනාදී වසයෙනි.

කම්කාරකයෙහි.

අගච්ඡීයිත්ථ, ගච්ඡීයිත්ථ
අගච්ඡීයි, ගච්ඡීයි යනාදී වසයෙනි.

---

1 ඔහට ඉ ආගමයවිය.
2 අගඤ්ජි, ගඤ්ජි, අගඤ්ඡ්, ගඤ්ඡ් - අගමි, ගමි, අගමි, ගමි, යනාදී වසයෙන්ද රූප සෑදෙති.

7 භවිස්සන්ති විභත්තිය : අනාගතයෙහියි.

ස්සති ස්සන්ති - ස්සසි ස්සථ - ස්සාමි, ස්සාම,
ස්සතෙ ස්සන්තෙ- ස්සසෙ ස්සව්හෙ ස්සං, ස්සාම්හෙ

√භූ ධාතු කතෘකාරකයෙහි,

| | | | |
|---|---|---|---|
| භවිස්සති | භවිස්සන්ති | භවිස්සතෙ | භවිස්සන්තෙ |
| භවිස්සසි | භවිස්සථ | භවිස්සසෙ | භවිස්සව්හෙ. |
| භවිස්සාමි | භවිස්සාම | භවිස්සං | භවිස්සාම්හෙ |

කර්මකාරකයෙහි,

[1] අනුභවිස්සති - අනුභවිස්සන්ති
අනුභවිස්සතෙ - අනුභවිස්සන්තෙ යනාදී වශයෙනි.

√පච ධාතු කතෘකාරකයෙහි,

| | | | |
|---|---|---|---|
| පචිස්සති | පචිස්සන්ති | පචිස්සතෙ | පචිස්සන්තෙ |
| පචිස්සසි | පචිස්සථ | පචිස්සසෙ | පචිස්සව්හෙ |
| පචිස්සාමි | පචිස්සාම | පචිස්සං | පචිස්සාම්හෙ |

කර්මකාරකයෙහි,

පච්චිස්සති - පච්චිස්සතෙ යනාදී වශයෙනි.

√ගමු ධාතු කතෘකාරකයෙහි,

ගච්ඡිස්සති - ගච්ඡිස්සන්ති, ගච්ඡිස්සතෙ, ගච්ඡිස්සන්තෙ
යනාදී වශයෙනි.

කර්මකාරකයෙහි,

ගච්ඡීයිස්සති - ගච්ඡීයිස්සතෙ
ගමීයිස්සති - ගමීයිස්සතෙ
යනාදී වශයෙනි.

8 කාලාතිපත්ති විභත්තිය. අතීත කාලිකයි.

ස්සා ස්සංසු ස්සෙ ස්සථ, ස්සං ස්සම්හා,
ස්සථ ස්සිංසු ස්සසෙ ස්සව්හෙ ස්සං ස්සාම්හසෙ,

ක්‍රියා සිද්ධියෙහි නිෂ්පත්තියක් නැති කල්හි කාලාතිපත්ති විභත්තිය වේ.

---

1 මෙහි 'ය' කට ලොප් විය.

∟ භූ ධාතූ කාරකයෙහි,

අභවිස්ස, භවිස්ස, අභවිස්සා, භවිස්සා - අභවිස්සංසු භවිස්සංසු
අභවිස්ස, අභවිස්සෙ - අභවිස්සථ,
අභවිස්සං - අභවිස්සම්හ,
අභවිස්සථ - අභවිස්සිංසු,
අභවිස්සසෙ - අභවිස්සව්හෙ,
අභවිස්සං - අභවිස්සාම්හසෙ,

කම්කාරකයෙහි,

අන්භවිස්ස - අන්වභවිස්සථ යනාදියයි.

∟ පච ධාතූ කාරකයෙහි,

අපචිස්ස පචිස්ස, අපචිස්සා, පචිස්සා, අපචිස්සංසු, පචිස්සංසු
අපචිස්ස, පචිස්ස, අපචිස්සෙ, පචිස්සෙ - අපචිස්සථ, පචිස්සථ
අපචිස්සං, පචිස්සං, - අපචිස්සම්හා, පචිස්සම්හා,
අපචිස්සථ - අපචිස්සිංසු
අපචිස්සසෙ - අපචිස්සව්හෙ,
අපචිස්සං - අපචිස්සාම්හසෙ,

∟ ගමු ධාතූ කාරකයෙහි,

අගච්ඡිස්ස, ගච්ඡිස්ස, අගච්ඡිස්සා, ගච්ඡිස්සා,
- අගච්ඡිස්සංසු, ගච්ඡිස්සංසු,
අගච්ඡිස්ස, ගච්ඡිස්ස, අගච්ඡිස්සෙ, ගච්ඡිස්සෙ,
- අගච්ඡිස්සථ, ගච්ඡිස්සථ,
අගච්ඡිස්සං, ගච්ඡිස්සං, - අගච්ඡිස්සම්හා, ගච්ඡිස්සම්හා
අගමිස්ස, ගමිස්ස අගමිස්සංසු, ගමිස්සංසු.
අගමිස්ස, ගමිස්ස, අගමිස්සෙ, ගමිස්සෙ, අගමිස්සථ
අගමිස්සං - අගමිස්සම්හා,

කම්කාරකයෙහි,

අගච්ඡිස්ස, අගච්ඡීයිස්සථ. යනාදිය වේ.

# විශෙෂ විභාග.

√ ඉසු, කැමැත්තෙහි.

1 ඉච්ඡති, ඉච්ඡන්ති; එසති, එසන්ති, කම්, ඉච්ඡීයති, එසීයති. ඉච්ඡතු, එසතු, ඉච්ඡෙය්‍ය, එසෙය්‍ය, [2] ඉච්ඡි, එසි, ඉච්ඡිස්සති, එසිස්සති ඉච්ඡිස්ස එසිස්ස,

√ සමු සිත් ඇලවීමෙහි,

1 නියච්ඡති, නියමති, කම්. නියච්ඡීයති, නියමීයති. නියච්ඡතු, නියච්ඡෙය්‍ය, නියච්ඡි, නියච්ඡිස්සති, නියච්ඡිස්ස,

√ ආස හිඳීමෙහි,

1 අච්ඡති, කම්, අච්ඡීයති. අච්ඡතු, අච්ඡෙය්‍ය, අච්ඡි, අච්ඡිස්සති, අච්ඡිස්ස

√ ලභ ලැබීමෙහි,

3 ලභති, කම් - ලබ්භතෙ; ලභතු, ලභෙය්‍ය, අලභිලභි, ලභිස්සති' අලභිස්සා,

√ වච කීමෙහි,

වචති, කම් - [4] උච්චතෙ, වචතු, වචෙය්‍ය, අවචා, අවොචි, [5] වක්ඛති, අවචිස්සා,

√ රුදි හැඬීමෙහි.

රොදති, රොදතු, රොදෙය්‍ය, අරුදි, රුච්ඡති, = රොදිස්සති අරොදිස්සා

√ කුස ක්‍රොධයෙහි,

අක්කොසති, අක්කොසතු, අක්කොසෙය්‍ය, [6] අක්කොච්ඡි අක්කොසිස්සති, අක්කොසිස්ස,

---

1 ධාතුහුගේ අන්ත්‍යට 'ච්ඡ' වේ. 2 පරොක්ඛා හියත්තනී රූප පිළියෙල කර ගත යුතු. භාෂාවේ වැඩිපුර නොයෙදෙන හෙයින් මෙහි නොදැක්වේ. 3 භවිස්සන්ති විභක්තියෙහිදී ලච්ඡති යනාදී වශයෙන් සිද්ධ වේ. 4 වච ධාතුහුගේ 'ව' හට 'උ' වේ. ය් පර කල්හිය, 5 භවිස්සන්ති විභත්තියෙහි දී ස්ස හට 'ඛ' ආදේශ වේ. 6 කුස සකාරෙත් ඊ හට 'ච්ඡි' ආදේශ වේ.

∟ **වහ** පැමිණවීමෙහි,

වහති, කම් - වුය්හතෙ. වහතු, වහෙය්‍ය, අවහි, වහිස්සති, අවහිස්ස.

∟ **ජර** දිරීමෙහි,

[1] ජීරති, ජීය්‍යති, කම් - ජීරියති. ජීරතු, ජීරෙය්‍ය' අජීරි ජීරිස්සති, අජීරිස්ස,

∟ **මර** මරණයෙහි,

[2] මීය්‍යති - මරති, මරතු, මරෙය්‍ය, මරි, මරිස්සති, අමරිස්ස

∟ **දිස** බැලීමෙහි,

[3] පස්සති, දක්ඛති. කම් - දිස්සතෙ පස්සතු, පස්සෙය්‍ය අපස්සි, පස්සිස්සති, අපස්සිස්ස

∟ **සද** හිඳීම් ආදියෙහි,

[4] නිසීදති,-භාවෙ - නිසජ්ජතෙ; නිසීදතු, නිසීදෙ, නිසීදි, නිසීදිස්සති, නිසීදිස්ස,

∟ **යජ** යාග කිරීමෙහි,

යජති කම් - [5] ඉජ්ජතෙ; යජතු යජෙ, යජි, යජිස්සති අයජිස්ස,

∟ **වද** වචනයෙහි,

වදති, [6] වජ්ජති, කම් - වජ්ජියති වජ්ජතු, වජ්ජෙය්‍ය අවදි, වදිස්සති, අවදිස්ස,

∟ **තුද** පෙළීමෙහි,

තුදති, කම් - තුජ්ජතෙ; තුදතු, තුදෙය්‍ය, අතුදි, තුදිස්සති අතුදිස්ස,

∟ **විස** පිවිසීමෙහි,

පවිසති, කම් - පවිසියතෙ. පවිසතු, පවිසෙ, පවිසි පවිසිස්සති, පවිසිස්ස,

---

1 ජර ධාතුහට ජීර, ජීය්‍ය, ආදෙශ වෙත්. 2 මර හට 'මීය්‍ය' ආදෙශ වේ. 3 දිස හට පස්ස, දිස්ස, දක්ඛ යන ආදෙශයෝ වෙති. 4 සද ධාතුහට 'සීද' ආදෙශ වේ; 5 යකාර 'ඉ' වේ. 6 ය ප්‍රත්‍යය පරකල සිය හට 'ජ' වේ.

√හූ වීමෙහි,

හොති, භාවෙ - හූයතෙ; හොතු, හෙය්‍ය, අහුවා, අහොසි, හෙසිස්සති, = හොහිති, අහවිස්ස,

√සී සයනය කිරීමෙහි,

සෙති, [1] සයති කම් - අතිසීයතෙ. සෙතු, සයෙ, අසයි සයිස්සති, අසයිස්ස;

√නී පැමිණ වීමෙහි,

නෙති, කම් - නීයතෙ; නෙතු, නයතු, නයෙ අනයි නයිස්සති, අනයිස්ස,

√ඨා සිටීමෙහි,

[2] තිට්ඨති = ඨාති, තිට්ඨතු, තිට්ඨෙ, අට්ඨාසි, ඨස්සති, පතිට්ඨිස්සති, පතිට්ඨිස්ස; කම්, [3] උපට්ඨීයති.

√පා බීමෙහි,

පිබති, පිබතු, පිබෙය්‍ය, පිවි, පිවිස්සති, අපිවිස්ස,

√අස වීමෙහි,

[4] අත්ථි, [5] සන්ති, අසි, අත්ථ, අස්මි, අස්ම, = අම්හ, [6] අස්සා ආසි, [7] භවිස්සති, අභවිස්ස,

√බ්‍රූ කීමෙහි,

බ්‍රවීති, බ්‍රූති, බ්‍රූතු, බ්‍රූව, අබ්‍රවි, බ්‍රවිස්සති, අබ්‍රවිස්ස,

√හන හිංසා කිරීමෙහි,

හනති = හන්ති, හනාති, කම් - හඤ්ඤතෙ; හනතු, හනෙය්‍ය, අහනි, හනිස්සති, අහනිස්ස, [8] වධෙති කම් - වධීයති. වධෙතු, වධෙය්‍ය අවධි, වධිස්සති, අවධිස්ස,

---

1 ව්‍යඤ්ජනයෙහි වූ ඊ හට අය ආදෙශ වේ. 2 තිට්ඨ ආදෙශ වේ. 3 ය ප්‍රත්‍යය පරකල්හි දා ධා මා ඨා හා පා මහ මථ යන ධාතූන්ගේ අන්තයට ඊ කාරාදෙශ වේ. 4 අස ධාතු කෙරෙන් පරවූ 'ති, හට 'ත්ථි' ආදෙශ වේ. ධාතු අන්තයට ලොප්වේ 5 'අ' හට ලොප් වේ. 6 ධාතු අන්තය සහිතවූ එය්‍යාදීන්ට ස්ස ස්සු, ස්සථ, ස්සං, ස්සාම, ආදෙශ වේ. 7 අස ධාතු හට භූ ආදෙශ වේ. 8 හන ධාතු හට සෑම තන්හි 'වධ' ආදෙශ වේ.

— හු ගිතෙලින් කරණ යාගයෙහි,

[2] ජුහොති කම්ම - හූයතෙ. ජුහොතු, ජුහෙය්‍ය, අජුහොසි ජුහිස්සති, අජුහිස්ස,

— හා ත්‍යාගයෙහි,

[2] ජහාති, කම්ම - හීයතෙ. ජහාතු, ජහෙය්‍ය, අජහාසි, ජහිස්සති, අජහිස්ස,

— දා දීමෙහි,

[3] දදාති, [4] දජ්ජති, කම්ම-දීයතෙ. දදාතු, දදෙ, හීයත්තනී අදදා. අදදී, = අදාසි, දදිස්සති, අදදිස්ස,

— ධා දැරීමෙහි,

[5] දධාති,= විදහති, කම්ම-ධීයතෙ. දධාතු, දධෙ, අධාසි = පිදහි, ධස්සති, අධස්ස,

අකාරය විකරණය කොට ඇති භූවාදිය මෙතෙකින් සමාප්ත යි.

— රුධි ඇවිරීමෙහි,

1 රුන්ධති, කම්ම - රුජ්ඣතෙ. රුන්ධතු, රුන්ධෙ, අරුන්ධි, රුන්ධිස්සති, අරුන්ධිස්ස;

— ඡිදි සිඳීමෙහි,

1 ඡින්දති, කම්ම - ඡිජ්ජතෙ. ඡින්දතු, ඡින්දෙ, අඡින්දි, ඡින්දිස්සති, අඡින්දිස්ස;

— භිද බිඳීමෙහි,

1 භින්දති, කම්ම - භිජ්ජතෙ. භින්දතු, භින්දෙ, භින්දි. භින්දිස්සති, අභින්දිස්ස;

---

1 හන ධාතු හට සෑම තැන්හි 'වධ' ආදෙශ වේ. 2 ධාතුහට ද්විත්වයේ මුලින් පිහිටි හ කාරයට 'ජ' ආදෙශ වේ. 3 ධාතු හට ද්විත්ව වේ. 4 ධාතු හට දජ්ජ ආදෙශ වේ. 5 ධාතු හට ද්විත්වය හා ධ හට 'ද' ආදෙශ වේ.

1 රුධාදි ධාතු ගණයේදී ධාතුවේ අකුරු දෙකා මැද නිග්ගහීතයක් ද [illegible] 'අ' [illegible] වේ. [illegible]

√ යුජ යෙදීමෙහි.

[1] යුඤ්ජති, කම් - යුජ්ජතෙ. යුඤ්ජතු, යුඤ්ජෙ, අයුඤ්ජි, යුඤ්ජිස්සති, අයුඤ්ජිස්ස,

√ භුජ අනුභවයෙහි,

[1] භුඤ්ජති, කම්, - භුජ්ජතෙ; භුඤ්ජතු, භුඤ්ජෙ, අභුඤ්ජි, භුඤ්ජිස්සති, [2] (=භොක්ඛති) අභුඤ්ජිස්ස.

√ මුච මිදීමෙහි,

[1] මුඤ්චති, කම් - මුච්චතෙ. මුඤ්චතු, මුඤ්චෙ, අමුඤ්චි, මුඤ්චිස්සති, = [2] මොක්ඛති, අමුඤ්චිස්ස.
නිග්ගහීතාගම හා අවිකරණයෙන් යුත් රුධාදිධාතු ගණයයි,

√ දිවු සෙල්ලමෙහි,

[3] දිබ්බති, කම් - දිබ්බතෙ. දිබ්බතු, දිබ්බෙ, අදිබ්බි, දිබ්බිස්සති, අදිබ්බිස්ස,

√ සිවු මැහීමෙහි,

[3] සිබ්බති, කම් - සිබ්බතෙ. සිබ්බතු, සිබ්බෙ, අසිබ්බි, සිබ්බිස්සති, අසිබ්බිස්ස,

√ පද ගමන්හි,

[3] උප්පජ්ජති, කම් - පටිපජ්ජතෙ. උප්පජ්ජතු, උප්පජ්ජෙ, උප්පජ්ජි, උප්පජ්ජිස්සති, උප්පජ්ජිස්ස,

√ බුධ අවබොධයෙහි,

[4] බුජ්ඣති, කම් - බුජ්ඣතෙ බුජ්ඣතු, බුජ්ඣෙ, අබුජ්ඣි, බුජ්ඣිස්සති, අබුජ්ඣිස්ස,

---

2 ධාතූන්ගේ අන්තය සහිත 'ස්ස' යන්නට 'ක්ඛ' ආදෙශය වේ.

1 රුධාදි ධාතුගණයේදී ධාතුවේ අකුරු දෙකට මැද නිග්ගහීතයක් ද ධාතුප්‍රත්‍ය දෙකට මැද 'අ' යන්නක් ද වෙති. රුධ්=රුංධ් අති= රුන්ධති

2 ධාතූන්ගේ අන්තය සහිත 'ස්ස' යන්නට 'ක්ඛ' යන ආදෙශ වේ.

3 මේ ධාතුන්ට විකරණය 'ය' වෙයි. (දිවු + ය = ති = දිව්යති = දිව්වති= දිබ්බති;)

4 ය විකාරණය වූකල යවත් වූ ධ හට ඣ ආදෙශව ජ්ඣ යි ද්විත්ව වේ.

∟ සුධ සුද්ධයෙහි;
සුජ්ඣති, — පෙ —

∟ කුධ කොපයෙහි,
කුජ්ඣති — පෙ —

∟ විධ තැලීමෙහි,
විජ්ඣති, — පෙ —

∟ නහ බැඳීමෙහි,
සන්නය්හති — පෙ —

∟ මන දැනීමෙහි,
මඤ්ඤති — පෙ —

∟ දා දීමෙහි, සං පූර්වවේ.
සමාදියති — පෙ —

∟ තුස ප්‍රීතියෙහි,
තුස්සති — පෙ —

∟ සම සන් සිඳීමෙහි,
සම්මති — පෙ —

∟ කුප කෝපයෙහි,
කුප්පති — පෙ —

∟ ජන ඉපදීමෙහි,

[1] ජායති, කම්ම - ජනීයතෙ. ජායතු, ජායෙය්‍ය, ජායි = අජනි, ජායිස්සති, = ජනිස්සති, අජායිස්ස = අජනිස්ස; යකාරය විකරණය කොට ඇති දිවාදිධාතු ගණයයි.

∟ සු ඇසීමෙහි,

[2] සුණොති = සුණාති, කම්ම - සූයතෙ. සුණොතු, සුණෙය්‍ය, අසුණි අස්සොසි, සුණිස්සති සොස්සති, අසුණිස්ස,

---

1 ∟ ජන හට ජා ආදෙශ වේ.

2 මේ ධාතු ගණයෙහි ණු. ණා. උණා යයි විකරණ තුනකි. හැම විකරණයක් හැම ධාතුවක් කෙරෙත්ම බලාපොරොත්තු නොවිය යුතුයි. සු + ණු + ති = සුණොති. ණු හට වෘද්ධි වේ.

√ හි ගමන්හි,

පහිණාති, පහිණාතු, පහිණෙය්‍ය, පහිණි,
පහිණිස්සති, පහිණිස්ස.

√ වු ඇවිරීමෙහි,

ආවුණාති — පෙ —

√ මි බැලීමෙහි,

මිනොති, මිනාති — පෙ —

√ අප පැමිණවීමෙහි,

පාපුණාති, කම් - පාපීයතෙ; පාපුණාතු, පාපුණෙ
පාපුණි, පාපුණිස්සති, පාපුණිස්ස,

√ සක හැකිවීමෙහි,

සක්කුණාති, භාව - සක්කතෙ. සක්කුණාතු,
සක්කුණෙය්‍ය, [1] අසක්ඛි, සක්ඛිස්සති, අසක්ඛිස්ස,

ණු. ණා. උණා යන විකරණ තුණකින් යුක්ත වූ ස්වාදි ධාතු ගණයයි.

√ කී ගණුදෙනු කිරීමෙහි,

[2] වික්කිණාති කම් - වික්කීයතෙ. වික්කිණාතු, වික්කිණෙ,
අවික්කිණි, වික්කිණිස්සති, අවික්කිණිස්ස.

√ ජී දිනීමෙහි,

ජිනාති, කම් - ජීයතෙ. ජිනාතු, ජිනෙය්‍ය, අජිනි,
ජිනිස්සති. අජිනිස්ස,

√ චි රැස් කිරීමෙහි,

චිනාති — පෙ —

---

1 අජ්ජතනී විභත්තියෙ පවත් සක ධාතුහුගේ ක හට 'ඛ' ආදෙශ වේ.

2 වි, කී + නා + ති = වික්කිණාති; මේ ධාතු ගණයෙහි විකරණයවූ 'නා' හට 'ණා' ආදෙශ විය.

√ ඤා අවබොධයෙහි,

1 විජානාති, විනායති, විජානාතු, 2 විජඤ්ඤා විජානෙය්‍ය සමජානි, 3 අඤ්ඤාසි, විජානිස්සති, අජානිස්ස;

√ මා ප්‍රමාණයෙහි,

මිනාති, කම් - මීයතෙ; — පෙ —

√ ලූ සිඳීමෙහි,

ලුනාති — පෙ —

√ ධූ කම්පාවෙහි;

ධුනාති — පෙ —

√ ගහ ගැණීමෙහි,

4 ගණ්හාති, ඝෙප්පති, කම් - ගය්හතෙ. ගණ්හාතු, ගණ්හෙ. අගණ්හි, = ගණ්හි, = අගගහෙසි, ගණ්හිස්සති, අගණ්හිස්ස,

'නා, විකරණ කොට ඇති කියාදි ධාතු ගණයයි.

√ තනු පැතිරවීමෙහි.

5 තනොති, කම්-පතඤ්ඤතෙ තනොතු, තනෙය්‍ය අතනි, තනිස්සති, අතනිස්ස

√ කර කිරීමෙහි,

කරොති, 6 කුබ්බති, කයිරති, කුරුතෙ, කම් - කය්‍යතෙ, කරොතු, කුරුතු,

---

1 ඤා ධාතුහට 'ජා නා, යන මොහු ආදෙශ වුහ.

2 ඤා ධාතු කෙරෙත් පර එය්‍ය හට 'ඉයා ඤා' ආදෙශයෝ වෙති. විජානියා විජඤ්ඤායි සිද්ධ වෙති. 3 නා හට ලොප්විය.

4 මේ ධාතුගණයේ විකරණ ප්‍රත්‍යයෝ 'ප්ප ණ්හා' දෙක වෙති. ණ්හා ප්‍රත්‍යය පර කල්හි 'ගහ, ධාතුහුගේ 'හ' හට ලොප් වේ. 'ප්ප ප්‍රත්‍යය පර කල්හි ගහ ධාතුවට ,ඝෙ, ආදෙශ වේ.

5 තනාදී ධාතු ගණයෙහි විකරණ ඔ යිර දෙක වෙත් එයින් 'යිර විකරණය කර ධාතු කෙරෙත් වේ. 6 කර+ඔ+ති = ඔ හට උ වේ කර +උ+ති = කර+ව+ති, ව පර කල්හි ර හට ලොප් වේ. ක+ව+ති, අ හට 'උ' වේ කු+ව+ති = ව ද්විත්ව වේ. කුව්වති, ව දෙකට බ දෙකක් වේ. කුබ්බති

සත්තමී- කරෙ, කරෙය්‍ය, කුබ්බෙ, කුබ්බෙය්‍ය,
1 කයිරා, කයිරුං, කයිරාසි, කයිරාථ, කයිරාමි, කයිරාම.
හීයත්තනී - 2 අකා = අකරා, අකරූ අකරො, අකාත්ථ, අකරොත්ථ, අකං, අකරං, අකම්හ, අකරම්හා. අකරත්ථ, අකරිං අකරම්හසෙ,

අජ්ජතනී - 3 අකාසි, අකාසුං, අකාසි, අකාසිත්ථ, අකාසිං අකාසිම්හ; අකාසිත්ථ,
අකරි, අකරිංසු, අකරී, අකරිත්ථ, අකරිං, කරිං අකරිම්හ, කරිම්හ; අකරිත්ථ; අකරිසිත්ථ,
භවිස්සන්ති, - 4 කාහති, කාහන්ති, කාහසි, කාහථ, කාහාමි කාහාම,
කරිස්සති, කරිස්සන්ති, — පෙ —
අභිසංඛරොති — පෙ — කර හට 'ඛර, ආදෙශයි.

— සක ශක්තියෙහි,

සක්කොති, සක්කොන්ති, — පෙ —

— අප පැමිණවීමෙහි, පප්පුබ්බ වේ.

පපෙපාති, පප්පොන්ති, — පෙ —

ඔ, යිර විකරණ කොට ඇති තනාදි ධාතු ගණයයි.

— චුර සොරකම් කිරීමෙහි,

6 චොරෙති, = චොරයති, කම් - චොරියතෙ චොරයතු, චොරයෙ, අචොරයි, චොරයිස්සති, අචොරයිස්ස,

— චින්ත සිතීමෙහි,

චින්තෙති, චින්තයති, චින්තෙතු, චින්තෙය්‍ය, අචින්තෙසි, චින්තෙස්සති, අචින්තිස්ස;

---

1 යිර ප්‍රත්‍යය කොටගෙන් වූ එය්‍යාදියට පිළිවෙළින් ආ, උං, ආසි, අථ, ආමි ආම, යන ආදෙශයෝ වෙත්. කර ධාතුහුගේ ර හට ලොප් වේ. 2 කර හට 'කා' ආදෙශ වේ. 3 කර ධාතුහට 'කාස' ආදෙශ වේ. 4 සස සහිත කර ධාතුහට 'කාහ' ආදෙශ වේ.

6 චුරාදියේ විකරණ ඒ, අය, දෙක වෙත්. ධාතුහුගේ ආදි ස්වරයට සුද්ධි සාල්සි වෘද්ධි වේ. චුර්+එ, ති= චුරෙති, චොරෙති,

∟ මන්ත රහස් සාකච්ඡාවෙහි,
මන්තෙති, මන්තයති, — පෙ —

∟ පාල රැකීමෙහි,
පාලෙති, පාලයති, — පෙ —

∟ ඝට ගැටීමෙහි,
1 ඝටෙති, ඝටයති, — පෙ —

∟ විද දැනීමෙහි;
වෙදෙති, වෙදයති, — පෙ —

∟ ගණ ගණනෙහි,
1 ගණෙති, — පෙ —

එ අය දෙක විකරණ කොට ඇති චුරාදි ගණයයි.

## නාම ධාතුක ක්‍රියා.

∟ තිජ ඉවසීමෙහි,

තිතික්ඛති, කම් - තිතික්ඛීයතෙ. තිතික්ඛතු, තිතික්ඛෙ අතිතික්ඛි, තිතික්ඛිස්සති, අතිතික්ඛිස්ස,

∟ ගුප පිළිකුලෙහි,
ජිගුච්ඡති — පෙ —

∟ කිත පිළියමෙහි,
තිකිච්ඡති, තිකිච්ඡනාති — පෙ —
විචිකිච්ඡති — පෙ —

∟ මාන විමසීමෙහි,
වීමංසති - වීමංසනාති — පෙ —

∟ භුජ අනුභව කිරීමෙහි, බුභුක්ඛති, — පෙ —
∟ ඝස අනුභවයෙහි ජිඝච්ඡති — පෙ —
∟ හර හැරීමෙහි, ජිගිංසති — පෙ —
∟ සු ඇසීමෙහි, සුස්සූසති, — පෙ —
∟ පා පීමෙහි, පිවාසති, — පෙ —

---

1 වෘද්ධි නොවේ.

∟ ජි - ජයෙති, විජිගිංසති, — පෙ —
∟ සමුද්ද - සමුද්දායති — (තාපසයා.)
∟ චිච්චිට = චිච්චිටායති, — (ශබ්දය.)
∟ ධූම = ධූමායති,
∟ ඡත්ත = ඡත්තීයති, ∟ පුත්ත = පුත්තීයති,

ප්‍රයොජ්‍ය හෙවත් හෙතුකර්තෘක්‍රියා,

මෙහි ප්‍රත්‍යයෝ 'එ අය ආපෙ ආපය' යන මොහු වෙත්. අසංයොග පර තත්හි ධාතුහුගේ ආදිස්වරය වෘද්ධි වේ

මේ ප්‍රත්‍යය චතුෂ්කයෙන් 'භූ' ආදී උවර්ණාන්ත ධාතු කෙරෙන් ඒ අය යන ණෙණය ප්‍රත්‍යය දෙක ද, ආකාරාන්ත ධාතු කෙරෙන් ආපෙ ආපය යන ප්‍රත්‍යය දෙක ද, සෙසු ධාතු කෙරෙන් මේ ප්‍රත්‍යය චතුෂ්කයම ද ධාතු ප්‍රත්‍යය දෙකට මැද පිහිටා ක්‍රියාපද සෑදෙති.

මේ භෙදය විශෙෂයෙන් සිතේ තබා ගන්න.

අකර්මක ධාතුවක් හෙතුකර්තෘයෙහි යෙදුනු කල්හි එය සකර්මක බවට පැමිණේ සකර්මක ධාතුවක් නම් විකර්මක වේ. 'දෙවදත්තො භවති, භූ ධාතුවෙන් නිපන් භවති' යන ක්‍රියා පදයට දෙවදත්තො යනු කර්තෘ වේ. මෙහි කර්මයක් නැත. ධාතුව අකර්මක හෙයිනි.

'භාවෙති' යි ක්‍රියාවට ප්‍රයොජ්‍ය වූ කල්හි 'සො සමාධිං භාවෙති' යි 'සමාධිං' කියා කර්මයක් ඇතිවිය. 'දෙවදත්තො ඔදනං පචති' පච ධාතුවෙන් නිපන් 'පචති' යන ක්‍රියාවට 'ඔදනං' යනු කර්මය වෙයි. ධාතුව සකර්මක හෙයිනි.

'සො දෙවදත්තං ඔදනං පාචෙති' යි ප්‍රයොජ්‍ය වූ කල්හි 'පාචෙති' යන ක්‍රියාවට 'දෙවදත්තං, ඔදනං' යි කර්මවයක් වූහ.

∟ භූ; භාවෙති, භාවයති, කර්ම- භාවීයතෙ. භාවෙතු, භාවයතු,
භාවෙය්‍ය, භාවයෙය්‍ය, අභාවෙසි, අභාවයි,
භාවෙස්සති, භාවයිස්සති; අභාවිස්ස, අභාවයිස්ස,

√ පච = පාචේති, පාචයති, පාචාපේති, පාචාපයති, (මින් පසු මෙහි රූප සතරක් නොදක්වේති,) කම්ම පාචීයති; පාචේතු, පාචෙය්‍ය, අපාචෙසි, පාචෙස්සති, අපාචිස්ස, √ සම = සමෙති, — පෙ — √ ගුහ = ගුහයති, — පෙ — √ දූස දූසයති — පෙ — √ ඉසු - ඉච්ඡාපෙති — පෙ — √ යමු - නියාමෙති, ලභ, ලාභෙති — පෙ — √ වච වාචෙති — පෙ — √ ජර, ජීරෙති √ තුද, තොදෙති — පෙ— √ විස පවෙසෙති, — පෙ — √ දිස උද්දිසාපෙති; √ සි සායෙති; √ නී - නායයති; √ ඨා පතිට්ඨාපෙති, √ හන ඝාතෙති, වධෙති, √ ඤා, ජානාපෙති, √ හූ, ජුහාපයති; √ දා දාපෙති, √ රුධි, රොධෙති, √ ඡිදි ඡේදෙති, √ යුජ, යොජෙති √ භුජ, භොජෙති, √ මුච, මොචෙති, √ දිමු, දෙමෙති, √ පද උප්පාදෙති, √ තුස, තොසෙති, √ සමු, සමෙති, √ කුප කොපෙති, √ ජා, ජනෙති, √ සු, සාවෙති, √ අප පාපෙති, √ කී වික්කාපෙති, √ ඤා ඤාපෙති. √ ගහ ගාහෙති, √ තනු විතානෙති, √ චුර චොරාපෙති, √ චින්ත චින්තාපෙති, √ පූජ පූජාපෙති,

ආඛ්‍යාතය මෙතෙකින් සමාප්තයි.

---

## අභ්‍යාස.

### I

(මෙම්වාහි පෙණෙන සමාස තද්ධිත ආඛ්‍යාත පදයන් වෙන්කොට විස්තර විභාග දැනගන්න. අර්ථ පරිශීලනය ද කරන්න.)

1 තතො පට්ඨාය සො සත්ථා - වීතනෙතා දෙවමානුසෙ
බොධිතො පූසමාසම්හි - නවමෙ පුණ්ණමාසියං;
(එතැන් පටන් බුදුරජතන් වහන්සේ දෙව් මිනිසුන් නික්මවමින් වසහැස්ක් බුද්ධත්වයෙන් නවවැනි මාසයෙහි දුරුතු මස පුරපසළොස්වක් දිනයෙහි)

2 ලඞ්කාමාගම්ම [1] ගඞ්ගාය - තීරෙ යොජනවිත්ථතෙ
මහානාගවනුය්‍යානෙ - ආයාමෙන තියොජනෙ.
(ලක්දිව් වැඩමවා මහවැලි ගං ඉවුරෙහි පුළුලින් යොදුනක් හා දිගින් තුන් යොදුන්වූ මහානාග වනයෙහි)

3 යක්ඛානං සමිතිං ගන්ත්වා - එත්වාන ගගනෙ තහිං
වාතන්ධකාර වුට්ඨීහි - කත්වා යක්ඛෙ භයද්දිතෙ,
(යක් සබයට වැඩ එහි අහසෙහි වැඩ සිට සුළඟින් යුත් තද අඳුරු වැස්සෙන් යක්ෂයන් බියෙන් පෙළනවුන් කොට)

4 ලද්ධාභයෙහි යක්ඛෙහි - තෙහි දින්නාය භූමියා
චම්මඛණ්ඩං පත්ථරෙත්වා - නිසීදිත්වාන තඞ්ඛණෙ,
(ලද අභය ඇති ඒ යකුන් විසින් දුන් බිමෙහි පත්කඩ එලා එහි වැඩහිඳ එකෙණෙහි)

5 චම්මඛණ්ඩං පදිත්තග්ගි - ජාලාමාලා සමාකුලං
ඉද්ධියා වඩ්ඪයිත්වාන - යාව සින්ධුං සමන්තතො,
(දිලියෙන ගිනිදැල් වලින් ඇසී ගියා වූ සම්කඩ සෘද්ධියෙන් සාගරය දක්වා හාත් පසින් පුළුල් කොට)

6 ජෘවන සින්ධුවෙලාය - රාසිභූතෙ නිසාචරෙ
ගිරිදීපමිධානෙත්වා - පතිට්ඨාපෙසි තෙ තහිං,
(වහා මුහුදු වෙරළට යකුන් රැස්වූ කල්හි ගිරි දිවයින මෙහි පමුණුවා ඒ යකුන් එහි පැමිණ වීය.)

7 දෙසයිත්වා ජිනො ධම්මං - තදා දෙව සමාගමෙ
බහුන්නං පාණකොටීනං - ධම්මාභිසමයං අහු,
(බුදුරජ තෙමේ එදා දෙව සමාගමයෙහි දහම් දෙසා බොහෝ කෝටිගණන් ප්‍රාණීන්ට ධර්මාවබෝධය කෙළේය.)

8 මහාසුමන දෙවස්ස - සෙලෙ සුමන කූටකෙ,
දත්වා නමස්සිතුං කෙසෙ - අගා ජෙතවනං ජිනො,
(බුදුරජ තෙමේ සමනළ පව්වෙහිදී සමන් දෙව්රජහට වැඳීමට කෙස්දා දී දෙව්රම් වැඩිසේක.)

---

1 ආගන්ත්වා යන්න ත්වා පට ය ආදෙශව ආගම්ම සයි සිද්ධ ....

9 පතිට්ඨාපෙත්වා තෙ ධාතු - නිසින්නාසනභූමියං
ඉන්දනීලමයං ථූපං - කාරෙත්වා සො අපූජයී.
(ඒ දෙව්රජ බුදුන් වැඩහුන් තැන බිම ඒ ධාතූන් පිහිටුවා
ඉඳුනිල්මිණිමුවා සෑයක් කොට පිදීය.)

---

II

1 රාජාධිරාජොථ සභායමජ්ඣෙ
දිස්වාන තං වීතභයං විසඞ්කං
කාලිඞ්ගරාජං පටිඝාභිභූතො
අභාසි පෙසුඤ්ඤකාරෙ නිගණ්ඨෙ,
(පඬුරජ තෙම සබාමැද පහව ගිය බිය ඇති සැක සිතක් නොමැති ඒ කාලිඟුරජු බලා ක්‍රොධයෙන් මඩනා ලද්දේ නිගණ්ඨ කේලමුන්ට මෙසේ කීය.)

2 දෙවෙ ජහිත්වාන නමස්සනීයෙ
ඡවට්ඨිමෙතෙන නමස්සිතං තං
අඞ්ගාරරාසිම්හි සජොති භූතෙ
නික්ඛිප්ප ඛිප්පං දහථාධුනෙති;
(වැඳියයුතු වූ දෙවියන් හැර මොවුන් විසින් පුදන ලද ඒ මිනී ඇටය, දූන් ගින්නෙන් බබලන අඟුරු රැසක වහා දමා අළුකරව්.)

3 පහට්ඨචිත්තා ච තතො නිගණ්ඨා
රාජඞ්ගණෙ තෙ මහතිං ගභීරං
වීතච්චිකඞ්ගාරකරාසි පුණ්ණං
අඞ්ගාරකාසුං අභිසඞ්ඛරිංසු;
(එයින් සතුටු සිත් ඇති නිවටහු රජමිදුලෙහි මහත් වූ ගැඹුරු වූ ගිනි ඇවිලගත් අඟුරුවලින් පිරුණු අඟුරු වළක් පිළියෙල කළහ.)

4 සමන්තතො පජ්ජලිතාය තාය
සජොතියා රොරුවභෙරවාය
මොහන්ධභූතා අථ තිත්ථියා තෙ
තං දන්තධාතුං අභිනික්ඛිපිංසු;

(හාත්පසින් ගිනි ඇවිලගත් රෞරව නිරයමෙන් බබලන් නාවූ එකී මොහයෙන් අන්ධ වූ ඒ නිවටෝ් දළදාව දුටුහ.)

5 තස්සානුභාවෙන තමග්ගිරාසිං
හෙත්වා සරොජං රථචක්කමත්තං,
සමන්තතො උග්ගතරෙණුජාල-
මුට්ඨාසි කිඤ්ජක්ඛභරාභිරාමං.

(ඒ දළදා තෙදින් ඒ ගිනිරැස බිඳ රියසකක් තරම්වූ හාත්පසින් නැගි රේණු සමූහ ඇති කෙසුරු බරින් මනරම් වූ පියුමක් නැගී සිටියේය.)

6 තස්මිං ඛණෙ පඞ්කජකණ්ණිකාය
පතිට්ඨහිත්වා ජිනදන්තධාතු
කුන්දාවදාතාහි පභාහි සබ්බා
දිසා පභාසෙසි පභස්සරාහි.

(එකෙණෙහි දන්ත ධාතූන් වහන්සේ කෙමියෙහි පිහිටා සුදු රැසින් සියලු දිගුන් බැබලවූ.)

7 දිස්වාන තං අච්ඡරියං මනුස්සා
පසන්නචිත්තා රතනාදිකෙහි
සම්පූජයිත්වා ජින දන්තධාතුං
සකං සකං දිට්ඨිමවොස්සජිංසු.

(ඒ ආශ්චර්යය දැක පහන් සිත් ඇති මිනිස්සු රුවන් ආදීයෙන් ඒ දළදා වහන්සේ පුදා සිය සිය මිසදිටුව අත හැරියාහුය.)

---

III

1. යො චන්දගොමිරචිතෙ වරසද්දසත්ථෙ
ටීකං පසත්ථමකරිත්ථ ච පඤ්චිකාය
බුද්ධිප්පභාව ජනනී ච අකා සමන්ත
-පාසාදිකාය විනයට්ඨකථාය ටීකං

(යම් මාහිමි කෙනෙක් චාන්ද්‍රව්‍යාකරණයට ටීකාව හා සමන්තපාසාදිකා විනයට්ඨකථාවට සියල්ලන්ට බුද්ධි ප්‍රභාව උපදවන්නාවූ සාරත්ථදීපනීනම් ටීකාව කළසේක්ද,)

2. අඞ්ගුත්තරාගමවරට්ඨකථාය ටීකං
සම්මොහවිබ්භම විඝාතකරිං අකාසි
අත්ථාය සංයමිගණස්ස පධානිකස්ස
ගන්ථං අකා විනයසංගහ නාමධෙය්‍යං;

(අඞ්ගුත්තර අටුවාවට මූලාභ්‍රම නසන්නාවූ සාරාර්ථමංජුෂා නම් ටීකාවද, ප්‍රධානික සංයමීන්ගේ ප්‍රයොජනය පිණිස 'විනයසඞ්ග්‍රහ' නම් ග්‍රන්ථයක්ද,)

3. සන්තින්ද්‍රියස්ස පටිපත්තිපරායණස්ස
සල්ලෙඛවුත්ති නිරතස්ස සමාහිතස්ස
අප්පිච්ඡතාදි ගුණයොග විභූසණස්ස
සම්බුද්ධසාසන මහොදය කාරණස්ස;

(සන්සුන් ඉඳුරන් ඇති පිළිවෙත්හි ඇළුනාවූ කෙලෙසුන් තුනීකිරීමෙහි නිරතවූ සමාහිතවූ අපිස් ආදි ගුණයන් ගෙන් සැරසුනාවූ බුද්ධශාසනයාගේ දියුණුවට කරුණුවූ)

4. සබ්බෙසු ආචරියතං පරමං ගතස්ස
සත්ථෙසු සබ්බසමයන්තර කොවිදස්ස
සිස්සො ත සාරිතනුජස්ස මහාදිසාමි
පාදස්ස තස්ස විමලම්බර සම්භවස්ස;

(සියල්ලන් කෙරෙහි උදැම් ඇදුරුබවට පැමිණියාවූ සියලු ශාස්ත්‍රයෙහි හා සමයාන්තරයන්හි දක්ෂවූ, මහාකුලයක උපන්නාවූ සාරිපුත්ත මහාස්වාමිපාදයන්ගේ ශිෂ්‍යවූ,)

5. සුද්ධන්වයෙන කරුණාදි ගුණොදයෙන
තක්කාගමාදි කුසලෙන විසාරදෙන
සබ්බත්ථපත්ථට සුධාකර රංසිජාල
සඞ්කාස කිත්තිවිසරෙන පරික්ඛකෙන;

(පිරිසිදු කුලයක ඉපදීම් ඇති වැඩුනු කරුණාදි ගුණ යෙන් යුක්තවූ තර්කාගමාදියෙහි දක්ෂවූ, විසාරදවූ සඳ රැස් මෙන් සියල්ලන් කෙරෙහිම පැතිරගිය කීර්ති කදම්බයෙන් යුක්වූ, මනා පරීක්ෂකයකුවූ,)

6. සද්ධාධනෙන සබලෙනච ධම්මකිත්ති
නාමෙන රාජගරුනා චරියෙන එසො
සොතුප්පසාද ජනනො ජිනදන්තධාතු
වංසො කතො නිඛිලදස්සි පභාවදීපො;

(ශ්‍රද්ධාධනයෙන් යුත්වූ සබල පැවිතුම් ඇති ධම්මකිත්ති නම්වූ රාජගුරු ඇදුරිඳු විසින් අසන්නන්ට ප්‍රසාදය ගෙණ දෙන්නාවූ සියල්ල හෙළිකර දක්වීමෙහි පහනක් වැනිවූ මේ ජිනදන්තධාතු වංශය රචනාකරණලදී.) (දාඨාවංස.)

---

IV

1. සොණ්ණදප්පන සඞ්කාස—සොම්මානන විභූසිතං
නීලනීරජ සංකාසං—විසාලායතලොචනං,

(රන් කැඩපතක් වැනි සෞම්‍ය මුහුණින් මනහරවූ, නිලුපුල් වැනි දිගු පුළුල් නෙත් ඇති;)

2. සිඞ්ගාර මන්දිරද්වාරෙ—ධජොපම භමූද්වයං
හෙමකාහල සංකාස—නාසිකං රූපලක්ඛියා;

(රූපශ්‍රීයගේ රතබිම් නමැති මැඳුරු දොරනැගූ ධ්වජයක් වැනිවූ; බැම දෙකක් ඇති, රන් හොරණෑ දෙකක් වැනි නැහැයක් ඇති,)

3. නීලවෙල්ලිත ධම්මිල්ල—ජීමූතොභයකොටියං
නිච්චවිජ්ජුල්ලතාචක්ක—මනුඤ්ඤ කණ්ණපාසිකං,

(නිල්වන් කෙශකලාප නමැති මෙඝයාගේ උභය පාර්ශ්වයෙහි මනහර කන්වැල් නමැති නිශ්චල විදුලිය සක් යුවලක් ඇති,)

4. සාතකුම්භ නිභාභාස—පයොධර ඝටද්වයං
සුවණ්ණද්දි තටායාත—නිජ්ඣරාකාරහාරිකං

(රන්කුඹු වැනි තන සඟලක් ඇති, රන්පව්වකින් ගලා බස්නා ගඟුල් හැල්ලක් වැනි මුතුහරක් ඇති,)

5. දෙහ දෙවද්දුමාලම්බ—පාරොහාභ භුජද්වයං
අඞ්ගුලී පල්ලවානම්බු—බින්දුචාරු නඛාවලී;

(සිරුරු නමැති දෙව්රුකෙන් ඇදවැටුනු අරළු දෙකක්
වැනි අත් දෙකක් ඇති ඇඟිලි නමැති ලපලු අග පිහිටි
දියබිඳු පෙළක් වැනි නිය පෙළක් ඇති.)

6. දෙහමාලාලි මාලාභ—රොමරාජි විරාජිතං
රූපණ්ණව තරඞ්ගාභි—වලිත්තය විචිත්තකං
(දේහ නමැති පුෂ්පද්‍රුමයෙහි බඹරු පෙළක් වැනි රෝම
රාජි ඇති, රූ සමුද්‍රයෙහි රැළිපෙළ වැනි විසිතුරු වලි
තුණක් ඇති,)

7. සොණ්ණරම්භා සමාවට්ට—පීනොරුද්වය සුන්දරං
සන්නීරකලිකාකාර—චාරු ජඞ්ඝා විභූසිතං
(රන් කෙසෙල් කඳන් දෙකක් මෙන් මනාව ආවෘතවූ,
මනොඥවූ කලවා සඟළක්ද, නුපුබුදු තැඹිලිමල් දෙකක්
වැනිවූ මනහර කෙණ්ඩා දෙකක්ද ඇති,)

8. සකූතිසඞ්ඝං පමොදෙන්තා—දෙවෙච මනුජෙපිච
ලද්ධං යසොධරා දෙවිං—'නුකූලං ජාති ජාතියං
(භෑසමූහයාද, දෙවියන්ද, මිනිසුන්ද සතුටුකරවන්නෝ
ජාතිජාතියෙහි අනුකූලවූ යශෝධරා දෙවිය ලැබී,)
(සමන්තකූට)

---

V

1. තිදසවෙගෙන රවි පතාපී
උණ්හාභිතත්තො පවනො ඛරො ච
ජරාතුරෙවා සිසිරාධරා ච
පිවිංසු තෙ සබ්බධි සබ්බමම්බුං
(තියං වේගයෙන් තැවුනු හිරුද, උණුසුම්වූ වාතයද,
උණුසුම්වූ පොළොවද යන තිදෙන උණකාරයන් මෙන්
හැම තැනම වූ දිය පානයකළාහුය )

2. අනන්තා භූසුණ්ණගත විපච්චමාන
සනිස්සන්තමෙහා හරිතෙච වාරී
තිබ්බාතපක්කන්ත වනන්තරාජී
රූතාකුලා ධායති වීරිකාකං

(ගැඹුරුවූ අවුවෙන් මඩනාලද වනරාජිය රැහැය්යන්ගේ තදින් ආකුලවූයේ ඇතුළත අධික උෂ්ණයෙන් තැවෙන්නාවූ ජලයෙන් පිරුණු සැළක් වැනිවිය.)

3 වස්සාන කාලෙපි පභාකරස්ස
පභාප සන්තාපිතමන්තලික්ඛං
සමාචිතං පණ්ඩර වාරිදෙහි
සචන්දනාලෙප මිවාතිරෙචි;

(වැසිකාලයෙහි පවා සූර්යයාගේ රළු තෙදින් තැවූනාවූ අහස සුදුවලායෙන් ගැවසිගත්තේ සඳුන් අලෙව්දුන් කාලක් මෙන් ඉතාම බැබළීය.)

4 දිසාමිනන්තාව දිසාපයාමං
ඵුසාරයන්තාව තමං සිඛාහි
ඡායාගිරීනං විය කාලමෙසා
නභත්ථලාදුසගතා ලසිංසු;

(දිසාවන්ගේ දිග මනින්නවුන් මෙන්ද, මේකුළුවලින් අඳුර පතුරවන්නවුන්මෙන්ද, අහස් කැඩපතට පැමිණි පව් සෙවනැලි මෙන්ද, කළුවන් වූ මේකුළු බැබළූහ )

5 නපූනී පූගී ඵලමත්තකම්පි
අග්ඝන්ති සීසානි විජීවිතානං
සීසන්තු මෙ වත්තති බොධියා ච
ධනස්ස ලාභාය ච අද්ධිකානං;

(මළවුන්ගේ හිස පල්පුවක් ගෙඩියක් පමණවත් නොඅගී. මගේ හිස වනාහි (මට) බොධිය පිණිසද මගියාට ධනය පිණිසද පවතියි )

6 නාලීවණ්ණස්සෙව රුජාකරස්ස
පූතිප්පධානස්ස කලෙබරස්ස
දුක්ඛානුභූතං පටිජග්ගනෙන,
සදත්ථයොගා සඵලං කරොමි;

(ඔඩුනිය වණයක්මෙන් රුජා ඇතිකරන්නාවූ කුණුගඳ වහනයවන්නාවූ මේ ශරීරයාගේ ප්‍රතිජග්ගනයෙන් අනුභව කළ දුක යහපත් කරුණක යොදාලීමෙන් සඵල කරමි.)

7 සංසත්තරත්තතලලෙ'ඛිත පාණි ඛෙත්ත
නික්ඛිත්ත සීස වරබීජ සමුබ්භවාය,
එතස්ස දානමය පාරමිතාලතාය
සබ්බඤ්ඤුතා ඵලරසො ජනතං ධිනොතු,

(ලැගුනාවූ ලේ නැමැති මඩ ඇති මගියාගේ අත්තල නැමැති කෙතෙහි පිහිටුවන ලද හිස නැමැති ධාන්‍යයෙන් උපන්නාවූ මේ රජතුමන්ගේ දානපාරමී නැමැති වැලෙහිවූ සර්වඥතා ඥාන නැමැති ඵලරසය ලොකයා සතුටු කෙරේවා.)

8 රාජාහමෙව සුභගො සිරිසඞ්ඝබොධි
සීසප්පදාන විධිනාසම් සමිද්ධ චිත්තො,
භවාසි රජ්ජසිරිලාභ සුඛෙන දෙව
එසො ච හොතු පටිපන්න සහස්සලාභො,

(හිස දන්දීමෙන් සමෘද්ධවූ සිත් ඇති මම සුභෘදවූ සිරි සඟබෝ රජ වෙමි. දෙවයෙනි; නුඹ රජසිරිසුවය නැමැති සුවයෙන් යුක්තවෙහිවා. මේ මගියා ලැබූ දහසක් කහවණු ඇත්තෙක් වේවා ) (අනාගතවංස)

---

## කිතකය

ධාතුවකින් අගට ප්‍රත්‍යයක් කොට සාදාගණු ලබන නාමය කිතක නම්. මෙය 'කිච්ච, කිතක' නමින් ප්‍රභෙද දෙකකට බෙදේ. කිච්ච ප්‍රත්‍යයෝ කාලත්‍රයයට අයත්ව කර්මකාරකයෙහි හා භාවයෙහි වෙති. කිතක ප්‍රත්‍යයෝද කාලත්‍රයයට අයත්වූවෝ කම්, කතු, කරණ, සපදන්, අවදි, අදර යන කාරක සයෙහි ද භාවයෙහි ද වෙති.

කිතක ප්‍රත්‍යයෝ වාච්‍යයාට බඳු ලිඟු ලබති. එහෙත් ඉවර්ණ උවර්ණාන්තධාතුකාරෙන් හා, වරාද ධාතු ගණයා කෙරෙන් අ ප්‍රත්‍යය වී සිද්ධවූ නාමයෝද, විසරූජපදාදිතො ච යන ආදි සූත්‍රයෙන් වන අ[1] ප්‍රත්‍යාන්ත ශබ්දද 'ඉ' ප්‍රත්‍යයවී සිද්ධවූ නාමද වාච්‍යයා කෙබඳු ලිඞ්ගයකින් පෙණී සිටියත්

පුංලිඞ්ගික වෙත්. කර්තෘකාරකයෙන් පිටත් කාරකයන්හි වන යු ප්‍රත්‍යයාන්ත ශබ්දද, භාවයෙහි වන කිච්ච ප්‍රත්‍යයාන්තයෝ ද, ත ප්‍රත්‍යයාන්ත ශබ්ද ද නපුංසක ලිඞ්ගික වෙත්.

තබ්බ, අනීය, [1] ඉච්ච, ය [2] යන මොහු කිච්චප්‍රත්‍යයෝ වෙති. මොවුහු කර්මභාව දෙක්හි වෙත්. කලාතුරකින් අනික් කාරකවලද වෙති. [3]

∟ භූ = (අභි—භව) –අභිභවිතබ්බො, අභිභවිතබ්බං, අභිභවනීයො, අභිභවනීයං, ([4] අභිභූයතෙති)

∟ ආස,(උප +)උපාසිතබ්බො ආසිතබ්බං;([5] ආසීයතෙති) උපාසනීයො, ආසනීයං,

∟ සි, (=සය), (අති) සයිතබ්බො, සයිතබ්බං, ([6] සීයතෙති) අතිසයනීයො, සයනීයං,

∟ පද, (+පජ්ජ), (පටි) පජ්ජිතබ්බො, උප්පජ්ජිතබ්බං, ([7] උප්පජ්ජතෙති)

∟ බුධ (+බුජ්ඣ) බුජ්ඣිතබ්බො, බුජ්ඣනීයො, ([8] බුජ්ඣතෙති)

∟ සු, (+සො, +සුණ) =සොතබ්බො, සුණිතබ්බං, ([9] සූයතෙති)

∟ කර, [1] කත්තබ්බො, කත්තබ්බං, [2] කරණීයො, කරණීයං, ([10] කරීයතීති)

---

1 මේ ප්‍රත්‍යයට මුලින් පිහිටි ධාතුහුගේ අන්තයට ලොප් වේ. 2 ධාතුහුගේ ආදි ස්වරයට වෘද්ධි වේ

3 නිය්‍යානීති නිය්‍යානීයො, ගමනීයො; නහායති එතෙන නහනීයං,

4 තබ්බ ප්‍රත්‍යයට මුලින් ඉකාරයක් ආගම වේ. අභිභව + තබ්බං = අභිභවිබ්බං,

1 තබ්බ පරකල්හි කර ධාතුහුගේ ර හට 'ත්' ආදෙශ වේ; 2 රකාරාන්ත හකාරාන්ත මකාරාන්ත ධාතු කෙරෙන් පර වූ 'අනීය' ප්‍රත්‍යයාගේ න හට 'ණ' ආදෙශ වේ.

4 මැඩ පැවතේ, 5 හිඳිනු ලැබේ. 6 නිදනු ලැබේ: 7 ඉපදේ: 8 අවබොධ කරණු ලැබේ; 9 අසනු ලැබේ: 10 කරණු ලැබේ:

∟ හර, හරිතබ්බො, හරණීයො, ([11] හරීයතීති.)
∟ ගහ, ගහණීයො, ගහණීයං; ([12] ගය්හතීති,)
∟ රමු, රමිතබ්බො රමණීයො, ([13] රමීයතීති,)
∟ අප, (පා + පුණ) පාපුණිතබ්බො, පාපුණනීයො, පත්තබ්බො, ([14] පාපීයතීති,)

∟ ගමු [15] ගන්තබ්බො, ගමිතබ්බං, ගමනීයං, ([16] ගච්ඡීයතීති,)

∟ බනු [15], බන්තබ්බං, බනිතබ්බං, බනනීයං, ([17] බඤ්ඤතීති,)

∟ හන, හන්තබ්බං, හනිතබ්බං, හනනීයං, ([18] හඤ්ඤතීති,)

∟ මන, මනිතබ්බො, මන්තබ්බො, (+ මඤ්ඤ) මඤ්ඤනීයං ([19] මඤ්ඤතීති,)

∟ පූජ, [20] පූජෙතබ්බො, පූජයිතබ්බො, පූජනීයො, ([21] පූජීයතීති,)

∟ කර + [1] ය = කාරියං; කාතබ්බන්ති (කටයුතුය.)
∟ හර + [1] ය = හාරියං; හරීයතීති (හරිණු ලැබේනුයි.)
∟ භර + [1] ය = භාරියං; භරීයතීති (පොෂණය කරණු ලැබේනුයි.)
∟ ලභ + [2] ය = ලබ්භං; ලභිතබ්බං (ලැබිය යුත්ත.)
∟ [3] වච + [2] ය = වාක්‍යං; වචනීයං (කියයුත්ත)
∟ [3] භජ + [2] ය = භාග්‍යං; භජනීයං (භජනය කටයුත්ත)

---

11 හරිණු ලැබේ. 12 ගණු ලැබේ. 13 සිත් අලවනු ලැබේ. 14 පමුණුවනු ලැබේ, 15 අන්තයට ත් කාරය වේ, 16 යනු ලැබේ, 17 කනිනු ලැබේ, 18 නසනු ලැබේ, 19 දැනගණු ලැබේ, 20 අන්තස්වරයට එ, අය ආදෙශ වේ, 21 පුදනු ලැබේ,

1 ධාතුහුගේ ආදිස්වරයට වෘද්ධි වේ. අතරෙහි ඉ ආගම වේ. 2 මෙහි 'හ්ය' යන පදයකටම 'බ්භ' ආදෙශ වේ. සෙසු සත්ති ද මෙසේමය. 3 ධාත්වන්තයෙහි වූ ච, ජ දෙකට ය පරකල්හි ක, ග දෙක වෙත්, ධාතුහුගේ ආදිස්වරයට වෘද්ධි වේ.

- [4]නී + ය[5] = නෙය්‍යං; නීයතීති (පමුණුවනු ලැබේනුයි)
- [6]වද + ය = වජ්ජං; වජ්ජති (කියනු ලැබේනුයි.)
- මද + ය = මජ්ජතං; මජ්ජති එතේනාති (මෙයින් මත් වේනුයි.)
- යුජ + ය = යොග්ගං; යුජ්ජතීති (යෙදේනුයි.)
- [7]ගරහ + ය = ගාරය්හො; ගරහියතීති (නින්දා කරණු ලැබේනුයි.)
- දා + ය = දෙය්‍යං; දාතබ්බං (දියයුත්ත.)
- මා + = මෙය්‍යං; මිනීයතීති (ප්‍රමාණ කරණු ලැබේනුයි:)
- [8]භූ + ය = භබ්බො, භවිතබ්බො (වියයුතු)
- [9]කර + ඉච්ච = කිච්චං, [4] කාතබ්බං (කටයුත්ත)
- ඉ + (පටි) = ඉච්ච = පටිච්චො පටිඑතබ්බො (පිණිස);

බොහෝසෙයින් 'කිච්ච' ප්‍රත්‍යයයෝ 'පෙස, අතිසග්ග' පත්ත කාල යන අර්ථයන්හි වෙති.

'පෙස' නම් මෙය තොප විසින් කටයුතුය යන ඇණවීමයි.

'කාතබ්බං කම්මං භවතා' මෙහි 'කාතබ්බං' යනු පෙසනයෙහිය. 'අතිසග්ග' නම් 'මා විසින් කුමක් කටයුතු දැයි' විචාළනුට 'මේ මේ දෙය තොප විසින් කටයුතුයි' දැන්වීම් වසයෙන් කරණ අනුඥමයි.

'භොතබ්බං භොජනං භවතා' මෙහි තබ්බ ප්‍රත්‍යය අතිසග්ගයෙහිය.

පත්තකාල නම් පැමිණි කාලයයි.

'කාතබ්බං භවතා ගෙහං' මෙහි 'තබ්බ' ප්‍රත්‍යය පත්තකාලයෙහිය.

---

4 ධාතූහුගේ ඊ හට ඒ වේ, 5 ය; දෙකක් වේ, 6 වද, මද, ගම, යුජ, ගරහ ආකාරාන්තයන් කෙරෙන් පර වූ ය හට ධාත්වන්තයත් සමග පිළිවෙළින් ජ්ජ, ම්ම, ග්ග, ය්හ, එය්‍ය යන ආදෙශයෝ වෙත්,

7 ධාතුහට 'ගාර' ආදෙශ වේ, 8 ධාත්වන්තය සහිත ය හට අබ්බ ආදෙශ වේ,

9 ධාතූහුගේ ර හට ලොප් වේ,

මේ කිතක ප්‍රත්‍යයෝ, අතීත වර්තමාන අනාගත යන කාලත්‍රයෙහි වෙත්. එසේම කර්තෘකාරකයෙහිද වෙත්.

1 කර්මපදයක් ආදියෙහි ඇති කල්හි ධාතු කෙරෙන්[1] 'අ' ප්‍රත්‍යය වේ.

කුම්භං √ කර + අ =[1] කුම්භකාරො; කුම්භං[2] කරොතීති (වළන් සාදන්නා)

පත්තං √ ගහ + අ =[1] පත්තගාහො; පත්තං ගණ්හාතීති (පාත්‍රය ගන්නා)

ධඤ්ඤං √ [3]මා + අ =[1] ධඤ්ඤමායො: ධඤ්ඤං මිනාතීති (ධාන්‍ය මනින්නා)

දානං √ දා + අ =[1] දානදායො; දානං දදාතීති (දන් දෙන්නා)

ධම්මං √ කමු + අ =[1] ධම්මකාමො; ධම්මං කාමයතීති (දහම් කැමත්තා)

තණ්හං √ කර + අ =[1] තණ්හංකරො; තණ්හං [4]කරොතීති (එනම් බුදුරජතෙමේ)

2 කර්මපදයක් ආදියෙහි ඇති කල්හි හෝ නැති කල්හි ධාතු කෙරෙන් [5] අ ප්‍රත්‍යය වේ.

ධම්මං √ ධර + අ = ධම්මධරො, ධම්මං ධරතීති (දහම් දරන්නා)

දිවසං √ කර + අ = දිවසකරො; දිවසං කරොතීති (හිරු.)

වි + √ නී[6] + අ = විනයො; විනෙතීති (හික්මවන්නා)

නි √ සි + අ = නිස්සයො; නිස්සීයතීති (හේතුව)

උ √ චි + අ = උච්චයො; උච්චියතං (උස්වීම)

වි √ ජී + අ = විජයො; විජයනං (දිනීම)

√ රු + අ = රවො; රවතීති (නාද කරන්නා)

සං √ වර + අ = සංවරො: සංවරණං (ආවරණය)

---

1 මෙය පර කල්හි ධාතුහුගේ ආදිස්වරයට වෘද්ධි වේ. 2 මෙහි පදයෙහි පිහිටි විභක්ති ලොප් විය. 3 මෙහි 'ආ' හට 'ආය' ආදෙශ වේ. 4 මේ තන්හි ආදියෙහි පිහිටි කර්මපදයාගේ විභක්ති ලොප් නොවිය. 5 මේ 'අ' ප්‍රත්‍යය පරකල්හි ධාතුහුගේ ආදිස්වරයට සමහර තැනක වෘද්ධි නොවේ. 6 මේ ධාතූන් වෘද්ධි වූ කල්හි ඒ හට 'අය' යනුද ඔ හට 'අව' යනුද ආදෙශ වෙති.

3 ධාතු කෙරෙන් [1] ණ්වු ප්‍රත්‍යය වේ.

√ කර + ණ්වු = කාරකො, කරොතීති (කරන්නා)
√ සු + ණ්වු = සාවකො; සුණාතීති (අසන්නා)

4 ධාතු කෙරෙන් තු ප්‍රත්‍යය වේ.

√ [2] කර + තු = කත්තා; කරොතීති (කරන්නා)
√ භර + තු = භත්තා; භරතීති (පොෂණය කරන්නා)
√ දා + තු = දාතා, දදාතීති (දෙන්නා)

5 ධාතු කෙරෙන් ආවී ප්‍රත්‍යය වේ.

භයං √ දිස[3] + ආවී = භ දස්සාවී; භයං පස්සතීති (බිය දක්නා)

6 විස, රුජ, පද ආදි ධාතු කෙරෙන් [4] අ[1] ප්‍රත්‍යය වේ. මේ ප්‍රත්‍යය කර්තෘකාරකයෙහි පමණක් නොව සෙසු කාරකයන්හි ද වේ.

ප √ විස + අ = පවෙසො; පවිසතීති (පිවිසෙන්නා)
√ රුජ + අ = රොගො; රුජතීති (පෙළන්නා)
උ √ පද + අ = උප්පාදො; උප්පජ්ජතීති (උපදවන්නා)
√ ඵුස + අ = [5] ඵස්සො; ඵුසතීති (ස්පර්ශ කෙරේනුයි)
රඤ්ජ + අ = [6] රාගො; රඤ්ජන්ති එතෙන (මෙයින් රඳනුයි)
√ භුජ + අ = [7] භොගො; භුඤ්ජතෙති (අනුභව කරණු ලැබේනුයි)
√ හන[8] + අ = වීඝාතො; විහඤ්ඤති එතස්මා (විපත)

---

1 මේ ප්‍රත්‍යය පරකල්හි ධාතුහුගේ ආදිස්වරයට වෘද්ධි වේ. ප්‍රත්‍යයට 'අක' ආදෙශ වේ. 2 තු ප්‍රත්‍යය පරකල්හි ධාතුහුගේ ර හට 'ත්' වේ:

3 දිස ධාතුහට දස්සාදෙශ වේ. මේ ශබ්දය දණ්ඩී ශබ්දය මෙන් වර නැගේ.

4 මෙය පර කල්හි ධාතුහුගේ ආදිස්වරයට වෘද්ධි වේ. ධාත්වන්තයෙහි 'ච, ජ' යන අක්ෂරයන්ට 'ක, ග' යන අක්ෂරයෝ වෙති. 5 ධාතුහුගේ උ හට අ වේ. 6 'ඤ්ජ' යන්නට 'ජ' ආදෙශ වේ. කරණ කාරකයෙහියි. 7 කර්මකාරකයි. 8 හන ධාතුහට ඝාත ආදෙශ වේ. අවධිකාරකයි.

∟ හර + අ=[9] විහාරො; විහරනති එත්ථ (විහාරයයි.)

∟ පච + අ=[10] පාකො; පචනං (පිසීම)

∟ දුස + අ=[11] දොසො, දුස්සති එතෙන (තරහ)

∟ මුහ + අ=[11] මොහො, මුය්හති එතෙන (මෝඩකම)

7 සියලු ධාතු කෙරෙන් ක්වි ප්‍රත්‍යය වේ.

අභි ∟ භූ + = ක්වි [1] අභිභූ. අභිභවතීති (මඩින්නා)

සං ∟ බු + = ක්වි[1] සම්බු : සම්බුනාතීති (සෙලවෙන්නා)

උර ∟ ගමු + ක්වි[1]=[2] උරගො, උරසා ගච්ඡති (නාගයා)

කුඤ්ජ ∟ රමු + ක්වි[1]=[2] කුඤ්ජරො=කුඤ්ජෙ රමති (ඇතා)

කම්ම ∟ ජන + ක්වි[1]=[2] කම්මජො=කම්මෙන ජාතො (රෙගය)

ලොක ∟ විද + ක්වි[1]=[3] ලොකවිදූ = ලොකං විජානාතීති (ලොකය දන්නා)

ඉම, ය, ත, අම්හ, කිං, එත, සමාන ශබ්දයන් කෙරෙන් පර වූ දිස ධාතු කෙරෙන් ක්වි ප්‍රත්‍යය වූ කල්හි මුලින් පිහිටි ශබ්දයන්ට පිළිවෙළින් ඊ, යා, තා, මා, කී, ඒ, සා, මොවුහු ආදෙශ වෙත්. ධාතුහුගේ අන්ත්‍යයහි ව්‍යඤ්ජනයට [4] ස, කඛ, ඊ, යන ආදෙශයෝ ද වෙත්. ක්විහට ලොප් වේ.

ඉම ∟ දිස + ක්වි=ඊදිසො, ඉමම්ව තං පස්සති (මෙවැන්නා)

ය ∟ දිස + ක්වි=යාදිසො, යම්ව තං පස්සති (යමෙකු වැන්නා)

ත ∟ දිස + ක්වි=තාදිසො, තම්ව තං පස්සති (එවැන්නා)

අම්හ ∟ දිස + ක්වි=මාදිසො, මම්ව තං පස්සති (මාවැන්නා)

කිං ∟ දිස + ක්වි=කීදිසො, කම්ව තං පස්සති (කවරෙකු වැන්නා)

එත ∟ දිස + ක්වි=ඒදිසො, එතම්ව තං" (මෙවැන්නා)

---

9 ආධාර කාරකයි, 10 භාවයයි, 11 කරණ කාරකයි.

1 ක්වි ප්‍රත්‍යයට හැමකල්හිම ලොප් වේ. 2 ක්වි ප්‍රත්‍යය පරකල්හි ධාතුහුගේ අන්ත්‍යයහි ව්‍යඤ්ජනයට ලොප් වේ. උරගමු + ක්වි= උරග + ක්වි= උරග; 3 ක්වි ප්‍රත්‍යය පරකල්හි ධාතුහුගේ අන්ත්‍යයට 'ඌ' වේ. 4 ස හට ස ආදෙශ කිරීම අනන්‍යලොපය වැළැක්වීම පිණිසයි.

සමාන ⌞ දිස + ක්වි = සාදිසො, සමානමිව නං පසසති (සමානයා වැන්නා)

දිස ධාතුහුගේ අන්තයට කක, ඊ ආදෙශ වෙත්.

ඊදිකෙඛා + ඊදි; (පෙරමෙන් වේ.) යාදිකෙඛා, යාදි; මාදිකෙඛා, මාදි; කිදිකෙඛා, කිදි, එදිකෙඛා, එදි; සාදිකෙඛා සාදි;

ධාතුහුගේ ද හට ර ආදෙශ වේ.

ඊරිසො, යාරිසො, තාරිසො, මාරිසො, කිරිසො, එරිසො සාරිසො, (පෙර මෙනි.)

ඊරිකෙඛා, යාරිකෙඛා, තාරිකෙඛා, මාරිකෙඛා, එරිකෙඛා, සාරිකෙඛා, යනු වශයෙන් ද සිටී.

8 ධරාදි ධාතුන් කෙරෙන් [1] අම්ම ප්‍රත්‍යය වේ.
⌞ ධර අම්ම= ධම්මො; ධාරෙතීති (ධර්මය.)
⌞ කර + අම්ම;=කම්මං, කරීයතීති (කර්මය)

9 සියලු ධාතුන් කෙරෙන් මෙය මොහුගේ සවභාවය යන අර්ථයෙහි :-

[2]ඊ තු, ආවී යන ප්‍රත්‍යයන් වී පද සෑදෙත්.

බ්‍රහමං ⌞ චර, + ඊ= බ්‍රහමචාරී; බ්‍රහමං චරති සීලෙනාති (බඹසර හැසිරෙන්නා)

සච්චං ⌞ වද + ඊ = සච්චවාදී; (සච්චං වදති සීලෙනාති) (සත්‍යවාදියා)

පසයහ ⌞ වතු + තු=පසයහපවත්තා[3] (මැඩපවත්වන්නා)

භයං ⌞ දිස + ආවී=[4]භයදස්සාවී; (බිය දක්නා සුල්ලා)

10 මෙය සවභාව කොට ඇක්කෝෂ යනාදි අර්ථයෙහි සඳ, කුධ, චල, මණ්ඩනාදි ධාතු කෙරෙන් [5] යු ප්‍රත්‍යයවේ.

---

1 මෙය පරකල්හි ධාත්වන්ත ව්‍යඤ්ජනයට ලොප් වේ. 2 මේ ප්‍රත්‍යය පරකල්හි අසංයොගාන්ත ධාතුහුගේ ආදිස්වරයට වෘද්ධි වේ. 3 කත්තු ශබ්දය මෙනි. 4 දිස හට 'දස්ස' ආදෙශ වේ; දණ්ඩී මෙනි,
5 යු ප්‍රත්‍යයට හැමතැන්හිදීම 'අන' ආදෙශ වේ,

සද්ද, කුධ, චල, මණ්ඩ යන ධාතූන්ගේ අර්ථ ඇති ඝුස, රුස, කම්ප, භූස යනාදි ධාතූ කෙරෙන්ද යු ප්‍රත්‍යයවේ.

∟ සද්ද + (යු) අන=සද්දනො, සද්දති සීලෙනාති, (ශබ්ද සුල්ලා)

∟ ඝුස[2] + (යු) අන=ඝොසනො; ඝොසති සීලෙනාති,(ශබ්ද සුල්ලා)

∟ කුධ[2] + (යු) අන=කොධනො; කොධති ,, (ක්‍රෝධ කරන්නා)

∟ රුස[2] + (යු) අන=රොසනො, රොසති ,, ( ,, )

∟ චල + (යු) අන=චලනො; චලති ,,(සෙලවෙන්නා)

∟ කම්ප + (යු) අන=කම්පනො; කම්පති ,, ( ,, )

∟ මණ්ඩ + (යු) අන=මණ්ඩනො; මණ්ඩති ,, (සැරසෙන්නා)

∟ භූස + (යු) අන=[3]භූසනො; භූසති ,, ( ,, )

11 පාරං ශබ්දාදිය මුලට ඇති ගමු ධාතු කෙරෙන් [4] රූ ප්‍රත්‍යය වේ.

පාරං∟ ගමු + රූ=පාරගූ, පාරංගච්ඡති සීලෙන (පරතෙරට යන්නා)

භික්ඛ ආදීන් කෙරෙන් පරව රූ ප්‍රත්‍යය වූ කල්හි ධාතූහුගේ අන්තස්වරයට ලොප් වේ.

∟ භික්ඛ + රූ=[5]භික්ඛූ, භික්ඛති සීලෙන,(මහණතෙමේය.)

∟ ධම්මං ∟ ඤා + රූ=ධම්මඤ්ඤූ, ධම්මං ජානාතීති (දහම් න්නා)

නන්දාදි ධාතූන් කෙරෙන් භාවකම්හි දෙක්හි[1] යු ප්‍රත්‍යය වේ.

∟ නන්ද + (යු) = අන=නන්දනං, නන්දනං වා නන්දියතීති (සතුට හෝ වනය)

∟ සු + (යු)=අන=[6]සවණං, සුති වා සූයතෙ (ඇසීම)

---

2 ධාතූහුගේ ආදිස්වරයට වෘද්ධිවේ. 3 මෙහි ආදිස්වරයට දීර්ඝ වේ.
4 මේ ප්‍රත්‍යය පර කල්හි ධාතූහුගේ අන්ත ව්‍යංජනයට ලොප් වේ. 5 හ්‍රස්ව වේ. 6 සු හට සොයි වෘද්ධිව අවආදෙශ වේ.

කත්තු කරණ සම්පදාන අපාදාන ආධාර කාරකයන්හි ද යු ප්‍රත්‍යය වේ.

රජං √ හර + (යු) අන=[2] රජෝහරණං; රජං හරතීති (ජලය)
√ සු + (යු) අන=[3] සවණං සුණොති එතෙන (කණ)
සම්ප √ දා + (යු) අන=[4] සම්පදානං, පදීයතෙ එතස්ස, (දීම ලබන්නා)
අප √ දා + (යු) අන [5] අපාදානං, අපදදාති එතස්මා (වෙන් වන තැන)
√ ඨා + (යු) අන=[6] ඨානං, තිට්ඨන්ති එත්ථ (තැන)

13 ස්ත්‍රී අර්ථයෙහි ධාතූන් කෙරෙන් අ, ති, යු[6] යන ප්‍රත්‍යයෝ වෙත්.

√ ජර + අ= ජරා; ජීරතීති, (ජරාව)
ප √ ඤා + අ= පඤ්ඤා; පජානාතීති (නුවණ)
√ සික්ඛ + අ= සික්ඛා, සික්ඛනං (හික්මීම)
√ සු + ති= සුති, සවණං (ඇසීම)
√ මන + ති= මති, මඤ්ඤතීති (දැනීම)

ති ප්‍රත්‍යය පරකල්හි ගමු, බන, හන, රම, යන ධාතූන්ගේ අන්ත ව්‍යඤ්ජය ලොප් වේ.

√ ගමු + ති= ගති; ගමනං (යාම)
√ බන + ති=බති, √ හන + ති=හති; √ රමු + ති=රති;
√ හා + ති=[7] හානි; (විනාශය)

14 නමක් කිවමනා කල්හි දා, ධා, යන ධාතූන් කෙරෙන් ඉ ප්‍රත්‍යය වේ..

ආ √ දා + ඉ=ආදි, ආදියතීති, (ආදිය.)
උද √ ධා + ඉ=උදධි; උදකං දධාතීති (සමුද්‍රය)
වාල √ ධා + ඉ=වාලධි; වාලානි දධාතීති (වලිගය)

---

2 කර්තෘකාරකය යි, රජෝයි ඕ ආගම වීය. 3 කරණ කාරකයි' 4 සම්ප්‍රදාන කාරකයි. 5 අවධි කාරකයි, 6 අන ආදේශය වේ, 7 හා ධාතු කෙරෙන් ති හට නි ආදෙශ වේ,

15 ඊස, දු, සු, ශබ්දයන් කෙරෙන් පරවූ ධාතු කෙරෙන් කර්මභාවයන්හි අ ප්‍රත්‍යය වේ.

ඊස √ කර + අ=ඊසක්කරං; ඊසංකරියතීති (මදක් කෙරේ නුයි.)

දු √ ලභ + අ=දුල්ලභො; දුක්ඛෙන ලභීයතෙති (ධර්මය)

සු √ කර + අ=සුකරං; සුඛෙන කරීයතීති (යහපත් දෙය)

16 බුධ ගමු ආදී ධාතු කෙරෙන් කර්තෘකාරකයෙහි ත ප්‍රත්‍යය වේ.

ධකාරාන්ත හකාරාන්ත ධාතූන් කෙරෙන් පරවූ තකට ධ වේ.

ත හට වූ ධකාරය පරකල්හි 'ද්' ආදේශය ද, ඪකාරය පරකල්හි 'ඪ' ආදේශය ද ධාත්වන්තයට වේ.

√ බුධ + ත=බුධ + ධ=බුද්ධො, අබුජ්ඣී ති දැනගත්තේ නුයි.

සරණං √ ගමු + ත=සරණං ගතො[1]

## අතීතකාලික කෘදන්තයෝ.

17 අතීතකාලයෙහි සියලු ධාතූන් කෙරෙන් 'ත, තවන්තු, තාවී' යන ප්‍රත්‍යයෝ කර්තෘකාරකයෙහි වෙත්. මේ ප්‍රත්‍යාන්ත නාමයෝ නිෂ්ඨාසංඥ හෙයින් වාක්‍යයන්හි ක්‍රියා වශයෙන් ද පෙණී සිටිත්.

√ හූ + ත=හූතො, (වීය.) √ හු + ත=හුතො (හෝම කෙළේ.)
√ හු + තවන්තු = හුතවා[2] (හෝම කෙළේ.)
√ හු + තාවී = හුතාවී, ( ,, )
√ වස + ත = වස උත්= වුත්ථො[3] (විසුයේ)
√ භුජ + ත = [4]භුත්තො= අනුභව කෙළේ,
√ රුදජ් + ත = [4]රුත්තො= රැඳියේ,
√ මුච + ත = [4]මුත්තො= මිදියේ,

1 ත පර කල්හි ගම් ඛන හන රම ඈතාදී ධාතූන්ගේ අන්ත ව්‍යංජනයට ලොප් වේ,

2 ගුණවන්තු මෙන් වරනැගේ. 3 වස ධාතුහුගේ ස හට ලොප් වේ,

4 අන්තයට ලොප් හා ත හට ද්විත්ව විය,

උ කුධ + ත= කුධ + ධ= කුද්ධො= කිපියේ,
උ රභ + ත= රභ + ධ= රද්ධො= ඇලුනේ,
උ වඩ්ඪ + ත= වඩ්ඪ + ඪ= වුඩ්ඪො[1] වැඩුනේ,
උ වඩ්ඪ + ති= වඩ්ඪ + ඪි= වඩ්ඪි = වැඩීම,

18 තර ආදි ධාතු කෙරෙන් පර වූ ත හට '**ඉණ්ණ**' ආදෙශ වේ. ධාත්වන්තයට ලොප් වේ.

උ තර + ත= තර + ඉණ්ණ= තිණ්ණො. **තරණය කෙළේ.**
උ ජර + ත= ජර + ඉණ්ණ= ජිණ්ණො **දිරුයේ,**

19 ත, ති යන ප්‍රත්‍යයන් පරකල්හි ජනාදි ධාතූන්ගේ අන්තයට 'ආ' වේ.

උ ජන + ත= ජාතො, උපන්නේ,
උ ජන + ති= ජාති= ඉපදීම,

20 ත, ති යන ප්‍රත්‍යයන් පරකල්හි ඨා, පා, යන ධාතූන්ගේ ස්වරයන්ට පිළිවෙළින් ඉ ඊ යන ස්වරයෝ **ආදෙශවෙත්.**
උ ඨා + ත= ඨිතො සිටියේ, උ ඨා + ති=ඨිති, සිටීම,
උ පා + ත= පීතො=බීවේ; උ පා + ති= **පීති**= සතුට

21 හකාරාන්ත ධාතු කෙරෙන් පර වූ ත, ති, දෙකට '**හ**' ආදෙශ වේ. ධාතුහුගේ 'හ' හට 'ළ' වේ. **දහ, නහ,** දෙක හැරීයි.

ආ උ රුහ + ත= රුහ + හ= ආරූළ්හො[2] නැගුනේ,
උ මුහ + ත=[2] මූළ්හො, මුළාවූයේ,

22 අතීත කාලයෙහි භාවකර්ම දෙක්හි සියලු ධාතූන් කෙරෙන් ත ප්‍රත්‍යය වේ.

උ හස + ත= [3]හසිතං සිනාසෙන ලදී හෝ **සිනාව**
උ නී + ත= නීතං පමුණුවන ලද්දේ, පැමිණවීම,

23 සාස දිස ආදී ධාතු කෙරෙන් පර වූ ත හට ඉට්ඨ **ආදෙශ** වේ. ධාත්වන්තයට ලොප් වේ.

---

1 ධාත්වන්ත සංයෝගයට ඪ හා ආදි අකාරයට 'උ'කාරය ද වේ.

2 ධාතුහුගේ ආදිස්වරයට දීර්ඝ වේ, 3 ප්‍රත්‍යයට මුලින් 'ඉ' ආගම වේ:

සාස + ත=සාස + ¹ඉට්ඨ=සිට්ඨෝ, අනුශාසනා කරණලදී.
∟ දිස + ත=දිස + ඉට්ඨ=දි + ඉට්ඨ =දිට්ඨෝ; දක්නා ලදී.

24 සකාරාන්ත ධාතූන් කෙරෙන් ද පුච්ඡ,භඤ්ජ, හංස යනාදි ධාතූන් කෙරෙන් ද පර වූ ත හට 'ට්ඨ' ආදෙශ වේ. ධාත්වන්ත ව්‍යංජනයට ලොප් වේ.

හස + ත=හස + ට්ඨ= හට්ඨෝ; අලුකාරණ ලද්දේ;
∟ තස + ත=තස + ට්ඨ= තට්ඨෝ; තසන ලද්දේ.
∟ පුච්ඡ + ත=පුච්ඡ + ට්ඨ=පුට්ඨෝ; විචාරණ ලද්දේ;
∟ භඤ්ජ + ත=භඤ්ජ + ට්ඨ=භට්ඨෝ; බඳින ලද්දේ,
∟ හංස + ත= හංස + ට්ඨ=හට්ඨෝ; සතුටුවන ලද්දේ,

25 භිදාදි ධාතූන් කෙරෙන් පර වූ ත හට ඉන්න, අන්න, ඊන යන ආදෙශයෝ වෙත්. ධාතූනගේ අන්ත ව්‍යංජනයට ලොප් වේ.

∟ භිද + ත= භිද + ඉන්න,= භින්නො =බිඳුනේ;
නි∟ සද + ත= ²සිද + ඉන්න = නිසින්නො= හුන්නේ,
∟ ඡිද + ත= ඡිද + අන්න = ඡින්නො = වැඩුනේ;
∟ රුදි + ත= රුදි + අන්න = රුන්නො = ඇඬුනේ,
∟ ඛී + ත= ඛී + ඊන³ = ඛීණො ක්ෂය වූයේ;
∟ හා + ත= හා + ඊන = හීනො =පිරිහුනේ;

ත ප්‍රත්‍යය පරකල්හි ධාත්වන්තය වූ ර හට ලොප් වේ.

∟ කර + ත= ක + ත= කටො⁴ කරණ ලද්දේ;
∟ ධර + ත= ධ + ත= ධටො⁴ දරණ ලද්දේ;

අතීත කාලිකයෝයි.

26 කාමතිය යන අර්ථය ඇති කල්හි සියලු ධාතූන් කෙරෙන් තවෙ, තුං යන ප්‍රත්‍යයෝ වෙති.

---

1 අට්ඨ, අට්ඨුං, අට්ඨු යන ආදෙශයෝ ද වෙති, දට්ඨුං, දට්ඨු, දට්ඨ, යනු වෙති.

2 සද ධාතුහට සීද යන ආදෙශය වේ. 3 න හට ණ වේ. 4 ත හට ට වේ.

∟ කර + තවෙ = කාතවෙ = කාතුං ඉච්ඡති (කරන්ට කැමතිවෙයි.)

∟ කර + තුං = [1] කාතුං ,, ,,

∟ සු + තවෙ = [2] සොතවෙ සොතුං ඉච්ඡති (අසන්ට කැමති වෙයි.)

සුදුසුය, හැකිය යන අර්ථයන්හිද සියලු ධාතූන් කෙරෙන් තුං වේ.

∟ නිසද + තුං = නිසීදිතුං[3] හිඳුමට සුදුසුය.
∟ දා + තුං = දාතුං දෙන්ට හැකිය.
∟ භුඤ්ජ + තුං = භුඤ්ජිතුං කන්ට හැකිය.

27 වර්තමානයෙහි ධාතූන් කෙරෙන් තූන, ත්වාන, ත්වා යන පූර්වක්‍රියා ප්‍රත්‍යයෝ වෙත්.

මොවුහු [4] සමාන කර්තෘකයෝ වෙති.

∟ කර + [5] කත්වා, කාත්වාන, කාතූන, කරිත්වා = කොට
∟ සු = සුත්වා, සුත්වාන, [6] සුණිත්වා, = අසා,
∟ චුර = චොරෙත්වා, චොරයිත්වා, සොරකම්කොට
∟ වන්ද = [7] වන්දිය, වන්දිත්වා, = වැඳ
උ ∟ දිස = උද්දිස්ස.[8] උද්දිසිත්වා, උදෙසා,

28 දිසධාතු කෙරෙන් පර වූ ත්වාන, ත්වා, යන ප්‍රත්‍යයන්ට 'ස්වාන ස්වා' යන ආදේශයෝ වෙත්. ධාත්වන්තයට ලොප් ද වේ.

∟ දිස + ත්වාන = දිස්වාන, + ත්වා, දිස්වා, (දැක)

29 මකාරාන්ත භකාරාන්ත දකාරාන්ත හකාරාන්ත ධාතු කෙරෙන් පර වූ ප්‍රත්‍යාදියට පිළිවෙළින් ම්ම, ය්හ, ජ්ජ බ්භ, ද්ධ යන ආදේශයෝ විකල්පයෙන් වෙත්. ධාත්වන්තයට ලොප් ද වේ.

---

1 කර ධාතුහට 'කා' ආදේශ වේ. 2 ආදිස්වරයට වෘද්ධි වේ, 3 ඉකාරාගම වේ, 4 අවසානක්‍රියාවේ කර්තෘ හා බැඳෙයි යන අර්ථය, 5 කර ධාතුහට ආදේශවන කා යන්නට හ්‍රස්ව වේ, 6 ධාතුප්‍රත්‍යය දෙකට මැද 'ණි' යන්නක් විය, 7 ත්වා හට 'ය' ආදේශ විය, 8 ත්වා හට ය ආදේශ වී නැවත ඊට පූර්වරූප විය;

ආ ⌊ ගමු + ත්වා, ආගම්ම, ආගන්ත්වා, (අවුත්) ⌊ කමු- ඔක්කම්ම ඔක්කමිත්වා,

ප ⌊ ගහ + ත්වා, පග්ගය්හ, පග්ගණ්හිත්වා, දැඩිව ගෙණ,
උ ⌊ පද + ත්වා, උප්පජ්ජ; උප්පජ්ජිත්වා; (ඉපද)
ආ ⌊ රභ + ත්වා, ආරබ්භ, ආරභිත්වා, (ඇරඹ)
උප ⌊ ලභ + ත්වා, උපලබ්භ, ලභිත්වා, (ලැබ)

## මිශ්‍රක්‍රියාවෝ.

30 වර්තමාන කාලයෙහි මාන, අන්ත යන ප්‍රත්‍යයෝ වෙත්. අන්ත ප්‍රත්‍යය කර්තෘකාරකයෙහි ද, මාන කර්තෘ කර්ම දෙකෙහිද වෙත්.

⌊ ගමු + මාන=[1] ගච්ඡමානො + අන්ත ගච්ඡන්තො; යමින්,
⌊ මහ + මාන= මහමානො; + අන්ත=මහන්තො=පුදමින්,
⌊ මර + මාන=[2] මීයමානො; මරමානො; මරන්තො; මැරෙමින්
⌊ ඨා + මාන =[3] තිට්ඨමානො; තිට්ඨන්තො, සිටිමින්
⌊ පා + මාන =[4] පිවමානො පිවන්තො, බොමින්
⌊ සු + මාන = සුණමානො; සුණන්තො; අසමින්
⌊ චුර + මාන = චොරයමානො; චොරෙන්තො; සොරකම් කරමින්

---

## කාරකය

"කරොතීති කාරකො" යනු හෙයින් එක එල්ලේම කාරක ශබ්දයෙන් කර්තෘ කියැවේ. "ක්‍රියං නිප්ඵාදෙතීති කාරකං" යන්නෙන් සෙසු විභක්තීහුද කාරක නාමයෙන් දැක්වෙති. ක්‍රියාව කරණ කර්තෘහට උපකාර වීම වසයෙනි. උක්තානුක්ත වසයෙන් කාරකය දෙ පරිදි වේ. ක්‍රියාවෙන්

1 ගමු ධාතුහුගේ අන්තයට ච්ඡ ආදෙශ වේ. ස්ත්‍රීලිඞ්ගයෙහි 'ගච්ඡමානා' යනු ද නපුංසක ලිඞ්ගයෙහි 'ගච්ඡමානං' යනු ද සිටී. 'ගච්ඡන්ත' ශබ්දය ස්ත්‍රීලිඞ්ගයෙහි 'ගච්ඡන්තී' යි නපුංසකයෙහි 'ගච්ඡන්තං' යිද සිටී. 2 මීය ආදෙශ වේ. 3 තිට්ඨ ආදෙශ වේ. 4 පිබ ආදෙශ වේ.

කම් කර්තෘ කරණාදීන් අතුරෙන් යමෙක් උක්ත වේ නම් ඒ උක්ත කාරක නම්. ඒ වාක්‍යයෙහි සිටි සෙස්සෝ අනුක්ත කාරක නම් වෙත්. උක්තය ප්‍රථමා විභක්තියෙන්ද අනුක්තය ස්වකීය විභක්තියෙන්ද සිටී.

උක්තකාරකය, අනුක්තකාරකය.

1. සූදො ඔදනං පචති,
2. දාසෙන භාරො ගාමං නීයතෙ,
3. ඡින්නරුක්ඛො භූමියං පති,
4. දින්නසුඞ්කො යුද්ධම්හා පරාජිතො,
5. නිග්ගතජනො රඤ්ඤො සුඞ්කං දෙති
6 මනොමාණ්ඩිගං අග්ගිනා දඩ්ඪං,

මෙ පිළිවෙළින් කර්තෘ, කම්, කරණ, සම්ප්‍රදාන, අවධි, ආධාර යන කාරකයක් ක්‍රියාවෙන් උක්තය ලබා පෙරවිබත ලැබූයේ යි.

මේ වාක්‍යයන්හි පෙනෙන "දාසෙන, ඔදනං, අග්ගිනා. රඤ්ඤො, යුද්ධම්හා, භූමියං"යි යෙදූ කතු, කම්, කරණ, සපදන්, අවදි, අදර" යන කාරකයෝ ඒ ඒ ක්‍රියාවලින් උක්ත නුවූහ. එහෙයින් සිය සිය විබත්වලින් සිටියාහු ය.

මේ ලෙසින් කාරකයන්ගේ උක්තානුක්තය දතයුතුයි. ඉක්බිති කාරකයන් පිළිබඳ විශේෂ විභාග දක්වනු ලැබේ.

**1 කර්තෘ කාරකය,**

ක්‍රියාව කරන්නා කර්තෘ නම්, එය සුද්ධකත්තෘ, හෙතුකත්තෘ, කම්මකත්තෘ යයි ත්‍රිවිධ වේ. ක්‍රියාව තෙමේම කරන්නේ සුද්ධකත්තෘ නම්.

"භික්ඛු ආයස්මන්තං රාහුලං ආහංසු"
"එකමෙව දනෙත ඛාදන්තා තිපජ්ජිංසු"

යමෙක් අනිකකු ලවා ක්‍රියාව කරවාද? ඒ හෙතුකත්තෘ නම්.

"සො පුරිසො තං පුරිසං ඔදනං පාචාපෙති"

යමක් අන්‍යවූ ක්‍රියා සම්බන්ධයෙන් කම්වූයේමුත් සුකර හෙයින් තෙමේම සිදුවේද, ඒ කම්මකත්තෘ නම්.

"සයං කරීයතෙ කටො"

"සයමෙව පච්චතෙ ඔදනො"

යන මොහු උදාහරණ වෙත්.

ක්‍රියාවෙන් අනුක්තවූ කර්තෘ තෘතීයාවෙන් සිටී.

"ජිනෙන දෙසිතො ධම්මො" "බුද්ධෙන ජිතො මාරො"

"අහිනා දට්ඨො නරො" "සද්ධෙහි කාරිතො විහාරො"

2 කර්ම කාරකය.

කර්තෘගේ ක්‍රියාවට යටත්වීම් වසයෙන් බැඳෙන හෙයින් කර්මය ද කාරක නම් වේ.

"රාජා අක්ඛන්දං අගාමිකෙසිට්ඨානෙ ඨපෙසි."

1 කර්මය නිබ්බත්ති. විකති; පත්ති; යයි තුන් වැදෑරුම් වේ. "මාතා පුත්තං විජායති" "දෙවදත්තො කට්ඨම-ඞ්ගාරං කරොති." "පණ්ඩිතො නිවෙසනං පවිසති." යන මොහු පිළිවෙළින් උදාහරණ වෙති.

2 නැවතත් ඉච්ඡිත කර්මය අනිච්ඡිත කර්මය යි දෙවැදෑරුම් වේ. "ආහාරො සුඛං ජනයති." "කුමාරො විසං ගිලති."

3 කථිත කර්මය අකථිත කර්මය යි දෙවැදෑරුම්ද වේ. මේ භේදය ද්විකර්ම ධාතූන්ගේ යොගයෙහි යි.

"ගොපාලො අජං ගාමං නයති"

"පරාභවන්තං පුරිසං මයං පුච්ඡාම ගොතමං"

මෙහි 'අජං', යනුද 'පුරිසං' යනුද කථිත කර්මයි. "ගාමං' යනුද 'ගොතමං' යනුද අකථිත කර්මයි.

4 අත්‍යන්ත සංයොගයෙහි කාල අධ්වානවාචක ශබ්දයෝ ද්විතීයා විභක්තියෙන් සිටියි.

කාලයෙහි- සත්තාහං ගවපානං, මාසං මංසොදනං,
සබ්බකාලං රමණීයං නන්දනං,

මාර්ගයෙහි- යොජනං වනරාජි, කොසං සජ්ඣායති,

5 පති පරි අනු යන කම්ප්‍රවචනීය ශබ්දයන් සමග ද්විතීයා විභක්තිය යෙදේ. ලක්ඛණ ඉත්ථම්භූත භාග වීච්ඡා යන අර්ථයන්හි කම්ප්‍රවචනීයෝ යෙදෙත්.

ලක්ඛණාර්ථයෙහි- රුක්ඛං පති විජ්ජෝතතෙ චන්දො, රුක්ඛං පරි විජ්ජෝතතෙ චන්දො, රුක්ඛං අනු විජ්ජෝතතෙ චන්දො;

ඉත්ථම්භූත නම් අමුතු ගතියකට පැමිණීමයි.

"සාධු දෙවදත්තො මාතරම්පති, සාධු දෙවදත්තො මාතරං පරි, සාධු දෙවදත්තො මාතරමනු,"

භාග නම් කොටසයි.

"යදෙත්ථ මම්පති සියා තං දීයතු, යදෙත්ථ මම්පරි සියා තං දීයතු, යදෙත්ථ මං අනු සියා තං දීයතු."

වීච්ඡා නම් වෙන් වෙන්ව පවත්නා වස්තූන් එකට සම්බන්ධ කරන්ට ඇති කැමැත්තයි.

"රුක්ඛං රුක්ඛං පති, රුක්ඛං රුක්ඛං පරි, රුක්ඛං රුක්ඛං අනු විජ්ජෝතතෙ චන්දො;"

6 අන්තරා, අභිතො, පරිතො, පටිභා ආදීන්ගේ යොගයෙහි ද්විතීයා විභක්තිය වේ.

"[1]අන්තරා ච රාජගහං අන්තරා ච නාලන්දං අද්ධාන මග්ගපටිපන්නො;"

"අභිතො ගාමං වසති," පරිතො ගාමං වසති,"

"[2]නදිං නෙරඤ්ජරං පති," "[3] උපමා මං පටිභාති."

7 තතියා සත්තමීන්ගේ අර්ථයෙහි ද්විතීයා විභක්තිය වේ.

"[4]සචෙ මං නාලපිස්සති."

"[5]එකං සමයං භගවා, පුබ්බණ්හ සමයං නිවාසෙත්වා."

---

1 රජගහනුවරට ද නාලන්දාවට ද මද්ධ්‍යයෙහිය යන අර්ථයි.

2 නෙරඤ්ජරාව ළඟය යන අර්ථයි. 3 උපමාවක් මට වැටහෙයි.

4 ඉදින් මා හා කථානොකරන්නේද: මෙය තෘතීයාර්ථයෙහිය. 5 සත්තමී අර්ථයෙහිය

8 උප, අනු, අධි, ආ, යන මොවුන් පූර්වකොට ඇති වස ධාතුහුගේ ආධාරය දුතියාවෙන් සිටී.

“ගාමං උපවසති, ගාමං අනුවසති, විහාරං අධිවසති, ගාමං ආවසති.”

**3 කරණකාරකය.**

උපකාරවීම් අයුරින් ක්‍රියාව හා බැඳෙන හෙයින් කරණය ද කාරක නම් වේ. අජ්ඣත්ත බාහිර වසයෙන් කරණය විප්‍රකාර වේ.

“හත්ථෙන කම්මං කරොති.” “චක්ඛුනා රූපං පස්සති.” “දාත්තෙන වීහයො ලුනාති.” අග්ගිනා කුටිං ඣාපෙති.” “සා භින්නෙන සීසෙන පග්ඝරන්තෙන ලොහිතෙන පටිවිස්සකානං උජ්ඣාපෙසි.” ඉත්ථම්භූතයෙහි කරණයි.

“එකාහෙනෙව බාරාණසිං පාවිසි.” [1] අපවග්ගයෙහි කරණයි.

“මාසෙන පුබ්බො.” පිතරා සදිසො.” පුබ්බ සදෘශාදීන් සමග යොගයෙහියි.

මාසෙන භුඤ්ජති, යොජනෙන ගච්ඡති.” කාලද්ධානයෙහියි·

“අනන්තනාව අත්තානං සම්මන්නති.” ප්‍රථමාර්ථයෙහියි. “සුමුත්තා මයං තෙන මහා සමණෙන.” පඤ්චමී අර්ථයෙහි කරණයි.

“න ජච්චා වසලො හොති” හෙත්වර්ථයෙහි කරණයි. “කෙන සමණෙන” සප්තම්‍යර්ථයෙහි කරණයි. “අක්ඛිණා කාණො” විකාරාවයව දක්වීමෙහි කරණයි.

**4 සම්ප්‍රදාන කාරකය.**

කැමැත්තෙන් දෙන දෙය ලබන්නා ද රුචිකිරීම ලබන්නා ද දූරීම ලබන්නා ද ක්‍රියාව හා බැඳෙන හෙයින් සම්ප්‍රදානය කාරක නම් වේ.

---

1 ක්‍රියාවගේ වහා නිමවීම අපවග්ග නම්.

අභිචාරණ, අපේක්ඛන, අනුමති වශයෙන් සම්ප්‍රදානය ත්‍රිවිධ වේ.

1 බුද්ධස්ස පුප්ඵං යජති, 2 යාචකානං ධනං දදාති, 3 භික්ඛූනං දානං දෙති. යනු පිළිවෙළින් උදාහරණයි.

සමණස්ස රොචතෙ සච්චං, රොචනාදියෙහිය.

දෙවදත්තස්ස සුවණ්ණච්ඡත්තං ධාරයතෙ, ධාරිමාදියෙහි යි. සිලාඝ, හනු, ඨා, සප, ධාර, පිහ, කුධ, දුහ, ඉස්ස, උසුය, රාධ, ඉක්ඛ යන ධාතුන්ගේ ප්‍රයෝගයෙහි ද සම්ප්‍රදානය යෙදේ. මේ ඊට උදාහරණයි.

"බුද්ධස්ස සිලාඝතෙ; තුය්හං හනුතෙ; උපතිට්ඨෙය්‍ය සක්‍ය පුත්තානං වඩ්ඪකී. මය්හං සපතෙ, තස්ස රඤ්ඤො, මයං නාගං ධාරයාම; දෙවාපි තෙසං පිහයන්ති, තස්ස කුජ්ඣ මහාවීර; දුහයති දිසානං මෙඝො; දුජ්ජනා ගුණවන්තානං උසූයන්ති; ආරාධො මෙ රඤ්ඤො; ආයස්මතො උපාලිත්ථෙරස්ස උපසම්පදා පෙක්ඛො උපතිස්සො."

ආරොචනත්ථ, තදත්ථ, තුමත්ථ, අලංසද්ද පටික්ඛෙපයන්හි ද සම්ප්‍රදානය වේ.

"ආරොචයාමි වො භික්ඛවෙ; බුද්ධස්සත්ථාය ජීවිතං පරිච්චජාමි; ලොකානුකම්පාය; අලං මෙ රජ්ජං; අලං තෙ ඉධ වාසෙන."

නමො යොගයෙහි ද සම්ප්‍රදානය වේ.

"නමො කරොහි නාගස්ස."

5 අපාදාන කාරකය.

යමක් පහවීමකින් හෝ ගැණීමකින් හෝ බියවීමකින් හෝ ක්‍රියාව හා බැඳේ නම් එය අපාදාන කාරක නම්.

"ගාමා අපෙන්ති මුනයො" "නගරා නිග්ගතො රාජා." "චොරස්මා භයං ජායතෙ."

නිද්දිට්ඨ විසය උපාත්ත විසය අනුමෙය විසය යි අපාදානය තුන්වැදෑරුම් වේ.

ක්‍රියාව එහිම පෙනේ නම් එය නිද්දිට්ඨ විසය නම්.

"පාපා නිවාරෙන්ති."

ක්‍රියාව අමුතුවෙන් පමුණුවා ගතයුතු නම් උපාත්ත විසය නම්.

"වලාහකා විජ්ජෝතන්තෙ විජ්ජු." මෙහි අපාදානයට සුදුසු ක්‍රියාව නොමැත. එය අමුතුවෙන් යොදාගතයුතුයි.

"වලාහකා නික්ඛම්ම විජ්ජෝතන්තෙ විජ්ජු."

ප්‍රමාණකොට සැලකීම අනුමේය විසය නම්.

"මාධුරා [1] පාටලිපුත්තකෙහි අභිරූපා."

අපාදානය චල අචල වශයෙන් ද දෙපරිදි වේ.

"ධාවතා හත්ථිමහා පතිතො අඞ්කුසධාරී."
"පබ්බතා ඔතරන්ති වනචරා."

දූර, අන්තික, අද්ධනිම්මාන, කාලනිම්මාන, ත්වාලොප දිසායොග යනාදී අර්ථයන්හි අපාදානය වේ.

"කීවදූරෙ ඉතො නළකාරගාමො; දූරතොව නමස්සන්ති; ඉතො මධුරාය චතුසු යොජනෙසු සඞ්කස්සං; ඉතො එකනවුතිකප්පමත්ථකෙ; [2] පාසාදා සඞ්කමෙය්‍ය; ඉතො සා පුරිමාදිසා; පාණාතිපාතා වෙරමණී" යනු පිළිවෙළින් උදාහරණයි.

සාමි විභක්තිය [3]

යමෙකුගේ අයිතියක් වේ නම් එය සාමිභාවය ෂෂ්ඨියෙන් දැක්වේ. "මනුස්සස්ස ධනං."

විශේෂණ විශේෂ්‍ය දෙදෙනා අතුරෙන් විශේෂණය ෂෂ්ඨියෙන් යෙදේ. "රඤ්ඤො පුරිසො."

තතියා සත්තමීන්ගේ අර්ථයෙහිද ෂෂ්ඨිය යෙදේ.

"පුප්ඵස්ස බුද්ධං යජති." "කුසලා නච්චගීතස්ස."

---

1 පැළලුප්නුවර වැස්සන්ට වඩා; 2 පාසාදං අභිරුහිත්වා සඞ්කමෙය්‍ය යන අර්ථයි. 3 කාරකයන්ට අයත් නුවූවත් මෙහිදී දැක්වීම සුදුසු වෙයි.

කර්තෘකාරකයෙහි කතප්‍රත්‍යය යොගයෙහි;

“රඤ්ඤො සම්මතො.”

දුතියා පංචමී විභක්තීන්ගේ අර්ථයෙහි ද ඡට්ඨිය වේ.

“අමතස්ස දාතා.” “අස්සවණතා ධම්මස්ස පරිහායන්ති.”

නිෂ්ඨා සංඥයන් පරකල්හි ඡට්ඨිය නොවේ.

“විහාරං ගතො; රථං කතවන්තො; රථං කතාවී; කටං කත්වා, කටං කරොන්තො, කටං කරණතො යනාදී තන්හි නොවේ.

6 ආධාර කාරකය

කර්තෘ හෝ කර්මය ඉසිලීම් වසයෙන් ක්‍රියාවට උපකාරවන හෙයින් ආධාරය ද කාරක සඞ්ඛ්‍යාවට අයත් වේ.

“[1]කටෙ නිසීදති දෙවදත්තො.” කර්තෘ උසුලයි.

“[2]ථාලියං ඔදනං පචති.” කර්මය උසුලයි.

ඔපසිලෙසික, විසය, ව්‍යාපික, සාමීපික යයි ආධාරය සිවු පරිදි වේ.

ආධාරයෙහි එකදෙසයක් වැලඳ ගැණිම් ඇත්තේ ඔපසිලෙසික නම්.

“ආසනෙ නිසින්නො සඞ්ඝො, ථාලියං ඔදනං පචති.”

යමෙකුගේ සමර්ථකම යම් පෙදෙසක නම් එය විසය ආධාරයි.

“ආකාසෙ සකුණා චරන්ති, භූමිසු මනුස්සා.”

ආධාරයෙහි හැමතැනම ආධෙයය වස්තුව පැතිර පවත්නේ නම් ඒ ආධාරය ව්‍යාපික නමි.

“තිලෙසු තෙලං අත්ථි.” දධිම්හි සප්පි.”

ආධාරයාගේ සමීපය ගතයුතු නම් එය සාමීපික නමි.

“ගඞ්ගායං [3]ඝොසො වසති, “භගවා සාවත්ථියං විහරති.”

---

1 පැදුරෙහි, 2 සැළියෙහි, 3 ගොපල්ලගම.

1නිර්ධාරණයෙහි ඡට්ඨී සත්තමී විභත්ති දෙක වේ.
"මනුස්සානං =මනුස්සෙසු ඛත්තියො සූරතමො."
"ගාවීනං =ගාවීසු කණ්හා සම්පන්න ඛීරතමා."
"අද්ධිකානං =අද්ධිකෙසු ධාවන්තා සීඝතමො."
"ආයස්මා ආනන්දො අරහතං= අරහන්තෙසු අඤ්ඤතරො අහොසි."

ගහ චුම්බ අභිවාදාදීන්ගේ යෝගයෙහි කර්මය ආධාරයෙන් සිටී.

2"නානා බාහාසු ගහෙත්වා." "මුද්ධනි චුම්බිත්වා"
"භික්ඛූසු අභිවාදෙන්ති."

පිඬු හැසිරීමක් හැඟෙනකල්හි කල්හි කරණය ආධාරයෙන් සිටී.
"පත්තෙසු පිණ්ඩාය චරන්ති."

සමහරතැනක නිමිත්ත ද ආධාරයෙන් සිටී.
"කුඤ්ජරො දන්තෙසු හඤ්ඤතෙ, "සම්පජාන මුසාවාදෙ පාචිත්තියං." සම්ප්‍රදානය ආධාරයෙන් ද සිටී.
"සඞ්ඝෙ දින්නං මහප්ඵලං."

පඤ්චමිය ද ආධාරයෙන් සිටී.
"කදලීසු ගජෙ රක්ඛන්ති.',

කාලයෙහි ද ආධාරය වේ.
"පුබ්බණ්හ සමයෙ ගතො, අකාලෙ වස්සති."

භාවයෙහි ද ආධාරය සිටී.

යම් කෘදන්ත ක්‍රියාවක් සත්තමී විභක්තියෙන් සිටි කල්හි ඒ කෘදන්ත ක්‍රියාව කර්තෘකාරක නම් කර්තෘ ද කර්මකාරක නම් කර්මය ද ආධාර විභක්තියෙන් සිටී.
"සබ්බෙ මග්ගා විවජ්ජන්ති ගච්ඡන්තෙ ලොකනායකෙ"
"භික්ඛූසු භොජියමානෙසු ගතො."

---

1 නිර්ධාරණ නම් අසවල් ජාති, ගුණ, ක්‍රියා නාමවලින් මේ තෙමේ ශ්‍රෙෂ්ඨයයි සමූහයකින් වෙන්කර ගැණීමයි. 2 අතින් ගෙණ, හිස සිඹ, භික්ෂූන් වඳිත්;

(සිංහල වාක්‍ය පාළියට නැගීම, පාළි වාක්‍යරචනා, පාළියෙන් කථාකිරීම,)

## සිංහල වාක්‍ය පාළියට නැගීම

I

"මපියානනි, ඔබ පිරිමියෙකු නොව ස්ත්‍රියකි. එබැවින් ස්ත්‍රියකට ඔබින මේ ආභරණය පැළඳගණු මැනවි."

මේ වනාහි සොළොස්හැවිරිදි ගැමුණුකුමරුගේ කියමනකි. ගැමුණුකුමාරයා වනාහි කාවන්තිස්ස රජුගේ වැඩිමහලු පුත්‍රයා වෙයි. ඔහුගේ මවු තොමෝ විහාරමහාදේවිය වූවාය. ඕතොමෝ සිය රටත් ජාතියත් රැකගණු සඳහා ජීවිත පරිත්‍යාග කළ වීරවරියකි. කාවන්තිස් රජතෙමේ බෞද්ධ උපාසකයෙකි. බලසම්පන්න එළාර රජු හා සටනට හෙතෙමේ නො කැමතිය. පින් දහම් කරමින් විසීමට ය ඔහුගේ කැමැත්ත.

එහෙත් බිසවුතොමෝ ඒ අදහසට විරුද්ධ අදහස් ඇත්තියකි. එළාර රජු පැරදවීමෙහි සමත් පුතෙකු ගැණීම ම ඈ අභිලාෂි වූවාය. දූන් දූත් ලංකාව දකුණු ඉන්දියාවේ ද්‍රවිඩ රාජ්‍යයක් බවට හැරීමේ ලකුණු පහළවන්නට වූහ.

අනාගත බෞද්ධයාගේ භාග්‍යයවිසින් ශ්‍රේෂ්ඨයෙකු ලැබූ වීරපුතෙක් විහාරමහාදේවියට ලැබුණේය. හේ නමින් ගැමුණුය. මවු බිසොව ඇගේ වීරත්වය කිරට හරවා ඔහුට පෙවුවාය. එහෙයින් කුඩා කළ සිට ම ඔහුගේ සිරුරෙහි වීර ලකුණු දිස්වූහ. මවු බිසොවගේ හැම උපක්‍රමයක් ම වූයේ කුමරු යුදෙහි පෙළඹවීම පිණිසයි.

එක් දවසක් ගැමුණු තෙමේ අත් පා වකුටුකොට ගෙණ යහනෙහි වැදහොත්තේය. "ඇයි, පුතණ්ඩ මෙසේ කුමක් හෙයින් වකගස් ගෙණ නිදියෙන්නෙහිදැයි" ඇසුවාය.

"මෑනියෙනි, දකුණුදිගින් මහමුහුදය. මහවැලිගඟින් එතර හැඩිදෙමළුය. කෙසේ මම් අත් පා දිගහරින්නෙම්ද?"

(සි. වා. රචනා.)

## II

ගම්බද ගොවියා දෙස බලන්න. ලොමින් වැසීගිය නො වැසුනු උඩුකයකි. නීරෝග සිරුරකි. වටකුරු දික්වූ දෙ අතකි. නිර්භීත බැව් කියන උඩුරුවුලකි. තියුණු දෙ ඇසකි. ගැඹුරු රළු කටහඬකි. පියකරු සිනාමුහුණකි. මුව තොල් රත්පැහැයෙන් යුක්තය. බුලත්විටක් මුවතුළ ඇත. ඉනේ දකුණුපස ගැසූ උල්පිහියකි. ඉදිරිපස රෙදි නැරුවෙහි බුලත් මඩිස්සල ය.

ඔහුගේ පින් තොට කුඹුරය. ඔහුගේ සම්පත ගවයා ය. ඉරිමා උදය නැගිට දෙනුන්ගෙන් කිරි දොවියි. තණබිම් කරා ගවයන් දක්කාගෙණ යයි. කුඹුරෙහි නියර දැඩි කරයි. වැඩිපුර වතුර බැසයන්ට සලස්සයි. අඟුරු කඩකින් දත් මැද මූහුණ දෙව පාතරාසයට ගෙට පැමිණෙයි. නැවත ද උදැල්ලත් කර තබාගෙණ කුඹුර පැත්තට ම ගමන් කරයි.

ඔහු වැසිකාලය දනියි. නියංකාලය දනියි. කුඹුර වපුරණ කාලයෙහිත් අස්වද්දන කාලයෙහිත් ගොවියා කඩිසරයෙකි, මැලිකම් නොදන්නෙකි. අව් වැසි නො හඳුනන්නෙකි. ගොවියා තරම් නිදහස් නිවහල් මිනිසෙක් මේ මිහිපිට නැත. හෙතෙමේ අනුන් යටතේ කුලියට මෙහෙකර නැත.

ඔහුගේ ගෙයි බිම ඔපදමන්නට ඕනෑ නැත. විසිතුරු බඩු බාහිර ඔහුගේ ගෙයි නැත. මෙහෙකරුවෝ ඔහුට නැත. විදුලි එළිය ගුවන්විදුලිය ගැණ මාස්පතා බිල් ඊමක් ඔහුට නැත. මොටෝරියක් නැත. එහෙයින් රියැදුරෙක් ද නැත. දරුවන් ඇතිදැඩි කිරීමට ආයාවරු මෙහෙකාරියෝ නැත.

ඔහුගේ ආගන්තුක සංග්‍රහය කැවුම්වලින් ය. වත්තේ තිබෙන, දොඩම්, අඹ, අන්නාසි, තැඹිලිවලින් ය. සුවඳ විහිදෙන හැල්සාලේ බතින් ය. දොරකඩ තිබෙන බුලත් පුවකින් ය. (සි. වා. රචනා;)

III

සීගිරි චිත්‍ර අජන්තා චිත්‍ර මෙන් ප්‍රකට ය. මේ සිතියම් වල ඇති සියුම්කම, එයට ගත් සායම හා එහි ආකාරය වර්තමාන චිත්‍රඥයන් විස්මය පත් කරවයි.

ශතවර්ෂ 14 ට පෙර අඳිනාලද මේ චිත්‍රයෝ අද ඊයේ ඇන්දක් මෙන් දිස් වෙත්. සීගිරි චිත්‍ර බලන්නට ගියෝ පියුම් පිරූ මල්හැටි අතින් ගත්, දෙවඟනන් වැනි වරඟනන් ගේ රුව දැක, ජීවමාන තරුණියන් සේ සලකා ඔවුන් සමඟ කවියෙන් කළ සංලාපයක අයුරින් කැටපත් පවුරෙහි ගී ලියා ආවෝය.

මේ ගී සිංහල සාහිත්‍යයට මැතදී ලැබුනු දායාදයකි. මෙකල පැරණි තැන් බලන්නට යන තරුණයෝ මේවා බලා කිසි හැඟීමක් ඇතිකර නො ගණිති. තම තමන්ගේ නම් ඉංග්‍රීසියෙන් ලොකු අකුරෙන් වටිනා දේ මත කොටා එති. අපේ පැරණි තරුණයෝ චිත්‍රකලාවට කොතරම් ගරු කළා හුද? එය කැටපත් පවුරෙහි පෙණෙන ගීවලින් පෙණේ.

ලෝකයෙහි විස්මය පත් කරවන හැම දෙය දුටුවහු විසින් නමුත් සීගිරිය දැක නොමැතිනම් ඔහුට මදිකමකි. ලොව නොයෙක් රටවලින් නොයෙක් දෙනා සීගිරිය බලන්නට ගලා එති.

සීගිරිය රාජධානි කරගත් කාශ්‍යප රජතුමා වීරයෙකි. මනුෂ්‍යත්වය ඉක්මවූ වීරයෙකි. සීගිරිය වැනි දුර්ගමවූ දුටුවන් බිය කරවනසුලු, නැගෙන්නන් සිරුර කම්පා කර වන ගල් පව්වක් සම්පූර්ණ නගරයක් බවට පෙරළන්නට සිතීම පවා විස්මය ජනකය. (සිං. වා. රචනා)

---

IV

මුඩුක්කු වැස්සෝ අපිරිසිදුකමෙහි ගැලී සිටිත්. පිරිසිදුකම ගැන නො දන්නෝය. මුඩුක්කු රොගවලට උත්පත්තිස්ථානය. නුගත්කමට දුරාචාරයට ආකරය. ආරාවුල් අසමගිකම් දිනපතා සිද්ධිය. සූදුව, බීමත්කම,

සොරකම යන මේවා නිති විසුම් ගත් අයුරුය. මිනීමළ ගෙයක් නැති දිනයක් නැත. වැරහැලි දවටා ගත් ග්‍රහණී දරුවන්ගෙන් ගහනය. මේට මිහිබට නිරයයයි කීම අයුතු ද?

මෙහි වසන ළමයින්ට කුසපුරා කන්නට දෙයක් නැත. සිතපුරා හඳින්නට දෙයක් නැත. ඉගෙනීමක් ලබන්නට ඉඩකඩක් නැත. දුකෙහි ඉපද, දුකෙහි වැඩී, දුකෙහි ම මැරී යති. ඔවුහු සැප විඳින්නන්ට ඊර්ෂ්‍යා කරති. ඔවුන්ගේ දෙය උදුරා ගන්නට මාන බලති.

මේවා පාලනය වෙන්නේ නාගරික සභාමගිනී. මේ සාමාජිකවරුන්ගෙන් ඇතැමෙක් ගෙවල් හිමියෝ ය. ඇතැමෙක් මුඩුක්කු කිසිකලෙක නො දක්නෝ ය. නගරය අලංකාර කිරීමට යයි උයන් තැනීම්, ක්‍රීඩාභූමි තැනීම් ආදියෙන් විශාල ධනයක් වියදම් කරති මේ දුප්පත් දරුරැල ඔවුන්ගේ ඇස්වලට නො පෙණෙති. (ෂං. වා. රචනා.)

---

V

ඉතිහාසයෙන් මිනිසුන් බුද්ධිමතුන් කරත්. කවීහු මිනිසුන් චතුරයන් කරත්. ගණිතය ඥානය දියුණු කරයි. තර්කය දැනීම පිරිසිදු කරයි. අධ්‍යයනය චරිතය සකස් කරයි. ශරීර ගත රෝග සුදුසු ව්‍යායාමයෙහි යෙදීමෙන් සුව වන්නා සේ බුද්ධියෙහි පවත්නා දුර්වලත්වය ශාස්ත්‍ර හැදෑරීමෙන් පහවයෙයි, කන්දුක ක්‍රීඩාව වකුගඩුවට යහපති. ධනුශ් ශිල්පය හෘදයවසනුවට ද, සක්මන් කිරීම ආමාශයට ද, අසුපිට යාම හිසට ද මැනවි.

යමෙකුගේ බුද්ධිය චංචල නම් ඔහු විසින් ගණිතය උගත යුතුය. යමෙකුගේ බුද්ධිය වෙනසක් දැක්වීමෙහි අසමත් නම් ඔහු විසින් මධ්‍යම කාලීන දාර්ශනිකයන් ආශ්‍රය කළයුතුය. ඔවුන් ඉතා සූළු දෙය පවා මනාව බෙදීම කළ හැක්කන් බැවිනි. කරුණු විමසා එක් කරුණක් ප්‍රස්තුත කොට අනිකක් ඔප්පු කිරීමට යමෙකු අසමත් නම් ඔහු

නීතිඥයන්ගේ තඩු පරීක්‍ෂා කරත්වා. මෙසේ මානසික සැම අඩුලුහුඩුකමකට ප්‍රතිකාරයකුත් තිබිය හැකිය.
(සිං. වා. රචනා)

---

VI

රාහල්හිමියන් විසින් පරවිසන්දේශය, කාව්‍යශෙඛරය, සැළලිහිණි සන්දේශය යන සිංහල ග්‍රන්ථ පඤ්චිකාප්‍රදීපය හා බුද්ධිප්පසාදනීය ය ද රචනා කරණ ලදහ. සැළලිහිණි සන්දේශය තරම් ජනප්‍රිය සන්දේශ කාව්‍යයක් වෙන නැත.

පඤ්චිකාප්‍රදීපය ලිවීමේදී පාලි, සංස්කෘත, සිංහල, ද්‍රවිඩ භාෂාත්මක තර්ක න්‍යාය ව්‍යාකරණ, ජ්‍යොතිෂ, ගණිත, නක්‍ෂත්‍ර ආදී නානා විෂයන් පිළිබඳව ලක්දිව හා දඹදිව ලියනලද ප්‍රසිද්ධ ග්‍රන්ථයන් අසූ ගණනකින් කරුණු ගෙණ හැර දක්වා තිබේ.

එහි සඳහන් ඇතැම් පොත් දැනට මේ දෙරණේ ම දක්නට නැත. මුද්‍රණ ශිල්පය නැති, පොත් දුර්ලභ සමයක, කියවන්නන් හිඟ කලෙක, රාහල්හිමියෝ පුස්කොළ පොත් දහස් ගණනක් කියවූහ.

බහුශ්‍රැතභාවයෙන් රාහල්හිමියන් බුද්ධඝොෂහිමියන්ට ද නො දෙවෙනි වෙතැ යි සිතිය හැකිය. පඤ්චිකාප්‍රදීපය විචාරකලාවේ දක්‍ෂයෙකුගේ කෘතියක් බව එය කියවනවිට සිතේ. රාහල්හිමියන්ගේ කාලයෙහි විජයබා පිරිවෙණ නාලන්දාව යයි කියයුතු තරමට විදෙශයන්හි පවා ප්‍රසිද්ධව පැවැත්තේ ය.

දඹදිවින් බමුණෝ ඇවිත් උන්වහන්සේගෙන් ශාස්ත්‍ර උගත්හ. භක්තිශතක කර්තෘ වූ චන්ද්‍රභාරතී එතුමන්ගෙන් උගත් ගිහි ශිෂ්‍යයෙකි. විජයබා පිරිවෙණෙහි එකල පැවති උසස් තත්ත්වය පිළිබඳ සත්‍ය දර්ශනයක් ගිරා සන්දේශයේ එයි. සිරිරාහල්හිමියෝ ෂඩ්භාෂා විෂයෙහි පටුතර බුද්ධිමතෙකි. එහෙත් මුන්වහන්සේගේ අදහස් මහායාන මතයන්ට බර වූහ. තොටගමුවිහාරයෙහි නානා දෙවොලක් පිහිටීම ද ඊට නිදසුනකි. (සිං. වා. රචනා.)

# පාලි වාක්‍යරචනා.

---

## ප්‍රබන්ධොපදෙශ.

---

1 මිනිසුන් පිළිබඳ රචනාවකදී :-

පළමුවෙන් හේ කිනම් දේශියයෙක්ද යන බව දැක්විය යුතුයි. නැවත ඔහුගේ භාෂාව, ඔහුගේ ධර්මය, ඔහු පිළිබඳ පුරාවෘත්තය, ඔහුගේ තත්ත්වය, ඔහු පිළිබඳ උගත්කම, ඔහුගේ රක්ෂාව, ඔහුගෙන් රටට සිදුවන සේවය, පරෝපකාරිත්වය යනාදිය ඇතුළත්වන සේ වාක්‍ය ප්‍රබන්ධය කටයුතුය.

2 සාමාන්‍ය සතෙකු පිළිබඳ රචනාවකදී :-

ඌ කිනම් ජාතියකට අයත් ද යන බව, ඌගේ හැටි, ඌගේ ප්‍රකෘති ස්වභාව, වර්ණය, ආයුෂ, කීකරුකම, ආහාරය ආදිය විස්තර වන සේ ලියයුතුයි. එසේ ඌ මිනිසුන්ට හිත නම් ඒ බවද අහිත නම් ඒ බවද සඳහන් කටයුතුය.

3 අනුරාධපුර, පොළොන්නරු, මහනුවර, කොළඹ, ගාල්ල ආදී යම් නගරයක් පිළිබඳ රචනාවකදී :-

ස්වාභාවික දර්ශනය, එහි හෝ අසල පවත්නා පර්වත, නදී, උයන්, වන පිළිබඳ කරුණු, ශිල්පායතන, ශාස්ත්‍රායතන පිළිබඳ කරුණු, එයින් ලැබෙන ආදායම් කටයුතු දේ, ඒ පිළිබඳව වියදම් කටයුත දේ හා ඓතිහාසික ශ්‍රේෂ්ඨත්වය ද විදහා කරුණු දැක්විය යුතුයි

4 ආපන ස්ථාන පිළිබඳ රචනාවකදී :-

එය කොතරම් විශාල වූවක්ද යන බව, කොතැන පිහිටියේද යන බව, එතැනින් ලබාගතහැකි දෙය, එහිදී හමුවන අය, කවරෙකු විසින් කවර කාලෙක එය පිහිටුවන ලද ද යන බව, එය විවෘතව පවත්නා කාලය, දිනපතා එහි වෙළඳාමේ

තත්ත්වය, එය පවත්නේ රෑද දවල්ද නැත්නම් දෙකෙහිමද යන බව, එහි වෙළඳසැල් කොතෙක් පවත්නේ ද යන බව, මෙයින් ඒ පළාත්වාසීන්ට සිදුවන මෙහෙය;

**5 පර්වතයක් පිළිබඳ රචනාවකදී :-**

එය පිහිටියේ කොහිද? එහි දිග පළල උස කොතෙක්ද? කිනම් සිව්පාවෝ එහි වෙසෙද්ද? කිනම් පක්ෂීහු එහි වෙසෙත්ද? එහි විහාරයක් පල්ලියක් හෝ දේවාලයක් පිහිටියේද? ඇත්නම් ඒ පිළිබඳ ඉතිහාසය, එහි මිනිස්සු වෙසෙත් නම් ඔවුන්ගේ සභ්‍යත්වය, මේ කඳුමුදුන කිනම් කිනම් පළාත්වලට පෙණේද? කිනම් නදීහු මෙයින් ප්‍රභවවෙත්ද? ඒ පිළිබඳ ඉතිහාසයද විස්තර වනසේ රචනා කටයුතුයි.

**6 නදියක් පිළිබඳ රචනාවකදී :-**

එය පටන්ගන්නා තැන, මුහුදට වැටෙන තැන, එහි දුර ප්‍රමාණය, සැඩපහරෙහි වේගය, අතුගංගා, ඒවා කිනම් සීමාවල පවතිද්ද? ඒ දෙපස පවත්නා නුවරවල්, එහි වැසියන්ට මෙයින් ඇති ප්‍රයෝජන, වෙළහෙළඳාම්වලට ඇති ප්‍රයෝජන, එයින් මිනිසුන්ට සිදුවන විනාශය, ඒ විනාශය මගහරවා ගැණීමට හැකි ක්‍රම යනාදිය වර්ණනා කටයුතුයි.

**7 රන්රිදී ආදි ඛනිජ වර්ග පිළිබඳ රචනාවකදී :-**

ජාතිය, හැටි, පැහැය, ගුණ, කොහේ ලැබිය හැකිද යන වග, ශුද්ධකරන්ට පළමු කෙසේද? ශුද්ධකළාම කෙසේද? ආකරවලින් ලැබිය හැකි නම් ඒ කෙසේද? යනාදිය විස්තර වනසේ ලිවියයුතුයි.

**8 සූර්ය චන්ද්‍රාදි නෛසර්ගික දේ පිළිබඳ රචනාවකදී :-**

හැටි කෙසේද? (හැකිනම්) ප්‍රභවය කෙසේද? කිනම් වෙලාවක පෙණේද? රශ්මිය කොබඳුද? පැහැය කෙසේද? රශ්මියෙන් ඇති ප්‍රයොජන කවරහුද? අප්‍රයොජන කවරේද? ඉතිහාස පුරාවෘත්ත කෙසේද? යි සුදුසු පරිදි වර්ණනා කටයුතුයි.

9 භූකම්පනය පිළිබඳ රචනාවකදී :-

කම්පනයට හේතුව, ආංශශී ධර්මානුගත මේ පිළිබඳ හැඟීම කෙසේද? කම්පනය ආරම්භයේදී, මධ්‍යයේදී අන්තිමේදී කෙසේ හඬනගාද? කිනම් විනාශයක් මින් සිදුවේද? ප්‍රයොජනයක් ඇත්නම් ඒ කිම? භූකම්පන බොහෝ සෙයින් පවත්නා පෙදෙස් කවරහුද? විස්තර කටයුතුයි.

10 වෘක්ෂජාති පිළිබඳ රචනාවකදී :-

පැලවීම කෙසේද? කුමකින්ද? කොපමණ කලකින්ද? කෙසේ පොළොව සකස් කළ යුතුද? කෙසේ පෝර යෙදිය යුතුද? කොපමණ උසට වැඩේද? පල දැරීම කොපමණ කලකින්ද? එයින් ගතයුතු ප්‍රයෝජන කවරහුද? කිනම් පෙදෙස්වල වැඩේද? නො වැඩේද? වර්ෂයකට ලැබිය හැකි ආදායම කෙසේද? යනාදිය විස්තර වශයෙන් ලෙඛනය කටයුතුයි.

---

## 1 කොකිලො.

සබ්බස්මිං භූතලෙ නිඛිල පක්ඛිගණෙසු පිකො නාම කවිජනානං අතිප්පියො විහඞ්ගමො. අස්ස වණ්ණො කණ්හො. චරණානි ධූමවණ්ණානි. සුගොලානි රත්තානි චක්ඛූනි සංඛෙපෙන කාකසදිසොව වත්තතෙ'ස්මිං බාහුල්ලෙන.

අතො එවොච්චතෙ කවිනා :-

"කාකඃ කෘෂ්ණඃ පිකඃ කෘෂ්ණඃ
කො භෙදඃ පික කාකයොඃ
වසන්ත සම්ප්‍රාප්තෙ
කාකඃ කාකඃ පිකඃ පිකඃ" ඉති අපිහි කාක විසයෙ වත්තතෙ පිකො.

පක්ඛීනං වායසො එව ධුත්තො. අපරො සදිසොපි න විජ්ජතෙ. තථාපි පිකවධූ සභාවෙන සෙට්ඨතරා. සා හි

පසවවෙලාය කාකකුලාවකමුපගම්ම කාකණ්ඩානි අධො පාතයිත්වා තස්මිං කුලාවකෙ සකානී චතත් අණ්ඩානි සූති.

තතො පිකපොතවමජනනානි කාකී තානි රත්තිංදිවං නිජ සරීරතාපෙන පරිතාපයති. කාලෙ සම්පත්තෙ තෙසු අණ්ඩෙසු භින්නෙසු තන්නික්ඛන්තෙ සාවකෙ නිජ සිසවොති මඤ්ඤ්‍ය ආහාරමාහරිත්වා ඛාදයිත්වා පිකසාවකෙ පොසයති. ජායා විය තත්‍රෙව සතතං අවතිට්ඨති. රත්තිං දිවං පක්ඛෙහි රක්ඛති. පිකපොතකා ච වයප්පත්තා උපමාතරං වායසිං වඤ්චයිත්වා නිජජාති ධම්මවසා වනොපවනං විලසන්ති. තදා තෙ නානාවිධානි පක්කඵලානි භුඤ්ජිත්වා කාලං නයන්ති.

එසො ඛලු විහඟො සුකාදයො විය න බුද්ධතාමාචවාර යති තථා පි එතං පඤ්ජරෙ පරිපොසයන්ති කෙචි භාරත දෙසියාඞ්ගනායො.

එවමාහු පණ්ඩිතා, "කොකිලානං සවරො රූපම්," ඉති කොකිලා කුරූපා, තථා පි තෙ සරෙන සබ්බෙ තොසයන්ති. වසන්තෙ යත්ථ සුපුප්ඵිතචූතරුක්ඛො විජ්ජතෙ, තත්ථ පිකොයං භීතො භීතො භුත්වා සංචරිය, රත්තවණ්ණෙන කණ්ඨෙන රවති. තදා යොගීනම්පි චිත්තං චඤ්චලමාපජ්ජතෙ.

කාලිදාස පණ්ඩිතො ආහ කුමාරසම්භවකාව්‍යෙ:-

"චූතාඞ්කුරස්වාද කෂායකණ්ඨඃ
පුංස්කොකිලො යන්මධුරං චුකූජ
මනස්වීනීමාන විඝාත දක්ෂං
තදෙව ජාතං වචනං ස්මරස්‍ය."

අයමෙව කොකිලො ජනානං උත්තමං පුප්ඵසමයෙ වසන්ත කාලෙ බාහුල්ලෙන නදති.

වසන්තන්තර කාලෙ සයං මූගවතො භවතීති පසිද්ධි හොති. තථාපි පඤ්ජරබද්ධො විහඟො සබ්බෙසු කාලෙසු එව සද්දායතෙ.

## 2 වස්සාන උතු.

සීහලදීපෙ'ස්මිං ඡන්නං උතූනං 'වස්සාන උතූති' ආසාළ්හ සාවණාබ්‍යං මාසද්වයං පරිකප්පයන්ති පුබ්බාචරියා. අස්මිං සමයෙ සදා එව නභො ජීමූතමාලාය ඡන්නො භවති. මෙඝෙසා නභෙ සමන්තා සඤ්චරිත්වා තස්මිංඛණෙයෙව භූමියං පතන්ති. අවිරතපතිතධාරාය ධරණීපිට්ඨි කලලීභූතාව තිට්ඨති.

තෙනෙතවං හි පිච්ඡලිතො රජ්ජමග්ගො. විහාරාරාම රච්ඡාදීනි කද්දමකිලින්නානි. එවම්පි ජිණ්ණපණ්ණකුටිරොදර වාසිනං ඡිද්දන්තරෙන පතිතොදකෙන සබ්බ වත්ථුමයා ජලසිත්තා සමාජාතා. නිබ්බිලෙස්මිං තපනකිරණවිරහෙන සබ්බ සත්තා විමූළ්හා අතිසීතභාවෙන පීළිතා. ආවිලොදකෙන තුස්සමානා මණ්ඩූකා සජානීහි සද්ධිං සාමග්ගි සුඛමනුභූය මොදමානා රත්තින්දිවං ගනගනායන්ත.

කදාචි අන්තරන්තරා පවාති පබලං කිල සමීරණො ද්වීහතීහං අවිරතං; ධාරානිපාතෙන ආකිණ්ණායො වාපි පොක්ඛරණියො. චණ්ඩප්පවාහා නදී. පවාති ජලකන්තිකා ඔක්කපුණ්ණා පථවී. තස්මා කිමිසප්පාදයො අධොභාගෙ වසන්තා ජලොප්ලවනතාය ආයන්ති මනුස්සානං ගෙහං. තෙන තෙහි දට්ඨා මනුස්සා අනයබ්‍යසනප්පත්තා යමාලයං පාපුණන්ති.

උදකරසිභූතාසු නින්නභූමිසු මකසා පාතුභවන්ති. තෙ විවිධ සංක්‍රාමිකරොග බීජානි සඤ්චීය මනුස්සානං ජීවසොණිතෙහි සද්ධිං මිස්සන්ති. තෙනෙව ජරකිණ්ණා මනුස්සා මාරමුඛං පවිස්සන්ති. කම්මකරපුරිසාපි යතනං ජලන පටිරුජ්ඣමානා දෙවසිකා කම්මං කාලං කාලම්පි සුදුක්කරං නිප්ඵාදයන්ති. සබ්බෙ ජනා අකම්මසීලිනො ගෙහෙසු මඤ්චට්ඨා නිද්දායන්ති. තස්මා හීනයා කම්මනිට්ඨතාය පමාදී භූතා අක්ඛකීළාසු නියුත්තා කාලං ඛෙපයන්ති.

අපරඤ්ච ගිම්හතාපදඩ්ඪා රුක්ඛලතාදයො පණ්ඩිතභූමි මාසජ්ජස්මිං සමයෙ සාඛා පසාඛාහි ආච්ඡාදයන්තා පායො එව සාමලං භූමිං නිම්මායෙන්ති. ධරණී පිට්ඨියා විලග්ගානි පූති ගන්ධමයානි කතිපය දිනාතික්කන්තානි සත්ත දෙහ මංසට්ඨීනි, තථා අඤ්ඤානි අපි දූසිතවත්ථූනි, තානි පවාහෙන වුය්හමානානි දූරතරමපසාරයන්ති නදී කුන්නදියො.

අස්මිං කාලෙ කස්සකා කෙදාරෙසු ධඤ්ඤානි වපන්ති. ධඤ්ඤසදිසං අපරං කිම්පි බීජං න විජ්ජතෙස්මිං භූතලෙ. නීපපලලවගුම්බන්තරවිජම්භිතානි ධූසරකිඤ්ජක්ඛමයානි කුසුමානි. පබුද්ධ කෙතකීකුසුමානි ච සුඛුමපරාගෙ මාරුත සහායෙන එකමගා අඤ්ඤං තතො පි අඤ්ඤං වාහයන්ති.

---

## 3 ගො.

ගෙහපාලිතෙසු පසූසු ගො එව මනුස්සානං අතිපයොජන භූතො ජන්තු. අයං හි වයං අනුප්පත්තො උච්චතො තිහත්ථ පරිමිතො දීඝතො පඤ්චහත්ථපරිමිතො; අසෙසාපරිතකුනො, දීඝනායගග යුත්තො පුච්ඡො. නාතිරස්සා ද්වෙ කණ්ණා. ද්වෙ සිඞ්ගානි. චත්තාරි චරණානි. ද්වෙ දලිතා ඛුරා. අයං පටිකඛණ සෙවාගං කණ්ණලාඞ්ගුලවාලෙනෙහි තථා දෙහකම්පනෙන ච මක්ඛිකානං ඩංසනතොහි අත්තානං රක්ඛති. රොමන්ථායමානො භූමිමධිසයිත්වා සෙසකාලං ඛෙපයති.

අයං පසු ඉත්ථිපුම්භෙදෙන විවිධො වත්තතෙ. පුරිස ජාතිකස්මිං අණ්ඩච්ඡෙදනං කත්වා සකටාකඩ්ඪනෙ, හලචාලනෙ තථාඤ්ඤෙසුපි කම්මෙසු නියොජයන්ති කස්සකා.

අපරා ඉත්ථිජාතිකා ගො ගබ්භං ගණ්හිත්වා දසමාසච්චයෙන සාවකං විජායිත්වා වස්සමෙකං දුද්ධං දදාති. අතීව අධික මත්තං. බාලානං තං පධානං භොජනං. එවම්පි බලහීනස්ස, තථා රොගිනො ච පරමහිතකරං දුද්ධං. සුස්සුතාදීහි මහෙසීහි පසංසීයතෙ දුද්ධං. තථාහි;

“අන්නාදෂ්ටගුණං පිෂ්ටං
පිෂ්ටාදෂ්ට ගුණං පයඃ” ඉච්චාදි.

අයං පසු සෙතකණ්හාදි විචිත්තවණ්ණො. කම්මාසවණ්ණොපි භවති. පධානතො පසවයං සස්ස තිණ පිඤ්ඤකාදීහි ආහාරෙන ධාරයති පාණෙ.

ගොදුද්ධතො දධි-නවනීතාදී පඤ්ච ගොරසෙ උප්පාදෙත්වා සක්කරාදිඉට්ඨවත්ථූහි මිස්සෙත්වා විවිධාඛජ්ජවිකතී තෙ සම්පාදීයන්තෙ කුසලෙහි.

එවං ගොමුත්තං, ගොමයං, ඛීරං, දධි, සප්පි ඉති පඤ්ච ගව්‍යානි දෙවපූජාදිමඞ්ගලකිච්චෙසු යොජෙන්ති සනාතනා ආචරියා. කාලුසභූමි ගොමයෙන විසුජ්ඣතීති පසිද්ධි ලොකෙ දිස්සතෙ. තා ච විවිධාකාරෙන සාරෙන්ති සන්තා.

එකෙ ගොමයං ආතපෙ සුස්සෙත්වා අග්ගිං ජාලෙත්වා අන්නං පචන්ති. කෙචි සස්සවඩ්ඪනත්ථං ඛෙත්තෙ යොජයන්ති. ගොමුත්තං නානාරොගාභිපීළිතස්ස පරමොසධං. ගොචම්මෙන පාදුකාදයො කරොන්ති චම්මකාරා. ගො මාතුයා සදිසාති මඤ්ඤන්තෙ භාරතීයෙහි.

“ගවී ධාත්‍රී තථා පෘථ්වී බ්‍රාහ්මණී රාජ පත්නිකාඃ
ආත්ම මාතා ගුරොඃ පත්නී සප්තෛතා මාතරඃ ස්මෘතාඃ”
තථාපි චණ්ඩාලා තං මාරෙත්වා සොදරං පූරයන්ති.

---

## 4 කාලො.

කාලො හි ඛණ ලය මුහුත්ත ඝටිකා දිවස පක්ඛ මාස සංවච්ඡරාදී භෙදෙන බහුධා විභජීයන්තෙ පණ්ඩිතෙහි. සබ්බෙ ඛලු පාණිනො කාලවසෙන ආවි භවන්ති, තිරො භවන්ති, සන්තිට්ඨන්ති ච. තස්මා කාලං තුච්ඡං න යාපයතු. යො තං ආලසියෙන කාලං නයති සො ලොකෙ වුද්ධිං වෙපුල්ලං න යාති. පරං යාවජීවං දුක්ඛමනුභවති ච.

එවම්පි ච සංසාරස්මිං න තාව එකොපි බහුවිධෙන ධනෙන මධුරවචනෙන කිත්තනෙන ජීවන යොබ්බන විනිමයෙන ච අඩ්ඪමුහුත්තමපි ඛණං නාමත්තනො වසං නෙතුං සමත්ථො'ති.

දෙවා අපි ච කාලවසෙන උප්පාද ඨිති භංගාදි කිච්චානි කුබ්බන්ති. පුනපි තස්මිං එව විපජ්ජන්ති. උත්තං හි විඤ්ඤූනා :

"යෙ සමර්ථා ජගත්‍යස්මින් සෘෂ්ටිසංහාරකාරිණඃ
තෙ'පි කාලෙන ලීයන්තෙ කාලො හි බලවත්තරඃ" ඉති;

යො එව කාලස්ස ගතිං ජානාති, සො හි විජ්ජාගහණෙ, ධම්ම සෙවනෙ, අත්ථසංරක්ඛණෙ ච පහවති. ලොකානං අසෙස සම්පත්තියා ච සමන්නාගතො භවෙය්‍ය. සතතං උන්නතිකාමී යසොභිලාසී ධීමා අඩ්ඪමුහුත්තමපි කාලං තුච්ඡං නාතික්කමති. උත්තං හි :-

"කාලමූලමිදං සර්වං භාවාභාවෞ සුඛාසුඛෙ,
කාලඃ සෘජති භූතානි කාලඃ සංහරතෙ ප්‍රජාඃ
කාලඃ සුප්තෙෂු ජාගර්ති කාලො හි දුරතික්‍රමඃ" ඉති,

අයමෙව කාලස්ස ගති.

---

## 5 ආරෝග්‍යං.

සරීරස්ස නිරාමයභාවො ආරොග්‍යසද්දෙනොපදිස්සතෙ. තමාරොග්‍යං සුඛස්ස නිදානං, තං නිරාමයසම්බන්ධිතං විවිධ නියමානං සම්මා පරිපාලනෙන සම්පජ්ජතෙ. 'තෙපි නියමා වායාමාදිසරීරහිතසාධනානුච්චන්තා.

තථාහි :-

"ව්‍යායාමොපි සදා පථ්‍යො බලිනාං ස්නිග්ධභොජිනාම්
සමශීතෙ වසන්තෙ ච තෙෂාං පථ්‍යතමඃ ස්මෘතඃ
ලාඝවං කර්ම සාමර්ථ්‍යං ස්ථෛර්‍යං ක්ලෙශ සහිෂ්ණුතා
දොෂක්ෂයොග්නි වෘද්ධිශ්ච ව්‍යායාමාදුපජායතෙ.

න ච ව්‍යායාමිනං මත්‍ර්‍යං මර්දයන්ත්‍යරයො බලාත්
න චෛනං සහසාක්‍රම්‍ය ජරා සමධිගච්ඡති.”
ස ච ව්‍යායාමො මත්තාය පතිදිනමෙව කරණීයො
තෙන සරීරස්ස බලං වුඩ්ඪි හානී ච උප්පජ්ජන්තෙ
තථාපි වායාමො අධික මත්තාය නො විධෙයො. තෙන
සරීරස්ස හානි ජායතෙ.

උත්තං හි චරක සංහිතාය :-

“ශරීරචෙෂ්ටා යාචෙෂ්ටා ස්ථෛර්‍ය්‍යාර්ථා බලවර්ධනී
දෙහව්‍යායාම සංඛ්‍යාතා මාත්‍රයා තං සමාචරෙත්.
ශ්‍රමඃ ක්ලමඃ, ක්ෂයඃ තෘෂ්ණා රක්තපිත්තප්‍රතාපකඃ
අතිව්‍යායාමතඃ කාසො ජ්වරඃ ඡර්දිශ්ච ජායතෙ
ව්‍යායාම හාස්‍යභාෂ්‍යාධ්ව ග්‍රාම්‍යධර්මප්‍රජාගරාන්
නොචිතානපි සෙවෙත බුද්ධිමානතිමාත්‍රයා.” ඉති.

තථා ආහාර විසයෙසුපි සදා සංයමිතා භවිතබ්බං, යමාහාරං නිජපකත්‍යනුසාරං හිතං භවෙය්‍ය තං භුඤ්ජිතබ්බං, අඤ්ඤථා රොගා සංජායන්ති. භෙසජ්ජෙහි පි තෙ නාසයිතුං න සක්කොන්ති.

උත්තං හි ලොලිම්බරාජෙන :-

පථ්‍යෙ සති ගදාර්තස්‍ය කිමෞෂධනිෂෙවණෛඃ.” ඉති.
අධිකභොජනං සදත්තහිතෙසී වජ්ජනීයං, තථාහි අති භොජනං රොගමූලං, අප්පායුකකරං, තස්මා අතිභොජනම්පි වජ්ජෙතු.” ඉති.

තාවදෙව භුඤ්ජිතබ්බං යාව සුඛං ච පරිපාකං ච ගච්ඡති. පරිපාක ගතමන්නං පීයූසමිව ඵලමාතනොති. තථාහි:-

“රසො භවති සම්පක්වාදපක්වාදමසම්භවඃ
වහ්නෙබිලෙන මාධුර්‍ය්‍යං ස්නිග්ධතං යාති සද්‍රසඃ,
පුෂ්ණාති ධාතූනඛිලාන් සම්‍යක් පක්වාමෘතොපමඃ
තථා මන්දවහ්නි විදග්ධශ්ච කටුශ්චාම්ලො භවද්‍රසං
විෂභාවං ව්‍රජෙද්වාපි කුර්‍ය්‍යාද්වා රොග සඞ්කරම්.” ඉති.

අපරං, තථා එව රිත්තකප්පදෙසෙ පවිසන්තො වාතො සෙවනීයො. වායො එව හි සබ්බෙසං භූතානං ආධාරො.

පාණීනඤ්ච පගෙව. සච සුවිසුද්ධො නිසෙවිතො විකාරගතිං භස්මං කරොති. සිරාසු සන්නිහිතං සොණිතං සොධයති. දෙහස්ස පටිභාගං සන්ධාරයති. චෙතං පසාදයති. මනසො අකම්මඤ්ඤං දූරමපනයති.

තථා පච්චාහං සඤ්ඣාපභාතික සමීරණසෙවනං. මත්තානුරූපො වායාමො, විමලෙහි ජලෙහි නහානං, පරිසුද්ධ වත්ථධාරණං, කීට පඞ්ක ධූලි ලූතාජාලාදි විවජ්ජිත ගෙහෙ වාසො, ඉත්‍යාදීනි යුත්තානං න කදාචි නිරාමය සම්පත්ති හානාය. රොගාපි තෙසං න සම්භවන්ති.

---

## 6 විනයො

විනයො නාම චෙතනානං විනයවෙගසඤ්ජාතො ධම්මවිසෙසො ස බලු සබ්බෙසු එව ගුණගණෙසු ගරුතරො. තෙන පරිහීනො නානාවිධගුණ මණ්ඩිතොපි විචක්ඛණො පරිභාසනාමාවහති ලොකානං.

යෙහි ගුණගණෙහි මනුස්සා ලොකෙ'ස්මිං සෙට්ඨපදවිං භජන්ති රිතෙ ච විනයං, තෙ හි තෙසං අනනුචිත මෙව ඤ්ඤපයන්ති. විනයී සබ්බාසු ගතීසු තථා සුඛෙසු දුක්ඛෙසු වා තුල්‍යරූපෙනාකඩ්ඪන්ති පරෙසං මානසබලං.

ස ච විජ්ජාය තථා ධනෙන විච්චුතොපි නිජාසාධාරණ විනයගුණෙන පරෙ විනෙත්වා සබ්බථා අත්තනො වසමානෙතුං පභවති. සදෙසෙ ච විදෙසෙ ච තස්ස සමානොව අධිකාරො.

යදි විනයහීනස්ස සන්ත්‍යපි විවිධ ගුණ ගණා, තථාපි අපරිමෙය්‍යානි ධනානි; තථාපි තෙ හි කෙවලං මුධා එව, කිංසුකකුසුමානීව දූරතො එව සම්පාදයන්ති. ඔලොකෙන්තානං නයනානන්දකාරං විනයවජ්ජිතං නරං උද්ධුම රූපමිව පරිකප්පෙන්ති සජ්ජනා.

යථා ඉත්ථිගුණවත විවජ්ජිතා ලලනා මහග්ඝරත්නාලඞ්කාර විමණ්ඩිතාපි න සුඛයති තෙසං චාපි මනං; පරං නිජ අවිනයතාය පදෙ පදෙ සමාවහති දුක්ඛං. විනයොහි න කම්පි ලඞ්ඝයති. න උන්නායති.

පරං සබ්බාසු වෙලාසු සමඟතිමෙව ඝටයති.
“ගෞරවං ගුරුෂු ස්නෙහං නීචෙෂු ප්‍රේම බන්ධුෂු
දර්ශයන් විනයො ධර්මඃ සර්වප්‍රීතිකරො භවෙත්.”
එසා විනයිනො ගති. සබ්බෙහි විනයො ගරුකාතබ්බො.

---

## පාලියෙන් කථාකිරීම.

I

පිතා – කුමාර, අජ්ජ පාඨාලයෙ තයා කිම්පි නින්දිතං කම්මං කතන්ති අස්සොසිං, සච්චං නු තං?

පුත්තො – තාත, තං සච්චමෙව; කින්තු, පඨමං අරියදාසො මං අනින්දි; පච්ඡාහං තම්නින්දිං; සො මං පහරි; අහ මුච්චං අක්කොසිං; සොපි අක්කොසි.

පි – තදා ආචරියො කිං නාකොසි?

පු – ආචරියො අහොසි පාඨයං, අම්හාකං විතානං අක්කොසසද්දං සුත්වා අතීව කුපිතො අහොසි.

පි – කුපිතො කිමකරි?

පු – සො තුවටං ආසනම්හා උට්ඨාය අම්හාකං සන්තිකං ආගතො;

පි – තතො කිං අකාසි?

පු – තතො ආචරියො අරෙ හත්ථං පසාරය, ඉති අරියදාසං අවොච. අරියදාසො තථා අකාරි. එවං අරියදාසෙන හත්ථෙ පසාරිතෙ සො වෙත්තලතාබණ්ඩයා අතාළෙසි.

පි – අමරපාල, මෙසෙසද තයාපි නින්දිත කම්මස්ස තාදිසං ඵලමනුභූතං;

පු – තාත, මමාචරියො ‘හත්ථං පසාරය’ ඉති අවොච. තාහං පසාරයිං;

පි – රෙ, ආචරියස්ස ආණා තයා න කතා, දුට්ඨො’සි, තිබ්බං දණ්ඩං අරහසි, හොතු තතො කිං?

පු - තතො ආචරියො කොධාභිභූතො පොත්ථකානි ගහෙත්වා, ඝරං ගච්ඡ ඉති අවොච. අහං දණ්ඩභීතො තුවටං තතො නික්ඛමිං.

පි - අරෙ, දුට්ඨ, තිට්ඨ; දණ්ඩභයෙන තතො නිග්ගතො ත්වං ඉත දිගුණං දණ්ඩං ලභිස්සසි.

පු - තාත, අයමෙකො අපරාධො; ඛමතු, ඉතොපරං න එවං කරිස්සාමි.

පි - කුමාර, තව විනයෙන සච්චවචනෙන ච තුස්සාමි. ඉතොපරං ඊදිසානි කම්මානි මාකුරු; ආචරියදෙවො භව, සතං බාලකානං මග්ගමනුයාහි.

---

II

පුත්තො - අම්ම, කොයං,
මාතා - පුත්ත, යාචකොයං,
පු - යාචකො කිං? කරොති,
මා - යාචකො භික්ඛං යාචති, යාචනෙන කුච්ඡිං පූරයති.
පු - කෙන සො කම්මං න කරොති.?

මා - පුත්ත, එස අලසො, ආලසෙන බාලකාලෙ පාඨාලයං මගන්ත්වා කාලමතයි. තෙන කිඤ්චිපි කම්මං න පරිචිතං,

පු - අජ්ඣයනෙන කථං ජීවිකා සම්පජ්ජතෙ,

මා - විජ්ජාය කිං න සිජ්ඣති, බුද්ධිමන්තා ජනා සමත්ථා භවන්ති සබ්බෙසු කම්මෙසු.
තෙන තෙ සුඛං ජීවන්ති,

පු - භවතු, සො යාචති, කිං ඉමස්ස පච්චාහං ආහාරං ලබ්භතෙ?

මා - කදාචි ලබ්භතෙ, කදාචි න ලබ්භතෙ, යදා මනුස්සා ආහාරං න දෙන්ති. තදා අඤ්ජලිං පග්ගය්හ පාදෙසු නිපතිත්වා මනුස්සෙ යාචති. යදි තථාපි න ලභෙය්‍ය, ඛුදාභිභූතො කත්ථචි ගන්ත්වා චොරෙති.

පු - කිං, රාජපුරිසා චොරෙ න ගණ්හන්ති ?

මා - සචෙ රාජපුරිසා පස්සන්ති තෙ ගණ්හන්ති, සඞ්ඛලිකාය බන්ධන්ති.

පු - අම්ම, සචෙහම්පි බාල්‍යෙ සිප්පං න උග්ගණ්හෙය්‍යං, මයාපි නනු යාචිතබ්බං? කා කථා? භවිතබ්බං;

මා - එවමහං සුවෙප්පභුති පාඨාලයං ගමිස්සාමි. සිප්පං උග්ගණ්හිස්සාමි;

III

[1]මද්දළො - සඛෙ, අපි කුසලං භවතො? අස්මිං දෙසෙ කා පවත්ති?

[2]උලූඛලො - මිත්ත, අස්මිං දෙසෙ මං විහාය සබ්බෙ'පි කුසලිනො එව, අහං පරමප්පසුඛො.

ම - කුතො ත්වමප්පසුඛො, කො තෙ දුක්ඛහෙතු?

උ - සඛෙ, කිං වදාමි, තථාපි සුණාතු, දුග්ගතස්ස මෙ සීසෙ: ධඤ්ඤානි නිධාය ඉත්ථියො පුරිසා ච නිද්දයා මං තාළයන්ති. කෙචි අයො දණ්ඩෙනාපි මං පහරන්ති. ඉත්ථං පතිදිනං මහන්තං දුක්ඛමනුභවාමි. කිමිතොපරං දුක්ඛං භවෙය්‍ය.

ම - මිත්ත, අහං ත්වත්තොපි අප්පසුඛො, ත්වං සීසෙ එව තාළීයසි. මං තු තාළෙන්තෙ කුසලා ජනා උභයපස්සෙපි හත්ථෙහි තාළෙන්ති. විසෙසතො විවාහුස්සවාදීසු සභාමජ්ඣෙ තිබ්බං තාළයන්තො මං නින්දන්ති. න එකොපි මමනුද්දයාවති. සබ්බෙපි සන්තුට්ඨා සීසං කම්පයන්තො මම තාළනමභිනන්දන්ති. කා අඤ්ඤස්ස කස්ස වා භවෙය්‍ය ඊදිසං දුක්ඛං.

ලොකෙ හි අඤ්ඤස්ස දුක්ඛං අඤ්ඤො න ජානාති.

---

1 බෙරය, 2 වංගෙඩිය.

IV

'කුත්‍ර දිස්සතෙ සූරියො?
'ආකාසෙ,'
'කුත්‍ර දිස්සතෙ චන්දො?
'ආකාසෙ,'
අත්ථි කිඤ්චි අඤ්ඤං ආකාසෙ?
අත්ථි එව මෙඝො;
අථ කීදිසො අස්ස වණ්ණො?
අසිතො,
කිං ගච්ඡති මෙඝො ජනානං?
ජලං,
කිමෙතං?
සක්කස්ස ධනු,
කීදිසො අස්ස ආකාරො?
අඩ්ඪවට්ටුලො,
කීදිසො අස්ස වණ්ණො?
විචිත්තවණ්ණො, අත්‍ර සන්ති රත්ත, පීත, නීල,
හරිත, කුසුම්භ, පාටල වණ්ණා;
කෙ ඉමායො?
තාරකායො, එතායො අසංඛ්‍යතා විජ්ජන්ති.
කථම්ව දිප්පන්ති එතායො තාරකායො,
මුත්තායො විය ආකාසෙ සොභන්ති
තාරකායො,

V

සඛෙ! කිමෙතං?
පඤ්ජරො'යං,
කථන්නු නිම්මිතො එස පඤ්ජරො?
ලොහස්ස සලාකාහි,
කෙන නිම්මිතො එස පඤ්ජරො?
ලොහකාරෙන,

කො නාමො ඛගො අස්මිං පඤ්ජරෙ වසති?

අයං සුකො,

කිමිති එස අත්‍ර ආගච්ඡති වසති ච?

අත්‍ර න ආගච්ඡති අයං සයං එව; කින්තු ජනා එතං
ගණ්හන්ති පඤ්ජරෙ ච වාසයන්ති.

අහො නිද්දයතා ජනානං, ඉමං කාතරං ඛගං අකාරණං
එව පීළයන්ති තෙ,

එතං ජනානං කම්මං න අකාරණං භවති. අපි එව,

අත්‍ර කිමපි කාරණං විනා න කාරියං පභවති.

න ගණ්හන්ති ජනා වායසං, චටකං, ගිජ්ඣං වා;

භවතු, කිමත්ථං තෙ සුකං ගණ්හන්ති?

එතං තාවයා අඤ්ඤාතං, කථය කීදිසො වණ්ණො සුකස්ස?

හරිතො ඛලු; පරං තස්ස කණ්ඨං පරිතො රත්තා රෙඛා
වත්තතෙ, චඤ්චු ච ආරත්තා;

කීදිසො වණ්ණො වායසස්ස?

කණ්හො, පස්ස, චඤ්චු ච කණ්හා;

අථ කස්ස රූපං රුචිරං?

ධුවං සුකස්ස, නතු වායසස්ස;

කීදිසො සරො වායසස්ස?

කක්කසො, තස්ස සරො මං න ආනන්දයති;

කීදිසො සරො සුකස්ස?

සුකස්ස සරො මධුරො, සො මං ආනන්දයති;

පස්ස, අයං සුකො තානි තානි නාමානි පඨති;

අථ කො පාඨයති ඉමං?

අස්ස පාලකො ඛලු;

---

# ඡන්දෝවිෂය.

පද්‍යයන්ගේ අක්ෂර නියමය ඡන්දස් නම්. එය මාත්‍රා ඡන්දස් වර්ණ ඡන්දස් වශයෙන් දෙපරිදි වේ. මේ සකල ඡන්දස් ශාස්ත්‍රය වනාහි, "ම, ය, ර, ස, ත, ජ, භ, න, ග, ල" යන දශාක්ෂරයකින් වැසී පවතී.

මෙයින් 'ම, ය, ර, ස, ත, ජ, භ, න' යන අටදෙන වර්ණ ඡන්දස් විෂයෙහි ද, 'භ, ජ, ස, ග, ල' යන පස්දෙන මාත්‍රා ඡන්දස් විෂයෙහි ද බල පවත්වති. මේ ශාස්ත්‍රයෙහි මොවුහු ගණ නමින් ව්‍යවහාරයට පැමිණෙති. 'ගණ' යනු සමූහයකට කියනු ලබන නමකි. යටත්පිරිසෙයින් සමූහයක් තිදෙනකුගෙන් පරිමිත විය යුතුය. එහෙයින් ගණයකට අකුරු තුණක් ය යන සම්මතය විය. මධ්‍යා ඡන්දස ප්‍රස්තාර කිරීමෙන් ලැබෙන වෘත්ත අට මෙහිදී ගණ වශයෙන් සලකති. එහි ගුරු ලඝු සිටින පරිදි මෙසේ දතයුතුය.

| | | | |
|---|---|---|---|
| ⌞ ⌞ ⌞ | මගණ | ⌞ ⌞ — | තගණ |
| — ⌞ ⌞ | යගණ | — ⌞ — | ජගණ |
| ⌞ — ⌞ | රගණ | ⌞ — — | භගණ |
| — — ⌞ | සගණ | — — — | නගණ, |

මෙයින් ම න භ ය යන සතර ගණය ඉටුගණ නමැයි ද ජ, ර, ස, ත යන සිවු ගණය අනිටු ගණ නමැයි ද පඬුවෝ දක්වති. මෙහි දක්වන ලද ප්‍රස්තාරයෙන් ඒ ඒ ගණවල ගුරු ලඝු සිටින අයුරු සිතේ තබාගත යුතුයි.

මෙසේ දීර්ඝ වූ හෝ හ්‍රස්ව වූ හෝ මිශ්‍ර අකුරු තුණකින් සමන්විත වූ ගණය වර්ණ ඡන්දස් නම් වේ.

මාත්‍රා ඡන්දසේ ගණයකට මාත්‍රා සතරකි. හ්‍රස්වයකට මාත්‍රා එකකි. ගුරකට මාත්‍රා දෙකකි. ගුරු අකුරු දෙකකින් හෝ හ්‍රස්ව අක්ෂර සතරකින් හෝ එක් ගුරකින් හා හ්‍රස්ව දෙකකින් හෝ යුක්තවූයේ මාත්‍රා ඡන්දස්හි ගණයකි. මාත්‍රා ගණන් කිරීමේදී දීර්ඝ අක්ෂරයකට මාත්‍රා දෙක බැගින් ද හ්‍රස්ව අක්ෂරයකට මාත්‍රා එක බැගින් ද සලකා ගණන් කළ යුතුයි. ලඝුවකට සෘජු ඉරක් ද ගුරකට වක් ඉරක් ද යොදනු.

"කාරුණා සීතල හදයං/ පඤ්ඤාපජ්ජෝත විහත මෝහ තමං
- - ∟ / ∟ - - / - - ∟ / ∟ ∟ / ∟ ∟ / - - - - / ∟ - - /∟
සනරාමර ලෝකගරුං / වන්දෙ සුගතං ගති විමුත්තං"
- - ∟/- - - ∟ / - - ∟ / ∟ ∟/- - ∟ / -/- - ∟ / ∟ /

මෙහි ගුරු ලඝු වෙන්කොට තිබෙන අයුරු සලකනු. මෙය මාත්‍රා ඡන්දස්වලට අයත් හෙයින් මෙහි මාත්‍රා හතරක් ගණයකි. ප්‍රථමාර්ධයේ ගණ හතක් හා අන්තයෙහි ගුරක් තිබේ. ද්විතීයාර්ධයෙහි එසේම ගණ හතක් හා ගුරකි. මෙහිදී ප්‍රථමාර්ධයෙහි සවන ගණය සර්වලඝුගණයක් හෝ ජගනයක්වීම ද ද්විතීයාර්ධයෙහි සවන ගණය හුදුලඝුවක් වීම ද විශේෂයෙන් සිහියේ තබාගත යුතුයි. මේ ලක්ෂණවලින් යුක්තව බැඳුනු ඒ පද්‍ය ආර්යාවෘත්ත සඞ්ඛ්‍යාවට අයත් වේ.

1 ප්‍රථමාර්ධ ද්විතීයාර්ධ දෙක්හි මුලින් පිහිටි ගණ තුණින් යති පිහිටි කල්හි ඒ වෘත්තය පථ්‍යාර්යා නම්. මෙහි ප්‍රථමාර්ධයෙහි මාත්‍රා 30 කි. ද්විතීයාර්ධයෙහි මාත්‍රා 27 කි. සම්පූර්ණ පද්‍යයෙහිම මාත්‍රා 57 කි. මෙම වෘත්තයක් බැඳීමට වුව මනා වන අඩුම අකුරු ගණන 30 කි. වැඩිම අකුරු ගණන 55 කි

2 යත්‍රෝභයත්තය ලුල්ල ඩිසියො/හ:ත්‍රාදිමො හවෙ විපුලා."
◡ - - / ◡ - - / ◡ ◡ / - ◡ - / ◡ ◡ /- ◡ - / ◡ - - / ◡."
සාමාන්‍ය ආර්යා ලක්ෂණ මෙහි ද පෙණේ. එහෙත් පථ්‍යාර්යා ලක්ෂණවලට වඩා ස්වල්ප වෙනසක් ඇත. එනම් උභයාර්ධයෙහි ම ගණ තුණෙන් යතිය නො සිට සිවුවෙනි ගණය මැද යති පිහිටීමයි. එසේ හෙයින් මේ වෘත්තය විපුලාර්යා නමු.

3 ගුරුමජ්ඣගා ජකාරෝ/ චතුත්ථකො දුතියකො චපලා.
- - ◡/ - ◡ - / ◡ ◡ / - ◡ - / ◡ - - / - / ◡ - - / ◡
සම්පූර්ණ පථ්‍යාර්යාලක්ෂණ ඇතිව උභයාර්ධයෙහි ම දෙවෙනි සතරවැනි ගණ ජගණ වෙත්නම් එය චපලාර්යා නමු.

4 චපලාගතා බිලං වෙ / දලාදිමං ලක්ඛණං භජති යස්සා

– – ◡ – ◡ – ◡ ◡ – ◡ – ◡ ◡ – ◡ – – – ◡ ◡

පථ්‍යා ලක්ඛණ මඤ්ඤං / මුඛචපලා නාම සා භවති[1]

◡ ◡ ◡ – – ◡ ◡ – – – – ◡ ◡ – ◡ – – ◡

මෙය සකල පථ්‍යා ලක්‍ෂණයන්ගෙන් අනුගතය. එහෙත් ප්‍රථමාර්ධයෙහි දෙවෙනි සිවුවැනි ගණ ජගණ වූහ. එහෙයින් මෙය මුඛචපලා නමු.

5 පථ්‍යාය ලක්ඛණං වෙ / පඨමඩ්ඪෙ ලක්ඛණතො චපලාය

◡ ◡ – ◡ – ◡ ◡ – – ◡ ◡ ◡ – ◡ – – – ◡ ◡

දුතියෙ දලෙථ යස්සා / පකිත්තිතා සා ජඝනචපලා.

– – ◡ – ◡ – ◡ ◡ – ◡ – ◡ – – – – – – ◡

පථ්‍යාර්‍යා ලක්‍ෂණයන්ගෙන් යුත් යම් පද්‍යයක් ද්විතීයාර්ධයෙහි දෙවෙනි සතරවෙනිවූ ගණ ජගණ නම් එය ජඝන චපලා නමු. මේ පථ්‍යා, විපුලා, චපලා, මුඛචපලා, ජඝන චපලා යන පඤ්චවිධ ආර්‍යාවන්ගේ ලක්‍ෂණයි.

6 සබ්බං පඨම දලෙ යදි—ලක්ඛණ මරියාය වුත්තමුභයෙසු යස්සා දලෙසු යුත්තං—වුත්තා සා ගීති වුත්තයති ලලිතා ආර්‍යාපූර්වාර්ධලක්‍ෂණ යම් පද්‍යයක උභයාර්ධයෙහිම පෙනේ නම් ඒ වෘත්තය ගීති නමි. මෙහි මාත්‍රා 60 කි.

7 අරියායං දුතියඩ්ඪෙ — ගදිතංලක්ඛණංයංතං භවති දලෙසුභයෙසුපි — යදි යස්සා සා සමුපගීති, ආර්‍යාද්විතීයාර්ධයෙහි ලක්‍ෂණ යම් පද්‍යයක උභයාර්ධයෙහි ම පෙනේ නම් ඒ වෘත්තය උපගීති නමු. මෙහි මාත්‍රා 54 කි.

8 අරියායද්ධමිතයං — පුබ්බොදිත ලක්ඛණූපෙතං විපරියයෙ යාභිහිතං —යස්සා සම්භවති චෙහ සොග්ගීති, ආර්‍යාපූර්වාර්ධලක්‍ෂණ ද්විතීයාර්ධයෙහි ද, ආර්‍යාද්විතීයාර්ධ ලක්‍ෂණ ප්‍රථමාර්ධයෙහි ද යම් පද්‍යයක පෙනේ නම් ඒ වෘත්තය උග්ගීති නමු. මෙහි මාත්‍රා 57 කි.

---

1 පාදාන්තයෙහිවූ ලඝුව ගුරු වශයෙන්ද ඡන්දශ්ශාස්ත්‍රඥයෝ සලකති.

9 ආරියා පුබ්බද්ධං යදි — ගුරුතෙකෙනාධිකෙන
නිධනෙ යුත්තං
යදි පුබ්බද්ධ සමානං — දලම්තරඤ්චාදිනාරියාගීති
ආර්‍ය්‍යාපූර්වාර්ධයෙහි අගට තවත් ගුරක් එකතු කිරීමෙන්
ඇති වූ ලක්‍ෂණ යම් පද්‍යාර්ධක දෙ අර්ධයෙහිම පෙණේ නම්
ඒ වෘත්තය අරියාගීති නම්. මෙහි මාත්‍රා 64 කි.

මේ ගීති ලක්‍ෂණයි.

---

10 වක්ත්‍රයන්ගේ පාදයකට අකුරු අටකි. මෙහි මුලඅකුර
හා අගඅකුර කැමැති සේ යෙදිය හැකිය. මුලඅකුරව
අගින් ම, භ, ය, ජ, ර, ත යන ගණවලින් කැමැති
එකක් ද, ඉක්බිති යගණය ද, ඉක්බිති තවත් අකුරක් ද
යොදනු. මේ ලක්‍ෂණ සතරපාදයෙහි ම වූ කල ඒ
වෘත්තය වක්ත්‍ර නමි.

11 පළමුවෙනි තුන්වෙනි පාද වක්ත්‍රලක්‍ෂණවලින් ද, දෙවෙනි
සතරවෙනි පාද අකුරු සතරකින් පරව ජගණයෙන් ද
ඉක්බිති අක්‍ෂරයකින් ද බැඳුනු කල ඒ වෘත්තය පථ්‍යා
වක්ත්‍ර නම්.

12 විනා වණ්ණෙහි මත්තා හා — විනා වණ්ණා ගුරූහි තු
විනා ලහූහි ගුරවො — දලෙ පථ්‍යාදිනො මතා,
මාත්‍රා වෘත්තයන්හි නියමිත මාත්‍රා ගණනින් පෙන්වූ
අකුරු ගණන අඩු කළ කල්හි ඉතිරිවෙන්නේ එහි ගුරු
අකුරු ගණනය. නියමිත මාත්‍රා ගණනින් පෙන්වූ
ගුරු අකුරු අඩු කළ කල්හි ඉතිරිවන්නේ එහි අකුරු
ගණනය. නියමිත මාත්‍රා ගණනින් පෙන්වූ ලඝුගණන
අඩුකොට දෙකට බෙදූ කල්හි ඉතිරි වන්නේද ගුරු
ගණනය.

පථ්‍යාර්‍ය්‍යාවෙහි නියමිත මාත්‍රා ගණන 57 කි. අකුරු
30 කින් බැඳි ආර්‍ය්‍යාවෘත්තයක ගුරු අකුරු කෙතෙක්
දැයි ඇසූ කල්හි, නියමිත මාත්‍රා ගණන වූ 57 න් 30 අඩු

කරණු. එකල ලැබෙන්නේ. (57-30)=27 කි. ඒ එහි පැමැති ගුරු අකුරු ගණනය. මේ ක්‍රමයෙන් සෙසු තන්හි ද දතයුතුය.

## වර්ණ ඡන්දස්.

පාදයක එක අකුරේ පටන් අකුරු 26 බැගින් ඇති ඡන්දස් සවිස්ස වර්ණ ඡන්දස් නම්. ඒවායේ පිළිවෙළින් නම් මෙසේය.

එක් පාදයක එක අකුර බැගින් පාද සතරෙහි අකුරු සතරක් ඇති උක්තා ඡන්දස, පාදයක අකුරු දෙක බැගින් ඇති, අත්‍යුක්තා ඡන්දස, පාදයක තුන බැගින් ඇති මධ්‍යා ඡන්දස; (මත්තෙහිද අකුරු ගණන ක්‍රමයෙන් මෙසේ වැඩේව. මින් මතු අපි පිළිවෙළින් නම් පමණක් දක්වන්නෙමු.) 4 ප්‍රතිෂ්ඨා, 5 සුප්‍රතිෂ්ඨා; 6 ගායත්‍රී, 7 උෂ්ණිහ්, 8 අනුෂ්ටුප්, 9 බෘහතී, 10 පංක්ති, 11 ත්‍රිෂ්ටුප්, 12 ජගතී, 13 අතිජගතී, 14 ශක්වරී, 15 අතිශක්වරී, 16 අෂ්ටි, 17 අත්‍යෂ්ටී, 18 ධෘති, 19 අතිධෘති, 20 කෘති, 21 ප්‍රකෘති, 22 ආකෘති, 23 විකෘති, 24 සංකෘති, 25 අතිකෘති, 26 උත්කෘති යන මොහු වෙත්.

බෙ,දෙ, වි,පය්,තී,සු, ප,වී,ත්‍රි,යා,න, = 11
තස්මා න දිඝපපනතිං හජෙය්‍ය = 11
පඤ්ඤානුයාතං විරියං වදන්ති = 11
සබ්බත්ථ සිද්ධිගගනණ්ණගහහත්ථං, = 11

මෙහි පාදයකට අකුරු 11 කි. එබැවින් මෙය ත්‍රිෂ්ටුප් ඡන්දසට අයත් වේ.

මෙතැන් සිට ත්‍රිෂ්ටුප් ඡන්දසේ පටන් වෘත්ත සමහරක් දක්වනු ලැබේ. එහෙත් එහි දක්වෙන්නේ එක් එක් පාදය බැගිනි. එවැනි පාද සතරක් වූ කල සම්පූර්ණ පද්‍යය සිදු වේ. ඒවායේ ගුරු ලඝු සිටින පරිදි සිහියේ තබාගත යුතුයි.

## ත්‍රිෂ්ටුප් 11

ඉන්ද්‍රවජ්‍රා- ඉන්දිකා තා වජිර ජගා ගො, (ත, ත, ජ, ගු, ගු)[1]

උපෙන්ද්‍රවජ්‍රා- උපාදිකා සාවජතා ජගාගො. (ජ, ත, ජ, ගු, ගු)

උපජාති- එක පද්‍යයේ ම ඉන්ද්‍රවජ්‍රා, උපෙන්ද්‍ර වජ්‍රා දෙක කවලම් වීමෙන් මෙය සෑදේ.

සො පණ්ඩුරජාපත දිට්ඨිජාලං (ඉන්ද්‍ර)
චිරානුබද්ධං අපරිච්චජන්තා (උපෙන්ද්‍ර)
පණිවච්චපෙත්වාධිකරඤ්ඤමෙතං (උපෙන්ද්‍ර)
කුමෙන සාතාපසි දන්තධාතුං (ඉන්ද්‍ර )
} උපජාති.

දොධක- 'දොධක මිච්ඡති වෙ භභභාගා' (භ, භ, භ, ගු, ගු)

සාලිනී- 'වෙදස්සෙහි මතාතගාග්සාලිනීසා' (ම, ත, ත, ගු, ගු,)

රථොද්ධතා- 'රොනරා ඉධ රථොද්ධතාලගා' (ර, න, ර, ල ගු,)

ස්වාගතා- 'ස්වාගතෙතිරනභා ගුරුකාචෙ' (ර, න, භ, ගු, ගු,)

## ජගතී 12.

වංසට්ඨ- 'වදන්ති වංසට්ඨමිදං ජතාජරා' (ජ, ත, ජ, ර,)

ඉන්ද්‍රවංසා- 'සා ඉන්ද්‍රවංසා බලු යත්ථ තාජරා' (ත, ත, ජ,ර')

තොටක- 'ඉධ තොටකමම්බුධිසෙහිමිතං' (ස, ස, ස, ස,)

කුසුමවිචිත්තා- 'නයසහිතා න්‍යා කුසුමවිචිත්තා' (න, ය, න, ය,)

භුජඞ්ගප්පයාත- 'භුජඞ්ගප්පයාතං භවෙවෙදයෙහි'(ය,ය,ය,ය)

වෙස්සදෙවී- 'පඤ්චාස්සච්ඡින්නා වෙස්සදෙවීමමායා' (ම, ම, ය, ය)

කමලා- 'කමලාතිසෙඤ්ඤයා සයසෙහියොචෙ' (ස, ය, ස, ය,)

## අතිජගතී 13.

ප්‍රහර්ෂිණී 'මිතාජ්රගොතිදසයතිප්පහාසිනීසා." (ම, න, ජ, ර, ගු )

රුචිරා- 'චතුග්ගහෙහිහරුචිරාජභාසජග්." (ජ, භ, ස, ජ, ගු,)

## සක්කරී 14.

වසන්තතිලකා- 'වුත්තා වසන්තතිලකා තභජාජගාගො." (ත, භ' ජ, ගු, ගු,)

---

1 තගණ, තගණ, ජගණ, ගුරු ගුරු සෙසු තන්හිද මෙසේම සළකන්න.

**පහරණකලිකා**- 'නනභනලගිතිප්පහරණකලිකා." (න, න භ, න, ල, ගු,)
**අපරාජිතා**- 'නනරසලහුගා සරෙභ්‍යපරාජිතා" (න, න, ර ස, ල, ගු.)

## අතිසක්කරී 15.

**සසිකලා**- 'චි යත භ ලහුරථගිතිසසිකලා' (ල. 14)
**මාලිනී**- 'නනමයයයුතා ං මාලිනීභොගිසීභි,' (න,න,ම,ය,ය,)
**පභද්දක**- 'භවති නජනජරසඞ්ඛිතාපභද්දකං" (න,ජ,භ,ජ,ර,)

## අට්ඨි 16.

**වාණිනී**- 'නජභජරා යදාභවති වාණිනීගයුත්තා" (න, ජ,භ, ජ, ර, ගු,)

## අච්චට්ඨි 17.

**සිඛරණී**- 'යමානොසොභල්ගා රසභර විරාමා සිඛරණී" (ය, ම, න, ස, භ, ල, ගු,)
**හරිණී**- 'රසයුගිසිතොනතා සොම්රාස්ලාග්යදා හරිණීතදා" (න, ස, ම, ර, ස, ල, ගු )
**මන්දක්කන්තා**- 'මන්දක්කන්තා මභනතනගාගො යුගුත්වසස කෙහි." (ම, භ, න, ත, ත, ගු, ගු,)

## ධුති 18.

**කුසුමිතලතා**- 'මොතොනොයොයා කුසුමිතලතා වෙල්ලි වෙල්ලිතා- තාකබුත් වීසිහි" (ම, ත, න. ය, ය, ය.)

## අතිධුති 19.

**මෙඝවිප්ඵුජ්ජිතා**- 'රසුතා සසභිය්මාන රරගුරූ මෙඝවිප්ඵු ජ්ජිතා සා. (ය, ම, න, ස,ර, ර, ගු,)
**සද්දූලවික්කීළිත**- 'අකකාසසාහි දිම්සජ්ජ තගා සද්දූල වික්කීළිතං" (ම, ස, ජ, ස, ත, ත, ගු,)

### කෘති 20.

වුත්ත– "වුත්තමීදිසන්තු නාමතො රජාරජරජාගුරුලහුව"
(ර, ජ, ර, ජ, ර, ජ, ගු, ල.)

### ප්‍රකෘති 21.

සද්ධරා– "ම්‍රභ්නා:යා යො'ත්‍රයෙනත්තිමුනියතියුතා සද්ධරා කිත්තිතායං"
(ම, ර, භ, න, ය, ය, ය,)

### ආකෘති 22.

භද්දක– 'භ්‍රා නරනාරනාඑවගුරුද්දසකන්නවිරමංහි භද්දකමිදං."
(භ, ර, න, ර, න, ර, න, ගු.)

සෙසු ඡන්දස්වල පද්‍යබන්ධන භාෂාවෙහි විරල ය.

---

## ෂට්ප්‍රත්‍යය.

1 ප්‍රස්තාර, 2 නෂ්ට, 3 උද්දිෂ්ට, 4 ලගක්‍රියා, 5 සංඛ්‍යාන, 6 අධ්වයොග යන මොහුයි.

1 ඒ ඒ ඡන්දස්වල සර්වගුරුපාදයෙන් පටන් ගෙණ තැවත ගුරුයටි ලුහුතර සෙසු තැන් මතුපෙලට සමසේ පුරවමින් ගොස් මුලින් අඩුතැන් ගුරුවලින් පුරවමින් සර්වලඝු පාදය තෙක් වෘත්තසංඛ්‍යාව නිමකර ගැණීම ප්‍රස්තාර නම්.

අත්‍යුක්තා ඡන්දසෙහි අක්‍ෂර සංඛ්‍යාව දෙකකි. ප්‍රස්තාරය මෙසේයි.



සර්වගුරු පාදය.

සර්වලඝු පාදය

මධ්‍යා ඡන්දසෙහි අකුරු තුණකි. එහෙයින් සර්වගුරු පාදය ගුරු තුණකි. ප්‍රස්තාරය මෙසේයි.

| | | | | |
|---|---|---|---|---|
| | ∟ | ∟ | ∟ | සර්වගුරු පාදය. |
| | — | V | ∟ | |
| අඩුතැන් පිරවීම | (ං) | — | ∟ | |
| | — | — | ∟ | |
| අඩුතැන් ,, | (ං) | (ං) | — | |
| | — | ∟ | — | |
| අඩුතැන් ,, | (ං) | — | — | |
| | — | — | — | සර්වලඝු පාදය. |

සෙසු ඡන්දස්හි ද ප්‍රස්තාරය මෙසේම් සලකනු. ප්‍රස්තාරයෙන් ඒ ඡන්දසට අයත් වෘත්ත මේ මේ යයි දතහැකිය.

2 අසවල් ඡන්දසෙහි පළමුවැනි දෙවැනි ආදී අසවල් වෘත්ත යෙහි ගුරු ලඝු සටහන කෙසේදැයි විචාළ කල ප්‍රස්තාර නොකොට එය දැනගන්නා ක්‍රමය නෂ්ට නම්.

පඞ්ක්ති ඡන්දසෙහි 20 වැනි වෘත්තයෙහි ගුරු ලඝු කෙසේ දැයි යමෙක් ඇසීල. පඞ්ක්ති ඡන්දස අකුරු දසයේ ඡන්දස හෙයින් එහි ගුරු ලඝු සටහන සලකුණු දසයකින් සමන්විත වෙයි. එයට නියමිත ලකුණු ප්‍රමාණය ලැබෙනතුරු වෘත්ත යෙහි අඞ්කය දෙකෙන් බෙදනු. දෙකෙන් බෙදුන කල ලඝු සලකුණක් ද, නොබෙදී විෂමව සිටි කල අතින් එකක් එකතු කොට සමවූකල බෙදා ඒ වෙනුවට සලකුණු පේළියෙහි ගුරු සලකුණක් ද යොදා ගන්න. ඒ ඡන්දසට නියමිත සලකුණු ගණන ලැබෙන තුරු මෙසේම කරන්න.

මෙසේයි:-

```
                         1        1           1  1     1    1    1
2 | 20    2 | 10         5        3  2|2      1  1     1    1    1
    10           5   2 | 6   2 | 4     1   2|2
                         3       2          1  2|2  ∟|2  ∟|2  ∟|2
                                                1     1    1    1
  —       —            (ං)      (ං)  —     (ං)
```

'— — ∟ V — ∟ ∟ ∟ ∟ ∟' මේ පඞ්ක්ති ඡන්දසෙහි 20 වැනි වෘත්තයේ ගුරු ලඝු සටහන යි.

3 වෘත්තයක ගුරු ලඝු සටහනක් දී මේ කීනම් ඡන්දසක කීවෙනි වෘත්තය දැයි දැනගන්නා ක්‍රමය උද්දිෂ්ට නම්.

‘— — ∟ ∠ — ∟ ∟ ∟ ∟ ∟’ මේ වෘත්තය කීනම් ඡන්දසක කීවෙනි වෘත්තය දැයි මෙසේ සොයනු. පළමු කොට ඒ සටහන ඇඳ ඒ ලකුණුවලට මත්තෙහි වෙන වෙනම 1, 2, 4, ආදි වශයෙන් ද්විගුණ කරමින් අඞ්ක ලියනු. ඉන්පසු ලඝු ලකුණු මත්තෙහි පිහිටි අඞ්ක ගණින් කොට අතින් ද එකක් ලාගත් කල්හි ඒ වෘත්තයෙහි සඞ්ඛ්‍යාව ලැබේ.

| 1 | 2 | 4 | 8 | 16 | 32 | 64 | 128 | 256 | 512 |
|---|---|---|---|---|---|---|---|---|---|
| — | — | ⌣ | ⌣ | — | V | V | V | V | V |

$1 + 2 + 16 = 19$ ලඝුස්ථාන මත අඞ්කවල ඓක්‍යය.

$1 + 19 = 20$ පඞ්ක්ති ඡන්දසෙහි 20 වැනි වෘත්තයයි.

---

## අලංකාරවිෂය.

කාව්‍ය ශෝභාකර ධර්ම අලඞ්කාර නම්. හේ ශබ්දාලඞ්කාර අර්ථාලඞ්කාර විසින් දෙපරිදි වේ. ඊට පළමු මෙහිදී කාව්‍ය ගුණයන් කියම්හ.

පසාද, ඔජ, මධුරතා, සමතා, සුඛුමාලතා, සිලෙස, උදාර, කන්ති, අත්ථබ්‍යත්ති, සමාධි යන මොහු කාව්‍යගුණ හෙවත් දශප්‍රාණයෝයි.

1 පසාද :- අනාකුල වූ ක්‍රියාකාරකපද සම්බන්ධය ඇති ප්‍රසිද්ධාර්ථවත් වූ පදාවලියෙන් යුක්තවූයේ ප්‍රසාද ගුණයෙන් යුක්ත වේ.

අලඞ්කාරුත්තා වදනං–මුනිනොධර රංසියො
සොභන්තෙතරුණරංසීව–සම්පත්තතම්බුජෝදරෙ,[1]

---

1 බුදුරජුන්ගේ දෙතොල් රැස් මුඛය සරසමින් පියුම ගැබෙහි අරුණු රැස් මෙන් බබලත්;

2 ඔජ :- පද්‍යයාගේ සමාස බාහුල්‍යය හා නිරාකූලත්වය ඔජෝගුණ නම්.

'මුනින්දමන්ද සඤ්ජාත-හාසචන්දන ලිම්පිතා
පල්ලවා ධවලා තස්ස-වෙකො නාධරපල්ලවො![1]

3 මධුරතා :- පද්‍යයාගේ රසවත් භාවය මධුරතා නම්. මෙය වනාහි පදාසත්ති අනුප්‍රාසය යි දෙපරිදි වේ. ස්ථාන කරණාදීන්ගේ ලං ලං සම්බන්ධය ඇති අකුරු ලංලංව යෙදීම පදාසත්ති නම්.

මුනින්දමන්දහාසාතෙ-කුන්ද සන්දෙහ විබ්භමා
දිසන්තාමනු ධාවන්ති-හසන්තා චන්දකන්තියො.[2]

ඒ ඒ ශබ්දයන්හි පවත්නා ගතකුරු නැවත නැවත ආවෘත්ත වීම අනුප්‍රාස නම්.

ඉන්දනීල දලමන්දං-සුන්දරං සිරිමන්දිරං
මුනින්ද නයනාවන්දං-වින්දතින්දීවරජ්ජුතිං,[3]

4 සමතා :- මොලොක්, රළු, මිශ්‍ර යන වර්ණයන්ගේ වෙන් වෙන්වූ සමන්වය සමතා නම්. එසේම මෘදු අක්ෂරයන් ගෙන් බැඳුනු පද්‍යය මුදුසමතා නම්. රළු අකුරුවලින් බැඳුනු පද්‍යය ඵුටසමතා නම්. මිශ්‍රවර්ණයන්ගෙන් යුත් පද්‍යය මද්ධ්‍යසමතා නම්. පිළිවෙළින් උදාහරණ මෙසේයි.

කොකිලාලාපසංවාදි-මුනින්දාලාප විබ්භමො
හදයංගමතං යාති සතං දෙති ච නිබ්බුතිං,[4]

මේ මෘදු අක්ෂරයන්ගේ සමතාවයි.

---

1 බුදුරදුන්ගේ මඳසිනා නමැති සඳුන් කල්කයෙන් අලෙව් දුන් ලඳලු සුදුවන් වූහ. උන්වහන්සේගේ අධර පල්ලවයන් පමණක් එසේ නොවිය. 2 කොඳරැස් වැනි බුදුරදුන්ගේ මඳසිනාවෝ සඳරැසව නිගා දෙමින්දිගුන් සොළවරට දුවත්.

3 මහනෙල්පෙති දෙකක් වැනි බුදුරදුන්ගේ මනා දෙයැස ඉඳුවර සිරි දරයි. 4 කොවුල්නද මේ යයි පවසන බුදුරජුන්ගේ හඬ සත්පුරුෂ යන්ගේ සිතට සාවදීන්නක් වෙයි. නිවණ ද ගෙණ දෙයි.

සම්භාවනීය සම්භාවං-භගවන්තං භවන්තගුං
භවන්තසාධනාකඞ්ඛි- සො න සම්භාවයෙ ජිනං, [1]

මේ කඨිනාක්ෂරයන්ගේ සමතාවයි.

ලද්ධ චන්දන සංසග්ග සුසඞ්ඛිමලයානිලො
මන්දමායාති භීතොව-මුනින්දමුඛමාරුතා, [2]

මේ මිශ්‍ර අක්ෂරයන්ගේ සමතාවයි.

5 සුකුමාලතා:- කෝමලාක්ෂර බහුල කොට ඇති, එසේම උසුරු වීමෙහි සුකර වූ පද්‍ය සුකුමාලතා ගුණයෙන් යුක්ත වේ. අලඞ්කාරයන්ගෙන් විගිත වුවද මේ පද්‍ය සාධුන්ට හිත වේ.

පස්සන්තා රූප විභවං- සුණන්තා මධුරං ගිරං
චරන්ති සාධු සම්බුද්ධ-කාලෙ කෙලී පරම්මුඛා, [3]

6 සිලෙස:- සමාස පද බහුල කොට ඇති පරුෂාක්ෂරයන්ගෙන් තොරවූ මටසිලුටු වූ පද්‍ය සිලෙස ගුණයෙන් යුක්ත වේ.

බාලින්දුවිබ්භම වෙජ්ජ-නඛරාවලි කන්තිහි
සා මුනින්දපදම්භොජ-කන්තිමෙව වලිතාවකං' [4]

7 උදාර:- යම් රචනාවකින් යමෙකුගේ උත්කර්ෂ බවක් හැඟේ ද ඒ පද්‍ය උදාර ගුණයෙන් යුක්තය.

පාදම්භොජ රජොලිත්ත-ගත්තා යෙ තව ගොතම
අහො තෙ ජන්තවො යන්ති-සබ්බථා නිරජත්තනං, [5]

---

1 සසරදුක් කෙළවර කළාවූ ද සියල්ලන් විසින් පිදිය යුතුවූ ද බුදුන්ට කවරෙක් නුපුදන්නේද, 2 සඳුන් සුවඳින් සුවඳ වත් වූ වාතය මුනිඳු මුඛ මාරුතයෙන් පැරදේ යයි බිය වුවාක්මෙන් මඳ මඳව හමයි.

3 සම්බුද්ධ කාලයෙහි ක්‍රීඩා පරවශ වූ සත්පුරුෂයෝ බුදුරදුන්ගේ රූ සපුව බලමින් මිහිරිදහම් අසමින් හැසිරෙත්. 4 බාලචන්ද්‍රයාගේ කාන්තිය නසන්නා වූ නියකාන්තීන් සමග වෙළුනා වූ පාපියුම් කාන්තිය නොප රකීවා.

5 ගෞතමය යම්කෙනෙක් නුඹවහන්සේගේ පා රජසින් වැකුනාහු ද ඔවුහුම පහවූ රජස් ඇත්තෝය: ආශ්චර්‍ය්‍යය:

8 කාන්ති:- ලෞකික ගුණයන් නො ඉක්මවා කළ වර්ණනාව කාන්තිගුණයෙන් යුක්ත වේ.

මුනින්දචන්ද සම්භූත-යසෝරාසි මරීචිනං
සකලාප්‍යායමාකාසො-නාවකාසො විජම්භනෙ, [1]

9 අර්ථව්‍යක්ති:- නෙය්‍ය වශයෙන් අර්ථ ගතයුතු බවක් නොමැත්තේ නැතහොත් අර්ථාවබෝධයෙහි සුකර වූයේ අර්ථ ව්‍යක්ති නම්.

මනොතුරඤ්ජනාමාරබ්භගතා සිඞ්ගාර විබ්භමො
ජිතෙනාසමතුඤ්ඤුනො-මාරස්ස හදයානලා, [2]

10 සමාධි:- ස්වභාව වශයෙන් අන්‍ය වස්තුවෙක්හි පිහිටි යමක් අන්‍ය වස්තුවෙක්හි ආරෝපණය කොට දැක්වීම සමාධි නම්.

1 අප්‍රාණීදෙයෙහි ප්‍රාණීධර්මාරෝපණය, 2 අරූපවස්තුවෙහි රූපීධර්මාරෝපණය, 3 නිරස දෙයෙහි සරස ධර්මාරෝපණය 4 අද්‍රවදෙයෙහි ද්‍රවධර්මාරෝපණය, 5 අකතෘවිෂයෙහි කතෘධර්මාරෝපණය, 6 අශරීරදෙයෙහි ශාරීරිධර්මාරෝපණය, යන මොවුන්ගේ වශයෙන් සමාධිය සවැදෑරුම් කොට දක්වති. පිළිවෙළින් උදාහරණ මෙසේයි.

උණ්ණපුණ්ණේන්දුනානාථ-දිවාපි සඞ්ගමා
විනිද්දා සම්පමොදන්ති-මඤ්ඤෙ කුමුදිනී තව, [3]
දයාරසෙසු මුජ්ජන්තා-ජනාවුත රසෙසිව
සුඛිතා සන්තදුස්සාතෙ නාථපාදම්බුජන්තා, [4]

---

1 බුද්ධචන්ද්‍රයාගේ යශෝරාශි මරීචිය පැලඹීමෙහි ආකාශය අනවකාශය,

2 සිත් ගන්නාසුලු වරඟනන්ගේ නෘත්‍ය ලීලාව බුදුරදුන් විසින් නො පිළිගන්නා ලදී. (එහෙයින්) මාරයාගේ හෘදයෙහි ගිනි ඇවිල ගති.

3 ලෝකනාථය, නුඹගේ උණ්ණරෝම නමැති චන්ද්‍රයා සමග සමාගමය හේතු කොට ගෙණ විල්හි දවල් කල්හි ද නො නිදා සතුටු වෙති.

4 නාථය නුඹගේ පා පියුම්හි නැමුනාවූ ජනයෝ අමා දියෙහි මෙන් කරුණා ගුණයෙහි ගැලෙන්නාහු නැසූ දෙසුන් ඇත්තාහු සුඛිත වෙති.

මධුරෙ පි ගුණෙධීර-නප්පසීදන්ති යෙ තව [1]
කීදිසී මනසො වුත්ති-තෙසං ධීර ගුණා න හෙ
සබ්බඤ්ඤ සිද්ධ චූලක-පූටපෙය්‍යා මහාගුණා [2]
දිසා සමන්තා ධාවන්ති-කුන්දසොභා සලක්ඛණා,
මාරාරිබල විස්සට්ඨා-කුණ්ඨා නානාවිධායුධා [3]
ලජ්ජමානඤ්ඤවෙසෙන-ජින පාදනතා තව,
මුනින්දභානුමා කාලො-දිතො බොධො දයාවලෙ [4]
සද්ධම්මරංසිනා භාති-භින්දමන්ධතමං පරං,

---

## ශබ්දාලඞ්කාර.

අනුප්‍රාස යමක දෙදෙන ශබ්දාලඞ්කාර යයි බොහෝ සෙයින් හැඳින්නෙති. රසාදීන්ට අනුගත කොට ව්‍යඤ්ජනාක්ෂරයන්ගේ නැවත නැවත කීම අනුප්‍රාස නමි. මෙය වනාහි 'ඡේක, වෘත්ති, ශ්‍රැති, අන්ත්‍ය, ලාට, සි පස්වැදෑරුම් වේ. මුලින් යෙදුනු ව්‍යඤ්ජන සමූහය නැවත නැවත ත් එහි ම යෙදීම ඡේකානුප්‍රාස නමි.

"සමාරො සමරායාතො-පාරමී පරමං බලං
වීරං වාරෙති කිංසිද්ධ-මසිද්ධො පාරමී බලං."

මුලින් යෙදුනු එක් එක් ව්‍යංජනයන්ගේ නැවත නැවත යෙදීමෙන් ඇති වන අක්ෂර සාම්‍යය වෘත්ත්‍යනුප්‍රාස නමි.

සකල විමලසීලං ධූතපාපාරි ජාලං
සුරනරමහනීයං පාහුණෙය්‍යාහුනෙය්‍යං
උජ්ජුපථපටිපන්නං පුඤ්ඤඛෙත්තං ජනානං
ගණමහමභිවන්දෙ සාරදං සාදරේන,

---

1 ධීරයන් වහන්ස· ඔබගේ මිහිරි ගුණෙහි යම් කෙනෙක් නො පහදිද්ද රළුවූ ගුණ ඇති ඔවුන්ගේ චිත්ත වෘත්තිය කෙබඳුද?, 2 සර්වඥයන්වහන්ස, ඔබගේ මුඛ පුටයෙන් පානය කළයුතු වූ කොඳුරැස් වැනි වූ මහාගුණයෝ හාත්පසින් දසදිගට දිවෙත්. 3 ජිනයන් වහන්ස, මරසතුරාගේ බලයෙන් නසා දමූ නන්විධ අවි මොට වූවාහු, ලජ්ජා වන්නාහු අන් වෙසින් ඔබගේ පාදයෙහි නැමුනෝය. 4 සර්වඥතාඥාන නමැති උදය පර්වතයෙහි පහළ වූ බුද්ධසූර්‍ය්‍යතෙමේ මාරවිජය කාල යෙහි මොහාන්ධකාරය සදහම් රැසින් බිඳිමින් බබලයි,

උත්පත්තිස්ථාන වශයෙන් සම වූ අකුරු ලං ලංව යෙදීම ශ්‍රැත්‍යනුප්‍රාස නම්.

"ඉන්දනීල රසනාය විචිත්තං-භාය චාරු ජඝනං සතජ්ඣනං
මීනකේතු නව කෙළිතලාභං-භාසතීව රසනා පරිපුණ්ණං."

පාදාන්තයෙහි පිහිටි ශබ්දයාගේ අග අකුර ඉක්බිති පාදයෙහි ප්‍රථමාක්ෂරය වේ නම් එය අන්ත්‍යානුප්‍රාසයෙන් යුක්ත වේ.

සබ්බත්ථ සාධක මුනීරිත ධම්මචක්කං
කංඛණ්ණවප්ප තරණාය සුවණ්ණභාවං
වංසප්පභේද ජනිතං කුසලත්ථිකානං
නං දෙවරූප ගත ධම්මපථං නමාමි."

ප්‍රථම පාදාන්තයෙහි පිහිටි ශබ්දයත් ද්විතීය පාදාදියෙහි පිහිටි ශබ්දයත් සමවූ කල්හි ලාටානුප්‍රාසය ලැබේ.

'සම්පුණ්ණ ලක්ඛණ විරාජිත රූප සාරං
සාරං විචිත්ත නය ධාරිත ධම්මදේසං
දේසං ව රක්ඛිත භවන්තය ඛේදයා ලෝකං
ලෝකඤ්ඤුතං ජිනවරං සිරසා නමාමි.

**යමක.** ප්‍රසිද්ධ අර්ථ ඇති, සිළුටුපද සන්ධි ඇති ප්‍රසාදගුණයෙන් යුක්තවූ වර්ණයන්ගේ ආවෘත්තිය ඇති පද්‍යය යමක නම්.

මෙය අව්‍යපේතය, ව්‍යපේතය, අව්‍යපේතව්‍යපේතය, යි තුන් වැදෑරුම් වේ. මෙය පාදයන්ගේ ආදි, මධ්‍ය, අන්තයන් විෂය කොට ඇත්තේය.

අව්‍යපේත යමකය, (සම්පූර්ණ පදයම ආවෘත්ත වෙයි.)

කමලං කමලට්ඨතනුං-වනදෙ වනදෝම්බරං
සුගතො සුගතො ලොකං-සහිතං සහිතං කරං

ව්‍යපේත යමකය, (පදයේ සමහර අකුරු අඩුවී ආවෘත්ත වීමයි )

වසුධා වසුමතා තෙන-කුලවංසක්කමාගතා
වනිතා වනිරුස්සාහං-සුප්පතිට්ඨා පිතා තතානි.

අව්‍යපෙතාව්‍යපෙත යමකය:-

'සමලං සමලං' කාතුං-සුචිරං සුචිරස්සජයෙ
සුචිරං 'සුචිරබ්ගන්තං- සමලං සමලමහි යො'

සමහරකෙනෙක් චිත්‍ර ලක්ෂණ ද ශබ්දාලඞ්කාර වශයෙන් දක්වති. පද්මබන්ධ මුරජ බන්ධනාදීහු චිත්‍රයෝ යි.

පද්ම :- නා සිතකානිනාමාර-රමානා සමලාභිතා
නා 'භිලාසාදිනායෙක-නායෙනාපහිතසිතා.

මුරජ :- භජතං තං මුදුපොතා-මපි තත්‍රිපපදලතා
නියතං සුබද්ධතාරං-සුගතං තංසද නමෙ.

අර්ථාලඞ්කාර,

සවභාවොක්තිය වක්‍රොක්තිය යි අර්ථාලඞ්කාරය ද්විප්‍රකාර වේ. වෙනසක් නො පෙන්වා ඇති සැටිය පැවසීම සවභාවොක්ති නම්.

ලීලා විකාසනි සුභගෙගා-දිසාපිර විලොචනෙනා
බොධිසත්තඞ්කුරො භාසං-විරොච්චාච මාසභිං [1]

වස්තූන්ගේ නියමගතිය අතහැර දමා අන් පරිද්දකින් වැණීම වක්‍රොක්ති නම්. එය අතිශයොක්ති උපමාදීන්ගේ වසයෙන් නන් වැදෑරුම් වේ.

අතිශයොක්ති :-ලොකවිෂය ඉක්මවා පැවසීම අතිශයොක්ති නම්.

1 පිබන්ති දෙහකන්තිංයෙ-නෙත්තඤ්ජලිපුටෙන තෙ
නාලං තනාතු ජිනෙසං තං-තණ්හං තණ්හාකරෙපි තිං [2]

2 උපමා:- උපමාන උපමේයයන්ගේ සමානත්වය උපමා නම්.

---

1 විලාස ගමනින් මනහර වූ දිසාවන් සපිර බැලුම් ඇති බෝසත් තෙමේ අභිත නාදය කරමින් බැබලුනේය.

2 යමෙක් ඔබගේ සිරුර පැහැය නෙත් දෙකොහින් බොත් ද, සම්බුදුසන් වහන්ස, තෘෂ්ණාව නසන්නා වූ නුඹවහන්සේ ඔවුන්ගේ පවස සරින්ට නිම වූවහුය.

'වීකාසි පදුමං'වාති-සුන්දරං සුගතානනං'[1]

3 රූපක :- උපමාද්‍යෝතක පද නොමැති හෙයින් සැඟවුනු උපමා අලඞ්කාරය ම රූපක නම්.

අඞ්ගුලීදල සංසොභී-නඛදීධිති කෙසරං
සිරසා න පිළන්ධන්ති-කෙ මුනින්ද පදම්බුජං.[2]

4 දීපක එක්තැනෙක සිට ප්‍රධාන අප්‍රධාන සියලු වාක්‍යයන්ට උපකාර වනුයේ දීපක නම්.

අකාසි බුද්ධො වෙනෙය්‍ය බන්ධූන මමිතොදයං
සබ්බපාපෙහි ච සමං-තෙකාතිජ්ජීය මද්දනං.[3]

'අකාසි' යනු මෙහි හැම වාක්‍යයට ම උපකාර වූ ක්‍රියාවයි·

5 ආක්ෂෙප :- උපමානයාගේ ප්‍රතික්ෂෙපයෙන් උපමෙයාගේ උත්කර්ෂ බව හැඟවීම ආක්ෂෙප නම්.

සච්චං න තෙ ගමිස්සන්ති-සච්චං සුජන ගොචරං[4]
මිච්ඡාදිට්ඨි පරික්කන්ත - මානසා යෙ සුදුජ්ජනා.

6 අර්ථාන්තරන්‍යාසය, ප්‍රධාන වස්තුහුගේ මනා අවබොධය පිණිස අප්‍රධාන වස්තුවක් දැක්වීම අර්ථාන්තරන්‍යාස නම්.

සත්ථා දෙවමනුස්සානං-වසීසොපි මුනිස්සරො
ගතොව නිබ්බුතිං සබ්බ-සඞ්ඛාරා නහි සස්සතා.[5]

---

1 බුදුරජුන්ගේ මුහුණ පිපුනු පියුමක් මෙන් මනහරය. 2 ඇඟිලි නමැති පත්‍රවලින් බැබළුණු නියරැස් නමැති කෙසරු ඇති බුදුරජුන්ගේ පා නමැති පද්මය කවරෙක් හිසින් නොපළඳිත්ද? 3 බුදුරජතෙමේ විනෙජනයන්ගේ වැඩීම කෙළේය· පව් සමඟ තීර්ථක මර්දනය ද කෙළේය.

4 මිසදිටු සිත් ඇති යම් කෙනෙක් සත්පුරුෂයන්ට ගොචර වූ නිවණට යත්ද යනු සත්‍යයක් නොවේ. කුමක් හෙයින් ද ඔවුහු ඉතාම දුදනෝය:

5 දෙව් මිනිසුන්ගේ අනුශාසකයා වූ වසඟ වූ ඉඳුරන් ඇති බුදුරජතෙමේ ද පිරිනිවිසේක්මය: සියලු සංස්කාරයන්ගේ සදාකාලික බවක් නැත්තේමය.

7 **ව්‍යතිරේක**, උපමාන උපමේය දෙදෙනාගේ වෙනස හැඟවීම ව්‍යතිරේක නම්.

මහාසත්තාති ගම්භීරා–සාගරො සුගතො පි ච
සාගරොඤ්ජන සඞ්කාසො–ජිනො චාමීකරජ්ජුති.[1]

8 **හේතු**, කාර්‍ය්‍ය කාරණ දෙදෙනා එකසේ දක්වීම හේතු නම්.

මුනින්ද චන්ද සංවාදී–කන්තභාවොප සොභනා
මුඛෙනෙව සුබොධංතෙ–මනං පාපානි නිස්සටං.[2]

9 **ක්‍රම**, පළමු කී ක්‍රමය නො ඉක්මවා නැවත නැවත ද කීම ක්‍රමාලඞ්කාර නම්.

ආලාපහාසලීලාහි–මුනින්ද විජයා තව
කොකිලා කුමුදුනී චෙව–පසෙවනෙත වනං ජලං.[3]

10 **සමාසොක්ති**, උපමානයාගේ වර්ණනයෙන් උපමේයය මේ යයි හඟවාලීම සමාසොක්ති නම්.

ඉච්ඡිතත්ථප්පදො, සාරො–ඵල පුප්ඵොපසොභිතො
සච්ඡායො යමපුබ්බාව–කප්පරුක්ඛො සමුට්ඨිතො.[4]

11 **උත්ප්‍රේක්ෂා** (පරිකල්පනා) ස්වභාවයෙන් සිදුවන දෙය අන් අයුරකින් කල්පනාකිරීම උත්ප්‍රේක්ෂා හෙවත් පරිකල්පනා නම්.

ගජං මාරො සමාරූළ්හො–යුද්ධාය වච්චන්ත මුනන්තං
මග්ගමඤ්ඤෙති නූන–ජිනභීතො පලායිතුං.[5]

---

1 සාගර සුගත දෙපලම මහාසත්ව, ගම්භීරය. එහෙත් සාගරය නිල් පැහැය වෙයි. බුදුරජහෙමේ රන්වන් පැහැය වෙයි.

2 මුනීන්ද්‍රයාණනි. චන්ද්‍රයා වැනි කාන්තභාවයෙන් හොබනාවූ මුඛය කාරණ කොට ගෙණ සිත පාපයෙන් වෙන්විය:

3 මුනීන්ද්‍රයන් වහන්ස, නුඹවහන්සේගේ වචනයෙන් ද සිනාවෙන් ද පැරද ගියා වූ කොවුලෝ ද කෙගුමුදසෝ ද වනයට ද ජලයට ද වැදුනාහුය.

4 කැමැති කැමැති දෙය දෙන්නා වූ සරු වූ ඵල පුෂ්පයන් හෙබියා වූ රශ්මිසහිත වූ අපූර්ව වූ මේ කප්රුකක් පහළ විය. මෙයින් බුදුරජ තෙම හඟවයි.

5 මාරයා යුද්ධ පිණිස ඉතා උස් ඇතෙකුට නැගුයේ ය. මෙය බුදුන් කෙරෙන් බියවූයේ පලායන්ට යයි සිතමි:

12 **පර්‍යායෝක්ත්‍යාලඞ්කාරය**, ප්‍රකට කොට නො කියා වටින් පිටින් කීම පර්‍යායෝක්ති නම්.

විමටඞ්ගන නිකඛිත්තං-ධනං මාරකඛ වජ්ජිතං
ධනකාම යථාකාමං-තුවං ගච්ඡ යදිච්ඡසි.[1]

13 **ව්‍යාජස්තුති අලඞ්කාරය** නින්දා කරන්නාක් මෙන් කරණ ස්තුතිය ව්‍යාජ වර්ණිතා නම්.

සඞ්වාලෙතුමලං ඛාංසි-භුසං කුවලයාබිලං
විසෙසං තාවතා නාථ-ගුණානං තෙ වදාම කිං.[2]

14 **විශෙෂොක්ති**, යම්කෙනෙකුගේ විශිෂ්ටාතිශය ජාති ද්‍රව්‍යා දීන්ගේ විකලත්වයෙන් වුවද ප්‍රකාශ වේ නම් එය විශෙෂොක්ති නම්.

න රථා න ච මාතඞ්ගා-න හයා න පදාතයො
ජිතො මාරාරි මුනිනා-සම්භාරු වජ්ජනෙන කි.[3]

15 **ශ්ලෙෂාලඞ්කාරය**, නානා අර්ථ ඇති භින්නාභින්න පද යෙන් යුක්ත වූ වාක්‍යය ශ්ලෙෂ නම්.

අබ්භුන්නතමහාමෙරු ධාරී-සමාරුළ්හො මහොදයං
රාජතෙ රංසි මාලීයං-භගවා බොධයං ජනෙ.[4]

---

1 ඇවිරීමක් නැති තැනක බහා තබන ලද අරකට ද කිසිවකු නැති ධනයක් වෙයි: ඉදින් කැමතිනම් නුඹ ද යව.

2 නාථයානනි, නුඹවහන්සේ සියලු පද්ම සමූහය නොහොත් භූමණ්ඩලය කම්පාකරන්ට සමත් වූවහුය. එපමණකින් ඔබගේ ගුණ පිළිබඳ කවර විශෙෂයක් ද?

3 ඇත් අස් රිය පාබළ සෙනඟක් ද නැත. එහෙත් පාරමීන් මෙතෙයි කිරීමෙන් බුදුරදුන් විසින් මාරයා දිනනලදි.

4 අභිවෘද්ධියට හෝ උදය පර්වතයට පැමිණියාවූ සොහඳුර හෝ ගනඳුර නසන්නාවූ මනොඥ වූ රශ්මාලා ඇති මේ බුදුරජතෙමේ හෝ සූය්‍ය තෙමේ ජනයන් පුබුදුවමින් බබලයි.

16 තුල්‍යයෝගිතා අලඞ්කාරය, අප්‍රස්තුත වස්තුව නින්‍දා පිණිස හෝ ස්තුති පිණිස ප්‍රස්තුත වස්තුවක් හා සමාන කොට දැක්වීම තුල්‍යයෝගිතා නම්.

සම්පත්ත සම්මදෙ ලොකො-සම්පත්තො ලොකසම්පදෙ
උභොහිරංසි මාලීව-භගවා ච තමොනුදෙ [1]

17 නිදර්ශනාලඞ්කාරය, යමක් සිදුකරන්නහු විසින් ඊට සමාන උසස් හෝ පහත් යමක් දක්වනු ලැබේ ද ඒ නිදර්ශනාලඞ්කාර නම්.

උදයං සමණින්දස්ස-යන්ති පාපා පරාභවං
ධම්මරාජ විරුද්ධානං-දීපයන්තා දුරන්තතං. [2]

18 උදාත්තාලඞ්කාරය, සම්පත්තියේ හෝ අදහස්වල ඉතා උසස් බවක් දැක්වීම උදාත්තාලඞ්කාර නම්.

සංපත්තා සම්බොධිං බොධි-සත්තො සත්ත හිතාය සො
සිතො ස්නෙහරසාබද්ධ-මපි රාහුල මාතරං. [3]

19 අපහ්නුති, උපමෙයය වළකා උපමානය ස්ථාපිත කිරීම අපහ්නුති නම්.

විචාදම්මනුසාසන්තො-මුනින්ද වදනින්දුනා
සම්පුණ්ණෙන චන්දිමා නායං-ඒකනමෙතං මනො භූමො. [4]

20 අප්‍රස්තුත ප්‍රශංසාලඞ්කාරය, උකටලී වූවෙකු අප්‍රධාන යමක් ස්තුතිකිරීම මුඛයෙන් රචනා කරණ ලද්ද අප්‍රස්තුතප්‍රශංසා නම්.

---

1 අඳුරු දුරලන්නාවූ සූර්යයාතෙමේ ද බුදුරජතෙමේ ද යන දෙදෙනා හෙතු කොටගෙණ ලෝවැසිතෙමේ පැමිණි ප්‍රීති ඇත්තෙක් ද පැමිණි ආලොක ඇත්තෙක් ද වී.

2 බුදුරජුන්ගේ පහළවීමෙන් අකුශල ධර්මයෝ බුදුරජුන් සමග විරුද්ධ වූවන්ගේ දුක් කෙළවර දක්වමින් පිරිහීමට යෙති.

3 බෝසත්තෙමේ ප්‍රේමයෙන් බැඳුනු රාහුල මවුද හැරදමා සත්ත්වයාට හිත පිණිස සම්බොධියෙහි ඇලුනේය.

1 බුදුරදුන්ගේ මුඛචන්ද්‍රයා සමග විවාදාපන්න වූ මේතෙමේ චන්ද්‍රයා නොවෙයි. අනඞ්ගයාගේ ඡත්‍රයකි.

සුඛං ජීවන්ති හරිණා-වනෙ සවපරසෙවිනො
අනායාසොපලාභෙහි-ජලදබ්භඞ්කුරාදිහි.[1]

21 **අඤ්ඤොඤ්ඤාලඞ්කාරය**, ඔවුනොවුන්ට ඔවුනොවුන්ම පිහිටවීම් මුඛයෙන් වර්ණනාකිරීම අඤ්ඤොඤ්ඤාලඞ්කාරනම්.

බ්‍යාමංසු මණ්ඩලං තෙන-මුනිනා ලොකබන්ධුනා -
මහන්තිං විදතීකානන්තිං-සො පි තෙනෙව තාදිසිං.[2]

22 **පරිවෘත්ත්‍යාලඞ්කාරය**, යම්කිසි පරිත්‍යාගයක් කරණකොටගෙණ වූ ලැබීමක් කියවේ ද එය පරිවෘත්ත්‍යලඞ්කාර නම්.

පුරා පරෙසං දත්වාන-මනුඤ්ඤඞ්ගං නයනාදිකං
මුනිනා සමනුප්පත්තා-දානි සබ්බඤ්ඤුතා සිරි.[3]

23 **ආශීරලඞ්කාරය**, අභිමත වස්තුහුගේ ලැබීමක් ප්‍රකාශකිරීම ආශීරලඞ්කාර නම්.

තිලොකෙන ගතීනාථො-පාතු ලොක මපායතො.[4]

24 **රසවද් අලඞ්කාරය**, යම් අලඞ්කාරයක් ශෘඞ්ගාරාදි රසයන්ගේ හැඟීම ඇති කෙරේද, එය රසවදලඞ්කාර නම්.

රාගාකතබ්භූත සරොජ මුඛං ධරාය
පාදන්තිලොක ගරුනො ඞ්කබද්ධරාගා
ආදාය නිච්ච සරසෙන කරෙන ගාළ්හං
සංචුම්බයන්ති සතතා හිත සම[illegible]මෙත.[5]

---

1 අනුන් යටතට නොපැමිණ මුවෝ වනයෙහි නිරායාසයෙන් ලැබෙන දිය දළු ආදියෙන් සුවසේ ජීවත් වෙත්.

2 බ්‍යාමප්‍රභාව බුදුරදුන් කරණකොට ගෙණ ද බුදුරජ තෙමේ බ්‍යාම ප්‍රභාව කරණකොට ගෙණ ද බබලයි.

3 පෙර අනුන්ට මනරම් නෙත් ආදිය දී දැන් බුදුරජුන් විසින් බුදුබව ලබන ලදී.

4 සම්බුදු රජතෙමේ ලෝකයා අපායෙන් රකීවා.

5 මහීකාන්තාවගේ අනුරාගයෙන් අභිමුඛ කරණලද ආශ්චර්‍ය්‍ය පද්මය කට බඳුවූ නැතහොත් රත්පැහැයට හැරුණු ආශ්චර්‍ය්‍ය පද්මය නැමැති මුඛය බුදුරජුන්ගේ සිරි පා රත්පැහැය ඇත්තාහු නිරතුරු අනුරාග ඇත්තාහු අතින් හොහොත් නිතර පැවති රශ්මියෙන් දැඩිව ගෙණ ස්පර්ශ කොට කරණලද ආදරයෙන් නොහොත් සුසමාගමයෙන් සිඹිත්:

රස නවයකි.

ශෘඞ්ගාර, හාස්‍ය, කරුණා, රෞද්‍ර, වීර, භයානක, බීභත්ස, අද්භූත, ශාන්ත යන මොහු නව දෙනාය.

1 ශෘඞ්ගාර රසය,

ගීතස්සරේන උපකඩ්ඪිය නෙකතරස්මි
බද්ධං කරිංව විවසඤ්ච කරග්ගහෙන
යාතාදිසෙපි විනියොජයි දුක්කරෙ මං
සෙරන්ධ්‍රී අධිගතා විධිනා මයජ්ජ. 1

2 හාස්‍ය රසය,

පූජෙසි කණ්ණමුණ්ඩිතා අපි යො පසන්නො
ධම්මම පුරා සමධුරං විධුරං ස ඤාතුං
ගොපෙන්තියාපි වචනෙන පියා සභාවං
භන්තිං අකාසි ඵරුසෙ මයි නාගරඤ්ඤ. 2

3 කරුණා රසය,

ආකඩ්ඪිතෙන සතරජ්ජුරක්ඛතො යො
ධම්මෙන ආසන මලඞ්කුරුතෙ ජිනොව
සො අස්ස වාලමවලම්බිය දූති නීතො
යක්ඛෙන ලොකතිලකො කුරුතෙ කිමෙතො 3

---

1 ගී හඬින් ඇද තෙන් නමැති රැහැණින් බැඳ, නැවත අය ගැණීමෙන් පහව ගිය ලෙබයිම් ඇති ඇතෙකු මෙන් යම් ස්ත්‍රියක් එබඳු වූ දුෂ්කර අවස්ථාවෙහි පවා යෙදූ ද? ඒ ඉන්දුරතී තෙමෝ මා විසින් දූත් පිණිත් පැමිණෙන ලදි.

2 යම් නාරජක් පෙර දහම්හි පැහැදුනේ කණ්ඩම ණිකායෙන් පිදී ද, ඒ නාරජතෙමේ සිය සිතේ හැටි රකින්නා වූ ස්ත්‍රියගේ වචනයෙන් විධුරයන් නසනු පිණිස සැඩවූ මාකොරෙහි ඇල්ම කොළේය.

3 යමෙක් එක්සියයක් රජුන් විසින් ඉදිරිපත් කරණ ලදුව බුදුරදුන් මෙන් දම් දෙසීමෙන් අසුන අලඞ්කාර කෙරේ ද, ලොවට තිලකයක් වැනී ඒ විදුරතෙමේ පූණ්ණක යක්ෂයා විසින් අදනාලද්දේ කෙන යන ලද්දේය. දූත් හුදකලාව අසුගේ වාලධිය ගෙණ කුමක් කෙරේ ද?

4 රෞද්‍ර රසය,

ගණ්හන්ත භො අභිගතොසි මනුස්සහත්ථ
අස්සස්ස වාලම්බිලම්බ පුරං අමෙත්ථ,
වෙරම්බවාත මුඛ චුණ්ණිත සබ්බගත්තො
මඤ්චෙව ත්වං පුන පි පස්සසි ජීවලොකං. [4]

5 වීර රසය,

ඉමං සරත්තපපිසිතං සරීරං
ධාරෙමි ලොකස්ස හිතත්ථමෙව
අජ්ජාතිථෙය්‍යත්ත මුපෙති තංවෙ
අතොපරං කිං පියමප්පිමය්හං. [5]

6 භයානක රසය,

යං දිට්ඨිසත්ථ පතනෙන පරිපුප්ඵරන්තී
කුම්භණ්ඩ රක්ඛසචමූ භමිතා සමන්තා
ආවත්තකවාල නගමස්ස ගතං පුරීව
හොන්තො මුහුංමුහුමපස්සි සපුණ්ණකොහං. [6]

7 බීභත්ස (පිළිකුල) රසය,

යක්ඛාමච්චං තරඩ්ඩක තඩ්ඩකණ්ඨරුගෙ නිම්මිතා පුණ්ණකෙන
නුත්තංසිත්තත පාණිසාලලම්බධරු භාරි සාතයෙන්තා රගා
ලිත්තා ලොහිත කුම්භකුම්භෙහි එත්ථුරෙ තෙනෙ පිවන්තා වසා
මජ්ජං සීසකපාල පාතිහි පුරෙ ධුත්තා ඒයොපෙක්ඛිතා. [7]

---

4 බොල මිනිසුන් කන යක්ෂයා විසින් ගත්තා ලද්දේ වෙහිය. අශ්වයාගේ වාලධිය කෙණ නුවර බලුව. වෛරම්බවාතයාගේ අභිමුඛයෙහි සුණු කළ සිරුරු ඇති මිනිසෙක් නැවතත් සත්ව ලෝකය කෙසේ දකීද?

5 මේ ලේ මස් සහිත සිරුර පරහට හිත පිණිස ම දරමි. අද ආගන්තුක බවට පැමිණෙන්. මේ යාචකයාට වඩා මට ප්‍රියයෙක් නැත.

6 දෘෂ්ටි නමැති ශස්ත්‍රය වැටීම හේතු කොට ගෙණ වෙවුලන්නාවූ කුම්භණ්ඩ රාක්ෂස සේනා තොමෝ හාත්පසින් සක්වළ පවුව තෙක් එලවාදමන ලද්දී ද? ඒ සෙනඟ අසුපිට හුන් යමෙකු විටින් විට දුක්කේද? ඒ මම පූණ්ණක වෙමි.

7 පූණ්ණක විසින් මවනලද මිනීඇට නමැති වලලු ඇති, මුදුන්මල් කළ අතුල් නමැති ලපලු ඇති මුතුහර මෙන් කළ අතුනු සපුන් ඇති, ලේ නමැති කොකුම් ඇති හිස්කබල් නමැති බඳුනෙන් වුරුණු නමැති සුරාපානය ඇති යම් යක්ෂයෙකෙනෙක් වෙත් ද, ඔවුහු විධුරයන් විසින් බුතීයන් මෙන් උපෙක්ෂා කරණ ලද්දෝය.

8 අද්භූත රසය,

සංපුණ්ණමහානාහට හොහා හිංසකො
සවයො භවෙනෙව සුනිච්චලොචලා
නිපාතිතො තෙන අචං සිඛරා පතං
අසහාහකං තං මිනි දිට්ඨිදට්ඨියා. [8]

9 ශාන්ත රසය,

එනෙනාපු කෙසරිකරිසවපි වෙඨයනෙතා
නාගෙ නගං මදගජෙ විය වෙළුගුම්බං
යකෙඛ විචාලයති නො චලි ඊසකම්පි
සන්තිං ගතොව විධුරො මධුරාපි භාවා. [9]

---

8 ඒ විධුරතෙරුම් පුණ්ණකයා විසින් නාළවෙකු විසින් මෙන් එලවන ලද නොයෙක් බිහිසුණු අරමුණු ඇති කල්හි ඉතා නිශ්චල වූයේ ඔහු විසින් පර්වතයෙන් හෙළන ලද්දේ යට බැලූ හිස් ඇත්තේ වැටෙමින් භූසත නොවත්තේය. ඒ පර්වතය දෘෂ්ටි යෂ්ටියෙන් මැත්තේය. පුදුමයි.

9 සිංහයන් හා ඇතුන් ඉදිරියට එන කල්හි ද සපුන් හිස වෙළන කල්හි ද මතැතු හුන ලැහැබක් මෙන් පුණ්ණකයා පවුව සොලවන කල්හි ද, තෙමේ සමවතට වැදුනු කලක් මෙන් මදක් වත් සිතෙහුදු නො සෙල්වී.

# උපග්‍රන්ථය

## අකාරාදිය

### අ

අකතඤ්ඤුසි - කළගුණ නොදන්නෙහි
අක්ඛමො - නොඉවසන්නේ
අකංසු - කළාහුය
අකම්මසීලිනො - කම්මැලියෝ
අක්ඛකීලාසු - දූකෙළිවල
අකුසලෝ - අදක්ෂයා
අග්‍යාගාරං - ගිනිහල් ගෙය
අගමාසි - ගියේය
අඞ්ගාරකාසුං - ගිනිඅඟුරුවල
අඞ්ගාරං - අඟුරු
අඞ්කුසධාරී - ඇත්ගොව්වා
අච්චන්තං - බොහෝ
අච්ඡරියං - පුදුමයකි
අච්චොදතො - ඉතා සුදු
අජ්ජ - අද
අජ්ජතග්ගෙ - අදපටන්
අජ්ඣගමා - පැමිණියේය
අජ්ඣාවසෙන්තො - නදුරන්නේ
අජ්ඣුපගතො - මැදහත්වූයේ
අඤ්ජලිං - ඇදිලිය
අත්තදත්ථං - අර්ථය
අත්ථභූතො - අර්ථයවූයේ
අත්ථසංරක්ඛනෙ - ධනය රැකීමෙහි
අතික්කමති - ඉක්මවයි
අද්ධානමග්ගං - කතරමගට
අධිවාසිතුං - ඉවසන්ට
අධිජ්ඣී - ගෙහි කටයුතු
අධුනා - දැන්
අන්වෙති - අනුව එයි
අන්තරාමග්ගෙ - අතරමග
අන්තරහිතො - අතුරුදන් වූයේ
අන්ධභූතො - අන්ධවූයේ
අන්ධබධිරො - අඳ බිහිරි
අනවසෙසං - නොවටඑව,
අනයව්‍යසනපපන්නො - බොහෝ කරදරවලට පැමිණියේ
අනාසවො - කෙලෙසුන් නැත්තෝ
අනායතනෙසු - ආයතන නුවූ යෙහිද
අනියාමිතපරිදීපනං - නියම නොදැක්ම
අනුරථං - පසුරථය

අනුවාතං–වාතයට අනුවූයේ
අනුජෙට්ඨං–දෙවැනි දෙටුවා
අට්ඨාසි–සිටියේය
අඩ්ඪවට්ටුලො–අඩ කහවය
අණ්ඩච්ඡෙදනං–ලිඟු ඉදිරීම
අප්පස්සුත–නූගත්
අප්පායුකං–මඳ ආයු ඇත්තා
අපරාපරං–ඔබ් මොබ
අපරිපටනං–නොගැළවෙන්
  නහු
අපෙති–යයි
අබ්භක්ඛානං–අබිබවාකීම
අබ්භුග්ගතො–පැනනැගුනේ
අභික්කමති–ඉදිරියට යයි
අභිණ්හං–නිතර
අභිසපිස්සාමි–සාප කරන්
  නෙමි
අයොමයං–යකඩින් සැදූ
අයොකපල්ලං–යකඩබල
අරයො–(රිය) දත්
අරියසච්චානදස්සනං–ආය්‍ය
  සත්‍යයන්ගේ දැකීම
අරෙ–බොල
අලං කම්මඤ්ඤා=සුදුසු ය
අවිජ්ජානාහොසි අවිද්‍යාවීය
අවිදූරෙ–නුදුරෙහි
අවිරහපත්තසාධාරණ–නුසුත්ව
  වැළෙන පොදින්
අවෙච්ච–දැන
අසංදිස්සමාන–රහවිදගැණීම
අසවනතා–ශ්‍රවණය නො
  කිරීමෙන්
අසම්භො–සම්ඵසෙක් නැති
අසිතො–කළුපාට
අසොකරත්තං–රැ දමල්

## ආ

ආකඩ්ඪිත්වා–ඇද
ආකාසෙව–අහසෙහිමෙන්
ආචණ්ඩියමනතා–චණ්ඩත්නේ
ආදාය–ගෙණ
ආධික්කා–අධිකබව
ආමන්තෙසි–ඇමතීය
ආයුත්තකො–අයකැමියා
ආරක්ඛං–ආරක්ෂාව
ආරභි–පටන්ගත්තේය
ආලසියෙන–කම්මැලිකමින්
ආලොකිතපුබ්බං–බැලූ විරූ
ආවාටෙ–වළෙහි
ආවිලොදකෙන–කැලැත්
  දියෙන්
ආවිභවන්ති–මතුවෙත්
ආසයො–ගුහාව
ආහ–කීය
ආහරථ–ගෙණඑනු

## ඉ

ඉච්ඡාපෙති–කැමතිකරවයි
ඉතරා–අන්‍ය
ඉතොපට්ඨාය–මෙතැන්පටන්
ඉතොචිතොච–මෙසින් මත්
  තොහි
ඉදඤ්චිදඤ්ච–මේ මේ දෙය
ඉට්ඨමනුඤ්ඤහි–කැමති වස්තුමෙන්

ඉරියාපථං-ඉරියව්ව
ඉස්සරකතං-මෙහෙසුරු විසින් කරණ ලද
ඊදිසානි-මෙබඳු

## උ

උක්ඛිපිත්වා-ඔසවා
උග්ගසොසො-උග්ඝෝෂණය
උග්ගණ්හාති-උගණියි
උජුකං-සෘජු
උත්තරිම්පි-මත්තෙහිද
උතුං-ඍතු
උද්දිසාපෙති-උදෙසවයි
උන්නාතිකාම-උසස්වනු කැමති
උපද්දවො-උවදුර
උප්පාදෙත්වා-උපදවා
උප්පතිත්වා-නැගී
උපට්ඨාකමනුස්සා-උවටැන් කරන්නෝ
උපදිස්සරෙ-දක්වනුලැබෙත්
උපනගරං-උයන
උපවධූ-කිරිමවු
උපමාතරං-කිරිමවු
උප්පාටෙත්වා-උපුටා
උපෙතා-යුක්තවූයේ
උපෙක්ඛති-මැදහත්වෙයි
උපෙති-පැමිණෙයි
උපොසථකම්මං-පොහෝකම්
උභො-දෙක

## එ

එකමිදාහං– (එකං + ඉධ + අහං
එකච්ච-ඇතැම් කෙනෙක්
එකාකෙනෙව-එකදවසින්ම
එතදවොච-මෙය කීය
එවංස-(එවං + අස්සා
එහි-එනු

## ඔ

ඔකපුණ්ණා-දියෙන් පිරුණු
ඔකාසො-අවසරයි
ඔතරන්ති-එතරවෙති
ඔනද්ධා-වැසුනු
ඔනීතපත්තපාණී-පාත්‍රයෙන් ගත් අත් ඇත්තෝ
ඔලොකෙසි-බැලීය
ඔවදති-අවවාදකරයි
ඔසානං-කෙළවර

## ක

කක්කසො-රළු
කච්චිනුඛො-කිමෙක්ද
කතමාච-කවරේද
කතා-කරණලදී
කත්තබ්බයුත්තකං– කටයුත්ත
කත්තිකස්ස-ඉල්
කතාධිකාරත්තා-කළපින් ඇති බැවින්
කදන්නං-අයහපත් ආහාරය

කදලීසු-කෙසෙල්වල
කද්දමකිලින්නගත්තී-මඩවැකුනු
කට්ඨං-දර
කණ්හං-කළු
කපොතො-කොබෙයි
කම්මාසවණ්ණා-කබුරුවන් පැහැය
කම්පමානො-සෙලවෙන්නේ
කරුණාවිහාරො-කරුණාවෙන් විසීම
කලලීභූතාම්-මඩවූ මෙන්
කලිංච-වරදමෙන්
කලුසභූමි-අපවිත්‍ර තැන
ක්වෙත්ථ- (කො + එත්ථ)
කස්සකො-ගොවියා
කසති-සායි
කසා-කැවිට
කාකකුලාවකං- කවුඩු කැදැල්ල
කාකස්සරො-කවුඩන් මෙන් සුරවූවනු
කාකී-කැවිඩියා
කාතරං-බ[illegible]ැ
කාපුරිසො-අසත්පුරුෂයා
කාරකො-කරවා
කාසාවං-සිවුර
කිංසුකකුසුමානි-කැලමල්
කිත්තකෙන-කොපමණකින්
කිමිසප්පාදයො-කෘමි සර්පාදීහු
කීටපටඞ්ගධූලිලූතාජාලාදීහි- පණු අසූචි මකුළුදැල් ආදියෙන්
කීවද්දූරො-කොපමණ දුරද
කුච්ඡිරොගො-ආමාශයගත රොගය
කුජ්ඣිත්වා-කිපී
කුඤ්ජරො-ඇතා
කුන්නදියො-ඇළ දොළ
කුටිං-කුඩා ගෙය
කුරූපා-අවලක්ෂණ
කුසලිනො-දක්ෂයෝ
කුසුම්භ-කොන්ද්‍රික්කාමල්
කෙතකී-වැටකේ
කෙදාරෙසු-කුඹුරුවල
කෙවලං-හුදෙක්
කොසං-කඩසතකි
කොසල්ලං-දක්ෂකම

ඛ

ඛගො-පක්ෂියා
ඛන්ධ-කඳ
ඛණ-ක්ෂණය
ඛණිත්වා-සාරා
ඛමතු-කමා කෙරේවා
ඛ්වජ්ජ- (ඛො + අජ්ජ)
ඛිප්පං-වහා
ඛිපි-බැහීය
ඛුදාභිභූතො-බඩසගින් පෙළුනේ
ඛෙපයන්ති-ගතකරත්

ග

ගච්ඡාමහං (ගච්ඡාමි + අහං)
ගතො-ගියේ

ගද්‍රභො-කොටළුවා
ගන්ධිකා-සුවඳ වෙළෙන්දා
ගබ්භ-ගැබෙහි
ගව්‍යානි-ගොම
ගහෙත්වා-ගෙණ
ගාමදාරකා-ගම් දරුවෝ
ගාහෙති-ගන්වයි
ගාළ්හතං-දැඩි
ගිජ්ඣං-ගිජුලිහිණියා
ගිම්හතාපදඩ්ඪා-ගිම් තෙදින් තැවුණෝ
ගිලති-ගිලියි
ගීවාය-බෙල්ලෙහි
ගුණානුකිත්තනං-ගුණ කීම
ගුම්බං-ලැහැබ
ගුහායති-සඟවයි
ගුළ්හෙන-රහසින්
ගොමයපිණ්ඩං-ගොම්පිඩ
ගොළිකං-උක්සකුරු වෙළෙන්දා

ඝ

ඝටිකා-පැය
ඝටෙති-ගලපයි
ඝරං-ගෙය
ඝාතෙත්වා-නසා
ඝායිත්වා-(සුවඳ) ආඝ්‍රාණය කොට

ච

චක්කං-රිය
චක්ඛුංඋදපාදි-නුවණැස පහළවිය

චඞ්කුට-කොටය
චන්දත්තං-සඳේහැටි
චන්දෝදයො-සඳ පෑයීම
චණ්ඩප්පවාහා-සැඩ ප්‍රවාහය
චම්මාසනතො-සම්සනින්
චරණානි-පා
චරිත්වා-හැසිර
චිත්තවණ්ණා-විසිතුරු පැහැය
චිත්තවිගන්ධපෙතො-සිය්සසර දන්නා
චුති-චුතවීම
චූතරුක්ඛො-අඹගස
චොරාපෙති-සොරකම්කරවයි

ඡ

ඡදනන්තරෙහ-පියසි අතුරෙන්
ඡයිමානි-මේ සයයි
ඡළභිඤ්ඤා-උතුම් නුවණ සය
ඡළඞ්ගං-කරුණු සයක්
ඡින්නහත්ථො-සිඳුණු අත්ඇති
ඡින්දති-සිඳියි

ජ

ජවචා-ජවීයෙන්
ජනෙති-උපදවයි
ජම්බුච්ඡායා-දඹසෙවන
ජලසිත්තා-ජලය ඉස්සේ
ජලෙප්ලවතාතාය-ජලයෙහි මතුවීමෙන්
ජනාමි-දනිමි
ජානිතුං-දැනගන්ට

ජිතින්ද්‍රියො-දිනනලද ඉඳුරන් ඇති
ජිනෙරිතං-බුදුන් වදාළ
ජිණ්ණකො-දිරූයේ
ජීමූතමාලාය-වලාකුළුවලින්
ජීරති-දිරයි
ජීවසොකිනො-ජීව ලොක සිත්
ජීවිතබ්බං-ජීවත්විය යුතුයි
ජුතින්ධරො-රශ්මිය ඇති
ජුහාපයති-හොම කරවයි
ජෙට්ඨක සිගාලො-දෙටු සිවලා
ඤත්වා-දැන
ඤාපෙති-දන්වයි.

ත

තංඛණෙ-එකෙණෙහි
තරහි-එකල්හි
තසෙසඤ්ඤ-එනම
තදුපමං-එසේ උපමා ඇති
තදා එකල්හි,
තණ්හං-තෘෂ්ණාව
තපනකිරණපරහෙත-තැවීම් රැස් නැසීමෙන්
තපොධනො-තපස ධනය කොට ඇත්තා
තමොනුදෙ-අන්ධකාරය පහ කරන්නේ
තාත-දරුව
තාව-ඒ තාක්
තික්ඛපඤ්ඤතතා-තියුණු නුවණ ඇති හෙයින්
තිබ්බ තියුණු
තිබ්බං-තීව්‍ර
තීරෙ-පිටත
තුච්ඡං-හිස්
තුණ්හසස-නිශ්ශබ්ද වූවහුට
තුරිතං-පැන පැන
තුවටං-වහා
තොසෙති-සතුටු කරවයි
ථලෙ-ගොඩ

ද

දත්වා-දී
දදෙය්‍ය-දෙන්නේය.
දණ්ඩාදණ්ඩි-පොලුවලින් කෝලාහල කරන්නා
දම්මි-දෙමි
දලිතා-පැළුනු
ද්විධාභිජ්ජිතා-දෙකට බෙද
දහරෙන-බාලයා විසින්
දමෙන්තො-දැමූනේ
දිසාපාමොක්ඛො-රජ
දිස්වා-දැක
දීඝතො-දිගින්
දුක්කතං-වරදවා කරනලද
දුද්ධං-මිදුණු කිරි
දුබ්බලො-දුබලයා
දූසයති-දූෂ්‍ය කරයි
දූභයති-වෑස පුරවයි
දෙති-දෙයි
දෙවසිකං-දවස්පතා

## ධ

ධනවස්සාපනක-වසනුම් වස්ස වත
ධනත්ථාය-ධනය පිණිස
ධනිං-ධනවතා
ධම්මබුද්ධි-ධර්මය යන හැඟීම
ධාවතා-දුවන
ධීමා-නුවණැති
ධුත්තා-ධූර්තයා
ධූමවණ්ණොති-දුම් පැහැය

## න

නගරද්වාරෙ-නුවර දොර
නන්දනං-සතුට
නනාස-නැසී
නභො-අහස
නයිමස්ස-(න + ඉමස්ස)
නයනානන්දධාරං-සතුටු කඳුලුදහර
නවනීත-වෙඬරු
න සක්කොති-නො හැකි වෙයි.
නස්සිස්සාමි-නැසෙමි.
නාගතා-නො පැමිණියෝ
නාගා-ඇතු
නානාවිධ-නන් වැදෑරුම්
නාලපිස්සන්ති කථා නො කරන්නාහුය.
නාසෙත්වා-නසා
නාළිමත්තං-නැළියක් පමණ
නික්ඛමති-නික්මෙයි.
නිඛිල-සියලු
නිගන්තගාමො-හිස්වූ ගම
නිග්‍රොධපණ්ණෙසු-නුග කොළ වල
නිච්ඡරති-නැඟිරෙයි.
නිජපකත්‍යනුසාරං-සිය පියවි අයුර
නිද්දරථං-කරදර නැති
නිද්දයො-දයා නැත්තා
නිද්දායති-නිදයි.
නිධාය-තබා
නිද්දිතුං-නිඳා කරන්ට
නිපතති-වැටෙයි:
නිපතන්ති-පැමිණෙයි.
නිපජ්ජි-හොත්තෝ ය.
නිබ්බත්ති-උපන්නේය.
නිම්මිනිත්වා-මවා
නියානිකත්තා-නියානික බැවින්
නිරන්තරං-නිතර
නිරාමයභාවො-රෝග නැතිබව
නිවාපෙත්වා-වසමා
නිවත්ති-නැවතුනේය.
නිවෙසනං-ගෙය
නිස්සාය-නිසා
නීඝිතනං-හුන්හුනු
නීප පලාසව ගුම්බන්තර-බක්මී දළු ලැහැබ අතර
නෙත්වා-පමුණුවා
නොචිතො-නුසුදුසුය.

ඨපාපෙත්වා--තබවා
ඨපෙසි-තැබීය.
ඩෙති-පියාඹයි.

## ප

පක්කමො-පැමිණීයෙ
පක්කොසති-කැඳවයි.
පගෙව-පළමු කොට
පග්ඝරන්තෙන-වැගිරෙන්
නහු විසින්
පංසුං-වැලි, මැටි
පඞ්කිතරූපමාසජ්ජ-මැටි
රුවක් කොට
පච්චයො-පසය
පච්ඡතො-පස්සෙන්
පඤ්ජරෙ-කූඩුවෙහි
පත්තහරණත්ථාය-පාත්‍රය
ගෙණයාම පිණිස
පතිට්ඨාපෙති-පිහිටුවයි.
පතිට්ඨිතො-පිහිටියේ
පත්තො-පැමිණියේ
පටිඝගී-විරුද්ධ සිතක
පටිවදති-පිළිවදන් දෙයි.
පටිසන්ධිං-ප්‍රතිසන්ධිය
පටිලාභො-ලැබීම
පටිවෙධො-ප්‍රතිවෙදයෙහි
පටිභාති-වැටහෙයි.
පටිවිස්සකානං-සමීප ගෙවල
ස්ත්‍රීන්ට
පණ්ඩිච්චං-පණ්ඩිත කම
පණ්ණකුටිරුදරවාසිනං-
කුඩා පැල්වල වසන්නන්

පපංචො-ප්‍රමාදය
පරියෙසනා-සෙවීම
පරිච්චජිස්සාමි-තැගි කරන්
නෙමි:
පරියෙසති-සොයයි.
පරික්ඛීණ-ක්ෂය කරණ ලද
පරිභාසසි-නින්දා කෙරෙහි
පරිසුජ්ඣති-පිරිසිදු වෙයි.
පරිදීපනං-දක්වීම
පරිපාලිතං-මනාකොට සෙවු
නා ලද
පරිච්චජාමි-පරිත්‍යාග කරමි.
පරිතාපයති-හාත්පසින් තවයි
පරිපාකං-පැසුනු
පරෙසං-අනුන්ගේ
පරොසතං-සියයට අධික
පවුච්චති-කියයි.
පවෙසති-පැමිණෙයි.
පසවවෙලාය - ප්‍රසූත කරණ
කල්හි
පසාඛාහි-කුඩා අතුවලින්
පසූ-සිවුපා
පහරි-ගැසීය.
පහොන්ති-පොහොතේ වෙත්.
පාචෙති-පිසවයි.
පාතුං-බොන්නට
පාතොව-අලුයම ම
පාදුකාදයො-වහන් ආදිය
පාටවං-දක්ෂකම
පාටිපදියං-පළමුවන දිනය
පාණකො-පණුවන්
පාපෙති-පමුණුවයි.

පාසාණෝ—ගල
පිකවධූ—කෙවිලී
පිකො—කොවුලා
පිච්ඡිලො—බෙලසුල්
පිඤ්ඤාකාදීහි—පුනක්කු ආදි යෙන්
පිධාය—වසා
පිට්ඨිං—පිට
පිලන්ධිත්වා—පැලඳ
පිවිස්සාමි—බොමි
පිහයන්ති—වැසපුරවත්
පීයූසම්ව—අමෘතය මෙන්
පීළිතො—පෙළුණේ
පුච්ඡි—ඇසීය.
පුථුජ්ජනතං—පෘථග්ජන භාවය
පුන—නැවත
පුණ්ණමී—පසළොස්වක
පුප්ඵංසා—(පුප්ඵං + අස්සා) උතුලෙය
පුබ්බඞ්ගමා—පළමු යන්[illegible]
පුබ්බදක්ඛිණා—ගිනි[illegible]කොණ
පුරිමාජාතිං—පෙරජා[illegible]ය
පුරතො—පළමුව
පූතිගන්ධමයාති—කුණුගඳමවූ
පොථෙතුං—තළන්ට
ඵරුසෙ—රළු

බ

බන්ධනා—බැම්ම
බන්ධිත්වා—බැඳ
බලවාහනං—සේනාවාහන
බව්හාබාධො—බොහෝරොග
බහුපකාරකං—බොහෝ උපකාර ඇත්තනු
බාහුල්ලතා—බහුල වශයෙන්
බුද්ධානුස්සති—බුදුන් මෙනෙහි කිරීම
බුබ්බුලං—බුබුල

භ

භඞ්ග—බිඳුනු
භත්තපාතිං—බත්පය
භන්තෙ—වහන්ස
භස්මං—අලු
භාරං—බර
භාරතදෙසියාඞ්ගනායො—දඹදිව ස්ත්‍රීහු
භින්නන්ත—බිඳුනු
භුත්තා—අනුභවකරණලද්දේ
භූතලෙ—පොළොවෙහි
භෙරිං—බෙරය
භෙසජ්ජෙහිපි—බෙ[illegible]හෙතින්ද
භොජියමා[illegible]සු—වළඳනු [illegible]නකල්හි
[illegible]ජෙති—වළ[illegible]වයි

ම

මකසා—මැ[illegible]සෝ
මක්ඛිකා—[illegible]සා
මඞ්ගලං—මඟුල්
මංසොදනං—මස්[illegible]පුත් බත
මච්ඡමංසං—මාළු මස්
මඤ්ජරී—මසූරා

මච්ඡරියභාවං-මසුරුකම
මඤ්චට්ඨා-ඇඳෙහි සිටියෝ
මඤ්ජුභාණකං-විසිතුරුව
කියන්නහු
මත්ථකෙන-හිසින්
මතාබහුමානභාගං-වනය
මනං-සිත
මනුස්සභූතො-මිනිස් වූයේ
මනුස්සතා-මිනිස්කම
මණ්ඩිතො-සරසන ලද්දේ
මණ්ඩුකා-මැඩියෝ
මහනීයං-පිදියයුතු
මහාභයප්පත්තො-බොහෝ
බියට පැමිණියේ
මහානිග්‍රොධො-මහනුග
මහාමච්ඡා-මහමසු
මහිච්ඡා-අධික ලොභොබියා
මහිද්ධිකො-මහත්සෘද්ධි
ඇත්තෝ
මාරෙත්වා-මරා
මාරෙථ-මරූ
මාහිසං-ගවමස්
මුඛොදකං-මූණ සෝදනාදිය
මුධා-නිෂ්ඵල
මුනයො-තපස්විහු
මුනිපුඞ්ගවො-උතුම් මුනිවරයා
මුහුංමුහුං-වරින්වර
මූ[illegible]තො-නො දෙඩා සිටීම
මූසිකාපූපං-[illegible]
මෙසො-වැස්ස
මොචෙති-මුදයි.

ය

යජති-යදියි
යථාරුචිය-රුචිපරිදි
යමාලයං-මරුගෙට
යසාභිලාසී-යසස කැමත්තේ
යාචකා-සිගන්නන්
යාපයතු-පොෂ්‍ය කෙරේවා,
යාවජීවං-දිවිතිබෙනතුරු,
යුජ්ඣිත්වා-යුද්ධකොට,
යොගිනමපි-යෝගීන්ට ද,
යොජෙති-යොදයි,
යොනියං-යොනියෙහි,

ර

රක්ඛති-රකියි,
රජොජල්ලං-ධූලි දූලි
රජ්ජියං-රජය
රති-ඇල්ම
රත්තූපරතො-රාත්‍රියෙහි
වැළකුණේ
රථිකා-රිය පදවන්නා
රහොගතො-රහසිගතවූයේ
රමණීයතං-සිත්කලුතැන
රිතෙ-හැරයි
රුච්චති-රුචිකෙරෙයි
රුචිරං-මිහිරි
රොමහංසමානො වමාරා
කමින්

## ල

ලඞ්කින්දො-ලඞ්කාධිපති
ලලනා-ස්ත්‍රිය
ලීළ්හාය-ලීලාවෙන්
ලුනාති-සිඳියි
ලොහස්සසලාකා-යකඩකූරු

## ව

වජ්ජනීයං-හැරියයුතුයි
වඤ්චෙතබ්බො-රැවටියයුතුයි
වත්ථු-වස්තුව
වදි-කීය
වනරාජී-වනදෙටු
වනචරා-සොරු
වට්ටකයොනියං-වටුජාතියෙහි
වඩ්ඩති-වැඩෙයි
වසන්ති-වසත්
ව්‍යාකතො-ප්‍රකාශකරණ ලද්දේ
වාචෙති-උගන්වයි
වායසො-කවුඩා
වාසිං-කැවිඩිය
වාසිට්ඨ-වසිට්ඨයාගේපුතා
විග්ගහො-කෝලාහලය
විචක්ඛණො-පණ්ඩිත
විචරථ-හැසිරෙව්
විජ්ජොතතෙ-බබලයි
විතානෙති-පතුරුවයි
විභජිත්වා-බෙදා
විමංසථ-විමසව්
විමූළ්හකං-මූළාවූවෝ
විලග්ගානි-ලැගුනු
විලසන්ති-බබලත්
විසිට්ඨතාය-විසිතුරුබැවින්
විහඞ්ගමො-පක්ෂියා
විහාසි-විසීය
වීතිපතන්ති-කල්යවත්
වුට්ඨාය-නැගිට
වෙත්තලතා-වේවැල
වෙණිකා-වෙණවයන්නා
වෙපුල්ලං-මහත්බව
වෙරමණී-වෙන්වීම
වෙසමා-විසමකම

## ස

සකලසරීරෙ-සියලුසිරුර
සක්ඛරානි-කැටගල්
සකානි-සවකීය
සකුණො-පක්ෂියා
සක්කො-ශක්‍රයා
සඞ්ඝාටි-දෙපටසිවුර
සංකාමිතරොගබීජානි-වසංගත රොගබීජ
සංවච්ඡර-අවුරුදු
සඞ්ඛලිකාය-කැකිල්ලෙන්
සචෙ-ඉදින්
සජාතිහි-සවකීයකුලයන්සමග
සජ්ඣායති-හදාරයි
සඤ්ඤොජනං-සංයොජන

සත්තරතනවස්සං-සත්රුවන්
වැස්ස
සත්තිමාකුලපරිවට්ටා-සත්
වැනිකුලයතෙක්
සතතං-නිතර
සත්තාහං-සුමානය
සද්ධිං-සමග
සන්තිකෙ-සමීපයෙහි
සන්තිට්ඨන්තෙ-සිටිනකල්හි
සනාතන-ඊශ්වරභක්තිකා
සපතෙ-දිවුරයි
සප්පි-ගිතෙල්
සබ්බසත්තානං-සියලුසතුන්ට
සබ්භිරෙව-සත්පුරුෂයා
සමඟම
සම්මන්ති-සංසිඳෙත්
සම්මදෙව-මනාකොට
සම්පන්නා-යුක්තවූයේ
සමීරණො-වාතය
සල්ලක්ඛණං-සැලකීම
සවණ්ණඤ්ජලිපු[...]ත-තන්
තැඹිලි දෙකො[...]න්

සාධියං-සිද්ධකටයුතු
සායං-සවස
සාරීරික-සිරුරෙහිහටගත්
සිගාල-සිවල්ලු
සිඞ්ගානි-අං
සිථිලං-ලිහිල්
සිරාසු-නහරවල
සිලාඝතෙ-පසසයි
සිසවො-දරුවෝ
සීසං-හිස
සුකාහටං-ගිරවුන්ගෙණා
සුති-ඇසීම
සුමුත්ත-මිදුනු
සූදො-අරක්කැමියා
සොණිතං-ලෙය

හ

හසි-හැසීම
හත්ථං-අත
හරිත[...]පාට
හොතු-වේ[...]ා

නිබ්බානස්ස පච්චයෝ හොතු
හීනටිගල පඤ්ඤාරාම ථේරෝ
2017-01-30. නාඋයන